# නිකීතාගේ ළමා කාලය



අලෙක්සේයි තොල්ස්තෝයි

අලෙක්සේයි තොල්ස්තෝයි

# නිකීතාගේ ළමා කාලය

කුරුලු පොත්
594/5, නාවල පාර, රාජගිරිය
දුරකථන: 2863350

අලෙක්සේයි තොල්ස්තෝයි

# නිකීතාගේ ළමා කාලය

ISBN 955 - 591 - 074 - X

අනුවාදය - දෑදිගම වී. රුද්‍රිගු


| | | | |
|---|---|---|---|
| ප්‍රථම | මුද්‍රණය | - | 1983 (මෝස්කව්) |
| දෙවන | මුද්‍රණය | - | 2001 දෙසැම්බර් |
| තෙවන | මුද්‍රණය | - | 2002 මාර්තු |
| සිව්වන | මුද්‍රණය | - | 2009 ජූලි |
| පස්වන | මුද්‍රණය | - | 2011 මැයි |
| හයවන | මුද්‍රණය | - | 2014 ජනවාරි |
| හත්වන | මුද්‍රණය | - | 2016 නොවැම්බර් |
| අටවන | මුද්‍රණය | - | 2018 පෙබරවාරි |
| නවවන | මුද්‍රණය | - | 2019 නොවැම්බර් |
| දහවන | මුද්‍රණය | - | 2023 මාර්තු |

ප්‍රකාශනය

**කුරුලු පොත්**

594/5, නාවල පාර, රාජගිරිය

දුරකථන: 2863350

**මුද්‍රණය**

දර්ශන මාර්කටින් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්

107, කඩුවෙල පාර, බත්තරමුල්ල

මගේ පුතුට,

නිකීතා අලෙක්සේයෙවිච් තොල්ස්තෝයිට

ආදරයෙන් පිරිනමමි.

කර්තෘ

## අපේ අලුත් රුසියානු ප්‍රකාශන

- ගොගල්ගේ හිම කබාය සහ වෙනත් කතා
- ඔබ ඉංජිනේරුවකු වීමට කැමතිද?
- අලෙක්සන්දර් පුෂ්කින්ගේ ඉස්කෝප්ප රැජින සහ තවත් කතා

# පටුන


| | පිටුව |
|---|---|
| දීප්තිමත් උදෑසන | 01 |
| අර්කාදියි ඉවානවිච් | 02 |
| හිම ගොඩැලි | 07 |
| රහස් ලියුම | 10 |
| සිහිනය | 12 |
| පැරණි නිවෙස | 16 |
| ළිඳ ළඟ | 18 |
| සටන | 21 |
| නීරස සැන්දෑව අවසන් වූ හැටි | 28 |
| වික්තර් සහ ලීල්‍යා | 34 |
| නත්තල් ගහ සැරසීම | 39 |
| වෙනම ගැලකින් ගෙනා තෑග්ග | 45 |
| නත්තල් උත්සවය | 49 |
| වික්තර්ගේ පරාජය | 55 |
| බිත්ති ඔර්ලෝසුවේ මල් පෝච්චියේ තිබුණු දෙය | 57 |
| අවසාන සැන්දෑව | 65 |
| වියෝවීම | 68 |
| වැඩ කටයුතු | 72 |
| ලිහිණියෝ | 77 |
| රෝද සහිත පුංචි ගෙදර | 81 |
| තාත්තාගේ පැමිණීම | 83 |
| තාත්තා ගිලිණු සැටි | 90 |
| නොසන්සුන් සතියක් | 95 |
| ප්යොතර් පෙත්රෝවිච්ගේ ළමයි | 97 |

| | පිටුව |
|---|---|
| ආත්ම ශක්තිය | 103 |
| වසන්තය | 107 |
| කොඩිය එසවීම | 109 |
| ෂෙල්තුහින් නමැති කුරුල්ලා | 112 |
| අශ්ව පැටවා | 118 |
| ජල ක්‍රීඩාව | 129 |
| වියළි කාලගුණය | 131 |
| කුඩා ලියුම | 136 |
| පෙස්ත්‍රාවිකාහි සල්පිල | 139 |
| කමතේ සිට | 146 |
| පිටවීම | 148 |

# දීප්තිමත් උදෑසන

උදෑසන අවදි වුණු නිකීතා සුසුමක් හෙළා දෙනෙත් ඇර බැලීය. හිම නිසා කවුළු වීදුරුවේ අපූරු හිම මල් ගෙත්තම් බඳු රටාවෙකි, එහි ඇති තරු සහ මල් ගෙත්තම් අතරින් හිරුඑළිය විනිවිද යයි. කාමරයෙහි හිම මෙන් සුදෝ සුදු ආලෝකයකි. මුහුණ සෝදන බේසමට වැටුණු හිරුඑළිය බිත්තියට වැදී ආලෝකමත් ලපයක් මවා පෑවේය.

දෙනෙත් හැර බැලූ නිකීතාට මතක් වූයේ ඊයේ හවස පහෝම් වඩුරාළ ඔහුට කී දෙයකි.

"මම දැන් මේ හිම යානය හොඳට පිළියෙළ කරන්නම්. පුංචි මහත්තයා උදේට නැගිටලා ඒකෙ වාඩි වෙලා හිම උඩ සෙල්ලම් කරන්න."

එකැස් කණක් සහ මුහුණෙ ලප සහිත පහෝම් වඩුරාළ නිකීතාගේ විශේෂ ඉල්ලීම පරිදි ඔහුට හිම යානයක් සෑදීය. එය හැදූ හැටි මෙසේය.

පහෝම් අස්රිය තබා ඇති මඩුවේ ලෑලි දෙකක් සහ කකුල් හතරක් යතුගා සාදා පිළියෙළ කළේය. පහළ තට්ටුව හැටියට ගැනෙන ලෑල්ල ඉදිරියෙන් මුණතක් ලෙස උඩට නමා ගත්තේ හිම කැට එය තුළට නොවැටීම පිණිසය. ඉහළ තට්ටුවට සිහින් කකුල් හතරක් සවි කළේය. හිම යානය මත වාඩි වන විට පහසුවන සේ දෙපැත්තෙන් පාද දැමීම සඳහා විශේෂ අඩ කවාකාර සිදුරු දෙකක් ද කැපීය. මෙලෙස හිම යානය සෑදූ පසු පහළ තට්ටුවට ගොම ආලේප කොට ඉතා දැඩි ශීතට සහ හිම තුෂාරයට හසු කැරැමින් එයට තෙවරක්ම වතුර ඉසින ලදී. ඉන් පසු පහළ තට්ටුව හෙවත් අඩිය වීදුරුවක් මෙන් දිලිසෙන්නට විය. උඩ ලෑල්ලට සිදුරක් විද ලනු පොටක් බැන්දේය. එය හිම යානය ඇද ගෙන යාමටය. එමෙන්ම හිම පිරි කන්දක සිට පහළට රූට්ටන විට යානය මෙහෙයැවීමටය.

දැන් සාදා පිළියෙළ කළ හිම යානය දොරකඩ අසල තබා ඇත. පහෝම් කියන දේ කරන මිනිහෙකි! "මම කියාපු දේ අකුරටම කරනවා"

ඔහු කීවේය.

නිකීතා ඇඳෙහි වාඩි වී කන් යොමා ඇසීය. ගෙතුළ නිහඬතාවයෙකි. තවම කිසිවකු නැගිටලා නැති හැඩයි. මුහුණ හෝදන්නේවත්, දත් මදින්නේවත් නැතිව, විනාඩියකින් ඇඳ ගත්තොත්, පස්සා දොරින් පිට වී, ගෙවත්තට යන්ට පුළුවනි. ගෙවත්තේ සිට ගඟ ළඟට යන්ට පුළුවනි. ගං ඉවුරෙ හිම ගොඩ ගැහිලා. හිම යානයේ වාඩි වෙලා හිතේ හැටියට පහළට ලිස්ස, ලිස්ස ගිහිල්ලා සෙල්ලම් කරන්ට පුළුවනි...

නිකීතා දෙපයේ ඇඟිලි තුඩුවලින් ඇවිදිමින් හිරු එළිය වැටී උණුසුම් වෙලා තියන තැනට ගියේය....

ඔන්න එතකොටම, කාමරයේ දොර ඇරිලා මිනිස් හිසක් එබී බැලුවා. ඇස් කණ්ණාඩි පැළඳ ඇති එම හිසේ ඇහි බැමි රතු-දුඹුරු පාටයි. යටි රැවුල තද රතු පාටයි. ඇහැක් අඩවන් කරලා හිස කතා කළා:

"කොලු පැංචා නැගිට්ටද?"

## අර්කාදියි ඉවානවිච්

රතු යටි රැවුලා නිකීතාගේ ගුරුතුමා වන අර්කාදියි ඉවානවිච්ය. ඔහු ඊයේ හවස සිට සිදු වුණ දේ බලා ගෙන හිටියා. දැන් උදේ පාන්දර කලින්ම නැගිට්ටා. පුදුම ලෙස දක්ෂ, හුරුබුහුටි කෙනෙකි, අර්කාදියි ඉවානවිච්, ඔහු හිනා වෙවී, නිකීතාගේ කාමරයට ඇතුළු වෙලා ජනේල වීදුරුවට කටින් පිම්බා. එවිට එහි තිබුණු හිම තට්ටුව දිය වුණා. ඔහු ජනේල වීදුරුවේ පැහැදිලි කොටසෙන් ගෙවත්ත දෙස බැලුවා.

"අන්න දොරකඩ ළඟ බොහොම ලස්සන හිම යානයක් තියෙනවා" ඔහු කීවේය.

නිකීතා නිහඬ වෙලා, ඇහි බැමි හකුළුවාගෙන හිටියා. ඔන්න ඉතින් නිකීතාට සිද්ද වුණා දත් මදින්ටයි, මූණ සෝදන්ටයි, ඒ විතරක් නොවෙයි, කන් දෙකයි බෙල්ලයි සබන් ගාලා හොඳට සෝදන්ට සිදු වුණා. ඊට පසුව අර්කාදියි ඉවානවිච් නිකීතාගේ උරහිසකින් අල්ලා ගෙන

ඔහුත් සමඟ උදේ තේ බීම පිණිස ආහාර ගන්නා කාමරයට ගෙන ගියා. නිකීතාගේ අම්මා උණුසුම් ඇති අළු පාට ගවොමක් ඇඳ ගෙන සමවාරය ළඟ වාඩි වෙලා හිටියා. අම්මා නිකීතාගේ මුහුණ දෑතින් අල්ලා ගෙන, පැහැදිලි දෙනෙතින් ඔහු දිහා බලාලා ඔහුගේ මුහුණ සිප ගත්තා.

"මගෙ පුතා හොඳට නිදාගත්තද?"

ඉන්පසු ඇ අර්කාදියි ඉවානවිච් වෙත අතක් දිගු කරලා මිහිරි ලෙස ප්‍රශ්න කළා:

"අර්කාදියි ඉවානවිච් ඔබ හොඳට නිදාගත්තද?"

"මම හොඳට නිදාගත්තා" එහෙම උත්තර දීලා එයා රතු පාට උඩු රැවුළ දෙපැත්තට විහිදිලා යන්නට මඳ සිනා පෑවේ මොකදැයි කියලා තේරුම් ගන්ට අමාරුයි. එයා මේසයට වාඩි වෙලා තේ කෝප්පයට කිරි ටිකක් වත් කරලා, සීනි කැල්ලක් කටේ දමාගෙන නිකීතා දෙස බලා ඇස් කණ්ණාඩියට අස්සෙන් ඇහැක් අඩවන් කරලා ඉඟි මැරුවා.

අර්කාදියි ඉවානවිච්ව තේරුම් ගන්ට බැහැ. හැමදාම එයා ප්‍රීතියෙන්, හැම තිස්සේම ඉඟි මරනවා. කිසිම දාක කෙළින් කතා කරන්නේ නැහැ. හදවත ගැහෙන්ට තමයි, එයා කතා කරන්නේ. ඔන්න බලන්න අම්මා බොහොම පැහැදිලි ලෙස ප්‍රශ්න කළා: "ඔබ හොඳට නිදාගත්තද?" ඔහු මෙහෙම පිළිතුරු දුන්නා: "මම හොඳට නිදාගත්තා," නමුත් එහි යටි අදහස තේරුම් ගන්ට ඕන මෙහෙමයි: "ඔන්න නිකීතා උදේ තේ බොන්නෙත් නැතුව, පාඩම් කරන්නෙත් නැතුව, පැනලා ගිහින් සෙල්ලම් කරන්ට හිතාගෙන ඉන්නවා. ඊයේ ජර්මන් පාඩම ඉගෙන ගන්නවා වෙනුවට අස්රිය මඩුවට ගිහිල්ලා පහෝම් වඩුරාළත් එක්ක පැය දෙකක්ම කතා කර කර හිටියා."

අර්කාදියි ඉවානවිච් කිසිම දිනෙක අම්මාට නිකීතා ගැන පැමිණිලි කළේ නැහැ. ඒක ඇත්ත. එහෙත් නිකීතාට හැමදාම පරිස්සමින් ඉන්ට සිදු වුණා.

ඊයේ රෑ හීතල බොහොම වැඩි වෙලා, හිම තුෂාරයක් ඇතිවෙලා

පීප්පෙ වතුර මිදිලා කියලා අම්මා කීවා. ඇවිදින්නට යන විට, හිම තොප්පියට උඩින් බෂ්ලීක් තොප්පියක් ඇඳ ගන්ට ඕන කියලා අම්මා පුතාට මතක් කළා.

"අම්මේ ඇත්තටම මට නම් බොහොම රස්නෙයි." එහෙම කීවෙ නිකීතා.

"පුතා බෂ්ලීක් තොප්පිය අඳින්ට ඕන" අම්මා නැවතත් කියා සිටියා.

"අම්මේ, ඒක ඇන්දම කම්මුල්වලට ඉඳිකටු ඇනෙනවා වගෙ දැනෙනවා. හුස්ම ගන්ටත් අමාරු වෙනවා. ඔය බෂ්ලීක් තොප්පිය ඇන්දම මට වඩාත් වැඩියෙන් හෙම්බිරිස්සාව හැදේවි."

අම්මා නිහඬව අර්කාදියි ඉවානවිච් දෙස බැලුවා, ආයෙමත් නිකීතා දිහාබැලුවා. ඈගේ කටහඬ වෙවුලන්නට වුණා:

"පුතා මේ තරම් මුරණ්ඩු වුණේ කොහොමද කියලා මං දන්නේ නැහැ."

"යමු පාඩම් කිරීමට" අර්කාදියි ඉවානවිච් එහෙම කියල, තීරණාත්මක ලෙස නැගිටලා ඉක්මණට අත් පිස දැම්මා. අංක ගණිතය පාඩම් කිරීම සහ ඇස් දෙකට මහන්සි ගෙන දෙන ප්‍රස්ථාව පිරුළු සහ ජනකතා කියවන විට ලිවීම තරම් සතුට ගෙන දෙන වැඩක් මේ ලෝකයේ තවත් නැතුවා වගෙයි.

නිකීතාගේ පංති කාමරය හිස්ය, බිත්ති සුදු පාටය. එක් බිත්තියක ලෝකයේ සිතියම එල්ලා ඇත. නිකීතා පුංචි ලියන මේසය අසල වාඩි විය. මේසය පුරා තීන්ත පැල්ලම්ය. අර්කාදියි ඉවානවිච් ගණිත පාඩම් පොත පෙරළුවේය.

"ඉස්සෙල්ලා අපි නැවතුණේ කොතැනද?" ඔහු සතුටින් අසා පැන්සල් තුඩින් ගණිත පාඩමේ අංකයට යටින් ඉරක් ගැසීය.

"වෙළෙන්දා නිල් පාට රෙදි යාර කීපයක් විකුණුවා. එක යාරයක මිල රූබල් 3 යි කොපෙක් 64 යි. ඒ වගේම කළු පාට රෙදි යාර...." නිකීතා ගණිත පාඩම කියවන්නට විය. හැමදා මෙන්ම අදත් ඔහුට ගණිත පාඩම්වල ඉන්න වෙළෙන්දා මැවී පෙනෙයි. ඔහුගේ කබාය දිගුය. එහි දූවිලි ගැවිලාය. ඔහුගේ මුහුණ කහ පාටය, මූසලය, පැතලිය, වේලිලාය, ඔහුගේ කඩය ගුහාවක් මෙන් ඇඳිරිය. දූලි සහිත රාක්කයේ රෙදි කැලි දෙකක් තිබිණි. වෙළෙන්දා තම කෙට්ටු අත්වලින් රෙදි කැල්ල ගෙන මළානික නෙත්වලින් නිකීතා දෙස බැලීය.

"නිකීතා ඔබ සිතන්නේ මොනවා ගැනද? වෙළෙන්දා විකුණූ මුළු ප්‍රමාණය රෙදි යාර දහ අටයි. නිල් පාට රෙදි කොපමණ විකුණුවද, කළු පාට රෙදි කොපමණ විකුණුවද?" ගුරුතුමා ප්‍රශ්න කළේය.

නිකීතා තවමත් සිතුවිලි ලෝකයේ පසුවෙයි. ඔහුගේ මනසෙහි ඇඳී ඇති වෙළෙන්දාගේ රූපය රෙදි කැලි දෙකත් සමග දූලි සහිත බිත්තියට වැදී අතුරුදහන් විය.....

"නිකීතා දවල් හීන දකිනවා වගෙයි" මෙසේ පැවසූ ගුරුතුමා යළිත් ගණිත පාඩම විස්තර කරමින් පැන්සලයකින් අංකයක් ලියා එය බෙදන්නට වූයේ හඬ නගමිනි: "එකක් ලියුවා, දෙකක් හිතේ තියා ගත්තා." "එකක් හිතේ තියා ගත්තා," දෙකක් හිතේ තියා ගත්තා" කියමින් ලියන විට, එහෙම හිතේ තියාගන්නා අංක අමතක නොවීමට මොළය ඇතුළෙහි ටොකු ඇනීමක් වැනි දෙයක් සිදුවන බවක් නිකීතාට සිතෙයි. මෙය නොසතුටක් ඇති කළේය. හිම තුෂාරය සහිත කවුළුවලට හිරු රැස් වැටිලාය. එය ඔහුට මෙසේ අඬ ගසන්නාක් මෙනි: "ගඟ ළඟට ගිහිල්ලා සෙල්ලම් කරමු!"

ඔන්න ගණිත පාඩම අවසන් විය. ඊළඟට කියවන විට ලිවීමේ පාඩමය. ගුරුතුමා පංති කාමරයේ බිත්තිය අසලින් යමින් කියවන්නට විය. ඔහුගේ කට හඬෙහි විශේෂ නිදිමත ගතියෙකි. එවැනි කට හඬෙකින් මිනිස්සු කතා නොකරති. ගුරුතුමා කියවන්නට විය.

"මේ ලෝකයේ වසන සියලු සත්තු හැමදා වැඩ කරති. සිදුවා කීකරු යහපත් ළමයෙක් විය... "

දිව යමින්මින් එළියට දමාගෙන නිකීතා ලියයි. පෑන් තුඩින් ශබ්දයක් මතු විය. තීන්ත අවට විසි විය.

හිටි හැටියේ ම මහ ගෙදර දොර වැසෙන ශබ්දයක් ඇසිණි. කොරිඩෝරය දිගේ හිම සපත්තුවල හඬක් ඇසේ. ගුරුතුමා ඒ හඬට කන් දෙමින් පොත පහත දැමීය. අම්මාගේ ප්‍රීතිමත් කට හඬ ළං ළංව ඇසෙයි.

"මොනවා, තැපැල් ලියුම් ගෙනල්ලද?" නිකීතා කොපි පොත දෙසට හිස පහත් කළේය. එලෙස සිනාසීම නවතාගත හැකි විය.

"කීකරු යහපත්" නිකීතා හනිකට කීවේය. "යහපත්: මම ඒ වචනය ලියුවා."

අර්කාදියි ඉවානවිච් ගුරුතුමා යළිත් ඇස් කණ්නාඩි කුට්ටම හරිගස්සා ගෙන කියැවීය:

"මේ ලෝකයේ වසන සියලු සත්තු කීකරුය, යහපත්ය... නිකීතා මොකද හිනා වෙන්නෙ?.... තීන්ත පැල්ලමක් ඇති කළාද?... කොහොම වුණත් අපි දැන් සුළු විවේකයක් ගනිමු"යි කී ගුරුතුමා, දෙතොල් තද කැරගෙන, පෑන්සලක් වැනි තමාගේ දිගැති ඇඟිල්ල පෙන්වා තරවටු කරමින් හනිකට පන්ති කාමරයෙන් පිටතට ගියේය. කොරිඩෝරයේ දී ඔහු අම්මාගෙන් මෙසේ ඇසීය:

"අලෙක්සාන්ද්‍රා ලියොන්තියෙව්නා මට ලියුම් නැද්ද?"

ගුරුතුමා ලියුම් බලාපොරොත්තුව සිටින්නේ කාගෙන්ද යන්න නිකීතා අනුමාන වශයෙන් දැන සිටියේය. දැන් ඉතින් කාලය අපතේ නාස්ති නොකළ යුතුය. නිකීතා කෙටි හිම කබායක් ඇඟලා ගෙන, හිම සපත්තු පය ලා ගෙන, තොප්පියක් හිස ලා ගත්තේය. බිහිලීක් තොප්පිය වෙන කාටවත් හොයා ගැනීමට නොහැකි වනලෙස ලාච්චු පෙට්ටිය යටට දමා එළි පත්තට දිව ගියේය.

# හිම ගොඩැලි

ගෙවත්ත සුදෝසුදු හිමවලින් වැසිලාය. එය ඉතා සිනිඳුය, හිරු රැස් නිසා දිලිසෙයි. හිම මත මිනිසුන්ගේ සපත්තුවල ගැඹුරු පා සටහන් සහ බල්ලන්ගේ පා සටහන්ය. සුළං පහර ඉතා ශීතය, තියුණුය, එය නාසය දවයි. කම්මුල්වලට කුඩා ඉඳිකටුවලින් අනින කලෙක මෙනි. අස්රිය තබන මඩුවත්, ගබඩා මඩුවත්, ගව පට්ටියත් කුඩාය. ඒවායේ පියස්ස හිමවලින් පිරිලාය. ඒවා හිමෙන් වැසුණු පොළව පලාගෙන මතු වුණාක් සේය. හිම යානයේ සටහන් ගෙවත්තේ හිම මත ඇඳී තිබුණේ වීදුරුවකින් සැදූ පටු තීරු වගෙයි.

නිකීතා එළිපත්තේ සිට දුවන විට නැවුම් හිම පයට පෑගී 'කර කර' යන හඬක් පිට කළේය. පහළ කඹයක් බැඳපු අලුත් හිම යානය තිබිණි. නිකීතා හිම යානය පිරික්ෂා බැලීය, එය ඉතා හොඳින් සාදා ඇත. හිම උඩ ඉතා හොඳින් ලිස්සා යාමට ද එයට පුළුවන. හිම යානය උරයක් මත තබා ගත් නිකීතා උදැල්ලද අතට ගත්තේ එය අවශ්‍ය වෙතියි සිතූ නිසාය. ඔහු වත්ත හරහා දුවමින් වෙල්ලට ළං විය. එය අසළ වූ ගස්වල අතු වසා ඇති හිම අයිස් බවට පත් වී වීදුරු කරල් මෙන් එල්ලෙමින් තිබිණි.

ඔහු වෙල්ල අසලින් දකුණට හැරී හිම මත ඇති පා සටහන් ඔස්සේ යාමට උත්සාහ කළේය. මිනිස් පයට පෑගී නැති නැවුම් හිම මත නිකීතා ගමන් කළේ පස්සෙන් පස්සටය. ඔහු ගිය මග ගුරුතුමාට සොයා ගැනීමට අපහසු වනු පිණිසය.

වග්රා ගංගාවේ දළ බෑවුම් සහිත ඉවුරේ පුළුන් වැනි නැවුම් හිම ගොඩැලිය. සමහර තැන්වල මේ හිම ගොඩැලි තුඩු මෙන් ගංගාව මත පැතිර තිබේ. උසැති එවැනි තුඩක් උඩට නැග ගෙන සතුටින් හඬ නගා හිම යානය මත වාඩි වූ විගස එය පහළට රූටා යයි. එවිට ඔහුට දැනෙන්නේ හිම පියළි සහිත වළාකුලක පාවෙන ලෙසිනි.

දකුණින් සුදු පැහැති කෙත් සහ මුඩුබිම් අතරින් ගඟ ගලා බසී. එය නිල් පැහැති ඡායාවකට සමානය. වම්පසින් සස්නෝව්කා ගමේ කළු පැහැති ගෙවල්ය. ළිංවලින් වතුර ගැනීම සඳහා සවි කොට ඇති බාල්දි

සහිත දිග රිටිමාන කොකුන්ට සමාන බවක් දැරිය. බැවුමේ ගැට්ට අසල කහ පැහැති පැල්ලම්ය. අද උදෑසන ලිප්වලින් පිටතට ඇද දැමූ අඟුරුය. එය අසල පුංචි ළමයි දුවති, පිනිති. ඒ නිකීතාගේ යාළුවෝය. "අපේ ගම" අයිනේ පදිංචි කොල්ලන්ය. ඈත ගඟ හැරෙන තැන තවත් කොල්ලන්ගේ රංචුවකි. "කොන්චාන්ස්කි"* නමැති ගමෙහි ඒ අය භයානක කොල්ලෝ වෙති.

නිකීතා උදැල්ල වීසි කොට හිම ගොඩැල්ල මත යානය තබා එහි වාඩි වී ලණුව අතට තදින් ගත්තේය. දෙවරක් පමණ පයින් යම්තමින් එය තල්ලු කළේය. එවිට හිම යානය පහළට ලිස්සා යන්නට විය. හුළං පහර මුහුණට වැදුණු අතර සිහිඳු හිම පියලි ඉහළ නැංගේය. හිම ගොඩැල්ලේ සිට හිම යානය බිමට ඇදී ගියේ ඊයක් මෙනි. හිටිහැටියේම හිම කැටිවලට හැප්පුණු එම යානය උඩට වීසි වී අයිස් තට්ටුවකින් වැසුණු ගංගාව මත යන්නට විය. සෙමින්, සෙමින් දුර ගොස් එය නැවතිණි.

නිකීතා හඬ නගා සිනාසී හිම යානයෙන් බැස ලණු පොටෙන් එය අදිමින්, දණක් හිම මත එරෙමින් හිම ගොඩැල්ලට නැංගේය. ඔහු ගං ඉවුරට ආ විට, තරමක් ඈතින් උසැති මිනිසෙකු එන සැටි පෙනිණි. ඒ අර්කාදියි ඉවානවිච් ගුරුතුමාය. නිකීතා උදැල්ල රැගෙන හනිකට හිම යානය මත වාඩි වූයෙන් එය යළිත් වරක් පහළට රූටා ගියේය. ඉන් පසු ඔහු තුඩුවක් සේ ගඟ මත ගොඩ ගැසී තිබෙන හිම ගොඩට දිව්වේය.

හිම පිරි තුඩුව මත ඔහු සෙල්ලම් උමං ගෙයක් හාරන්නට විය. සිහිඳු හිම හාරා දැමීම ලෙහෙසි කාරියකි. උමං ගෙයට රිංගා ගත් නිකීතා හිම යානය ද තමා වෙතට ඇදගෙන, සිදුර වැසෙන සේ හිම කැටි තැබීය. මෙලෙස හිම කැටවලින් සිදුර වැසූ ඉක්බිතිව, උමං ගෙය තුළ පැහැදිලි නිල් පැහැති අඩවන් ආලෝකයකි. සෙල්ලම් උමං ගෙය තුළ පහසුවක් සහ ප්‍රීතියක් දැනිණි.

මෙතරම් අපූරු හිම යානයක් කිසිම ළමයකුට නැතැයි නිකීතා කල්පනා කරන්නට විය. ඔහු තම සාක්කුවෙන් කුඩා පිහියක් ගෙන හිම

---

* පිට ගම් කාරයෝ - අනුවාදක

යානයේ ඉහළ තට්ටුවේ 'වේවිට්' යන අකුරු කැපීය. එය ඔහුගේ හිම යානයේ නමය.

"නිකීතා, ඔයා හැංගිලා ඉන්නේ කොහේද?" ගුරුතුමාගේ කට හඬ ඔහුට ඇසෙයි. නිකීතා පිහිය සාක්කුවේ දමා ගෙන සිදුර වසා ඇති හිම කැට අතර ඇති හිඩැස්සෙන් පිටත බැලීය. පහල අයිස් තට්ටුව මත සිටින ගුරුවරයා ඔහුට පෙනෙයි.

"ඒයි පල් හොරා! නුඹ කොහෙද?" ගුරුතුමා ආදරයකින් ප්‍රශ්න කරයි!

අර්කාදියි ඉවානවිච් ගුරුතුමා ඇස් කණ්නාඩි කුට්ටම හරි ගස්සා ගෙන සෙල්ලම් උමං ගෙයට රිංගත්ම, ඔහු ඉණක් දක්වා හිම ගොඩේ එරිණි.

"එළියට එන්න. නැතිනම් මම කොහොම හරි නිකීතා එළියට ඇද ගන්නවා."

නිකීතා නිහඬව සිටියේය. ගුරුතුමා තවත් ඉහළට නැගීමට උත්සාහ කළ ද, ඔහු යළිත් හිම ගොඩෙහි එරිණ. එවිට ඔහු දැත් සාක්කුවේ ඔබා ගෙන කතා කළේය.

"අකමැති නම් එළියට එන්න එපා, ඔතනට වෙලා ඉන්න. සමාරාවලින්* අම්මාට ලියුමක් ලැබී තියෙනවා. ඔන්න මා ගියා. ආයුබෝවන්!"

"මොන ලියුමක්ද?" නිකීතා ඇසීය.

"අහා, එහෙනම් නිකීතා ඔතන හැංගිලා ඉන්නව නේද?"

"කියන්නකෝ, ලියුම කාගෙන්ද?"

---

* දැන් මේ නගරය **කුයිබිෂෙව්** නමින් හැඳින්වේ.

"උත්සවයට මෙහාට එන මිනිසුන් ගැන තමා ඒ ලියුම."

හිම ගොඩැල්ලේ ඉහළින් හිම කැට විසි වී උමං ගෙයි සිටි නිකීතාගේ හිස පිටතට වත් සැටි ගුරුතුමා දැක බක-බක ගා සිනාසුණේය.

## රහස් ලියුම

දහවල් ආහාර ගන්නා විට අම්මා ලියුම කියැවූවාය. එය තාත්තා එවූ ලියුමකි.

"ආදරණීය සාෂා, අර ළමයාට තෑගි දීමට ඔබත් මාත් තීරණය කළ දේ මම අද මිළ දී ගත්තා. මේ තරම් හොඳ දෙයක් ඒ ළමයාට තෑගි දීමට තරම් ඒ ළමයා සුදුසු ද කියන එක මා හිතන හැටියට එතරම් ස්ථිර නැහැ." අම්මා ලියුමේ මෙම කොටස කියවද්දී ගුරුතුමා නිකීතා දෙස බලා ඇසක් අඩවන් කොටැ ඉහි මැරුවේය. "ඒ තෑග්ග මහ විසාලයි. ඒක ගෙනෙන්ට තවත් අශ්රියක් ගන්ට සිදුවුණා. තවත් එක ආරංචියක් දන්වන්ට ඕන. උත්සව කාලයට අන්නා අපලෝසව්නා බාබ්කිනා ඇගේ ළමයින් සමග අපේ ගෙදරට එනු ඇති......"

"තවත් දුර කියවීම වැඩක් නැතැයි" අම්මා කීවාය. නිකීතා ඇසූ ප්‍රශ්නවලට අම්මා පිළිතුරු දුන්නේ දෙනෙත් වසාගෙන හිස වනා මෙසේ පවසමිනි: "මම කිසිම දෙයක් දන්නේ නැහැ.

ගුරුතුමා ද දෑත් වනා නිහඬව මෙසේ ඇඟවීය. "මාත් කිසිම දෙයක් දන්නේ නැහැ." එදින ගුරුතුමාත් බොහෝ සතුටින් සිටි අතර හිටි හැටියේම විටින් විට, සාක්කුවෙන් ලියුම් කැබැල්ලක් ගෙන මොනවාදෝ පේළි දෙකක් විතර සෙමින් කියවා දෙතොල් හකුළුවා ගත්තේය. ගුරුතුමාටත් එයාගේම රහසක් තියෙන හැඩයි.

හවස් වනවිට නිකීතා ගෙවත්ත හරහා මෙහෙකරුවන්ගේ කාමරය වෙත ගියේය. එහි සිට කවුළුවලින් ආලෝකයක් දම් පැහැති හිම මත වැටෙන්නට විය. මෙහෙකරුවෝ කෑම කමින් සිටියෝය. නිකීතා තෙවරක් සීවුරු හඬලත්ම ඔහුගේ අඹ යාළුවාවන මිෂ්කා කාර්යෂොනක්

ආවේය. ඔහු දණ හිස දක්වා දිගැති හිම සපත්තු දෙකක් පය ලා සිටියේය. ඒවා මහා විශාලය. ඔහු හිම කබායක් හැඳ සිටිය ද හිසෙහි හිම තොප්පියක් නොවීය. මිෂ්කා මෙහෙකරුවන්ගේ කාමරයෙන් පිටතට ආ විට නිකීතා ඔහුට තාත්තාගේ ලියුමෙහි ඇති රහස කනට කොඳුරා කීවේය. නගරයේ සිට ගෙනෙන දේ මොනවා විය හැකි දැයි නිකීතා මිෂ්කාගෙන් ඇසීය.

අධික ශීතල නිසා වෙවුලමින් සිටි මිෂ්කා පිළිතුරු දුන්නේ දත් දෙපෙළ එකිනෙකට ගැටෙන හඬක් සමගය, වෙවුලමිනි.

"මගේ ඇස් දෙක පල්ලා, මොනවා හරි මහා විශාල දෙයක් ගෙනේවි. මම කාමරයට යන්නම්. මෙතන බොහොම ශීතලයි. දන්නවද වැඩක්, හෙට අපි කොන්වාන්ස්කි ගමේ කොල්ලන්ට බැට දෙන්ට යනවා. නුඹත් එනවද?"

"හොඳයි, එන්නම්!"

නිකීතා නිවසට විත්, "හිස රහිත අසරුවා" නමැති කතාව* කියැවීමට වාඩි විය.

වටකුරු මේසය අසල අම්මාත්, ගුරුතුමාත් වාඩි වී පොත් කියවති. මේසය මත විශාල පහන දල්වේ. කාමරයට උණුසුම ගෙනදෙන ලිප තුළ දර කෝටු 'පට පට' යන හඬක් නගමින් ගිනි ගෙන දැවෙයි. යාබද කාමරයේ පොළව යටින් හඬක් ඇසිණි.

හිස රහිත අසරුවා ප්‍රේරී* තණබිම ඔස්සේ දිවෙයි. උසැති තණ පඳුරු සුළඟට සැලෙයි. රතු පාට හඳහාමි විලට ඉහළින් පායා ඇත. තමාගේ හිස මුදුනේ ඇති හිසකේ සැලෙන සැටියක් නිකීතාට දැනිණි. ඔහු ප්‍රවේසමින් හැරී බැලීය. කළු පැහැති කවුළුවලට එහා කිසියම් අළු පැහැති සෙවණැල්ලකි. සත්තකටම ඇත්ත, නිකීතාට එය පෙනුණි.

---

* හිස රහිත අසරුවා - ඉංග්‍රීසි ලේඛක මයින් රීඩ් (1818-1883) ගේ ත්‍රාසජනක නවකතාවෙකි.

* ප්‍රේරි - උතුරු ඇමෙරිකාවේ ස්ටෙප්ස් මහා භූමිය මෙනමින් හැඳින්වේ.

අම්මා පොත කියවීම නවත්වා හිස ඔසවා කතා කළාය.

"හුළං පාර සැරයි. රෑ වෙන විට මහා හිම කුණාටුවක් ඇති වේවි" .

## සිහිනය

තිකීතා සිහිනයක් දුටුවේය. ඔහු එම සිහිනය කිහිප වරක්ම දැක ඇත.

මහ ගෙදර සාලයට ඇතුළුවන දොර තිහඬව විවෘත විය. සාලයේ ලී පොළොව මත ජනේලවලින් වැටී ඇති සඳ එළිය ලා නිල් පැහැතිය. කළු පැහැති කවුළුවලට එහා හඳ විශාල ගෝලාකාර බෝලයක් මෙනි. තිකීතා කාඩ් සෙල්ලම් කිරීමට පාවිච්චි කරන ලොම්බෙර් මේසය උඩ නැංගේ තිහඬවය. එම මේසය තබා ඇත්තේ කවුළු දෙකක් අතර වූ බිත්තිය අසලය. ඔහු සාලය දෙස බලන්නට විය.

රට හුණු මෙන් සුදු පැහැති බිත්තිය අසල දිගැති කම්බියකින් එල්ලී පැද්දෙන බට්ටෙක් සහිත ඔර්ලෝසුවකි. එය සඳ එළියට දිලිසෙයි ඔර්ලෝසුවට ඉහළින් බිත්තියේ රාමුවක පින්තූරයෙකි. එහි දුම්කොළ පයිප්පයක් අතින් ගත් මහල්ලෙකි. ඔහු අසලින් මැහැල්ලෙකි. ඈ කුඩා හිස්වැස්මක් හිසලා ගෙන සලුවක් පොරොවාගෙන සිටී. ඇගේ දෙතොල් එකට තදින් ගැටී වැසිලාය. ඔර්ලෝසුව තිබෙන තැන සිට මුල්ල දක්වා ඇඳි සහිත පුටු සතරෙකි. ඒවා තීරු වැටිච්ච රෙදිවලින් සරසලාය. මුල්ලේ බකල ගැසුණු සෝපාවෙකි. ඒවා මුහුණු සහ ඇස් නැති මිනිසුන් මෙන් සිටී. සඳ එළියට හසු වී ඇති ඒවා සෙලවෙන්නේවත් නැත.

සෝපාවට සහ වෙල්වට් කවරයට යටින් බළලෙක් පිටතට ආවේය. ඌ සෝපාවට පැන්නේය. කළු පැහැති ඌ දිගය. වලිගය පහත නමාගෙන ඌ පුටුවෙන් පුටුවට පැන ඒවායේ ඇඳිවලට යටින් රිංගුවේය. අන්තිම පුටුවට ගොස් ලීයෙන් කළ බිමට පැන්නේය. කවුළුවලට පිටු පා බළලා ඔර්ලෝසුවට මූණ ලා බිම හිඳ ගත්තේය. ඔර්ලෝසු බට්ටා ඒ මේ අතට පැද්දෙයි. මහල්ලාත් මැහැලියත් බළලා දෙස බලති. ඔන්න එවිට බළලා එක අතකින් ඔර්ලෝසුවේ දිගැති කවරය අල්ලා ගෙන අතින් අතින්

බට්ටා ඇල්ලීමට තැත් කළේය. ඔර්ලෝසු පෙට්ටි කවරය වසන වීදුරුවක් නැත..... ඔන්න දැන්, දැන් බළලා ඔර්ලෝසු බට්ටා අල්ලා ගනු ඇත.

ඕඃ දැන් ඉතින් කෑ ගසන්නට ඇත්නම්! එහෙත් නිකීතාට ඇඟිල්ලක්වත් හොළවන්ට බැරිය, සෙළවිය නොහැකිය, බියජනකය, බියජනකය, දැන් දැන් විනාශයක් වනු ඇති.....

සඳ එළිය හරි හතරැස් කොටුවක් සේ කාමරයේ පොළවට වැටී ඇත. හැම දෙයක්ම නිහඬය. සිදුවන්නේ මොනවාදැයි බලා සිටී. බළලා දිග ඇදී, දෙකන් සොළවා, ඔර්ලෝසු බට්ටා ඇල්ලීමට යයි. බළලාගේ අත වැදුණු හැටියේම ඔර්ලෝසු බට්ටා නවතින බව නිකීතා දනී. අන්න එවිට හඬ නංවා පුපුරා හැම දෙයක්ම කඩා හැළෙනු ඇත. ඒවා දූලිවලට පත් වී හැම දෙයක්ම අතුරුදහන් වනු ඇත. එවිට සාලයත් සඳ එළියත් නැති වෙයි.

බොහෝ සේ බියවූ නිකීතාට දැනෙන්නේ ඔහුගේ හිස තුළට කා වැදුණු වීදුරු කටු හඬ නගන සැටියෙකි. ඇඟ කිලි පොලා යන හැටි ඔහුට දැනෙයි. නිකීතා තමාට ඇති සියලු ශක්තිය ගොනු කැර ගෙන හඬ නගා කෑගසමින් පොළවට පැන්නේය. පොළව පහළට කිඳාබසින සැටියක් ඔහුට දැනිණි. නිකීතාට ඇස් ඇරුණේ ඔහු පොළවට වැටුණු පසුවය. තද ශීතලට හසුවුණු කවුළු දෙකත්, ඊට එහා ඇති හඳත් ඔහුට පෙනේ. හඳ වෙනදාට වඩා විශාලය, අපූරුය. ඔහුගේ ඇඳ අසල පෝච්චියකි. හිම සපත්තු ආදිය ඇඳ ළඟ ඒ මේ අත දමලාය.

"දෙවියන් වහන්සේට කීර්තිය අත්වේවා! අනේ දෙවියනි!" නිකීතා හතිකට කුරුසියේ ලකුණ හැඳගෙන කොට්ටය හිසට උඩින් දමා ගත්තේය. ඒ කොට්ටය මුදුය, උණුසුම්ය, එය පුරා අපූරු සිහින ඇත.

නිකීතා දෙනෙත් වසාගත් විගස නැවත ඔහුට අර පැරණි සිහිනය ම පෙනෙන්නට විය. පැරණි සාලය හඳ එළියට හසු වී බබළයි. ඔර්ලෝසුවේ බට්ටා වැනෙයි. බිත්තියේ එල්ලා ඇති පින්තූරයේ මහල්ලා සහ මැහැල්ල රවා බලති. ඔන්න ආයෙමත් සෝපාව යටින් අර බළලා හිස එළියට දමයි. එහෙත් ඒ වන විට නිකීතා අත දිග හැර මේසය තල්ලු කොටැ මේසය උඩට පැන්නේය. දැන් ඔහු දෙපා තබමින් ඉක්මණට ගමන්

කරයි. ඔහු එක්කෝ ඉගිලෙනවා විය යුතුයි. නැතිනම් පොළොවට ඉහළින් පියාසර කරනවා විය යුතුයි.


කාමරය තුළ හීනෙන් පියාසර කිරීම බොහොම ලොකු සතුටක්. දෙපා බිමට වැදෙන්ට යන විට නිකිතා අත් දෙක දිගහැරලා වැනුවා, එවිට ඔහුට ඉහළට ගිහිල්ලා බිත්තිය දිගේ පියාඹන්නට වුණා. සීලිමට ළඟින්ම ඇති මුදුන් කඩ ලී ස්තරයේ අළු පැහැති දූලි තිබ්ණි. එයින් නැවුම් පුසුඹක් වහනය වුණා. ඊට පස්සේ ඔහුගේ නෙත ගැටුණේ බිත්තියේ පැල්ලමකටයි. එය රුසියන් සිතියමේ වොල්ගා නදියට සමාන රූ සටහනක් මවා පෑවා. බිත්තියට කාවැදුණු බොහොම පරණ ඇණයක් සහ එය ඇඳුණු පරණ ලණු පොටක් නිකිතා දුටුවා. එහි මළ මැස්සන්ගේ සළකුණු තිබුණා.

නිකිතා එක් පයකින් බිත්තිය තල්ලු කරලා කමරය හරහා ඔර්ලෝසුව තිබෙන තැනට පියාඹා ගියා. ඔර්ලෝසු තුඩුවේ ඉහළ පියන මත ලෝකඩ මල් බඳුනක් තිබුණා. ඒ මල් බඳුනේ පතුලෙහි ඇති දෙය නිසි ලෙස බලන්නට බැහැ. ඔන්න එතකොට කවුදෝ ඔහුගේ කනට කොඳුරා මෙහෙම කියුවා: "නිකිතා පියාඹා ගිහිල්ලා පතුලේ තිබෙන දේ ගන්න."

නිකිතා බඳුන පතුලට අත දැම්මා විතරයි අර ඉස්සෙල්ලා හීනෙන් විස්තර කරපු පින්තූරයේ හිටිය නපුරු ආච්චි ඇගේ කෙට්ටු අත දිගු කරලා නිකිතාගේ කෙස් වැටියෙන් අල්ලා ගත්තා. නිකිතා බොහොම අමාරුවෙන් ආච්චිගේ ග්‍රහණයෙන් මිදුණු හැටියේම පිටුපස පින්තූරයේ ඉන්න සීයා එයාගෙ දුම්කොළ පයිප්පයෙන් නිකිතාගේ පිටි කොන්දට පහරක් ගැහැව්වා. නිකිතා 'ඩොග්' ගාලා බිම වැටුණු හැටියේම එයාගෙ ඇස් දෙක ඇරුණා.

කාමරයේ කවුළු හිම තුෂාරයට අසුවෙලාය. කවුළු අතරින් හිරු රැස් කාමරය තුළට වැදී ඇත්තේ ඇඳ වූ සෙවණැලි මෙනි. ඇඳ ළඟ අර්කාදියි ඉවානව්ච් ගුරුතුමා හිටගෙන නිකිතා උරහිසකින් අල්වා සොළවන්නට විය.

"නිකිතා, නැගිටින්න, වේලාව උදේ නවයයි."



නිකීතා දෙනෙත් පිහදාගෙන ඇඳ මත වාඩි වී සිටී. ගුරුතුමා ඔහු දෙස බලා ඉහිමරා දැත් පිරිමැද්දේය.

"නිකීතා අද සිට පාඩම් කිරීම නවත්වලා ගුරුතුමා පැවසීය.

"ඒ මො-කද?"

"මොක වුණත් කමක් නැහැ. ඔයාට සුමාන දෙකක් හැම තැනම ගිහිල්ලා සෙල්ලම් කළ හැකියි. නැගිටිනවා!"

නිකීතා නැගිට, ඇඳ ළඟ ළමා නැටුමක් නැටුවේය.

"නත්තල් නිවාඩු!"

අද සිට සති දෙකක වාසනාවත් නිවාඩුවක් පටන් ගන්නා බව ඔහුට අමතක විය. ගුරුතුමා ඉදිරියේ නටන නිකීතා තවත් දෙයක් අමතක කළා. එනම් ඔහු දුටු සිහිනයත්, ලෝකඩ බඳුනත්, "පතුලේ තිබෙන දේ ගන්නැ"යි කනට කොඳුරා කී සැටිත් ඔහුට අමතක විය.

## පැරණි නිවස

දවස් දහහතරක නත්තල් නිවාඩු. ඕනෑ දෙයක් කළ හැකියි. නොකළ හැකියි. වැඩක් නැති නිසා කාන්සියක් ඇති වුණා. උදේ තේ බොන විට ඔහු බටර් සහ ජෑම් ගාලා පාන් පෙති පහක්ම කාලා කිරි තේ බිව්වා. බොහොම බඩ පිරුණු නිසා නිහඬව විවේක ගත්තා. තේ හදන සමවාරය කණ්නාඩියක් වගේ දිලිසෙනවා. නිකීතාට එයාගෙ මුහුණ සමවාරයෙන් පෙනිණි. සමවාරයේ හැඩය අනුව එය දිගට දිගේ විකෘති වුණු මුහුණකි. ඔහු තේ බිව් පසුව කල්පනා කිරීමට පටන් ගත්තේය. හැන්දක් අරගෙන උඩ කොටස කැඩුවොත්, එය පුංචි ඔරුවකට සමාන වේ. අනික් කොටස මොනවා හරි භාරන්නට කටුවක් ලෙස පාවිච්චි කළ හැකියි.

අවසානයේ දී අම්මා මෙසේ පැවසුවා: "දැන් ඉතින් නිකීතා ගිහින් ඇවිදින්න." ඔහු කලබල නොවී, හිම කබා, හිම තොප්පි, හිම සපත්තු ඇඳ ගෙන කොරිඩෝරය දිගේ ගියේය. ඔහු යන ගමන් කටුමැටි

ගාපු බිත්තිය දිගේ ඇඟිල්ලකින් ඉරක් ඇඳගෙන යාමට අමතක කළේ නැත. බිත්තියට එහා හිම කාලයට ගිනි තැපීමට ගිනි උඳුන් තියෙන නිසා උණුසුමක් දැනේ. කොරිඩෝරයට වම් පසින්, ශීත කාලයට පාවිච්චියට ගන්නා, මිනිසුන් වාසය කරන, උඳුන් සහිත කාමර තිබේ. දකුණට ගිම්හාන කාලයට පාවිච්චි කරන කාමර පහකි. ඒවා බාගෙට හිස්වෙලාය. ඒ කාමර මැද සාලයකි. මෙහි සතියකට වරක් තපින ගිනි උඳුන් ඇත. රෙදි පටි ඔතා ආරක්ෂා කළ පළිඟු වීදුරු සහිත පහනකි. සාලයේ ලී පොළව මත ඇපල් ගෙඩි ගොඩකි. මේ ඇපල් ගෙඩිවලින් වහනය වන මිහිරි පුසුඹ ගිම්හාන කාලයේ දී පාවිච්චියට ගන්නා කාමරවලින් පැතිර යයි.

නිකීතා අමාරුවෙන්, ඕක් ලීයෙන් සාදන ලද දෙපළු දොර හැරියේය. ඔහු දෙපයේ ඇඟිලි තුඩුවලින් ගිම්හාන කමරවලට ගියේය. එහි ඇති අඩක් වටකුරු කවුළුවලින් හිම පිරි ගෙවත්ත පෙනෙයි. කොළ හැලුණු ගස්වල අතු හිම තට්ටුවලින් වැසිලාය. බැල්කනියට නගින පිය ගැට පෙළ අවට සිරේන් පඳුරුය. ඒවා හිම කැටිවල බර නිසා නැමී තිබිණි. බැද්දේ හාවන්ගේ පා සටහන්ය. කවුළුව අසල වූ ගස් අත්තෙක කපුටෙක් සිටී. උගේ හිස විශාලය, කළු පාටය. ඌ යකෙකුට සමාන යැයි නිකීතාට සිතේ. නිකීතා කවුළු වීදුරුවට ඇඟිලි තුඩින් තට්ටු කළේය. කපුටා 'කාක්-කාක්' ගාමින් අත් තටු වනා ඉගිලී යත්ම, අත්ත වසා තිබුණු හිම කැටි බිම වැටිණි.

කාමර පෙළේ අන්තිම කාමරයට නිකීතා ගියේය. මෙහි දූලිවලින් වැසුණු පොත් අල්මාරි කීපයකි. ඒවායේ වීදුරු දොරවලට එහා ඇති පොත්වල කවර දිලිසේ. හම් බැම්මෙන් බඳින ලද පොත් පැරණිය. සතියකට වරක් මොළවන ලිපට ඉහළින් ඉතා ලස්සන ගැහැණියකගේ පින්තූරයෙකි. ඈ කළු පැහැති වෙල්වට් ඇඳුමක් ඇඳ අත් වැසුම් පැළඳ සිටියාය. එක් අතක දිග හරින ලද කසයකි. ඈ මුහුණ හරවා නිකීතා දෙස කපටි බැල්මක් හෙළන සැටියෙකි. ඇගේ දෙනෙත් දිගුය.

නිකීතා සෝපාව මත වාඩි වී, නිකට දැත් මත තබාගෙන ගැහැණියගේ රූපය සහිත පින්තූරය නරඹන්නට විය. ඇය දෙස බොහෝ වේලාවක් බලාගෙන සිටීමට ඔහුට පුළුවන. ඇය නිසා නිකීතාගේ මී මුත්තාට විශාල විපතක් සිදු වූ බව අම්මා කියන සැටි ඔහු අසා ඇත.

අවාසනාවන්ත මී මුත්තාගේ පින්තූරය ද පොත් අල්මාරියට උඩින් එල්ලා ඇත. ඔහු කෙට්ටුය, ගිරා හොටක් වැනි නහයක් ඔහුට ඇත. ඔහුගේ දෙනෙත් අඩවන් වෙලාය. මුදු සහිත ඇඟිලිවලින් යුත් ඔහු අතකින් කබාය අල්ලා ගෙන සිටී. පසෙක අඩක් හැකිළුනු පැපිරියුස් කඩදාසියක් සහ පිහාටු පෑනකි. ඔහු අවාසනාවත් මහල්ලෙකු බව ඔහු දෙස බලන ඕනෑම කෙනෙකුට පෙනෙයි.

මී මුත්තා දහවල් කාලයෙහි සාමාන්‍යයෙන් නිදාගන්නා අතර රාත්‍රී කාලයෙහි පොත් කියැවීමට සහ ලිවීමට පුරුදුව සිටි බව අම්මා කියනු නිකීතා අසා ඇත. ඔහු ඇවිදීමට ගියේ ඇඳිරි වැටෙන විට පමණකි. රට මුරකාරයින් ලී කෝටු එකිනෙක ගාටා හඬ නංවමින් ගෙය වටේ ගියේ ජනේල අසලට එන බස්සන්, බකමූණන් සහ වවුලන් වැනි සතුන් පන්නා දැමීමටය. උන්ට මී මුත්තා බය නොවීමටයි, මුරකරුවන් මෙසේ කළේ. ඒ කාලයේ දී ගෙවත්තේ උසට වැඩුණු තණ පඳුරු තිබුණු බව කියති. මේ කාමරය හැර ගෙදර අනික් කොටස් පාළු වී තිබිණි. ගෙදර මෙහෙකරුවෝ සියලු දෙන පැන ගියහ. මී මුත්තාගේ තත්ත්වය ඉතා කණගාටුදායක විය.

දවසක් දා ඔහු අතුරුදහන් වුණා. ගෙදරත් ගෙවත්ත වටේත් සෙව්වා, කිසිවකුට සොයා ගැනීමට නොහැකි විය. ඔහු නැත්තටම නැති විය. අවුරුදු පහකට පසුව ඔහුගේ බූදලය අයිති විය යුත්තාට ලියුමක් ලැබිණි. "බුද්ධිමත් වයසේ දී සන්සුන්තාවය සෙව්වා. සොබාදහම තුළින් සතුට සොයා ගත්තා" යැයි එම ලියුමේ ලියා තිබිණි.

මී මුත්තාගේ සියලු විපත්වලට හේතුව මේ පින්තූරයේ ඉන්න කාන්තාවය. නිකීතා ඇය දෙස බැලුවේ කුතුහලයෙන් සහ කැළඹීමෙනි.

කපුටා නැවත ගහේ අත්ත මත වසා හිස වනා 'කාක්-කාක්' කියා හඬ නැඟීය. අත්ත වසා තිබූ හිම කැට වැටිණි. නිකීතාට බියක් ඇති විය. ඔහු පාළු කාමරවලින් එළියට විත්, ගෙවත්තට දිව ගියේය.

## ළිඳ ළඟ

ගෙවත්ත මැද ළිඳකි. එය වටේ ඇති හිම කඳ පැහැතිය. සමහර

හිම කැට අයිස් බවට පත් වී ඇති අතර ඒවා පයට පෑගිලාය. මිෂ්කා කෝර්යෂොනක් ලිං පඩිය මත වාඩි වී, ඔහුගේ අත් වැස්මේ තුඩ වතුරට දැමීය. ඔහුගේ අත් වැසුම් හමින් සාදා ඇත.

එසේ කරන්නේ මන්දැයි නිකීතා ඔහුගෙන් ඇසීය. මිෂ්කා මෙසේ පිළිතුරු දුන්නේය.

"කොන්චාන්ස්කි ගමේ කොල්ලෝ උන්ගේ අත් වැසුම් තෙමනවා. මීට පස්සේ අපිත් එහෙම කරනවා. ඒවා සීතල වී ගල් වුණාට පස්සේ ගහ ගන්ට ලෙහෙසියි. අල්ලපු ගමට යන්ට ඔයත් එනවද?"

"කීයටද යන්නේ?"

"දවල් කෑමට පස්සේ යමු. අම්මාට කිසි දෙයක් කියන්න එපා." මිෂ්කා කීවේය.

"ඇවිදින්ට යන්න අවසර දුන්නේ අම්මා. ගහගන්ට යන්ට එපයි කිව්වා." නිකීතා පැවසීය.

"ගහගන්ට අවසර නැතිද? උන් ඔයාට ගැහැව්වොත්? ඔයාට ගහන්නේ කවුද දන්නවද ස්ත්යෝප්කා කර්නඋෂ්කින්. ඌ ගැහැව්වොත් වැඩේ ඉවරයි."

"ස්ත්යෝප්කා ගැන මම බලාගන්නම්. එයාට මම ගහන්නෙ සුළැඟිල්ලෙන්." මෙසේ කී නිකීතා තම සුළැඟිල්ල මිෂ්කාට පෙන්වීය.

මිෂ්කා ඇඟිල්ල දෙස බලා අහකට කෙළ ගසා බැරෑඩි හඬකින් කතා කළේය.

"ස්ත්යෝප්කාගේ අතට මන්තර ජප කරල තියෙනවා. ගිය සුමානේ එයා තාත්තාත් එක්ක ලුනුයි, මාලුයි ගේන්න උත්යෝව්කා ගමට ගියා. එහෙදි තමා එයාගේ අතට ජප කරල තියෙන්නෙ.

ඇස් දෙක පල්ල බොරු නොවෙයි."

නිකීතා කල්පනා කළේය. ගමට නොගිහින් ඉන්න එක නම් වඩාත් හොඳයි. නමුත් මිෂ්කා කියාවි මා බය ගුල්ලෙක් කියලා.

"අතට ජප කරන්නේ කොහොමද?" නිකීතා ඇසීය.

මිෂ්කා නැවතත් කෙළ පිඩක් ගසා මෙසේ කීවේය.

"බොහොම ලෙහෙසි වැඩක්. ලිපේ අළු අත්වල දවටා ගෙන තුන්වරක් මෙහෙම කියන්ට ඕන. 'ඕං රීන් කට්ටු කට්ටු, සතුරන් කරන්නට මට්ටු. දෙන්නකො මට යකඩ අතක්, සතුරට එය වානෙ කඳක්...' ඔන්න ඔච්චරයි."

නිකීතා මිෂ්කා දෙස බැලුවේ ලොකු ගෞරවයකිනි. ඒ වේලාවේ දී ගෙවත්තේ දොර හැරී එළු බැටළු රංචුවක් කඩා වැදිණි. උන්ගේ කුර හිම සහ අයිස්වලින් වැසී ඇති පොළවට වැදී හඬ පිට විය. උහු වලිග වැනූහ. ළිඳ අසල ඇති වතුර පිරී බක්කිය වසා තිබුණු තුනී අයිස් තට්ටු හොම්බෙන් බිඳ දමා හඬ නගමින්, කහිමින් උහු වතුර බීවෝය. ළිඳ වටේට උන් රංචු ගැසිණි. කිලිටි දිග ලොම් සහිත බැටළුවෙක් කුඩා ඇස්වලින් මිෂ්කා දෙස බලා කුර පොළවේ ගැසීය. මිෂ්කා ඌ දෙස බලා මෙසේ කීවේය. "කාලකණ්ණියා!" බැටළුවා මිෂ්කා පසුපස ලුහුබඳින්නට විය. එවිට ඔහු කුඩා ලිං ගැට්ටට ඉහළින් පැන්නේය.

නිකීතා සහ මිෂ්කා සිනහ වෙමින් සහ බැටළුවා කුලප්පු කැරැවමින් ගෙවත්තට දිව්වෝය. බැටළුවා ඔවුන් ලුහුබැඳ ගොස් නැවතී හඬ නැඟීය.

"නුඹලා කා-ලකණ්නි-යෝ, බැහැ-බැහැ-බැ-හැ." බැටළුවන් එසේ කියන ලෙස හැඟිණි.

එළිපත්තේ සිට නිකීතාට කෙනෙක් අඬ ගැසුවේ දවල් ආහාරය සඳහාය. එවිට මිෂ්කා ඔහුට මෙසේ පැවසීය.

"බලාගෙන, රවටන්ට එපා, අපි අද අල්ලපු ගමට යනවා."

## සටන

නිකීතා සහ මිෂ්කා ගෙවත්ත හරහා පොකුණ අසලින් වැටී ඇති කෙටි මග ඔස්සේ ගමට ගියෝය. අයිස් තට්ටුවකින් වැසී ගිය පොකුණ උඩ මිෂ්කා විනාඩියක් නැවතුණේය. ඔහු තම සාක්කුවෙන් කුඩා පිහියක් සහ ගිනිපෙට්ටියක් ගෙන, නාසයෙන් හුස්ම ඉහළට ඇද හඬක් පිට කොටැ, සුදු පැහැති බෝලයක් පෙනෙන තැන වසා තිබෙන අයිස් තට්ටුව බිඳින්නට විය. මේ බෝලයට කොල්ලන් කියන්නේ "කොෂ්කා" කියාය. පොකුණේ මඩ ගොහොරුවල සිට ගෑස් වායුව ඉහලට විත්, අයිස් තට්ටුවට යටින් ගෝලාකාර ලෙස ගුලි ගැසෙන්නේ තද ශීතට හසුවන බැවිණි. මිෂ්කා බිඳ ගත් අයිස් තට්ටුවේ සිදුරට දල් වූ ගිනි කූරක් තැබූ විගස ගෑස් වායුවට ගිනි ඇවිලී නිහඬ ගිනි සිළුවක් මතු විය.

"නිකීතා මේ ගැන කාටවත් කියන්න එපා. අපි ලබන සුමානෙ පහළ පොකුණට යනවා, එහි තියෙනවා මහා විශාල 'කොෂ්කා' ගුලියක්. ඒකට ගිනි තිබ්බම මුළු දවස තිස්සෙම ගිනි ඇවිලේවි."

පොකුණ මත මිදී තිබෙන අයිස් තට්ටුවට උඩින් දුවගිය මේ දෙදෙනා ගම මායිමේ ඇති කහ පැහැති පඳුරු සහිත බිම හරහා ගමට වැදුණෝය.

මෙවර ශීත සමයේ දී වෙනදාට වඩා වැඩියෙන් හිම වැටිණි. ගෙවතු වඩා ඇති වැටවල් නිසා ගෙවතුවලට එතරම් විශාල ගොඩක් හිම නොවැටුණ ද, ගෙවල් අතර ඇති අතු පාරවල හිම උසට ගොඩ ගැසිණි. සමහර තැන්වල මේ හිම ගොඩැලි ගෙවල පියස්සට වඩා උසින් වැඩි විය.

ඉඩම් නැති, දිළිඳු තනිකඩ ගොවි දාසයකුවන සවෝස්කාගේ ගෙපැල සම්පූර්ණයෙන්ම වැසී යන තරමට හිම ගොඩ ගැසී තිබිණි. ඔහුගේ ගෙපැල වහලේ ඇති දුම් බටය පමණක් පෙනුණේය. ගම්මු එකතු වී දවස් තුනකට පෙර මෝඩ සවෝස්කාගේ ගෙපැල වසා තිබූ හිම තට්ටුව ඉවත් කළ බවත්, ඒ මෝඩ මිනිහා ගෙතුළට වී මස් නැතිව ගෝවා සුප් උණු කොටැ බීලා, ලිප් මැස්සට වී නිදාගත් අතර, ගම්මු ඔහුගේ ගෙපැල ගොඩගත් විට, හීතලට ගුලි ගැසී නිදා සිටි මෝඩ සවෝස්කා

අවදි කළ බවත් මිෂ්කා විස්තර කළේය. ඔහුගේ මෝඩකම නිසා ගොවියන් ඔහුගේ කෙස් වැටියෙන් ඇද්ද සැටි ද ඔහු කීවේය.

ගම සන්සුන්ය, පාලුය. ඉදහිට ගෙයක දුම් බටයෙන් දුම් ගුළි පිට විය. හිමෙන් වැසී ඇති පාළු සමතලා බිමෙහි ඈත පිදුරු ගොඩට එහා හිම තුෂාරයට වැසී ඇති හිරු මලානික ලෙස පෙනෙයි. තිකීතා සහ මිෂ්කා මුළු ගමේම චණ්ඩියා ලෙස ප්‍රසිද්ධ අර්තමෝන් තුරින්ගේ ගෙය ළඟට ආවෝය. බොහෝ සවි ශක්තිය ඇති, නිතර කෝපවන මේ මිනිහාට මුළු ගමම බිය විය. ඔහු ලී හැන්දකින් කැඳ බොන සැටි තිකීතා දුටුවේ කවුළුවෙනි. ඔහුගේ යටි රැවුළ රතු පැහැතිය, එය කොස්සක් මෙනි. අනික් කවුළුවේ වීදුරුවට බොහෝ ළං වී කොල්ලෝ තිදෙනෙක් පිටත බලාගෙන වුන්හ. ඒ අර්තමොන්ගේ පුතුන්ය. ස්යෝම්කා, ලියෝන්කා සහ පුංචි අර්තමොෂ්කාය. මිෂ්කා ගෙය අසලට විත් සිවුරු හඩ ලෑවේය. අර්තමොන් ගොවිරාළ කැඳ බොන ගමන් හැරී බලා, ලී හැන්ද පෙන්වා මිෂ්කාට තර්ජනය කළේය. අනික් කවුළුව අසල සිටි කොල්ලෝ තිදෙන සැනෙකින් එළිපත්තට ආවෝය. ඔවුහු තම අඩ හිම කබා වටා බඳ පටි හැඳගත්හ.

"අනේ බං නුඹලා හරියට කෙල්ලන් වගේයි, මොකද ගෙදරට වෙලා බයවුණාද?" මෙසේ ඇසූ මිෂ්කා හිම තොප්පියෙන් දෙකන් වසාගත්තේය.

"අපි කාටවත් බය නැහැ" මුහුණේ ලප ඇති ස්යෝම්කා පැවසීය.

"තාත්තා කීවා, වාලෙන්කි හිම සපත්තු නාස්ති කරන්ට එපයි කියලා" ල්යොන්කා කීවේය.

"මම අද අල්ලපු ගමට ගියා. ඒ ගමේ කොල්ලො අපට අරියාදු කරන්නේ නැහැ." පුංචි අර්තමොෂ්කා කට දැම්මේය.

මිෂ්කා තවත් වරක් තොප්පිය පහතට ඇද ගෙන හඬක් පිට කොටැ තීරණාත්මක ලෙස කතා කළේය.

"අපි යමු උන් කුලප්පු කරන්ට. අපේ හැටි උන්ට පෙන්නමු."

ලප සහිත මුහුණු ඇති කොල්ලෝ තුන් දෙනා "අපි යමු"යි කීවෝය. කොළු රළ මහ හරහා ඇති හිම ගොඩැල්ල මත නැග ගත්හ. අර්තමොන්ගේ ගෙට එහා ඇති මායිමෙන් අල්ලපු ගම පටන් ගැනෙයි.

ඒ ගමේ කොල්ලන් පිරී ඇතැයි නිකීතා කල්පනා කළ ද, ඔවුහු එහි නොසිටියෝය. ලොකු සලුවලින් හිසත් බෙල්ලත් ඔතා ගත් කොල්ලෝ දෙදෙනෙක් හිම ගොඩක් උඩට නැග හිම යානා මත වාඩි වී පහළට රූටා යන්ට වූහ. ඔවුහු හිම යානා මත වාඩි වී, දණ හිස දක්වා උසැති වාලෙන්කි නැමැති හිම සපත්තු සහිත පාද පෙරට දමා ගෙන, යානාවල ලනු පට අතින් ගෙන, හිම ගොඩෙන් පහළට ලිස්සා ගබඩා කාමරය අසලින් හිම පිරි පාරටත්, එතැනින් ගඟේ දළ බෑවුම දක්වාත් ලිස්සා ගියෝය.

මිෂ්කාත්, ඔහුට පසුපසින් අර්තමොන්ගේ පුත්තු තිදෙනාත් නිකීතාත් හිම ගොඩැල්ලකට නැගී කෑගසන්නට වූහ.

"කොන්වාන්ස්කි ගමේ කොල්ලනි!"

"අපි තොපට යස පාඩමක් උගන්වමු!"

"තුඹලා හැංගිලාද? බයවෙලාද?"

"එළියට වරෙව්! අපි තොපට බැට දෙමු!"

"කොල්ලනි, වරෙව් එළියට මම තොප තනිවම පරාද කරන්නම්" යැයි වහසි බස් දෙඩූ මිෂ්කා හිම අත් වැසුම් සහිත අත්වලින් හඬ පිට කළේය.

එහා පැත්තේ හිම ගොඩැල්ලේ සිටි කොන්වාන්ස්කි ගමේ කොල්ලෝ සතර දෙනෙක් පෙනී සිටියෝය. ඔවුන් හැඳ සිටි හම කබාවලට තට්ටු කැරැමින්, හිම තොප්පි හරිගස්සා ගනිමින් ඔවුහු ද කෑ ගැසූහ.

"අපි තොපට බොහොම බයයි!"

"හොඳටම බයවෙලා!"

"ගෙම්බෝ ඇවිත් බක-බක ගානවෝ!" මේ පැත්තේ හිම ගොඩැල්ලට තවත් සගයෝ එකතු වූහ. අලෝෂ්කා, නීල්, කළු කන් ඇති වාන්කා, දිළිඳු මෝඩ ගොවියාගේ බෑණා වන පෙත්රූෂ්කා ද පැමිණියහ. ඔවුන් අතර තවත් බට්ටිච්චෙක් තරම් පුංචි කොල්ලෙක් ලේන්සුවෙන් හිසත් බෙල්ලත් වසා ඔතා ගෙන සිටී. ඒ වනවිට විරුද්ධ පැත්තේ පිහිටි හිම ගොඩැල්ල මත තවත් කොල්ලන් පස් හය දෙනෙකු සිටිනු දක්නා ලදී.

"මුහුණුවල ලප ඇති කොල්ලනි, මෙහෙ වරෙව්. අපි තොපේ ලපයි, හමයි ගළවමු!" කොන්වාන්ස්කි ගමේ කොල්ලෝ කෑ ගැසූහ.

"යකඩ තලන වපරයිනි! තොපි මීයන්ට ලාඩම් ගැහැව්වා නේද?" මේ පැත්තේ සිට මිෂ්කා බෙරිහන් දුන්නේය.

"ගෙම්බෝ, ගෙම්බෝ, ගෙඹි පැටව්!"

දැන් දෙපැත්තේම කොල්ලන්ගේ ගණන හතළිහක් පමණ වී ඇත. දෙපැත්තම පොර කෑමට ඉදිරිපත් නොවූයේ බය වූ බැවිනි. හිම ගුළි කොටැ දමා ගැසුව ද පොර කෑමක් නොවීය. එක් පැත්තක කොල්ලන් "ගෙම්බෝ!" යැයි කෑගසන විට අනික් පැත්තේ කොල්ලෝ, "යකඩ තලන වපරයෝ!" යැයි බෙරිහන් දුන්හ. හිටි හැටියේම කොන්වාන්ස්කි ගමේ කොල්ලන් අතරින් මිටි, පළල් උරහිස් සහ පැතලි නහයක් ඇති කොල්ලෙක් නැගිට සිටියේය. ඔහු තම සගයින් ඈත් මෑත් කොටැ හිම ගොඩැල්ලෙන් පහළට බැස අවුත්, වැදගත්කමක් පාමින් කෑ ගැසීය.

"ගෙඹි පැටව්නි, එක එකා වරෙව්!"

ඒ තමා සුප්‍රසිද්ධ ස්ත්‍යෝප්කා කර්නැළුෂ්කින්. ඔහුගේ අතට ජප කැරැ තිබෙන බව මිෂ්කා තිකීතාට කියා ඇත.

ප්‍රීතියට පත් කොන්වාන්ස්කි ගමේ කොල්ලෝ හිම තොප්පි

උඩට වීසිකොට කන් බිහිරිවන සේ සිවුරු හඬලමින් ප්‍රීති වූහ. අනික් පැත්තේ කොල්ලෝ නිහඬ වූහ. නිකීතා පසුපස හැරී බැලීය. අර්තමොන්ගේ කොල්ලන් තිදෙන රවා ගෙන සිටින සැටි පෙනිණි. අලෝෂා සහ වාන්කා පසු බැස්සාහ. පුංචි කොල්ලෝ දෙනෙත් මහත් කැරගෙන ස්ත්යෝප්කා දෙස බැලීය පුංචි එකා අඬන්ට සූදානම්වන සැටියෙකි. මිෂ්කා බඳ පටිය තද කැරගෙන මුමුණන්නට විය.

"අපි ගහල තියෙනවා ඔයිට වැඩිය ලොකු චණ්ඩියන්ට, නොදුටු දෙයකි. පටන් ගන්ට මට වුවමනාවක් නෑ. මට කේන්ති ගියොත් මම ඕකට දෙනව, උගේ හිම තොප්පිය යාර දෙකක් උඩ යන්ට."

තමා සමග පොර කෑමට කිසිවෙක් ඉදිරිපත් නොවන බව දුටු ස්ත්යෝප්කා අත්වැස්ම වනා මෙසේ පැවසීය.


"කොල්ලනේ උන්ට ගහපියව්!"

කොන්වාන්ස්කි ගමේ කොල්ලෝ හූ හඬ නගමින් සිවුරු හඬ ලමින් හිම ගොඩැල්ලේ සිට පහළට දුවගෙන ආවෝය.

අර්තමොන් බෑයන් තිදෙන බිය වී දුවන්නට වූ අතර ඔවුන් පසුපසින් මිෂ්කා, වාන්කා සහ අනිත් ළමයි ද දුවන්නට වූහ. නිකීතාත් දිව්වේය. ලේන්සුව පොරවා ගෙන සිටි පුංචි කොල්ලා හිම මත වාඩි වී බෙරිහන් දුන්නේය.

ළමයි අර්තමොන්ලාගේ ගෙවත්ත ළඟින් දුව ගොස් හිම ගොඩට නැංගාහ. නිකීතා වටපිට බැලීය. අලෝෂා, නීල් සහ තවත් කොල්ලෝ පස් දෙනෙක් එක්කෝ බිම වැටුණහ, නැතිනම් බිම වැතිර ගත්හ. ඔවුන් එසේ කළේ බිය වූ බැවිනි. බිම වැටී සිටින අයට නොගැසීම සිරිතකි.

නිකීතාගේ සිතෙහි අමනාපයක් සහ ලජ්ජාවක් ඇති වූයෙන් ඔහුට ඇඬීමට සිත් විණි. බිය වූ නිසා පහර දීමට ගියේ නැත. නිකීතා නැවතී මිට මොළවා ගත්තේය. එවිටම වාගේ ස්ත්යෝප්කා බැටළු හමින් කළ හිම තොප්පියත් හැඳ ගෙන වේගයෙන් දුවන සැටි නිකීතා දුටුවේය. ස්ත්යෝප්කාගේ නහය පැතලිය, කට විශාලය. නිකීතා හිස පහත් කැරගෙන හැකි තරම් වේගයෙන් ඉදිරියට ගොස්, ස්ත්යෝප්කාගේ



පපුවට පහරක් ගැසීය. ස්ත්යෝප්කාගේ හිස වැනිණි, ඔහු හිම ගොඩේ ඉන්දවුණි. ඔහුගේ හිම තොප්පිය බිම වැටිණි.

"අපොයි ඇති!" ඔහු කීවේය.

කොන්වාන්ස්කි ගමේ කොල්ලෝ නැවතුණාහ. නිකීතා ඉදිරියට යත්ම, කොල්ලෝ පසු බැස්සාහ. එවිට නිකීතාටත් වඩා ඉදිරියට දිවගිය ඔහුගේ සගයෝ "අපි දිනනවා!" යන හඬ නංවමින් කොන්වාන්ස්කි ගමේ කොල්ලන් මත කඩා පැන්නාහ. ඔවුන් ගෙවල් පහකින් පමණ පසු බැස ගිය පසු නිකීතාගේ සගයෝ ලුහුබැඳීම නවත්වා ආපසු ආවෝය.

නිකීතා කැළඹිලාය. ඔහුට උණුසුමක් දනේ. තවත් කාට පහර දිය යුතු දැයි සිතමින් ඔහු වට පිට බැලීය. ඔහුට අඬ ගැසීය. ගබඩාව පිටුපසට වී සිටියේ ස්ත්යෝප්කාය. නිකීතා ඔහු ළඟට ගියේය. ස්ත්යෝප්කා යටැසින් නිකීතා දෙස බලා කතා කළේය.

"නුඹ මට සැර පහරක් ගැහැව්වා. අපි යාළු වෙමුද?"

"සත්තකින්ම කැමතියි" නිකීතා හනිකට පැවසීය.

දෙදෙනම ඔවුනොවුන්ගේ මුහුණ දෙස බලා මඳ සිනා පෑවෝය.

"මොනව හරි මාරු කරගනිමු."

"මම කැමතියි"

ස්ත්යෝප්කාට තෑගි දිය යුතු හොඳම දේ මොකක් දැයි කල්පනා කළ නිකීතා තමා සතු තල හතරක් සහිත පිහියක් තෑගි කළේය. ස්ත්යෝප්කා තම සාක්කුවේ තිබූ ඊයම්වලින් සාදන ලද කලාකිරිංඤයක් නිකීතාට තෑගි කරමින් මෙසේ කීවේය.

"මෙන්න නැති කරගන්ට එපා. වටිනා දෙයක්."

## නීරස සැන්දෑව අවසන් වූ හැටි

"නිවා" නැමැති සඟරාවේ පළ වී තිබෙන පින්තූර බැලීමට නිකීතා සවස් කාලය ගත කළේය. පින්තූරවලට පහළින් ලියා ඇති විස්තර ඔහු කියැවීය. පින්තූර ඔහුගේ සිත් නොගත්තේය. එක් පින්තූරයක් මෙසේය: වැලමිට දක්වා කෙටි අත් සහිත ගවොමක් ඇඟ ලා ගත් කාන්තාවකි. ඇගේ උරහිසක සහ පාදය අසල පරෙවියන්ය. ගෙයි වැටට එහා තුවක්කුවක් උරෙහි එල්ලාගත් මිනිහෙක් දත් විරිත්තයි.

මේ පින්තූරයේ තේරුම් ගත නොහැකි දෙය නම් එය ඇඳපු හේතුවය. එයට යටින් ඇති විස්තරයෙන් මෙසේ කියැවෙයි:

"මිනිසාගේ සැබෑ මිතුරන් වන පරෙවියන් ඔබ දැක නැතිද? (ඊළඟට පරෙවියන් ගැන ඇති විස්තරය නිකීතා කියැවූයේ නැත.) පරෙවියන්ට උදෑසන කෑම දීමට ආශා නොකරන්නේ කවුද? කුසලතාවයෙන් හෙබි ජර්මන් චිත්‍ර ශිල්පී හාන්ස් වුර්ස්ට් එවැනි අවස්ථාවක් චිත්‍රයට නගා ඇත. පූජකතුමාගේ දියණිය - තරුණ එල්සා දුටු පරෙවියෝ ඇය වෙත පැමිණෙති. ඔන්න බලන්න එක් පරෙවියෙක් ඇගේ උරහිසක් මත සිටී. තවත් පරෙවියෙක් ඇගේ අතෙහි තිබෙන වී ඇට අහුලාගෙන කයි. අල්ලපු ගෙදර තරුණ දඩයක්කාරයා හොරෙන් ඇය දෙස බලා ප්‍රීතිවෙයි." නිකීතා මෙලෙස සිතන්නට විය. පින්තූරයෙන් පෙනෙන එල්සා පරෙවියන්ට කෑම දීලා, තවත් කෑම දීලා එතැනින් පසු එයාට කිරීමට වෙනත් වැඩක් නැතුව යාවි. එවිට එයාට මහ ලොකු වෙහෙසක් දනේවි. ඇගේ තාත්තා පූජකතුමා කාමරය තුළ පුටුවෙක වාඩි වී කරන්ට දෙයක් නැති නිසා ඈනුම් අරිනවා වෙන්ට ඕන. අල්ලපු ගෙදර තරුණයා දත් විරිත්තන්නේ එයාගේ බඩ රිදෙන නිසා විය යුතුයි. ඉතින් ඔය තරුණයා පාර දිගේ යන ගමන් දත් විරිත්තනවා. ඇත්තටම එයාගෙ තුවක්කුවෙන් වෙඩි තියන්ට බැහැ. ඒ පින්තූරයේ අහස අළු පාටයි, හිරු එළියත් අළු පාටයි.

නිකීතා පැන්සලක් ගෙන පූජකයාගේ දුවගේ නාසය පහළින් රැවුළක් ඇන්දේය.

ඊළඟ පින්තූරය බුසුලුක් නගරයේ දර්ශනයෙකි: හැතැප්ම

කණුවක් සහ කැඩුණු රෝදයක් පෙනේ. ඇත ගෙවල්ය. දේවස්ථානයෙකි. වැසි වසී, අහසේ වලාකුළු පාවෙයි.


තිකීතා ඇනුමක් හැර "නීවා" සහරාව වසා දැමීය. ඔහු නිහඬව සවන් දෙන්නට විය.

ඉහළ අට්ටාලයේ කිසිවකුගේ සිවුරුහන් බැමක හඬක් ඇසෙයි. දෙතොල් උල් කැරගෙන 'ඌඌඌ' යන හඬක් නගන සැටියෙකි. ඔන්න ඉන් පසුව, ඒ හඬ සෙමින් නහයෙන් අඬන ශබ්දයක් දක්වා වෙනස් විය. ඊටත් පස්සේ ආයෙමත් දෙතොල් උල් කැරගෙන හඬන හබ්දයට සමාන හඬක් ඇසිණි.

වටකුරු මේසයට ඉහළින් සුදු පැහැති ගොලෝවක් සහිත ලාම්පුව දැල්වේ. කොරිඩෝරය දිගේ යමෙක් ගාටමින් යන හඬ ඇසිණි. ලිප මොලවන්නා විය යුතුය. ලාම්පු කවරයේ පළිඟු කැට යම්තමින් හඬ නැඟීය.

අම්මා හිස නමාගෙන පොතක් කියවයි. ඇගේ හිසකේ අළු පැහැතිය. දෙකන්වලට ඉහළින් හිසකේ රැළි ගැසිලාය. එක් කනකට ඉහළින් ඇති උපත් ලපය බාර්ලි ඇටයක් වගේය. ඉඳහිට අම්මා ගොතන කටුවේ ආධාරයෙන් පොතේ පිටු වෙන් කැර ගනියි. ඒ පොතේ පිට කවරය ගඩොල් පාටය. තාත්තාගේ පොත් අල්මාරියේ මෙවැනි පොත් බොහොමයක් ඇත. ඒවායේ නම "යුරෝපා පුවත්"ය. වැඩිහිටි ඇත්තන් නීරස පොත්වලට කැමති වීම මවිත කරවන දෙයකැයි නිකීතාට හැඟේ. මේවගේ පොත් කියවීම ගඩොල් උරච්චි කරන්නාක් වැනි දෙයකි.

අම්මාගේ දණහිස් මත හීලෑ ඉත්තෑ පැටියා නිදාගෙන සිටියි. උගේ නම අහීල්කා. උගේ නාසය පැතැලිය, ඌ කුඩා පාද වකුටු කැරගෙන නිදයි. ගෙදර මිනිසුන් නිදාගන්ට ගිය පසු ඉත්තෑ පැටියා ගෙදර කාමර ගානේ, අහු මුළු ගානේ යන්ට පටන් ගනී. දවල් කාලයේ දී නිදා ගන්නා අහීල්කා රෑට කුඩා පාදවලින් තට්ටු කරන්ටයි, 'කුරු-කුරු' ගාන්ටයි පටන් ගනී. හැම මුල්ලකටම ගොස් ඉව අල්ලයි. මී ගුළ ළඟට වෙලා මුර කරයි.



ලිප මොලවන්නා කුඩා යකඩ දොර හඬ නංවයි. ලිපේ දර කෝටු සහ අඟුරු කැට එහා මෙහා කරන සැටි ඇසේ. කාමරය තුළ උණුසුම්ය, බිත්ති බදාමයෙන් සුවඳක් වහනය වෙයි. බිම සේදූ විට ඇතිවන සුවඳකුත් එයට මුසු වී ඇත. පාලු ගතියක් දනුණ ද, පහසුවක් ඇත. අට්ටාලයේ සිට පැතිරෙන හඬ දැන් 'යූඋ-යූඋ-යූ' දක්වා වෙනස් වී ඇත.

"අම්මේ, සිවුරු හඬවන්නේ කවුද?" නිකීතා ඇසීය.

අම්මා පොත කියවන ගමන් ම ඇහි බැම් ඔසවා නිකීතා දෙස බැලුවාය. කොපි පොතකට රූල් ගසමින් සිටි ගුරුතුමා, නිකීතාට වැරදෙන තුරු බලා සිටියාක් මෙන්, හනිකට මෙසේ කීවේය:

"සිවුරු හඬලන්නේ කවුද කියල අහන්ට ඕන."

අට්ටාලයේ සිට 'බූඋ-ඌ-ඌ' හඬ දිගටම ඇසේ.

අම්මා ඒ හඬට සවන් දී දෙවුර සොළවා, දෙවුර වසා ඇති සලුව හරිගස්වා ගත්තාය. තින්දෙත් අවදි වුණු ඉත්තෑ පැටියා කේන්ති වුණු විටෙක මෙන් නහයෙන් හඬ නැගීය.

නිකීතා කල්පනා කරන්නට විය: අඳුරු අට්ටාලයේ කවාටයට හිම වැටිලාය. අට්ටාලයේ විශාල බාල්ක අතරට වී පරෙවියෝ සිටිති. අට්ටාලයේ පරණ පුටුය, කැඩිච්ච මේස කැලි සහ සෝපාය. දුම්බටය ළඟ ඇති කැඩිච්ච පුටුවක් උඩ 'සුළඟ' වාඩි වී සිටින සැටි ඔහුට දනේ. දූලි සහිත මකුළු දැල්වල එතී සිටින කඩමාල්ලකු හැටියටය, සුළඟ නිකීතාගේ සිතෙහි ඇඳී තිබෙන්නේ. ඉතින් ඔය සුළඟ කෑගහනවා, දෙතොල් උල් කැරගෙන, "මට පාලුයි" කියලා කෑගහනවා. රාත්‍රිය දීර්ඝය. අට්ටාලයේ දැඩි ශීතලකි. සුළඟ වාඩි වී සිටින හුදකලා ප්‍රාණියකු ලෙස නිකීතාට හැඟිණි.

නිකීතා පුටුවෙන් බැස අම්මා ළඟට වී වාඩි විය. අම්මා මිහිරි සිනාවක් පා ඔහුගේ හිස අත ගා, සිපගත්තාය.

"පුතාට නිදාගන්නට වේලාවයි, නේද?"

"අනේ අම්මේ, තව පැය බාගයක් ඉන්නම්කෝ."

නිකීතා තමාගේ හිස අම්මාගේ උරහිස මත තැබීය. කාමරයේ කෙළවර දොර හඬ නංවමින් ගෙදර ඇති කරන බළලා ආවේය. උගේ නම වාස්කාය. උගේ වලිගය උඩට නමා ඇත. ඌ සන්සුන්ය. ඌ කටහැර යමිතමින් ඇසෙන සේ 'ඤාව්' ගෑවේය. ගුරුතුමා රුල් ගසන ගමන් ම මෙසේ ඇසීය:

"වාස්කා බළල්රාළ මොකද?"

වාස්කා අම්මා ළඟට විත්, උගේ කොළ පැහැති කපටි ඇස්වලින් ඇය දෙස බලා හඬ නගා 'ඤාව්' ගෑවේය. ඉත්තෑ පැටියා ආයෙමත් ගෙරවීය. වාස්කා කිසියම් දෙයක් දන්නා බවත්, ඒ ගැන දැන්වීමට මව් වෙතට ආ බවත් නිකීතාට හැඟිණි.

අට්ටාලයට වැදෙන සුළං පහර බියකරු හඬක් නංවයි. ඒ අතර කවුළුවලට එපිටින් හිම පෑගෙන විට ඇතිවන ක්‍රික් හඬක් ඇසිණි. කවුදෝ කතා කරන හඬක් ද ඇසෙන්නට විය. අම්මා හනිකට නැගිට්ටාය. ඇගේ දණහිස් මත නිදා සිටි ඉත්තෑ පැටියා ගුළි වී බිමට වැටිණි.

ගුරුතුමා නැගිට ජනේලය අසලට ගොස් බලා මෙසේ පැවසීය:

"ඇවිල්ලා!"

"අනේ දෙවියනි! ඒ ආන්නා අපොලෝසොව්නා ද? මේ තරම් සැර හිම කුණාටුවක් තියෙද්දී..."

විනාඩි කීපයකට පසුව, කොරිඩෝරයට පැමිණි නිකීතා ලොම් රෙදි ඔතා වසා ඇති මහගෙදර ලොකු දොර අමාරුවෙන් විවෘත වූ සැටි දුටුවේය. හිම තුෂාරය සහිත වාෂ්ප සමග සුළං පහරක් ගෙතුළට වදිත්ම, හිම කබා දෙකක් පොරවාගෙන වුලන් තුවායකින් හිස ඔතා ගත්, උසැති

තරබාරු කාන්තාවක් ගෙතුළට ආවාය. ඇගේ හිම කබාය හිම කැටවලින් පිරී තිබිණි. ඈ පිරිමි ළමයකු අතින් අල්ලා ගෙන සිටියාය. ඒ ළමයා ඇඟලා සිටියේ අළු පාටැති හිම කබායකි. එහි බොත්තම් දිලිසිණි. ඔහුගේ හිස බෂ්ලික් තොප්පියකින් වැසිලාය. ඔවුන්ට පිටුපසින් වාලෙන්කි නැමැති හිම සපත්තු හප්පා ගෙතුළට අවේ ගල්කරුවාය. ඔහුගේ යටි රැවුලේ සහ උඩු රැවුලේ හිම කැට අයිස් බවට පත් වී ඇත. සුදු පාටැති ඔහුගේ ඇහි බැම් දිගට වැවී තිබිණි. ඔහු දැතින් වඩා ගෙන ආ ගැනු ළමයා බැටළු සමින් කළ හිම කබායක් හැඳ සිටි අතර ඇය වටා තවත් වුලන් තුවායක් ඔතා තිබිණි. රියකරුවාගේ උරතලය මත හිස තබා ගෙන ගැනු ළමයා නිදා සිටියාය. ඇගේ දෙනෙත් වැසී තිබුණ ද, මුහුණ මුදුය, දිලිසෙන සුලුය.

ගෙතුළට ආ උසැති කාන්තාව බැරෑඩි හඩෙකින් මෙසේ කීවාය:

"අලෙක්සාන්ද්‍රා ලියොන්තියෙව්නා, අමුත්තන්ව පිළිගන්න!"දැත් ඔසවා ඉස බැඳි තුවාය ලිහන්නට වූවාය. "ළඟට එන්ට එපා. ඔයාට ශීතල දනේවි. අපොයි ඔය ගොල්ලන්ගේ ගමේ පාරවල් නම් බොහොම සවුත්තුයි.... ගේ ළඟටම ඇවිල්ලා පදුරක පැටලුණා."

ඒ මගේ මවුතුමියගේ යෙහෙළියක වූ ආන්නා අපොලෝසොව්නා බාබ්කිනාය. ඈ පදිංචිවැ සිටින්නේ සමාරා නගරයේය. ඇගේ පුතා වික්තර් බෂ්ලික් තොප්පිය හිසෙන් ගළවනතුරු සිටි අතර යටැසින් නිකීතා දෙස බැලීය. මගේ මවුතුමිය නිදා සිටි ගැනු ළමයා රියැකරුගෙන් ගෙනැ ඇය ඔතා තිබුණු වුලන් සලුව ඉවත් කළාය. එවිට ඇගේ එන් පැහැති හිසකේ විහිදිණි. අම්මා ඒ ගැනු ළමයාව සිපගත්තාය.

"ලීලව්කා ගෙදර ඇවිත්"

ගැනු ළමයා සුසුම් ලා නෙත් හැර බැලුවාය. ඒවා විශාලය, නිල් පැහැතිය. නැවත වරක් සුසුම් ලා නිදන්නට වූවාය.

## වික්තර් සහ ලීලයා

නිකීතා සහ වික්තර් එදින රයෙහි නිකීතාගේ කාමරයෙහි නිදාගත්හ. පසු දින අවදි වූ ඔව්හු ඉක්බිතිව ඇඳන්වල වාඩි වී එකිනෙකා දෙස යටැසින් බලන්නට වූහ.

"මට ඔයා මතකයි" නිකීතා කීවේය. "මටත් ඔයාව හොඳට මතකයි. ඔයා අපේ ගෙදරට - සමාරාවට ආවා. එක දවසක් ඔයා තාරා මසුයි ඇපලුයි කාපු නිසා ඔයාට උස්මුරුත්තෙ හැදුණා. ඉතින් ඔයාට එඬරු තෙල් දුන්නා." එසේ කීවේ වික්තර්ය.

"මට නම් එහෙම දෙයක් මතක නැහැ."

"මට නම් මතකයි" වික්තර් පැවසීය.

කොල්ලෝ දෙදෙනා ඉන් නිහඬ වූහ. වික්තර් බොරුවට ඇනුම් හැරියේය. නිකීතා කතා කළේ නොසැලකිල්ලකිනි:

"මගේ ගුරුතුමා අර්කාදියි ඉවානොවිච් බොහොම සැරකාරයෙක්. එයා මා හෙම්බත් වනතුරු මට උගන්වලා. එයාට ඕනෑම පොතක් පැය බාගයකින් කියවීමට පුළුවන්"

වික්තර් බොරු සිනාවක් පෑවේය:

"මම විද්‍යාලෙ දෙවැනි පංතියෙ ඉගෙන ගන්නෙ. අපේ විද්‍යාලෙ බොහොම සැරයි. මට දවල්ට කෑම දෙන්නේම නැහැ."

"ඒක එතරම් දෙයක් නොවේ" නිකීතා පැවසුවේය.

"එහෙම කියන්ට එපා. ඒ වුණත් මට දවස් එක් දාහක් නොකා ඉන්ට පුළුවනි."

"අනේ පව්! ඔයා අත්හදල බැලුවද?"

"නැහැ. තවම අත්හදල බැලුවේ නැහැ. අම්මා ඒකට ඉඩ දෙන්නේ නැහැ."

නිකීතා ඇනුම් හැර දිග ඇදුණේය.

"ඔයා දන්නවද දවස් තුනකට උඩදි මම ස්ත්යොප්කා කර්නැළ්කින් පරාද කළා."

"ඒ ස්ත්යොප්කා කර්නැළ්කින් කවුද?" වික්තර් ඇසීය.

"ලොකුම ගණන්කාරයා. මම ඌට එක පාරයි ගැහුවෙ ඌ බිම වැටුණා. පසුව මම එයාට පිහිතල හතරක් තියන පිහියක් තෑගි කළා. එයා මට ර්යම් කලාකිරිංඥ්ඤයක් තෑගි කළා. පස්සෙ මම ඒක ඔයාට පෙන්වන්නම්."

නිකීතා මෙසේ පවසා ඇඳෙන් නැගිට හෙමින් ඇඳුම් ඇඳ ගත්තේය.

"මට එක අතකින් මකාරව්ගේ ශබ්ද කෝෂය උස්සන්ට පුළුවනි"යි වික්තර් කීවේ බලාපොරොත්තු රහිත හඬකිනි. ඔහු පල්ලම් බසින සැටි දනටමත් පැහැදිලි විය. ලිප ළඟට පැමිණි නිකීතා එය අතින් අල්ලන්නේ නැතිව එහි පඩිය මත එක පිම්මට පැන්නේය. ඉන් පසුව ඔහු දණහිස් අඩක් නවා බිමට පැන්නේ තනි කකුලෙනි.

"ඔන්න ඔය විදිහට ඉක්මණින් ඉහළට පැනලා දෙපා වැනුවොත් ඉගිලෙන්ට පුළුවනි"යි වික්තර්ගේ දෙනෙත් දෙස ඕනෑකමින් බැලූ නිකීතා පැවසීය.

"අපොයි ඒක සුළු දෙයක්, අපේ පංතියෙ ඉගෙන ගන්න බොහෝ දෙනෙක් ම ඉගිළෙනවා."

මේ දන් පුළුස්සන ලද අලුත් පාන් සහ බනිස්වල පුසුඹ වහනය වන ආහාර ගන්නා කාමරයට ඔවුහු දෙදෙන ගියහ. එහි මේසය මත අති විශාල සමවාරයෙකි, ඉන් පිටවන දුම් සීලිම දක්වා ඉහළ නගී. වාෂ්ප

බින්දු කාමරයේ කවුළුවල පවා දක්නට තිබිණි. උදේ ආහාරය ගැනීමට අම්මාත්, ගුරුතුමාත්, වික්තර්ගේ නංගීවන අවුරුදු නවයක් පමණ වයසැති ලීලයාත් ඇවිත් සිටියෝය. අල්ලපු කාමරයේ අන්නා අපොලෝසොවිනාගේ බැරඩි කට හඩ ඇසෙයි: "මට තුවායක් දෙන්න."

ලීලයා සුදු පාට ගවොමක් ඇඳ නිල් පැහැති පීත්ත පටියක් බඳ වටා බැඳ සිටියාය. එය පිටුපසින් මලක් සේ ගැට ගසලාය. දෙවැනි පීත්ත පටියකින් ඇගේ රන්වන් හිසකේ බැඳ තිබුණේ සමනළයකුගේ හැඩය ඇති ගැටයකිනි. එයත් නිල් පාටයි.

නිකීතා ඇය ළඟට ගොස්, ලජ්ජාවෙන් රතු පැහැගත් මුහුණක් ඇතිව කකුලක් අද්දන්ට විය. ලීලයා පුටුවේ වාඩි වී ගෙනම හැරී අතක් දිගු කොටැ බැරරුම් ලෙස මෙසේ කීවාය:

"ආයුබෝවන් ළමයා!"

ඈ එසේ කියන විට ඇගේ කටේ උඩු තොල පමණක් උස් වී පහත් විය.

ඇය හැබෑ ගැනු ළමයකු නොවන බවකි, නිකීතාට සිතුණේ. ඈ ඉතා ලස්සනය. ඇගේ දෙනෙත් නිල් පැහැති පීත්ත පටිවලටත් වඩා නිල් පාටය, දීප්තිමත්ය. ඇගේ ඇහි බැමි සේද මෙනි. ලීලයා ඔහුට ආචාර කළ පසු, ඔහු දෙස තවත් නොබලා ලොකු තේ කෝප්පයක් දැතින් ගෙන මුහුණ පහත් කැර ගෙන තේ බොන්නට වූවාය. කොල්ලෝ දෙදෙන ළං ළංව වාඩි වූහ. වික්තර් පුංචි ළමයකු සේ තේ කෝප්පය අල්ලා ගෙන කුදු ගැසී තේ බොන්නේ කට උල් කැරගෙනය. ඔහු පළමුව තේ පෝප්පයට සීනි කැට ගොඩක් දැමීය. සීනි නිසා තේ උකු වූ පසු වතුර වත්කරන ලෙස ඔහු ඉල්ලා සිටියේය. නිකීතාගේ දණ හිසින් තල්ලු කළ ඔහු මෙසේ ඇසීය.

"ඔයා මගේ නංගිට ආසද?"

නිකීතා කතා නොකළ ද ඔහුගේ මුහුණ රතු විය.

"ඔයා නංගි ගැන පරිස්සම් වෙන්න. එයා හැම තිස්සෙ ම අම්මට

දුක් ගැනවිලි කියනවා." වික්තර් රහසක් මෙන් පැවසීය.

ලීල්‍යා තේ බී අවසාන වී, කට පිස දමා ගෙන සන්සුන් ලෙස පුටුවෙන් බැස නිකීතාගේ මව් වෙතට ගොස් ආචාරශීලී ලෙස මෙසේ පැවසුවාය:

"සාෂා නැන්දේ බොහොම ස්තුතියි."

පසුව ඈ කවුළුව අසල තිබුණු උසැති දුඹුරු පාට ඇඳි පුටුවට නැග ඉඳිකටු සහ නූල් සහිත කුඩා පෙට්ටියක් ගෙන මහන්නට පටන් ගත්තාය. දැන් නිකීතාට සමනළයෙකු බඳු ඇගේ පීත්ත පටියත් රන්වන් කෙස් කැරළි දෙකත්, පෙනෙයි. ලීල්‍යා යම්තමින් දිව දිගු කැර ගෙන මහන්නේ, හරියට එය මැහීමට උදව් වන්නාක් මෙනි.

නිකීතාගේ හිස අවුල් විය. ඇඳි පුටුවට උඩින් පනින සැටි ඔහු වික්තර්ට විස්තර කළ ද, ලීල්‍යා හැරී නොබැලුවාය. එවිට නිකීතාගේ අම්මා කොල්ලන් දෙදෙනා අමතා, "ඔය දෙන්න ගෙවත්තට ගිහිල්ලා කෑ ගහන්ට!" යැයි කීවාය.

කොල්ලෝ දෙදෙන හිම කබා පැළඳගෙන ගෙවත්තට ගියෝය. එදින හිම සීතල එතරම් සැර නොවීය. දවස තරමක් අඳුරුය. රතු පාට හිරු තට්ටු තට්ටුවලට පෙළ ගැසී තිබුණු වලාකුළු හිම පිරි කුඹුරක් සිහියට නැංවීය. ගෙවත්තේ කොළ හැළුණු රෝසමල් පඳුරු මත කුඩා පිනි බිඳු විය. හිම මත වැටී ඇති මඳ එළිය අපැහැදිලිය. ගෙවත්තේ අපූරු නිහඬතාවකි. කුස්සියේ කළු එළිපත්ත අසල සිටි ෂරොක් සහ කතොක් නැමැති බල්ලෝ දෙදෙන එකිනෙකාට හැප්පෙන තරම් ළං වී, උනුන් දෙස බලාගෙන ගොරවන්නට වූහ. මේ විදිහට උන් දෙදෙනාට දත් විරිත්තමින් බොහෝ වේලාවක් ගෙරවීමට පුළුවන. ගෙදර මෙහෙකරුවෙක් උන් ළඟින් යන විට, උන් දෙසට අත් වැසුමක් වීසි කළොත්, උන් කහිමින් කොතරම් බිහිසුණු ලෙස පොර කති ද යත්, උන්ගේ මයිල් පවා හැළිණි. පිට බල්ලන්ට උහු බිය වූ අතර හිඟන්නන්ට වෛර කළහ. රෑට මුරකරනවා වෙනුවට අස් රිය තබන කාමරයට වැද නිදාගත්හ.

"දැන් ඉතින් අපි මොනවා කරමුද?" වික්තර් ඇසීය.

තිරිඟු පාගන ස්ථානයේ සිට කැහැටු කපුටෙක් අසතුටු ලෙස හරක් මඩුව දෙසට පියාඹයි. නිකීතා ඌ දෙස බැලීය. ඔහුට සෙල්ලම් කිරීමට සිතක් නැත. ඔහු කණගාටු වෙන්නේ කුමක් නිසා දැයි ඔහුම නොදනී. විසිත්ත කාමරයේ සෝපාවෙක වාඩි වී, පොතක් කියැවීම වඩාත් හොඳ යැයි ඔහුට සිතෙයි. එහෙත් වික්තර් කතා කළේය:

"ඔයාට කෙල්ලන් එක්ක සෙල්ලම් කිරීමට හිතිල තියෙන බව මට පේනවා."

"ඒ මොකද?" නිකීතා ප්‍රශ්න කරත්ම ඔහුගේ කම්මුල් රතු විය.

"මොකදැයි කියන එක නිකීතාම හොඳට දන්නවා."

"වික්තර් නිකම් ඇහේ එල්ලෙන්ට එනවා. ඔය කතා මම දන්නේ නැහැ. අපි ළිඳ ළඟට යමු."

කොල්ලෝ දෙදෙන ළිඳ ළඟට ගියහ. ගව පට්ටියේ ගේට්ටුව හැර, එහි සිට වතුර බීමට හරකුන් එන සැටි පෙනිණි. ඈත සිට මිෂ්කා දිගැති කසයක් වනා හඬ නැගුවේ තුවක්කුවකින් වෙඩි තබන විටෙක මෙනි. ඔහු හිටි හැටියේ ම කෑගැසීය.

"බයාන්, බයාන්, - නිකීතා බේරෙන්න!"

නිකීතා හැරී බැලීය. අනිත් ගවයින්ගෙන් වෙන් වී, බයාන් නැමති හරකා කොල්ලන් දෙදෙනා වෙත වේගයෙන් දුවන්නට විය. ඌ ලාරත් අළු පැහැතිය. උගේ නළල මත දුනු මෙන් එතුණු මයිල්ය. උගේ අං කෙටිය.

බයානයා භයානක ලෙස හඬ නගමින් වලිගයෙන් බඩ දෙපැත්තට ගසා ගනිමින් දුවගෙන එයි.

නිකීතා වික්තර්ගේ අතක් අල්ලා ගනිමින්, "වික්තර්, දුවමු"යි කෑගසා කියමින් නිවෙස දෙසට දුවන්නට විය.

හරකා උඩ පනිමින් "ම්බෑ" කියමින් කොල්ලන් දෙදෙනා පසුපස ලුහුබඳියි.

වික්තර් හැරී බලා කැගසා හිම මත වැටී හිස දැතින් වසා ගත්තේය. හරකා වික්තර්ගෙන් පියවර පහකට වඩා දුර නොවීය. එවිට, නැවතුණු නිකීතා කෝපය නිසා උණුසුමට පත් වී, හිස මත ඇති තොප්පිය ගෙන හරකාගේ හොම්බට පහර පිට පහර ගසන්නට විය:

"පල යන්ට! පල යන්ට!" යැයි ඔහු කෑගැසීය. හරකා අං පහත් කැරගෙන නැවතුණේය. හතිකට දුව ගෙන ආ මිෂ්කා කසය හඩ නංවා උඩට ගැසීය. එවිට බයාන් නැමති හරකා වේදනාව නිසා කෙඳිරි ගාන හඬක් නංවා ආපසු හැරී ළිඳ ළඟට ගියේය. කැළඹීම නිසා නිකීතාගේ දෙකොල් වෙවුලන්නට විය. ඔහු හිම තොප්පිය හිස ලා ගෙන හැරී බැලීය. ගෙය අසලට පැන ගොස් සිටි වික්තර් අතක් වැනීය. එළිපත්තේ සිට තෙවැනි කවුළුව දෙස නිකීතා බැලුවේ ඉබේටමය. කවුළුවේ වීදුරුවෙන් ඔහු දෙස විමතියට පත් ඇස් දෙකක් ද, අරගේ හිසට ඉහළින් නිල් පාට පිත්ත පටියකින් බඳින ලද සමනළයකු වැනි ගැටයා ද ඔහු දුටුවේය. කවුළු පඩිය මත වාඩි වී සිටි ලීලයා නිකීතා දෙස බලා මඳ සිනා පෑවාය. ඔහු සැනෙකින් කවුළුවට පිටු පෑ අතර තවත් වරක් හෝ ඒ දෙස නොබැලුවේය. ඔහුට ප්‍රීතියක් දැනුණෙන් ඔහු වික්තර් අමතා කෑගැසීය:

"වික්තර් අපි යමු හිම ගොඩැලි උඩ සෙල්ලම් කරන්ට!"

දිවා ආහාරයට අඩ ගසන තෙක්ම, හිම ගොඩැලි මත සිට පහළට ලිස්සමින්, හඬ නගා සිනාසෙමින් "කුලප්පු වී" සෙල්ලම් කළ නිකීතා යටි සිතින් මෙසේ සිතන්නට විය:

"ආපහු ගෙදර යන කොට, ජනේලය දිහා බලන්ටද එපාද? නැහැ, ජනේලය ළඟින් ගියාට ඒ දිහා බලන්නේ නැහැ."

## නත්තල් ගහ සැරසීම

දවල් ආහාරය ගන්නා වේලාවේ දී ලීලයා දෙස නොබැලීමට නිකීතා ඉටා ගත්තේය. ඔහු ඇය දෙස බැලීමට උත්සාහ ගත්තත් එය කළ

නොහැකිය. ඔහු සහ ලීලයා අතර ඇති පුටුවේ වාඩි වී ඉන්නේ ආන්නා අපොලෝසොව්නාය. ඈ අත් රහිත කුඩා කබායක් හැඳ සිටියි. ලා රත් පැහැති වැල්වට් කබාය පපුවට සහ පිටට උණුසුමක් ලබා දෙයි. ඈ දැත් දිගහැර කොතරම් බැරැඩි හඬෙකින් හයියෙන් කතා කරන්නීද යත්, සීලිමේ ලාම්පුව වටා එල්ලා ඇති කුඩා වීදුරු කැට එකට හැප්පී යමින් හඬ නගයි.

"නැහැ. අලෙක්සාන්ද්‍රා ලියොන්තියෙව්නා, පුතා ගෙදර නවත්වාගෙන එයාට උගන්වන්න. අපොයි, දන් විද්‍යාලවල කොතරම් නරක වැඩ කෙරෙනවද කියල කීවොත්, එහි අධ්‍යක්ෂකයා මගේම දෑතින් එළියට ඇදලා දාන්ට හිතෙනවා..."යි ඕ බැරැඩි හඬින් කීවාය. හිටිහැටියේම ආන්නා මැතිණිය තම පුතා දෙස බලා "වික්තර්"යැයි කෑගසා, "ලොකු මිනිසුන් ගැන අම්මා කියන දේ පුතා ගණන් ගන්ට එපා. ලොකු අයට, ලොක්කන්ට ගරු කරන්ට ඕන. අලෙක්සාන්ද්‍රා ලියොන්තියෙව්නා බලන්න අපේ ගුරුවරුන් ගැන. ස්වර්ගයේ වැඩ සිටින දෙවියනි, උන් හරිම පල් මෝඩයෝ. එකෙක් අනිකාට වැඩිය මෝඩයි. භූගෝල සාත්තරය උගන්වන අතර ගුරුවරයා, වික්තර්, එයාගෙ නම මොකක්ද?"යි ඕ ඇසුවාය.

"සිනීව්කින්"

"ඔව්, එක්කෝ එයාගෙ නම සිනීව්කින් නැතිනම් සින්යාව්කින්. ඉතින් ඔය ගුරුවරයා කොතරම් මෝඩදැයි කියනවා නම්, දවසක් දා ගෙදරක සාදයකට ගිහිල්ලා ආපසු යන ගමන් එයාගෙ තොප්පිය කියල හිතේ තියාගෙන පෙට්ටියක් උඩ නිදාගෙන සිටි පූසෙකු අල්ලා හිස උඩ තියාගත්තා... වික්තර් පිහියයි, ගෑරුප්පුවයි අල්ලන්නෙ ඔහොමද? චව්, චව් ගාලා කන්ට එපා.... මේසයට ළං වෙයන්... ඔන්න ඉතින් අලෙක්සාන්ද්‍රා ලියොන්තියෙව්නා, මා කියන්නේ මොනවාද? අමතක වුණා. ආ-ඔව්. නත්තල් ගහ සරසන්න මම ලට්ට-ලොට්ට ගොඩක් ගෙනාවා. හෙට ළමයින්ට කියල ඒවා අලවන්නට ඕන."

"හෙට වනතුරු කල් දමන්නේ මොකටද, අද ම ඒවා අලවන්ට ඕන, නැතිනම් පමාවීමට පුළුවනි"යි අම්මා පිළිතුරු දුන්නාය.



"ඕන විදිහකට කරන්නකෝ. මම ගිහිල්ල ලියුම් ටික ලියල දාන්නම්. දවල් ආහාරය දුන්නාට ඔයාට බොහොම ස්තුතියි."

ආන්නා මැතිණිය තොල කට පිසදමාගෙන හඩ නංවා පුටුව මැත් කොටැ ලියුම් ලිවීම පිණිස ඇයට වෙන් කළ කාමරයට ගිය ද, විනාඩියක් යත්ම ඇගේ ඇඳ කොතරම් විශාල හඬක් නැගුවේද යත්, එහි දුනුවලින් පවා හඬ පිට විය. හරියට ඇඳ මත ඇතින්නියක් පෙරළුණාක් මෙනි.

ලොකු මේසය වසා තිබුණු ලේස රෙද්ද ඉවත් කරන ලදී. අම්මා කතුරු හතරක් ගෙනැවිත් මේසය උඩ තබා, පසුව පාප්ප සාදන්නට වූවාය: ගෙදර බෙහෙත් අල්මාරියෙන් පිටි බඳුනක් ගෙනැ එයින් හැන්දක් පුරා පිටි වීදුරුවකට දමා, එයට ඇල් වතුර හැඳි දෙකක් දමා ඉතා හොඳට කළවම් කරන්නට වූවාය. පිටිත් වතුරත් ඉතා හොඳින් මිශ්‍ර වූවාට පසුව, දුම් දමන සමවාරයෙන් උතුරන වතුර එයට වත් කරමින් ඉතා හොඳින් හැඳි ගාන්නට වූවාය. එවිට පිටි විනිවිද පෙනෙන ජල්ලිවලට සමාන විය. කඩදාසි ආදිය ඇලවීම සඳහා ඉතා හොඳ පාප්ප එලෙස සාදාගන්නා ලදී.

ආන්නා මැතිණිය සඳහන් කළ බෑගය නිකීතා සහ වික්තර් ගෙනාවෝය. අම්මා එහි පියන හැර, එහි ඇති විසිතුරු දෑ එළියට ගන්නට වූවාය: රන්වන් පාටැති කඩදාසි, ඉන් සමහරක් සිතිඳුය. ඉතිරි ඒවා සටහන් සහිතය. රිදී පාට, නිල්, කොළ සහ ලා රතු පාට කඩදාසි ද එහි විය. කාඩ්බෝඩ්, ඉටිපන්දම් සහිත පෙට්ටි, නත්තල් ගහ වටේ තබල ඉටි පන්දම් සඳහා විශේෂ පුංචි කණු, රන් පැහැති කුඩා මාළු සහ කුකුළෝ, වීදුරු බෝල, මේවා නූල් පටට ඇමිණිය යුතුය. රිදී පැහැති ගෙත්තම් සහිත වීදුරු බෝල, ඒවා විවිධ පාටවලින් යුක්ත විය, කුඩා වෙඩි සහිත පෙට්ටියක්, කුඩා ජනේල සහිත විවිධ පාටින් යුත් ලන්තෑරුම් සහ ලොකු තරුවක් ඇතුළු තවත් සෙල්ලම් බඩු එහි විය.

"තවත් හොඳ දේවල් මෙහි තියෙනවා. අපි දැන් ඒවා ලිහලා නොබලමු. දැන් අපි අලවන්ට තියෙන දේ අලවමු"යි පෙට්ටිය තුළට අතක් දැමූ අම්මා පැවසුවාය.

වික්තර් කඩදාසි දම්වැල් ඇලවීමට පටන් ගත්තේය. නිකීතා සීනි බෝල සහ කුඩා වොකලට් කැට සඳහා කඩදාසි කවර සෑදුවේය. අම්මා කාඩ්බෝඩ් සහ කඩදාසි අවශ්‍ය ලෙස කපාගන්නට පටන් ගත්තාය. ලීලා ආචාරශීලි ලෙස මෙසේ අවසර ඉල්ලා සිටියාය.

"සාෂා නැන්දේ, කාඩ්බෝඩ් පෙට්ටිය අලවන්ට මට අවසර දෙනවද?"

"අනේ රත්තරන් ළමයෝ, ඕන දෙයක් අලවන්න."

ළමයි වචනයකුදු නොදොඩා නොයෙකුත් කඩදාසි ඇලවීමට පටන් ගත්හ. නාසයෙන් හුස්ම ගනිමින් අතේ තැවරුණු පාප්ප ඇඳුම්වල ගා ගත්හ. ඉස්සර කාලේ දන් වගේ නත්තල් ගහ සැරසීමට සෙල්ලම් බඩු ආදිය නොමැති වූ නමුදු ඒ කාලයේ දී සියලු දෙයක්ම ගෙවල්වල අය විසින්ම කරගත් සැටි අම්මා විස්තර කළාය. ඒ කාලයේ දී එනිසා ඉතා දක්ෂ අය සිටියාහ. ඇකිලවිය හැකි පඩි පෙළ සහ පාළම් සහිත ලස්සන සෙල්ලම් මැළිගාවක් ගැන විස්තර කළ නිකීතාගේ අම්මා එම මාලිගය සියැසින් දුටු බව ද කීවාය. මාළිගය ඉදිරිපිට පොකුණක් වෙනුවට කණ්ණාඩියක් පොකුණ සැටියට සරසා එය වටේ පඳුරු සාදලා තිබිණි. ඒ පොකුණෙහි කුඩා රන් ඔරුවකට බඳින ලද හංසයෝ දෙදෙනෙක් පීනූහ.

ලීලා කතාවට සවන් දෙමින් නිහඬව තම වැඩෙහි යෙදුණාය. නිකීතා ඇය දෙස බලමින් සීනි බෝල එතීමට කඩදාසි සෑදීම නැවැත්විය. ඔහුගේ අම්මා එවේලාවේ දී පිටතට ගිය නිසා ඔහු ලීලා සමග කතා කරන්නට විය. විවිධ පාටින් යුත් කඩදාසිවලින් පුරුක් කපා එකිනෙකට ඇල වූ යාර දහයක් පමණ දිගැති දම්වැලක් සෑදූ වික්තර් ඒවා පුටු මත තැබීය.

"ඔයා මොනවද අලවන්නේ?" නිකීතා ප්‍රශ්න කළේය.

ලීලා හිස ඔසවා නොබලා මඳ සිනා පෑවාය. රන්වන් කඩදාසියෙන් තරුවක් කපා කාඩ්බෝඩ් පෙට්ටියේ නිල් පැහැති පියන මත ඇලවූවාය.

"මේ පෙට්ටියෙන් ඇති ප්‍රයෝජනය කුමක්ද?" අඩ ස්වරයෙන් නිකීතා ප්‍රශ්න කළේය.

"මේ පෙට්ටිය බෝතික්කන්ගේ අත් වැසුම්වලටයි. ඔයා පිරිමි ළමයෙක් නිසා ඔයාට ඒක තේරුම් ගන්ට බැහැ." ලීලා ඉතා බැරෑරුම් ලෙස පිළිතුරු දුන්නාය.

ඈ හිස ඔසවා ඇගේ නිල් පැහැති විශාල දෙනෙතින් ඔහු දෙස බැලීය. නිකීතාගේ මුහුණ රතු වීමට පටන් ගති. ඔහුගේ මුහුණ රතු වී, අවසානයේ දී එය දම් පැහැයට හුරු පාටක් බවට පත් විය.

"අපොයි, එයාගේ මුහුණ බොහොම රතු පාටයි. හරියට බීට්රූට් ගෙඩියක් වගෙයි," ලීලා පැවසුවාය.

ඉක්බිතිව ඈ හිස පාත් කරගෙන තම වැඩෙහි නිරත වූවාය. ඇගේ මුහුණේ එක්තරා කපටි පෙනුමක් තිබිණි. පුටුවට ඇලුණු විටෙක මෙන් නිකීතා පුටුවේ වාඩි වී සිටි අතර ඔහු කුමක් කිව යුතු දැයි නොදත්තේය. එමෙන්ම ඔහුට කාමරයෙන් පිටතට යාමට ද නොහැකි විය. ලීලා ඔහුට විහිළු කළාය. එහෙත් නිකීතා තුළ අමනාපයක් හෝ කේන්තියක් හෝ නොවීය. ඔහු ඇගේ මුහුණ දෙස බලාගත්වනම සිටියේය. හිටි හැටියේම ලීලා හිස නොඔසවා කතා කළේ, වෙනත් කට හඬකිණි. ඔවුන් දෙදෙනා අතර යම්කිසි රහසක් තිබෙන අතර දැන් ඇය එම රහස ගැන කතා කරන්නාක් මෙනි.

"ඔයා මේ කාඩ්බෝඩ් පෙට්ටියට කැමතිද?"

"ඔව් කැමතියි" නිකීතා පිළිතුරු දුන්නාය.

"මාත් එයට බොහොම කැමතියි" ලීලා කීවේ හිස වනමිනි. එවිට ඇගේ හිස බැඳි පීත්ත පටියත් කෙස් කැරළිත් සෙළවිණි.

ඇයට තවත් යමක් කියන්නට සිත් වුණ ද, එවිටම වාගේ පැමිණි වික්තර් ලීලා සහ නිකීතාට මැදින් හිස පොවා ඉක්මණින් මෙසේ පැවසීය.

"මොන පෙට්ටියක්ද, පෙට්ටිය කොහේද?... අපොයි මේක නිකම්ම නිකම් කබල් පෙට්ටියක්! මට මේ වගේ දෙවල් ඕන තරම් හදන්ට පුළුවනි."

"ඔන්න වික්තර් නොකීවයි කියන්ට එපා, සත්තකින්ම මම අම්මා ළඟට ගිහිල්ලා ඔයාට විරුද්ධ පැමිණිලි කරනවා. ඔයා මට කොළ අලවන්ට ඉඩ දෙන්නේ නැහැ" ලීලා එසේ කීවේ වෙවුලන හඬකිනි. ඉන්පසු ඈ පාප්ප සහ කඩදාසි රැගෙන මේසයේ අනික් කෙළවරට ගියාය.

වික්තර් ඇසක් අඩවන් කැර නිකීතා අමතා මෙසේ කීවේය:

"මම ඔයාට වේලාසනින් කිව්වා නේද, ඔය කෙල්ලත් එක්ක පරිස්සම් වෙන්න ඕනයි කියල. කේළම්කාරි."

රාත්‍රී ආහාර ගැනීමෙන් පසු නිකීතා නිදන්නට ඇඳට නැගී, දෙපයේ සිට හිස දක්වා පොරවා ගත් පසු බොල් හඬකින් මෙසේ ඇසීය:

"වික්තර් ඔයා නිදිද?"

"තවම නැහැ.... දන්නේ නැහැ... මොකද?"

"වික්තර් මේ අහන්න. මම ඔයාට මහා ලොකු රහසක් කියන්න ඕන... වික්තර්.... ඔයා නිදාගන්න එපා... වික්තර් මේ අහන්න..."

"ක්ර්ර්ර්" යන හඬක් නංවමින් වික්තර් නිදාගත්තේය.

## වෙනම ගැලකින් ගෙනා තෑග්ග

අරුණෝදය එළැඹෙත්ම, සිහින අස්සේ නිකීතාට ගෙයි ගිනි උදුන අසලින් නගන හඬ ඇසිණි. ඉන්පසු ඈත දොර වැසෙන ශබ්දය ද පැතිරිණි. ගිනි උදුන භාරව වැඩකරන මිනිහා දර සහ ගොම රොටි ගෙනා හඬ එය බව ඔහු වටහා ගත්තේය.

වාසනාව නිසාම නිකීතා අවදි විය. උදෑසන පැහැදිලිය, හිම තුෂාරය සහිතය. ඉතා තද ශීතල නිසා කවුළුවල වීදුරු මත කොළවල හැඩය සහිත හිම රූ සටහන් ඇඳී ඇත. වික්තර් තවමත් නිදයි. නිකීතා ඔහුට කොට්ටයෙන් දමා ගැසීය. එහෙත් වික්තර් හඬක් නගා බ්ලැන්කේට්ටුවෙන් හිස වසාගෙන නිදාගන්නට විය. වාසනාවකින් පසුවන නිකීතා ඇඳුම් ඇඟ ලා ගෙන කොහේ යා යුතු දැ?යි කල්පනා කරන්නට විය. ඔහු ගුරුතුමා වෙතට දිව ගියේය.

අර්කාදියි ඉවානවිච් නිදි ඇඳෙහි වැතිර ගෙන තිස්වරක් කියැ වූ ලියුම යළිත් වරක් කියවමින් සිටියේය. ඔහු නිකීතා දක බ්ලැන්කේට්ටුවත් සමග දෙපා ඔසවා, බ්ලැන්කේට්ටුවෙන් ඇඳට ගසා කෑගැසීය.

"බොහොම අපූරු සිද්ධියක්! ඔක්කෝටම ඉස්සෙල්ලා නිකීතා නැගිටලා!"

"ගුරුතුමනි, අද දවස කොහොමද හොඳයි නේද!"

"අනේ පුංචි පුතේ අද දවස අපූරුයි."

"ගුරුතුමනි, මම ඔබගෙන් ප්‍රශ්නයක් අහන්න කැමතියි" මෙසේ කී නිකීතා කවුළුවේ ඉහළ පඩිය අත ගාන්නට විය. "බාබ්කින් පවුලට ඔබතුමා කැමතිද?"

"නිකීතා අහන්නේ ඒ පවුලේ කා ගැනද?"

"ළමයින් ගැන"

"අ-හා එහෙමද? නිකීතාගේ අදහස අනුව මා වැඩියෙන්ම කැමති විය යුත්තේ කොයි ළමයාටද?"

ගුරුතුමා ඒ ප්‍රශ්නය ඇසුවේ සාමාන්‍ය කට හඬකින් වුව ද, ඉතා ඉක්මණිනි. ඔහු කොට්ටය මත වැළමිටි තබා ගෙන නිකීතා දෙස මඳ සිනා නොපා බැලීය. එහෙත් එම බැල්ම අධික ලෙස අවධානය පළවූවක් විය. ඔහු ද යම් කිසිවක් දන්නා හැඩයි. නිකීතා හිටි හැටියේම

ගුරුතුමාගේ කාමරයෙන් පිටතට දිවැ ගොස්, තරමක් වේලා කල්පනා කොටැ ගෙවත්තට ගියේය.

මෙහෙකරුවන් පදිංචි කාමරවලත්, ගල්වළ අසල පිහිටි නාන ගෙයිත්, හිම පිරි කුඹුරුවලට එහා පිහිටි ගම්බද ගෙවල්වලත් පියසිවලට ඉහළින් තිල් පැහැති දුම් වළා කණුවලැ හැඩයක් ගෙන තිබිණි. පසුගිය රාත්‍රියෙහි දී කොළ රහිත තුරු මත වැටී තිබෙන හිම කැටිවල ප්‍රමාණය තවත් වැඩි විය. පොකුණට එහා පිහිටි ඔසකෝර්ි හෙවත් කළු තොපොල් ගස්වල අතු හිමෙන් පිරිලාය. තිල් පැහැති අහස නිසා ඒ ගස් වඩාත් හොඳට පෙනිණි. හිම දිලිසිණි. නැවුම් හඬක් ඉන් පිටවිය. තද හිම ශීත නිසා නාස් පුඩු දැවිණි. ඇසිපිය එකිනෙකට ඇලිණි.

දුම් ගුළි පිටවන පැළ දොර අසල ෂරොක් සහ කතොක් නැමැති බල්ලෝ දෙදෙන එකිනෙකාට ගොරවති. හිම කැටි පාගමින් ගෙවත්ත හරහා නිකීතා ගමන් කළේ මීෂ්කා හමුවීමටය. ඔහු පොල්ලකුත්, තද ශීතට හසු වී ගල් ගැසී ඇති ගොම රොටි කීපයකුත් රැගෙන පොකුණේ අයිස් තලය උඩ සෙල්ලම් කිරීමට ආවේය. ඒ වේලාවේ දී ගමට දකුණින් පිහිටි පාර ඔස්සේ ගැල් පෙළක් එමින් සිටින සැටි පෙනිණි. ඒවා කුඩා ගල් වලේ සිට කන්ද නගිමින් ඉහළට ඇදෙයි. පහළ පිහිටි පොකුණේ සිට වේල්ල දක්වා ඇති මග දිගේ පෙළට ඉදිරියට ඇදෙන ඒවා සුදෝ සුදු හිම ගොඩේ කළු පැහැති ලප සේය.

අත් වැස්ම සහිත මාපට ඇඟිල්ලක් නහයට තැබූ මීෂ්කා සොටු සූරා මෙසේ පැවසීය:

"නගරයේ ඉඳලා අපේ හිම යානා සහ කරත්ත තැගි ගෙනාවා."

ගැල් පෙළ දන් වේල්ල දිගේ ගමන් කරති. දෙපස ඇති තුරු මුදුන්වල හිම ගැල්වලට ඉහළින් වූ ආරුක්කුවක් වැන්න. ගැල්වලට යට වන හිම පිටකරන හඬ පවා ඇසෙයි. කඩ ඇනවලින් නැගෙන සිහින් හඬ ද, අශ්වයින්ගේ ආශ්වාස ප්‍රශ්වාසය ද ඇසෙයි.

හැමදා මෙන්ම අදත් ගැල්වලට පෙරටුව ගමන් කළේ ජ්‍යෝෂ්ඨ මෙහෙකරුවකු වන නිකීපර්ය. ඔහුගේ ගැල ඇද ගෙන යන දුඹුරු රත්

පැහැයෙන් යුත් වෙළඹිය හඳුන්වන්නේ වෙස්ටා යන නමිනි.

මිටි පළල් උරතල සහිත මහල්ලකු වූ නිකීපර් හම යානාවක් අසලින් පා නැගීය. ඔහුගේ දණහිස දක්වා වැසුණු වාලෙන්කි නැමැති හිම සපත්තු වටා කඹ ඔතා තිබිණි. ඔහුගේ සනැති හිම කබායේ බොත්තම් පියවා නොතිබිණි. එහෙත් බැටළු ලොමින් සාදන ලද කර පටිය බෙල්ල වැසෙන සේ ඔසවා ගත් ඔහු හිම තොප්පියක් පැළඳ සිටියේය. දහදියෙන් නැහැ වී සිටි දුඹුරු පැහැති වෙස්ටා නැමැති වෙළඹිය වේගයෙන් හුස්ම ගත්තාය. නාසයෙන් පිටවන ප්‍රශ්වාසය වාෂ්ප බඳු විය. පොෂ්ඨ සේවකයා හිස හරවා ගැල් පෙළට අණ කැරැමින් කෑ ගැසීය. සෙම්ප්‍රතිශ්‍යාවෙන් පෙළෙමින් සිටි ඔහුගේ කට හඬ බැරැඩිය, ශක්තිමත්ය. ඔහු පසුපසින් එන ගැල්වලට කෑගැසීය:

"ඒයි ගබඩා කාමරවලට හරවාපියව්! මා කියන දේ අහපියව්! අන්තිමටම ගමන් කරන ගැල මහ ගෙදරට හරවාපියව්!

ඒ ගැල් පෙළට හිම යානා දහසක් අයත් විය. අශ්වයෝ ප්‍රබෝධමත් ලෙස ගමන් කළහ. අශ්ව දහදිය පුසුඹ හැම තැනම වහනය විය. කඩ ඇණවලින් 'කීස්' යන හඬක් පිටවිය. අශ්වයින් දක්කන ගැල්කරුවන්ගේ අත ඇති කස හඬ නැංවිණි.

අවසාන ගැල වේල්ල පසු කැර මහ ගෙදරට ළං විය. එහි ඇත්තේ කිනම් තෑග්ගක්ද යන්න වහාම නිකීතාට දැනගත නොහැකි විය. එය විශාලය, දිගැතිය, කොළ පැහැතිය, රතු ඉරකින් අලංකාර වී ඇත. නිකීතාගේ හදවත ගැහෙන්නට විය. හිම යානයට සහ තවත් අතිරේක යානයකට සවි කර තිබුණේ හබල් දෙකකින් පැදවිය හැකි පැතලි මූනතක් සහිත ඔරුවකි. එය ගමන අනුව ඒ-මේ අත පැද්දෙන්නට විය. ඔරුව දෙපැත්තේ කොළ පාට තීන්ත ගාන ලද හබල් දෙකකි, එමෙන්ම රුවල සඳහා තඹවන් මුදුණක් සහිත කුඹ ගසක් ද එහි විය.

රහස් ලියුමෙහි පොරොන්දු වී තිබුණු තෑග්ග තමා එය!

# නත්තල් උත්සවය

මහ ගෙදර විසිත්ත කාමරයට අති විශාල නත්තල් ගහක් ගෙනෙන ලදී. එය දැඩි හිම තුෂාරයට හසු වී තිබිණි. එය සිටුවීම සඳහා ලීයෙන් සෑදූ කතිර හැඩයට අත්තිවාරමක් පහෝම් වඩුරාළ ඇණ ගසමින් හා පොරෝවෙන් සැසිමින් බොහෝ වේලාවක් ගත කළේය. නත්තල් ගහ කොතරම් උස ද යත්, එහි මුදුන් අත්ත සීලිමේ ගෑවෙයි.

මුලදී නත්තල් ගහෙන් දැඩි ශීතක් පැතිරිණි. පසුව කාමරයේ උණුසුම නිසා ගහේ අතු කෙමෙන් ශීතලෙන් මිදී විහිදිණි. මුළු ගෙය පුරාම නත්තල් ගහේ නැවුම් ප්‍රණීත සුවඳ වහනය විය. ළමයි, තමන් විසින් සාදන ලද කඩදාසි දම්වැල් සහ අනිකුත් සැරසිලි ගෙනැවිත් ගස වටා පුටු තබා නැග එය සරසන්නට වූහ. ඔවුන් සෑදූ සැරසිලි ප්‍රමාණවත් නොවන බව ඉක්මණින්මැ හෙළි විය. නැවත වරක් සීනි බෝලවලට පාට කඩදාසි එතීමට ද රට කජුවලට රත්රන් පාට කඩදාසි එතීම සහ ක්‍රිමියාවේ ඇපල් ගෙඩි රිදී පැහැති නූල් පටවලින් ගහට එල්ලීමට ද ආදී සැරසිලි කිරීමට ළමයින්ට සිදු විය. මුළු හවස පුරාම ළමයි මෙම වැඩවල යෙදුණහ. බොහෝ සේ මහන්සි වුණු ලීල්‍යා මේසය මත තම වැළමිටි තබාගෙන හිස පහත් කැර ගෙන නිදන්නට වූවාය. ඇගේ හිසෙහි තිබුණු සමනළාකාර පීත්ත පටිය ඇකිළී, පොඩි වී ගොසිනි.

නත්තල් උත්සවයට ආසන්න කාලය එළැඹිණි. නත්තල් ගස සරසා සම්පූර්ණ කරන ලදී. එය වටා රන් පැහැති කෙඳි වැනි සිහින් නූල් ඔතා, දම්වැල්වලින් සරසා, ඉටි පන්දම් වෛවර්ණ අඩු මත තබන ලදී. මේවා සියල්ල අවසාන කළ පසු අම්මා මෙසේ පැවසුවාය:

"ළමයිනි, දැන් ඉතින් විසිත්ත කාමරයෙන් පිටතට ගිහිල්ලා සෙල්ලම් කරන්න. ඊ වනතුරු මෙහාට ඇවිත් එබී බලන්ට එපා."

එදින දිවා ආහාරය පමා වූ අතර එය ද කඩිමුඩියේ ගන්නා ලදී. ළමයි පැණි රසැති පුඩින් පමණක් කෑවෝය. ගෙදර කලබලයකින් පිරී පැවතිණි. කොල්ලෝ දෙදෙන සෑම කාමරයක් පාසා යමින් වැඩිහිටියන්ට කරදර කරමින්, නත්තල් උත්සවය ඉක්මණින් ආරම්භ වෙතිදැයි අසන්නට වූහ. නිකීතාගේ ගුරුතුමාත් උත්සවකාරී ලෙස කළු කබායක්

සහ කැඳ දමා මදින ලද සුදු කමිසයක් හැඳ ගෙන, කළ යුත්තේ කුමක්දැයි නොදන සිටියේය. ඔහු ජනේලයක් පාසා යමින් සිවුරු හඩ ලැවේය. ලීලා ඇගේ මවුගේ කාමරයට ගියාය.

එදින හිරු බැස ගියේ බොහෝ සෙමිනි. අවරදිග රෝස පැහැගෙන මීදුම් පටලයක් වැනි වළාවලින් වැසිණි. ළඟ ළඟ ඇති ගස්වල සිට වැටුණු සෙවණැලි දිගුව පිහිටියේය. අවසානයේ දී ළමයින්ට ඇඳුම්වලින් සැරසෙන ලෙස අම්මා කීවාය: නිකීතාගේ කාමරයෙහි ඔහුගේ ඇඳ මත නිල් පැහැති සිල්ක් කමිසයක් සහ වැල්වට් කලිසමක් විය. කමිස කර වටා නත්තල් ගහක් ගෙත්තම් කරලාය. කලිසමෙහි රැළි සහිත බඳ පටියක් විය. නිකීතා හැඳ පැළඳගෙන අම්මා වෙත දිවැ ගියේය. ඈ ඔහුගේ හිස පීරා කෙස් වැටිය කැරළි ගැසුවාය. ඈ ඔහුගේ දෙවුරෙන් අල්ලා ගෙන මහත් වුවමනාවෙකින් ඔහු දෙස බැලුවාය. ඉන් පසු ඈ ඔහු කැටුව විශාල කණ්නාඩිය ඉදිරිපිටට ගියාය.

කණ්නාඩිය දෙස බැලූ නිකීතා ඉතා යහපත් ළමයකු දැක පුදුමයට පත් විය. ඇත්ත වශයෙන්ම ඒ ඔහුද?

"අනේ නිකීතා මගේ පුතේ, ඔයා හැමදාම මේ වගේ ලස්සනට ඉන්නවා නම් කොච්චර අගේද"යි ඇසූ අම්මා ඔහුගේ හිස සිපගත්තාය.

නිකීතා ඇඟිලි තුඩුවලින් ගමන් කරමින් කොරිඩෝරයට පැමිණෙත්ම බොහෝ වැදගත් පෙනුමක් ආරූඪ කැරගෙන එන ලීලා ඔහුට හමු විය. ඈ සුදු පැහැති ගවොමක් හැඳ සිටියාය. එහි සාය රැළි වැටුණු එකකි. සුදු පැහැති සේද පීත්ත පටියකින් හිස සරසා තිබුණු අතර කැරළි ගැසුණු හිසකේ රොදවල් හයක් ඇගේ සිහින් උරහිස මත වැටී තිබිණි. ලීලා නිකීතා ළඟට විත් කට ඇද කරගෙන බැලුවාය.

"ඔයා සිතුවේ මම හොල්මනක් කියලද? මොකද බයවුණේ?" එසේ ඇසූ ලීලා කාර්යාල කාමරයට ගොස් සෝපාව මත වාඩි වූවාය.

නිකීතා ඇය පිටුපසින් කාර්යාල කාමරයට ඇතුළු වී, එම සෝපාවේ අනික් කෙළවර වාඩි විය. කාමරයට උණුසුම ලබා දෙන ලිපෙහි දර කෝටු 'පට-පට' ගා පුපුරන්නට විය. හම් කවරය සහිත ඇඳි පුටුවලට

ගිනි දළුවල ආලෝකය වැදෙත්ම ඒවා වරින් වර දිලිසෙන සැටියක් පෙනිණි. බිත්තියේ රත්රන් පැහැති රාමු සහිත පින්තූර ද, අල්මාරි අතර පුෂ්කින්ගේ උඩුකය ප්‍රතිමා රූපයක් ද එමෙන්ම මෙම ආලෝකයට හසු විය.

ලීලා‍යා නොසැළී වාඩි වී සිටියාය. ලිපෙහි නටන ගිනි සිළු ඇගේ දෙකොපුල්වලට සහ යම්තමින් උස් වූ නාසයට වැටෙන විට අපූරු ලස්සනක් මැවී පෙනිණි. දිලිසෙන බොත්තම් සහිත නිල් පැහැති ඇඳුමක් හැඳගත් වික්තර් ද කාර්යාල කාමරයට ඇතුළු විය. ඔහු හැඳ සිටි කරපටිය ඔහුට කොතරම් තද වී ද යත්, කතා කිරීමට පවා ඔහුට නොහැකි විය.

වික්තර් ද ඇඳි පුටුවක් මත වාඩි වී නිහඬ විය. යාබද විසිත්ත කාමරයේ නිකීතාගේ මව් සහ වික්තර් හා ලීලායාගේ මවත් යම්කිසි පාර්සල් වගයක් ලිහන හඬත් ඒවා බිම තබන හඬත් ඇසෙයි. ඒ දෙදෙන අඩ ස්වරයෙන් කතා කළහ. වික්තර් නැගිට කාමරයේ යතුරු සිදුරෙන් විසිත්ත කාමරය තුළට බැල්මක් හෙළීය. එහෙත් සිදුරට කඩදාසි ඔබා තිබුණෙන් කිසිවක් නොපෙනිණි.

අනතුරුව කොරිඩෝරයේ දොර විවෘත වී බොහෝ දෙනෙකු ඇතුළු වූ සැටි ඇසිණි. නිකීතාලාගේ ගෙදරින් තෑගි ලබා ගැනීමට පැමිණි ගම්බද ළමයින්ය, ඒ. ඔවුන් වෙත දිව යා යුතු වුවද, නිකීතාට නැගිට සිටීමට තබා සෙළවීමට පවා නොහැකි විය. දැඩි ශීතට හසුවැ හිම මල් ඇඳී ඇති කවුළු වීදුරුවලට නිල් පැහැති ආලෝකයක් වැටිණි. ලීලායා සිහින් හඬින් කතා කළාය.

"තරුව ආලෝක කරලා."

එවේලාවේ දී ම කාර්යාල කාමරයේ දොර හරින ලදින් ළමයි තිදෙන නැගිට සිට ගත්හ. විසිත්ත කාමරයේ සීලිම දක්වා උසැති නත්තල් ගහ ඉටිපන්දම් විශාල සංඛ්‍යාවක ආලෝකය නිසා බැබළෙන්නට විය. දිලිසෙන සරුව පිත්තල සහ වීදුරු ආදී සෙල්ලම් බඩු නිසා ඉටිපන්දම් ආලෝකය දසත පැතිර අපූරු රැස් දහරා මවා පෑවේය. උණුසුම සහිත පුළුල් රැස් ධාරාත් සමග නත්තල් ගසේ පුසුඹත්, ඉටිපන්දම්, නාරන් සහ

පැණි විස්කෝතුවල සුවඳත් මුසු විය.

ළමයි පුදුමව නත්තල් ගස දෙස බලා සිටියහ. විසිත්ත කාමරයට යාබද අනික් දොර හරින ලදින් ගමේ ළමයි බිත්තිය අයිනේ තෙරපෙමින් නත්තල් ගහ වෙත ළං වූහ. ඔවුහු වාලෙන්කි නැමැති සනැති හිම සපත්තු ගළවා දැමූහ. දෙපාවල ගොවීන් පළඳින වුලන් මේස්ය. රතු, ලා රතු සහ කහ පැහැති ගොවි කමිස කොල්ලෝ හැඳ සිටියහ. ගොවි දූරියෝ කහ, රතු සහ සුදු ලේන්සු හිස බැඳ සිටියෝය.

එවිට නිකිතාගේ මව් පියානෝව වාදනය කරන්නී, පොල්කා තාලයක් පටන් ගත්තාය. ඈ වාදනය කරන ගමන්ම නත්තල් ගහ දෙස බලා මඳ සිනා පා, ගයන්නට වූවාය:

ඈත වටුවන්ට දිගැති පාද
උනුන් මුහුණ නොගැසුණා නේද....

නිකීතා ලීලියාට අතක් දිගු කළේය. ඈ ඔහුට අත දී දල්වෙන ඉටිපන්දම් දෙස බල්නනට වූවාය. ඇගේ නිල් පැහැති නෙත් දෙකෙහිම දල්වෙන් නත්තල් ගහක් බැගින් තිබෙන සැටි නිකීතාට පෙනිණි. ගොවි ළමයි නිහඬවැ ගල් ගැසී නත්තල් ගහ දෙස බලාගත් වනම සිටියෝය.

නිකීතාගේ ගුරුතුමා රැස්ව සිටි ළමයින් අතරට විත් ඔවුන්ගේ දෑතින් අල්ලා ගෙන උඩ පනිමින් නත්තල් ගහ වටේ දුවන්ට විය. ඔහුගේ කළු කබායේ බොත්තම් ගැළ වී, එය දෙපැත්තට වැනුණි. ඔහු දුවන ගමන් ළමයින් දෙදෙනෙකු ඇල්ලුවේය. පසුව නිකීතාවත්, ලීලියාවත්, වික්තර්වත් ඇල්ලීය. ළමයි නත්තල් ගහ වටේ දුවමින් ගම්බද ගී ගයන්නට වූහ:

ඉතුරු කරල රැකගත් රන් කාසි ගොඩක්
ඉතුරු කරල රැකගත් රිදී කාසි මිටක්.....

නිකීතා නත්තල් ගහේ එල්ලා තිබුණු කුඩා මල් වෙඩිල්ලක් ගෙන ඇද්දේය. එය තුළ තිබුණු කුඩා තරු ගොඩක් විය. එවිට අනිත් අය ද එහි තිබූ මල් වෙඩි අදින්නට වූයෙන්, විසිත්ත කාමරය පුරා වෙඩි

බෙහෙත් සුවඳ පැතිරිණි. ගොටු වැනි කඩදාසි තොප්පිවලින් හඬ පිට විය.

ලීලාට සාක්කු සහිත කඩදාසි ඒප්‍රනයක් ලැබිණි. ඈ එය හැඳ ගත්තාය. ඇගේ දෙකම්මුල් රතු පාට ජම්බු ගෙඩි මෙනි. දෙතොල් මත චොකලට් පැල්ලමිය. නත්තල් ගහ යට තිබූ ඇඳුම් පැළඳුම් සහිත විශාල බෝනික්කකු දෙස බැලූ ඈ නොනවත්වාම සිනා පෑවාය.

නත්තල් ගහ යට ගම්බද ළමයින් සඳහා විවිධ පාටවලින් යුත් කඩදාසිවලින් ඔතන ලද තෑගි ද විය. වික්තර්ට තෑගි වශයෙන් ක්‍රීඩා කාලතුවක්කු සහ කුඩාරම් සහිත සෙබළ බලකායක් ලැබිණි. නිකීතාට සැබෑ අසකු පිට යාමට දමන සැදෑලයක්, කටකලියාවක් සහ සබුක්කුවක් ලැබිණි.

ඊළඟට නත්තල් ගස අවට සිටි ළමයි රට කොට්ටම් ඇට බිඳ ඒවායේ මද කන සැටි ඇසිණි. කොට්ටම් ඇටවල පොතු ගස අවට බිම දමන ලදින් ඒවා පයට පෑගිණි. ගොවීන්ගේ ළමයි නාස්පුඩුවලින් ආශ්වාස කැරැමින් තමන්ට ලැබුණු තෑගි මලු ලිහා බැලූහ.

අම්මා යළිත් පියානෝව වාදනය කැරත්ම ළමයි නත්තල් ගහ වටේට යමින් ගී සින්දු ගයන්නට වූහ. මේ වන විට ඉටිපන්දම් සියල්ල පත්තු වී අවසන් වූයෙන් ගුරුතුමා උඩ පැන ඒවා එකින් එක නිවා දමන්නට වූයේය. නත්තල් ගහ ආලෝක කළ ඉටිපන්දම් නිවුණු පසු අම්මා පියානෝව වසමින් ළමයින් සියලු දෙනාටම තේ බීමට ආරාධනා කළාය.

එවිට ගුරුතුමා ළමයින් විසිපස් දෙනෙකු සමග කොරිඩෝරය දිගේ ගොස් කෑම ශාලාවට ඇතුළු විය.

ගෙදරට ඇතුළුවන කාමරයේ දී ලීලා නැවතුණාය. ඈ හුස්ම ඉහළට ඇද ගනිමින් නිකීතා දෙස සිනහසෙන නෙත්වලින් බැලුවාය. ඈත් නිකීතාත් හිම කබා එල්ලන ස්ථානවල සිටගත්හ. එවිට ලීලා මෙසේ පැවසුවාය:

"ඔයා මොකද හිතාවෙන්නේ?"

"හිනාවෙන්නේ මම නොවෙයි, ඔයා" නිකීතා පැවසීය.

"ඔයා මොකටද මා දිහාම බලන්නේ?" ලීලියා යළිත් ඇසුවාය.

නිකීතාගේ මුහුණ රතු විය. ඔහු ඇයට ළං වී, කරන්නේ කුමක්දැයි නොදැනම ඇගේ මුහුණ සිප ගත්තේය. ඈ එවිට හනිකට මෙසේ පැවසුවාය:

"ඔයා හොඳ ළමයෙක්. මා ඔයාට එහෙම කරන්ටයි කීවේ නැහැ. කාටවත් කියන්ට එපා. ඒක රහසක් ලෙස පැවතුණාවේ!" ලීලියා වහාම කෑම ශාලාවට දුව ගියාය.

තේ බීමෙන් පසු ගුරුතුමා නොයෙක් සෙල්ලම් යෝජනා කළ ද, ළමයි විඩාපත් වී සිටියහ. බොහෝ කැවිලි වර්ග කා තේ බී සිටි නිසා ක්‍රීඩාවල දී ළමයි අදක්ෂතාවයක් පෙන්වූහ. අවසානයේ දී පලාවන් කමිසයක් ඇඳ සිටි එක් කුඩා ළමයෙක් නිදා වැටෙමින් සිට පුටුවෙන් පහළට පෙරළී හඬන්ට විය.

නිකීතාගේ මවු නත්තල් උත්සවය හමාර වූ බව දන්වා සිටියාය. ළමයි කොරිඩෝරයට ගොස් බිත්තිය දිගේ ගොඩ ගසා තිබුණු හිම සපත්තු සහ හිම කබා ඇඳගෙන එක ගොඩේම හිම තුෂාරය සහිත එළියට ගියෝය.

ගොවි ළමයින් කැටුව නිකීතා වේල්ල දක්වා ගියේය. ඔහු ගෙදරට තනිවම හැරී එන විට මලානික වටකුරු හඳ අහසට නැග තිබිණි. වේල්ල අසල ගස් විශාල බවත් ඒවා සියල්ලම සුදෝ සුදු හිමෙන් වැසී තිබෙන අතර ඒවා හඳ එළිය නිසා වැඩී තිබෙන බවත් නිකීතාට හැඟිණි. දකුණු පැත්තේ හිමෙන් වැසී ගත් පාලු බිම ඈත අන්ධකාරය දක්වා විහිදෙයි. නිකීතාගේ සිරුරේ සෙවණැල්ල විශාල හිසක් සහිත දිගැති එකක් විය.

තමා මායාකාරී රාජ්‍යයෙක සිහින ලෝකයක් තුළින් ගමන් කරන සැටියක් නිකීතාට දැනිණි. එවැනි මායාකාර ලෝකයක පමණකි, අධ්‍යාත්මයට එතරම් පුදුම සහ වාසනාවත් විය හැක්කේ.

## වික්තර්ගේ පරාජය

වික්තර් මේ දවස්වල මිෂ්කා සමග මිත්‍ර විය. දෙදෙනාම පහළ පොකුණේ අයිස් තට්ටුවලට යටින් ඇති ගෑස් ගුලිවලට ගිනි තැබීමට ගියහ. ඔවුන් ගිනි තැබූ එක් ගෑස් ගුළියක් කොතරම් විශාල වී ද යත්, ඉන් පැන නැඟි ගිනි සිළුව මිනිහෙකුටත් වඩා උසින් වැඩි විය. අනතුරුව ඔවුහු පොකුණට එපිටින් ඇති අගල මත හිමවලින් බලකොටුවක් සෑදූහ. එය හිම කුළුණක්, වට තාප්ප සහ කපොලුවලින් යුක්ත විය. ඊට පසු වික්තර් කොන්චාන්ස්කි ගමේ කොල්ලන්ට ලියුමක් යැවීය:

"කොන්චාන්සිකි ගමේ කොල්ලනි, චපරයිනි, යකඩ තපන්නෙනි, මීයන්ට ලාඩම් ගසන්නෙනි, අපි තොපට මතක හිටින්ට යසට තලන්නෙමු. අපේ බලකොටුවට වී අපි නුඹලා එනතුරු බලා සිටිමු. මීට බලකොටුවේ ප්‍රධානියා වන විද්‍යාලයේ දෙවන පංතියේ ඉගෙන ගන්න වික්තර් බාබ්කින්."

එම ලියුම රිටකට තබා ඇණ ගසන ලදී. මිෂ්කා එය ගෙන ගොස් අර්තමෝන්ලාගේ ගෙදර හිම ගොඩක් මත තැබීය. ස්යෝම්කා, ල්යෝන්කා සහ පුංචි අර්තමෝෂ්කා ද, අලෝෂා, වාන්කා සහ පෙත්රුෂ්කා ද එම ලියුම සහිත රිට අසල වූ හිම ගොඩ මත නැග කොන්චාන්ස්කි ගමේ කොල්ලන් දෙසට ගොම රොටි හිම ගුළි විසිකරමින් ඔවුන්ට තර්ජනය කොට, මිෂ්කාත් සමග හිම බලකොටුවට ගියෝය.

කොල්ලන් සියලු දෙනටම හිම ගුළි සාදා ඒවා සියල්ල තාප්පය දිගේ තැබීමට අණ කළ වික්තර් පං කොළ සහිත රිටක් කුළුණ මත ගසා බලා සිටියේය.

නිකීතා විත් බලකොටුව පිරික්සා බලා දෑත් සාක්කුවල ඔබා ගනිමින් මෙසේ කීවේය:

"කිසිම කෙනෙක් නුඹලගෙ බලකොටුවට එන්නේ නැහැ. ඔය බලකොටුව තඹයක් වටින්නේ නැහැ. මම ගෙදර යනවා."

"කෙල්ලක් එක්ක සෙල්ලම් කරන්ට යනවා. ගෑනු කිච්චා!"

වික්තර් හිම තාප්පය අසල සිට කෑගැසීය.

අර්තමෝන්ගේ පුත්තු තුන්දෙනා බක බක ගා සිනාසුණහ. වාන්කා දෑතේ ඇඟිලි දෙකක් කටේ ඔබා සිවුරු හඬ ලෑවේය.

"මට සිතුණා නම් නුඹලාගේ ඔය හිම බලකොටුව කඩා බිඳ දමන්ට වුණත් පුළුවනි. දැත් කිලිටි කරගන්ට මම කැමති නැහැ." මෙසේ පැවසූ නිකීතා, වික්තර්ට දිව දිගු කොට පෙන්වා පොකුණ වසා ඇති අයිස් තට්ටුව උඩින් ගෙදර ගියේය.

ඔහු දෙසට හිම ගුළි වීසි කළ නමුදු ඔහු ආපසු හැරී බැලුවේවත් නැත.

ඔවුන්ට බලකොටුව තුළ වැඩි වේලා ඉන්නට සිදු වූයේ නැත. පිදුරු ගොඩකට මුවා වී සිටි කොල්ලෝ ඉදිරියට ආහ. සංඛ්‍යාවෙන් පහළොවක් පමණ වූ කොන්චාන්ස්කි ගමේ කොල්ලෝ දණක් හිම ගොඩේ එරෙමින්, එක එල්ලේම හිම බලකොටුව දෙසට ගමන් කළෝය.

වික්තර්ගේ නහය තද ශීතල නිසා රත් පැහැගෙන තිබිණි. ඔහු නහය නටවමින් කොන්චාන්ස්කි ගමේ කොල්ලන් හක්කේ තබා සෙම අරින බව කියමින් පුරසාරම් දොඩවන්නට විය. කොන්චාන්ස්කි ගමේ කොල්ලෝ හිම බලකොටුවේ තාප්පය ළඟටම ඇවිත්, සමහරු සිටගත්හ, සමහරු වාඩි වූහ. අම්මාගේ හිස බඳින තුවායක් පොරවා ගත් කුඩා කොල්ලෙක් ද ඔවුන් අතර විය. කොන්චාන්ස්කි ගමේ කොල්ලෝ ස්ත්යෝප්කා නමැති ගණන්කාර කොල්ලා ගෙන්වා ගත්හ. හිම බලකොටුව දෙස බලා ඔහු මෙසේ පැවසීය.

'අර දිලිසෙන බොත්තම් සහිත සූට් එකක් ඇඳලා ඉන්න කොල්ලා අපට දීපල්ලා! අපි එයාගේ දෙකන්වල හිම අතුල්ලන්නම්!..."

වික්තර් කලබල වී ඉහිමරන්නට විය. මිෂ්කා ඔහුට කනට කොඳුරා මෙසේ පැවසීය: "ඌට ලොකු හිම කැටයකින් ගහපන්:" වික්තර් හිම ගොඩක් දමා ගැසුවද එය ස්ත්යෝප්කාට වැදුණේ නැත. ස්ත්යෝප්කා පසු බැස්සේය. කොන්චාන්ස්කි කොල්ලෝ හිම ගුළි

ගැසීමට පටන් ගත්හ. ඒ වන විට හිම බලකොටුව තුළ සිට ඔවුන්ට හිම ගුළිවලින් පහර දෙන්ට වූහ. අර්තමෝන්ගේ පුත්තු තිදෙනා ඉතා දක්ෂ ලෙස හිම ගුළිවලින් පහර දුන්හ. වහාම ඔවුහු අම්මාගේ සාලුව පොරවාගෙන සිටි පුංචි කොල්ලා බිම වට්ටාලූහ. කොන්චාන්ස්කි ගමේ කොල්ලෝ ද හිම ගුළි කොට වීසිකරමින් 'සටන්' කළහ. මේ අයුරින් දෙපැත්තේම කොල්ලෝ හිම ගුළිවලින් පහර දි ගනිමින් සටන් කළහ. හිම බලකොටුවේ කුළුණ මත තිබූ කොඩි ගහ බිම වැටිණි. හිම තාප්පයක් මත නැග පහර දෙමින් සිටි වාන්කා බිම වැටුණෙන්, ඔහු විරුද්ධ පක්ෂයට යටත් විය. හිටි හැටියේම වික්තර්ගේ තොප්පියට වැදුණු හිම ගුළියක් නිසා එය බිම වැටිණි. එවිටම තවත් හිම ගුළියක් ඔහුගේ මුහුණට වැදුණේය. කොන්චාන්ස්කි ගමේ කොල්ලෝ හඬ නගා කෑගසමින් පහර දීමට වේගයෙන් ඉදිරියට දිවැ ගියහ... හිම බලකොටුවේ තාප්ප කඩා වැටිණි. හිම බලකොටුවේ සිටියහු කුඩා පඳුරු අස්සෙන් අයිස් තට්ටුවකින් වැසී තිබුණු පොකුණ වෙත දිවූහ.

## බිත්ති ඔර්ලෝසුවේ මල් පෝච්චියේ තිබුණු දෙය

කොල්ලන් සමග සෙල්ලම් කිරීම නිසා නිකීතාට පාළු ගතියක් ඇති වූයේ මන්දැයි ඔහුට නොතේරුණි. ඔහු ගෙදර විත්, කාමරය හරහා යන විට, ලීල්‍යා කතා කරන සැටි ඇසිණි.

"අම්මේ මට පිරිසුදු වෙළුම් පටියක් දෙන්න. මගේ බෝනික්කාගේ කකුලක් තුවාල වෙලා. එයාගේ අසනීපය මගේ සිතට ලොකු කරදරයක්."

නිකීතා නැවතුණේය. ඔහු යළිත් ප්‍රීතියක් දැනිණි. ඔහුගේ හදවත තුළ සංගීත පෙට්ටියක් හඬ නගන විටෙක මෙන් ඉතා මිහිරි සංගීතයක් ඇසෙන සැටියක් ඔහුට දැනිණි.

පෙරේදා ලීල්‍යා විඩි වී සිටි තැනට ගොස් වාඩි වූ නිකීතා දෙනෙත් හකුළුවා ගෙනැ කණ්නාඩියේ හිම රටාව දෙස බලන්නට විය. හඬ පිට නොකැර සංගීතය වාදනයවන අරුම පුදුම රටේ සැරසිලි ලෙස මෙම ලස්සන හිම රටාව නිකීතාට පෙනුණේය. ඒ හිම රටාව ගස් වැල්

සහ ලස්සන අමුතු සතුන්ගෙන් හා මිතිසුන්ගෙන් සමන්විත විය. ඒ හිම රටාව දෙස බලන තිකීතාගේ සිතිවිලි ඉබේටම වචනවලට පෙළ ගැසී ගීත බවට පරිවර්තනය වන සැටියක් දනෙයි. එම ගීත රාවය නිසා ඔහුගේ හිස මුදුනෙහි ඇති කෙස් කිති කැවෙයි.

තිකීතා සෙමින් සෝපාවෙන් බිමට බැස තාත්තාගේ ලියන මේසය මත ඇති දඩදාසියක ලොකු අකුරෙන් කවියක් ලියන්නට විය:

සුන්දර වන මාතාවෙනි, ලස්සන
මායාවක් වැනිය ඔබේ ලස්සන
සැම තැනම ඉගිලෙති රාජාලියෝ
දුවති, පනිති, වන පොව්වෝ...
පිළිගනු මැනවි වන මාතා ආදරය...
පිරිනමමි තුති ගී සාදරය...

කැලෑවක් ගැන තවදුරටත් කවි ලිවීමට තිකීතාට හැකියාක් නැත. ඔහු පෑන සපමින් සීලිම දෙස බලන්නට විය. මීට මොහොතකට පෙර ඔහු විසින්ම තාලයට ඇද-පැද කී වචන ඔහු අතින් ලියැවී නැත. ඒ වචන ඔහුගේ හිතට ඇතුළු වුණේ ඉබේටම මෙනි.

තිකීතා ඔහු ලියූ කවිය කියැවීය. එය ඔහුට සතුටක් ගෙනදිණි. ඔහු එම කඩදාසිය අටට නමා සාක්කුවේ දමා ගෙන භෝජනාගාරය වෙත ගියේය. එහි කවුළුවක් අසල ලීලියා වාඩි වී මසමින් සිටියාය. සාක්කුව තුළට අත ඔබාගෙන කවි ලියා ඇති කොළය අල්ලා ගෙන සිටි නිසා තිකීතාගේ අත දහදියෙන් තෙමුණ ද, ඔහු ඇයට එම කවි පෙන්වීමට තීරණය නොකළේය.

ඇඳිරි වැටුණු පසු වික්තර් ගෙදර පැමිණියේ ඉතා දඩි සීත නිසා තිල් පැහැගත් සහ ඉදුමුණු නහයක් ඇතිවය. වික්තර්ගේ මට දැත් විදහාගෙන කතා කළාය:

"ඔන්න ආයෙමත් නහය කඩාගෙන! කා එක්කලද ගහ ගත්තේ? වහාම උත්තර දෙනු!"

"අම්මේ, මම කාත් එක්කවත් ගහ ගත්තේ නැහැ. නහය නිකම්ම ඉදිමිලා." වික්තර් දුක්මුසු ලෙස පිළිතුරු දී, තම ඇඳ මත වැතිර ගත්තේය.

නිකීතා ද නිදන කාමරයට විත්, ලිප අසල සිට ගත්තේය. කොළ පැහැයට සමාන අහසෙහි ඉදිකටු තුඩු මෙන් සිහින් තරු කීපයක් දැකිය හැකියි. නිකීතා වික්තර් ඇමතීය:

"ඔයා කැමතිද මා ලියාපු කවි අහන්ට?" වික්තර් දෙවුර සොළවා දෙපා ඇඳෙහි ගැට්ට මත තබා මෙසේ කීවේය:

"මගේ අතට අහුවෙන්ට එපයි කියල අර ස්ත්‍යෝප්කාට කියන්න."

"වික්තර් දන්නවාද මම ලියාපු කවිවල විස්තර කරල තියෙන්නෙ කැලෑව ගැනයි. ඒ වුණත් ඒ කැලෑව ගැන හැම දෙයක් කියන්ට බැහැ... වික්තර්ගෙ හිතට දුකක් දනෙනවානම් මේ කවි කියවන්න. දුක නැතිවෙලා යාවි. දන්නවද සමහර දාට රෑට හීනෙන් පෙනෙනවා මොනවදෝ හොඳ දෙයක්. එය තේරුම් ගන්ට බැහැ. ඇහැරුණයින් පස්සෙ කොහොමටවත් බැහැ ඒ ගැන මතක් කරගන්ට... වික්තර්ට තේරුම් ගන්ට පුළුවන්ද?"

"බැහැ තේරුම් ගන්ට බැහැ. ඔයාගේ කවි අහන්ටත් මට ආසාවක් නැහැ"යි වික්තර් පිළිතුරු දුන්නේය.

නිකීතා සුසුමක් හෙළා ලිප අසල මොහොතක් සිට පිටතට ගියේය. මහා සාලයෙහි නටමින් ඇවිලෙන ගිනිසිළු සහිත ලිප ඉදිරිපිට, වෘක හමකින් වසා ඇති පෙට්ටගමක් මත වාඩි වී සිටි ලීලායා, නටන ගිනි සිළු දෙස බලා සිටී.

නිකීතා ද පෙට්ටගම මත නැගලා ඇය අසලින් වාඩි විය. සාලයෙහි උණුසුම නිසා ලිපෙන් හටගන්නා සුවඳක් ද, ශීත කාලයට අඳින සත්ත්ව ලොමින් කල 'ෂුබා' නැමැති කබාවලින් පැන නගින සුවඳක් ද, අති විශාල ලාච්චු පෙට්ටියේ ලාච්චුවල බහා තිබෙන විවිධ පැරණි ඇවලින් පැන නගින රස සුවඳක් ද වහනය වෙයි.

"අපි දෙන්නා ටිකක් කතා කරමු. ඔයා මට මොනවා හරි හොඳ දයෙක් ගැන කියන්නැ"යි ලීලා නිකීතාගෙන් ඉල්ලා සිටියේ කල්පනාකාරී ලෙසය.

"මේ ළඟ දී මා දැකපු හීනයක් ගැන කියන්නද?"

"හොඳයි, හීනය ගැන කරුණාකරල කියන්න."

නිකීතා බළලා ගැනත්, බිත්තියේ එල්ලා තිබුණු ඡායාරූප පණ ඇති ඒවා ලෙස හැසිරුණු සැටිත්, ඔහු සීලිම දක්වා ඉගිලී ගිය හැටිත් විස්තර කළේය. ලීලා ඔහුගේ කතාවට සවන් දුන්නේ, ඇගේ බෝනික්කා දණහිස් මත තබා ගෙනය. ඒ බෝනික්කාගේ හිස වෙළා තිබුණේ එයා අසනීපව සිටි බැවිනි.

ඔහු කතාව කියා අවසාන වන විට ඇගේ දෙනෙත් බිය සහ කුතුහලට පල කළ බවක් දැන්වීය. ලීලා සෙමින් මෙසේ ප්‍රශ්න කළාය:

"මල් පෝච්චියේ තිබුණේ මොනවාද?"

"දන්නේ නැහැ"

"මල් පෝච්චිය ඇතුළෙ මොනවා හරි හොඳ දෙයක් තියෙන්න ඇති," ලීලා කීවාය.

"මල් පෝච්චිය දුටුවේ හීනෙන් නොවැ" නිකීතා කියා සිටියේය.

"කොහොම වුණත් ඒ මල් පෝච්චිය ගැන හොයල බලන්ට ඕන. ඔයා පිරිමි ළමයෙක් නිසා ඔයාට ඕව තේරුම්ගන්ට බැහැ. ඔයාලගෙ ගෙදර ඒ වගේ මල් බෝච්චියක් හැබෑටම තියෙනවද?"

"අපේ ගෙදර හැබෑටම ඔර්ලෝසුවක් නම් තියෙනවා. මල් පෝච්චියක් ගැන නම් මට මතක නැහැ. සීයාගේ කාර්යාල කාමරයේ තියෙන අර ඔර්ලෝසුව කැඩිලා!" නිකීතා පිළිතුරු දුන්නේය.

"අපි එහාට ගිහිල්ලා බලමු" යැයි ලීලාා යෝජනා කළාය.

"එතැන අඳුරුයි"

"අපි නත්තල් ගහේ තියෙන ලන්තෑරුම ගනිමු. කරුණාකරල ලන්තෑරුම ගේන්න."

තිකීතා විසිත්ත කාමරයට ගොස් විවිධ පාට සහිත වීදුරු ජනේල ඇති ලන්තෑරුම ගෙන එය දල්වා ලීලාා සිටි කාමරයට ආවේය.

ලීලාා ලොකු චූලන් සළුවකින් හිසත්, උරහිසත් වසා ගත්තාය. ළමයි දෙදෙන හොරෙන්, හොරෙන් කොරිඩෝරයට විත් මහ ගෙදර ගිම්හාන කොටසට දිව ගියෝය. උසැති ඇඳිරි කාමරයේ කවුළු හිම තුෂාරයෙන් වැසිලාය. හඳ එළිය තිසා තුරු අතුවල සෙවණැලි ජනේලවලට වැටෙයි. එහි තරමක ශීතලක් දැනිණි. කුණු වූ ඇපල් ගෙඩිවලින් ගඳක් වහනය වෙයි. ඕක් ලීයෙන් තැනූ යාබඳ කාමරයේ දොරවල් වසා ඇත.

"ඔර්ලෝසුව ඒ කාමරයේද?" ලීලාා ඇසුවාය.

"තවත් එහාට තුන්වැනි කාමරේ"

"තිකීතා, ඔයා කිසිම දේකට බය නැතිද?"

තිකීතා ඉදිරියෙන් ගොස් දොර හරිත්ම, එයින් දොම්නස මුසු හඬක් පිටවිය. පාලු කාමරය තුළ දී එම දෝංකාරය රැව්දිණි. ලීලාා තිකීතාගේ අතක් අල්ලා ගත්තාය. ලන්තෑරුම ගැස්සිණි. එහි කුඩා වීදුරු ජනේලවලින් විහිදුණු රතු සහ නිල් පැහැති ආලෝකය කාමරය පුරා පැතිරිණි.

දෙපයේ ඇඟිලි තුඩුවලින් ගමන් කරමින් දෙදෙන යාබද කාමරයට ඇතුළු වූහ. කෙවුළු අතරින් කාමරයේ ලී පොළව මත වැටෙන තිල්වන් සඳ එළිය හරි හතරැස් කොටුවලට සමානය. බිත්තිය අසල ඇඳි පුටුය. ඒවා ඉරි සහිත කුඩා මෙට්ටවලින් යුක්තය. මුල්ලේ සෝපාවෙකි.

නිකීතාගේ හිස කැරකැවීමට පටන් ගත්තේ වරක් ඔහු මේ කාමරය මෙලෙසින්ම සිහිනෙන් දුටු බැවිනි.

බිත්තියේ එල්ලා ඇති මහල්ලාගේ සහ මැහැල්ලගේ පින්තූර දුටු ලීලියා ඒවා දෙස ඇඟිල්ල දිගු කරන්නී, මෙසේ පැවසුවාය: "අන්න ඒ ගොල්ල අප දිහා බලනවා."

ළමයි කාමරයේ දෙවැනි දොර ඇරියහ. සීයාගේ කාර්යාල කාමරය සඳරුසින් නැවිලාය. අල්මාරිවල වීදුරු දොරවල් ද, පොත් කවරවල රනින් කළ බොරදම ද, සඳ එළියට දිලිසිණි. කාමරය තුළ ලිපට ඉහළින් එල්ලා ඇති පින්තූරයේ 'ඇමසෝන්කා' නැමැති ඇඳුමින් සැරසුණු කාන්තාව ගුප්තමය ලෙස මඳ සිනා පාන සැටි පෙනෙයි.

"මේ කවුද?"යි ලීලියා ඇසුවේ නිකීතා වෙතට ළං වෙමිනි.

ඔහු පහත් හඬින් පිළිතුරු දුන්නේය:

"මා කීවේ මෙයා ගැන තමයි."

ලීලියා හිස වනා, යමක් දුටු විට හදිසියෙන් කතා කරන පරිදි මෙසේ කීවාය:

"අන්න බලන්න, නිකීතා, අන්න මල් පෝච්චිය!"

සත්තකින්ම කාර්යාල කාමරයේ ගැඹුරෙහි රතු ලීයෙන් නිම කරන ලද ඔර්ලෝසු පෙට්ටිය මත රළි සහිත කුඩා කණු දෙකක් අතර සිංහ මුහුණක් සහිත මල් බඳුනකි. ඔර්ලෝසු බට්ටා එක තැන නැවතිලාය. නිකීතා මීට පෙර මෙහි මල් බඳුනක් අති බව කිසියම් හේතුවක් නිසා දක නැත. ඔහු සිහිනෙන් දුටු මල් බඳුන එය තමා.

ඔහු ඔර්ලෝසුව ළඟටම පුටුවක් ගෙනැවිත් තබා එය මත නැග, දෙපයේ ඇඟිලි තුඩුවලින් සිට ගනිමින් මල් බඳුනට අත දැම්මේය. එහි වූ දූවිලි අතර යම්කිසි තදැති දෙයක් තිබිණි.

"සම්බ වුණා!" යැයි කී නිකීතා අත මිට මොළවා ගෙන පුටුවෙන් බිමට බටුයේය.

ඒ වෙලාවේ දී පුස්තකාලයෙහි මීයන් අල්ලමින් සිටි බළලා 'ෂූ' යන හඩක් නංවත්ම, උගේ දම් පැහැති දෙනෙත් දිලිසිණි.

ලීලා දැත් වනා දුවන්නට වූවාය. ඔහු ද ඇය පසුපසින් දිව්වේය. කිසිවෙක් ඔහුගේ හිසකේ අත ගෑ විටෙක මෙන් වූ නිසා ඔහුට මහත් බියක් දැනිණි. ළමයින් දෙදෙනා පසුබාමින් බළලා වලිගය පහත් කැරගෙන සඳැරැසින් පිරි කාමරය හරහා දිව ගියහ.

ළමයි දෙදෙන එක පිම්මට කබා එල්ලන කාමරයේ, ඇවිලෙන ගිනි සිළු සහිත ලිප අසල තිබූ පෙට්ටගම මත වාඩි වූවෝ, බිය වූ නිසා හති ලන්නට වූහ. ලීලාගේ දෙකොපුල් රත්විය. නිකීතා දෙස බැලූ ඇ මෙසේ ප්‍රශ්න කළාය.

"ඉතින්?"

එවිට ඔහු මිට මෙළවූ අතේ ඇඟිලි දිග හැරියේය. නිකීතාගේ අත්ළ මත නිල්වන් මැණිකක් සහිත සිහින් මුදුවකි. ලීලා නිහඬව දැත් එක් කැර ගනිමින් මුමුණුවාය:

"මුද්දක්!"

"මේක හාස්කම් ඇති මුද්දක්!" නිකීතා කීවේය.

"අපි දැන් මේ මුද්දට මොනවා කරමුද?"

නිකීතා බරපතළ බවක් ආරූඪ කර ගෙන ඇගේ අතක් ගෙන එහි දබරැඟිල්ලට ඒ මුද්ද දැමීය.

"ඇයි මෙය මට දුන්නේ." මෙසේ ඇසූ ලීලා මුද්දේ දිලිසෙන නිල්වන් මැණික දෙස බලා සුසුමක් හෙළ, නිකීතාගේ ගෙළ බදාගෙන ඔහු සිපගත්තාය. නිකීතාගේ මුහුණ කොතරම් රත් පැහැ ගත්තේ ද යත්, ඔහුට ලිපෙන් ඈතට යාමට සිදු විය. ඔහු යළිත් සිත එක් තැන් කරගෙන මෙසේ



ද පැවසීය:

"මේකත් ඔයාට තෑගි කරනවා."

ඔහු තම සාක්කුවෙන් එළියට ගත් කවි කොළය ඇගේ අත තැබීය. වනය ගැන ලියා තිබුණු එය අටට නැවූ කඩදාසියකි.

කඩදාසිය දිග හැර සෙමින් කවි කියැවූ ලීලා අනතුරුව කල්පනාකාරී ලෙස මෙසේ පැවසුවාය:

"නිකීතා, ඔබට බොහොම ස්තුතිය. මම ඒ කවිවලට බොහොම කැමතියි."

## අවසාන සැන්දෑව

හවස තේ බොද්දී නිකීතාගේ මවු වික්තර්ගේ මවුත් සමග ඔවුනොවුන්ගේ මුහුණු බලා ගනිමින්, දෙදරා හකුළුවා ගත්තාය. නිකීතාගේ ගුරුවරයා ද තේ වීදුරුව දෙස බලා ගත්වනම සිටියේ ඔහු කපා දැමුවත් රහස හෙළි නොකරමියි යන හැඟීමෙකිනි. ඔහුගේ මුහුණෙන් කිසිවක් හෙළි නොවීය. වික්තර්ගේ අම්මා උණු රොටී කමින් කිරි තේ කෝප්ප පහක්ම බිවුවාය. තමා ඉදිරියේ වැටී ඇති කුඩා රොටී කැබැලි ආදිය අතින් ගෙන මේස රෙද්දේ එක තැනකට ගොඩ ගසා, බැරැඩි හඬින් මෙසේ පැවසුවාය:

"අනේ, අනේ, අපොයි බැහැ, මගෙ හොඳ යෙහෙළියේ මා කී දේ ස්පීරයි. ඔය හොඳටම ඇති." පසුව ඈ කුදු ගැසී සිටින වික්තර්ගේ පිටට ඇඟිල්ලෙකින් ඇන පිටි කොන්ද කෙළින් තබා ගන්නා ලෙස දන්වූවාය. "ඔන්න මේ ළමයි... හෙට සඳුදා, ඔයාට සත්තකින්ම අමතක වෙලා නොව, ඔය දෙන්න තේ බීලා නිදාගන්න යන්න. හෙට උදේ පාන්දරින්ම අපි පිටත් වෙන්ට ඕන."

වික්තර් නිහඬව දෙතොල් උල් කර ගත්තේය. ලීලා හනිකට දෙනෙත් පහත දමාගෙන කෝප්පය දෙසට ගෙළ පහත් කළාය. ලාම්පු දැල්ලේ ආලෝක ධාරා නිකීතාගේ කළුවු පිරී දෙනෙතට වැටුණෙන් ඔහු

බළලා දෙස බැලීය.

ඌ හොඳට සෝදා පවිත්‍ර කළ බිමෙහි වැතිර දෙනෙත් හකුළුවාගෙන කකුලක් ලෙවකයි. බළලාට සොම්නසක් හෝ දොම්නසක් හෝ නැතිය. ඌට ඉක්මන්වීමට වුවමනාවක්ද නැත. බළලා මිනිසුන් ගැන මෙහෙම සිතනවා විය යුතු යැයි නිකීතාට සිතෙයි: "මිනිසුන් වන නුඹලාට හෙට නැවත වැඩ කටයුතු පටන් ගන්නවා. ආයෙමත් ගණන් හදන්ටයි, කියන විට ලිවීමයි ආරම්භ වෙනවා. මම බළලා, උත්සවවලට ගියෙත් නැහැ, කවි ලියුවෙත් නැහැ. ගෑනු ළමයින්ගේ මුහුණ සිපගත්තෙත් නැහැ, මට අදත් හෙටත් එකවගේම හොඳයි."

වික්තර් සහ ලීලා‍ා තේ බීම අවසන් කොට අම්මාගේ මුහුණ දෙස බැලූහ. ඇගේ ඇහි බැම් නැටවෙන්නට පටන් ගෙන තිබිණි. ඔවුහු අම්මාගෙන් සමුගෙන මේසයෙන් නැගිට, නිකීතාත් සමග පිටතට ගියෝය. එවිට වික්තර්ගේ මවු තම පුතුට ඇසෙන සේ කෑගැසුවාය.

"වික්තර්!"

"අම්මේ මොකද?"

"යන හැටි ඔහොමද?"

"හොඳ නැතිද?"

"පුතා යන්නේ හරියට ගාට-ගාට යනවා වගේ නොවෙ. පණ ඇතුව ගමන් කරන්න. කාමරය තුළ දණ ගාන්න එපා. අර තියෙන්නේ දොර. පිටි කොන්ද කෙළින් තියාගන්න... නුඹ වැදගැම්මකට ඇති එකෙක් වෙයිද, මට නම් තේරුම් ගන්න බැහැ!"

ළමයි හිම කබා එල්ලන කාමරයට ආවෝය. පිරිමි ළමයින් දෙදෙනාට දකුණට හැරී යා යුතුව ඇත. නිකීතා ලීලා‍ා ඉදිරිපිට නැවතී යටි තොල විකා ගනිමින් මෙසේ ඇසීය:

"ඔයා ගිම්හාන නිවාඩුවටත් මෙහෙ එනවා නේද?"

"ඔව්, නිකීතා, මම ඔයාට ලියන්නම්."

"එහෙනම් ඉතින් ආයුබෝවන්!"

"ආයුබෝවන්, නිකීතා."

ලීලායා හිස වනා අතේ ඇඟිලි තුඩු දිගුකොට ඔහුට අතට අත දී, වමට හැරී ඍජුව ගමන් කළාය. පිටු පා යන ඇය දෙස බලන කෙනෙකුට කිසිඳු නිගමනයක් කළ නොහැකියි. "මගේ දුව හැඟීම් පිටතට නොපෙන්වන කෙනෙක්" යැයි ඇගේ අම්මා වරක් කී සැටි නිකීතාට මතක් විය.

වික්තර් මුමුණමින් කුඩයකට ඔහුගේ පොත් හා තවත් සෙල්ලම් බඩු දැමීය. යම්කිසි චිත්‍ර වගයක් ගලවා කුඩා පෙට්ටියකට දැමීය. අනතුරුව මේසය යටට රිංගා ඔහුගේ පිහිය සොයන්නට විය. දෙපා දක්වා වැසෙන සේ පොරවා ගෙන නිදාගන්නා බවක් පෙන්වමින් වැතිර සිටියේය.

ලෝකයේ හැම දෙයක්ම අවසානයට පත් වී තිබෙන බවක් ඔහුට දැනෙයි. ඔහුගේ නිදිබර දෙනෙත් වැසෙත්ම, ඔහුට අවසාන වරට ලීලායා හිස වනන සැටිත්, ඇගේ හිස බැඳි පීත්ත පටිය නටන සැටිත් පෙනිණි. ඔහු එය ජීවිතයේ කිසි දිනෙක අමතක නොකරනු ඇත. නින්දට වැටෙන ඔහුට යම්කිසි හඬක් ඇසේ, කිසිවෙකු ඔහුගේ ඇඳින් ඈතට යන සැටි ද, හඬ ඈත ඇසෙන සැටි ද දැනේ. ඔහුට විශාල උණුසුම සහිත කොළ ද, විශාල ගස් ද, ඔහු ඉදිරියේ මැවී ඇති බැද්ද අතරින් යන මාර්ගයක් ද පෙනේ. බැද්දෙහි අපූරු රත් පැහැති ආලෝකය මිහිරි බවක් ගෙන දෙයි. අධික වේදනාවකින් කෑගැසීමට සිත් විය. හිටි හැටියේම රතු පැහැති හිසක් පඳුරු අතරින් මතු විය. රන්වන් රාමුවක් සහිත ඇස් කණ්නාඩියක් පැළඳ සිටි හිස, හඬ නගා කතා කළේය. "අහා, නුඹ තවමත් නිදි නැතිද?"

නිකීතා දෙනෙත් හැර බැලීය. ඔහුගේ මුහුණට උදෑසන හිරු රැස් වැටිලාය. ඇඳ ළඟ ඔහුගේ ගුරුතුමා සිටගෙන සිටියි. ඔහු පැන්සලයකින් ඔහුගේ නාසයට තට්ටු කර ගනිමින් මෙසේ පැවසීය:

"පල් හොරා, කොලු පැංචා, නැගිට්නවා! නැගිට්නවා!"

## වියෝවීම

ජනවාරි මාසයේ දී නිකීතාගේ තාත්තා වසිලි නිකීතියෙවිච් අම්මාට එවූ ලියුමේ මෙසේ සඳහන් විය:

"...ආදරණීය සාෂා, මගේ ප්‍රවේණි උරුමය පිළිබඳ වැඩ කටයුතු තවත් දුර ගැස්සීම නිසා මම ඉමහත් පසුතැවිල්ලකින් පසුවෙමි. මොස්කව් නගරයට ගොස් මෙසේ කටයුතුවල යෙදීමට සිදුවන හැඩයි. කෙසේ වුවත්, පාස්කු කාලය වනවිට ඔබ හැම දෙන දකීමට බලාපොරොත්තු වෙමි..."

අම්මා ලියුම කියවා බොහෝ සේ කණගාටුවට පත් වූවා, හවස නිකීතාගේ ගුරුවරයාට ඒ ලියුම පෙන්වා මෙසේ තෙපළාය:

"ඔය උරුමය හන්දා ඔය තරම් කරදර නම්, ඒක ඕන කෙනෙකුට ගියාවේ. මුළු හිම කාලයෙම තිස්සේම ඉන්නේ වෙන්වෙලයි. අමතක වේගෙන එන හැඩයි මට සිතෙන්නේ."

ඕ මුහුණ අහකට හරවා ගෙන දැඩි ශීතට හසු වී ඇති කළු පැහැගත් කවුළුව දෙස බලන්නට වූවාය.

කවුළුවෙන් එපිට අන්ධකාර මහා රාත්‍රියය. හිම තුෂාරය සහිත දැඩි ශීතකි. ඇඟ කිලිපොළා යන පරිදි ගෙවත්තේ නග්න තුරු අතු හඬ නැගීය. අට්ටාලයේ බාල්ක පවා 'කිට් කිට්' යන හඬක් නැංවීය. උදෑසන හිම තුෂාරයට හසුව මය ගිය වී කුරුල්ලන් දක්නා ලදී. අම්මා දෙනෙතින් කඩා හැළුණු කඳුළු කැට පිස දා ගත්තාය.

"අනේ ඔව්, වියෝවීම, වියෝවීම" යැයි නිකීතාගේ ගුරුතුමා තමාටම කියා ගත්තේ කල්පනා සයුරෙක ගිලෙමිනි. ඔහු, ඔහුගේ වියෝවීම ගැන සිතනවා විය යුතුයි. ඔහුගේ අතක් සාක්කුවේ ඇති ලියුම වෙත යැවිණි.

අද නිකීතාගේ භූගෝල පාඩමයි. ඔහු දකුණු ඇමරිකාවේ

සිතියම් අඳිමින් සිටියි. අද අම්මා නිකීතාට බොහෝ වේලාවක් තිස්සේ අවවාද කළාය. නත්තල් කාලයේ දී නිකීතා අලසයකු බවට සහ වැඩ පැහැර හරින කෙනෙකු බවට පත් වී ඇතැයි අම්මා කීවේ කැළඹී ගත් හඬකිනි. ඔහු ගම් සභා කාර්යාලයෙක ලියන්නකු නැතිනම් බෙසෙන්චුක් දුම්රිය පළේ සංඥා පණිවුඩ යවන්නා වැනි පහත් රැකියාවක් කිරීමට සූදානම් වෙතැයි ඕ පැවසුවාය. "අද භූගෝල පාඩමේ දී දකුණු ඇමෙරිකාවේ සිතියම අඳින්න"යි ඕ නිකීතාට අණ කළාය.

දකුණු ඇමරිකාවේ සිතියම අඳින නිකීතා ඇත්තටම තමාට තාත්තා අමතක වී දැයි සිතන්නට විය. නැත, ඔහුට තාත්තා අමතක වී නැත. ඇමෙසන් ගංගාව සහ දේශාංශ සහ අක්ෂාංශ ආදිය වෙනුවට ඔහුගේ මනස ඉදිරියෙහි රත් පැහැගත් කම්මුල් සහ දිලෙන නෙත් සහ දත් සහිත තාත්තාගේ පියකරු මුහුණ මැවී පෙනිණි. කළු පැහැති යටි රැවුළ වැඩිලාය. ඔහු කොක් හඬලන සිනාවෙක් බඳු හඬකින් කතා කරයි. ඔහු යමක් විස්තර කරන විට ඔහු දෙස පැය ගණනක් වුව ද බලා සිටිය හැක්කේ ඔහු අසන්නන් ඉළ කැඩෙනතුරු සිනස්සන බැවිනි. ඔහුගේ මෙම නිදහස් හැසිරීම සහ සැහැල්ලු ගති නිසා අම්මා ඔහුට අඩ වශයෙන් දොස් කීවාය. එහෙත් තාත්තාගේ මේ ගතිගුණවලට හේතුව ඔහුගේ ජීවමය චරිතයය. මහ ගෙදර ඉඩමට අයත් පොකුණු තුනේම පිරී සිටින ගෙම්බන් අපතේ යන බව හිටිහැටියේම තාත්තාට කල්පනා විය. ඔහු එතැන් සිට දවස් කීපයක් යනතුරුම ගෙම්බන්ට කෑම දීම ගැනත්, උන් බෝ කොට, පීප්පවලට බහා පැරිසියට යැවීම ගැනත් කියන්නට විය. අම්මා තාත්තාගේ මේ කතාව අසන්නී දෙනෙතින් කඳුළු කැට වැටෙනතුරු මහ හඬින් සිනාසෙන්නට වූවාය. "හොඳයි, ඔයා හිනා වෙන්නකො, මම ඔය ගෙම්බන් විකුණලා පොහොසත් වෙනවාමයි" හේ කීවේය. තාත්තා පොකුණේ කොටසක දැලක් දමා වටකොට ගෙම්බන්ට විශේෂ ආහාර දී පර්යේෂණය සඳහා ගෙම්බන් ගෙදර ගෙනාවේය. එවිට අම්මා තාත්තාට මෙසේ කීවාය: "එක්කෝ මා තෝරා ගන්ට, නැත්නම් ගෙම්බන් තෝරා ගන්ට". අම්මා ගෙම්බන්ට ඉමහත් සේ බිය වූවාය. පර්යේෂණ සඳහා ගෙදරට ගෙම්බන් ගෙනා විට ඇයට එහි විසීම අපහසු විය. දවසක් දා නගරයට ගිය තාත්තා එහි පරණ ඕක්මුවා දොරවල් සහ ජනේල රාමු පිරවූ කරත්තයක් සහ එයත් සමග ලියුමක් එව්ය. "ආදරණීය සාෂා, ජනේල රාමු සහ දොරවල් කීපයක් මිල දී ගැනීමට අහම්බෙන් මට හැකි වුණා. තොපොල් ගොඩනැගිල්ලේ ශාලාවක් හැදීමට ඔයා අදහස් කළ

නිසා මේවා ප්‍රයෝජනවත් වේවි. මම ගෘහ නිර්මාණ ශිල්පියෙකු සමග සාකච්ඡා කළා. ශීත කාලයට පවා ඔරොත්තු දෙන ශාලාවක් සෑදිය යුතු යැයි ඔහු උපදෙස් දුන්නා. මා දැනටමත් ප්‍රීති වෙන්නේ පහත් බිමක පිහිටා තිබෙන අපේ ගෙදර ජනෙල්වලින් කිසිදෙයක් පෙනෙන්නේ නැති නිසා අපේ අළුත් ශාලාව ගැනය."

අම්මා හඬන්නට වූවාය. මාස තුනක් තිස්සේ නිකීතාගේ ගුරුතුමාට වැටුප් ගෙවා නැත. ඒ මදිවාට හිටිහැටියේම අමතර වියදමක් කිරීම ගැනය... අළුත් ශාලාවක් සෑදීම පිළිබඳව අදහස අම්මා දැඩි ලෙසම ප්‍රතික්ෂේප කළ නිසා දොරවල් සහ ජනේල රාමු මඩුවේ දිරාපත් වීමට ඉඩහරින ලදී.

හිටිහැටියේම තාත්තාට අළුත් අදහසක් උපනි. කෘෂිකර්මය වඩාත් යහපත් කිරීමය. මෙය ද විපත්තිදායක වැඩකි. අළුත් යන්ත්‍ර ඇමරිකාවෙන් ගෙන්වන ලදී. දුම්රියපළට ගිය තාත්තා ඒවා ගෙනාවේය. එම යන්ත්‍ර ක්‍රියා කරවන හැටි කම්කරුවන්ට උගන්වන අතර කෝපයට පත් වී කෑගසන්නට විය: "යක්සයිනේ, පරෙස්සමින් වැඩ කරපියව්!"

ටික කලෙකට පසු අම්මා තාත්තාගෙන් මෙසේ විපරම් කළාය:

"ඉතින් ඔයාගෙ අර අරුම පුදුම යන්ත්‍රය කොහොමද?"

තාත්තා කවුළුවට ඇඟිලි තුඩුවලින් පිළිතුරු දුන්නේය: "මොකද? ඉතා අනර්ඝ යන්ත්‍රය"

"මම දැක්කා ඒ යන්ත්‍රය මඩුවේ දමලා තියෙනවා"

තාත්තා දෙවුර වනා දැතින්ම යටිරවුල අතගාමින්ම බලයි. අම්මා යළිත් ප්‍රශ්න කරයි.

"මොකද, ඒක කැඩිලද?"

තාත්තා හඬක් පිට කොට මෙසේ පැවසීය:

"ඒ මෝඩ ඇමරිකන් කාරයො නිතර, නිතර කැඩෙන යන්ත්‍රයක් හදලා.- ඉතින් මම මොනවා කරන්ටද?"

ඇමේසන් ගඟ අඳින නිකීතා තාත්තා ගැන කල්පනා කළේ ආදරයෙන් සහ මුදු ප්‍රීතියෙනි. ඔහුගේ හිත සන්සුන්ය. පුතාට තාත්තා අමතක වී ඇතැයි අම්මා කීවද එය ඇත්තක් නොවේ.

හිටිහැටියේම ගෙයි බිත්තියෙන් හඬක් පිටවිය. අම්මා තිගැස්සෙත්ම වියන කටු බිම වැටිණි. ඉත්තෑ පැටියා ද කෝප වී හඬක් පිට කළේය. නිකීතා තම ගුරුතුමා දෙස බැලීය. ඔහු පොතක් කියවන බවක් ඇඟවුවද හිඳගත්වනම ඔහු නිදාගෙන සිටින සැටි දුටුවේය. නිකීතාට ගුරුතුමා ගැන ඇති වූයේ ඉමහත් දුකකි. අනේ පව්, දුප්පත් ගුරුතුමා එයාගෙ ආදරවන්තිය - වාස්ස් ආ නීලව්නා ගැන එයා සිතනවා. ඇ නගරයේ පාසලක උගන්වන ගුරුවරියක්. එයා නම් හැබෑටම වියෝ දුකක්!

නිකීතා කම්මුල අත්ල මත තබා ගෙන තමාගේ වියෝව ගැන කල්පනා කරන්ට විය. මේසයේ මෙන්න මෙතැන ලීලයා වාඩි වී හිටියා. දන් ඇය නැත. කොතරම් විශාල කණගාටුවක්ද! හිටියා දන් නැත. ලීලයා මේසය මත හැලූ 'ගම් ඇරැබික්' මැලියම් පැල්ලම තවම තියෙනවා. ඇගේ හිස බැඳි කොන්ඩා පටියේ හෙවණැල්ල මේ බිත්තියට වැටුණා. ප්‍රීතිමත් දවස් ඉගිලී ගොසිනි. නිකීතාගේ කල්පනාව විසින් මවන ලද මේ වචන නිසා කණගාටුවක් ඇතිවත්ම ඔහුගේ උගුර වියළිණි. ඔහු ඒ වචන අමතක නොකරනු වස් ඇමේසන් ගංගාවට පහළින් 'ප්‍රීතිමත් දවස් ඉගිලී ගොසිනි'යි ලියුවේය. ඔහු ඇමේසන් ගංගාව ගලා බසින මාර්ගය වැරදි ලෙස ඇන්දේ පැරගුවායි සහ උරුග්වායි රටවල් හරහා එය ගලා බසින සැටි දක්වමිනි.

"ඇලෙක්සාන්ද්‍රා ලියොන්තියෙව්නා, මා සිතන්නේ ඔබේ නිගමනය නිවැරදියි කියලා. මේ ළමයා නම් බෙසෙන්වුක් දුම්රිය ස්ථානයේ සංඥා පණිවුඩකරුවකු වෙනවාමයි." ගුරුතුමා කොතරම් සන්සුන් හා දැඩි ලෙසකින් කතා කළේද යත්, ඔහුගේ කතාව නිසා පිට දිගේ හම ඉලිප්පෙන සැටියක් නිකීතාට දැනිණි. එසේ කීමට පෙර ගුරුතුමා බොහෝ වේලාවක් තිස්සේ නිකීතාගේ ඇමේසන් ගංගාව ගලා

බසින දිසාව දෙස ඕනෑකමින් බලාගෙන සිටියේය.

## වැඩ කටයුතු

හිම තුෂාරය වඩාත් ශීතල අතට හැරිණි. නග්න තුරු අතු අයිස් තට්ටුවලින් වැසිලාය. මුලින් වැටුණු හිම යම්තම්න් දියවීම නිසා හැදුණු අයිස් තට්ටුවට උඩින් තවත් හිම තට්ටුවක් වැටී ඇත. දැඩි ශීතට සහ බඩගින්නට හසු වූ වෘකයෝ එකා බැගින් හෝ දෙදෙනා බැගින් හෝ රාත්‍රී කාලයේ දී මහ ගෙදර අසලට එන්නට වූහ.

වෘකයින්ගේ ඉව දැනගත් ෂරොක් සහ කතොක් නැමැති මුර බල්ලෝ දෙදෙන බියවූවෝ, කෙදිරි ගාමින්, එය මඩුව යටට රිංගා ගෙන එතැන සිට සිහින් හඬින් උඩු බුරන්නට වූහ. ඌ-ඌ-ඌ....

වෘකයෝ අයිස් තට්ටුවෙකින් වැසී ඇති පොකුණ හරහා විත් මහ ගෙදර සත්ත්ව ප්‍රාණීන්ගේ ඉව දැන ගෙන පඳුරු අස්සට වී සිටියෝය. පසුව වඩාත් නිර්භය වූවෝ ගෙවත්තට විත් හිම පිරි බිමෙහි පසු පස, ගාත් බිම තබාගෙන උන්හ. උහු උන්ගේ දිලිසෙන ඇස්වලින් ගෙදර ඇඳිරි ජනේල දෙස බලා හොඹු උඩු අතට හරවා ගෙන, පළමුව පහත් හඬින් ද පසුව උස් හීන් හඬින් ද කෑගැසූහ. වඩාත් උස් හීන් හඬින් කෑගසන උන්ගේ වෘක නාදය දෙන් විදින මර ලතෝනියකට සමාන විය...

මේ කෑගැසීම විසින් බල්ලෝ දෙදෙන කෙතරම් බිය වූවෝද යත්, පිදුරු ගොඩ අස්සේ උන්ගේ හොඹු සඟවා ගෙන රිය මඩුව යටට වී මළාක් මෙන් උන්හ. මෙහෙකරුවන්ගේ කාමර පෙළෙහි ලිප උඩැති මැස්ස මත තුලුප් හිම කබායක් පොරවා ගෙන වැතිර සිටි පහෝම් වඩුරාළ මුමුණන්නට විය:

"අහෝ සර්වබලධාරී දෙවියනි, අපේ පවුවලට සමාවන සේක්වා!"

මහ ගෙදර වැඩ කටයුතු බහුලව පැවැති දවස් ද විය. නිල්-කළු පැහැති කවුළු වලින් එපිට යම්තම්න් හිමිදිරි පාන්දර අරුණෝදය වැටෙත්ම, හැම දෙනෙක්ම අවදි වූහ. අහස යම්තම්න් ලා නිල් පැහැයක්

ගත්තා පමණකි.

ගෙදර ලිප්වල කුඩා යකඩ දොරවල හඩ ඇසිණි. කුස්සියේ හුම්තෙල් ලන්තෑරුම තවමත් නිවා නැත. සමවාරයෙන් පිටවන හුමලයෙන් ද, උණු පාන්වලින් ද අපූරු සුවඳක් වහනය විය. උදේ තේ පානය ඉක්මණින් අවසන් විය. කෑම ශාලාවේ ලොකු මේසය අස්-පස් කළ අම්මා මහන මැසිම ඒ මත තැබුවාය. පෙස්ත්රාවිකා නැමැති ගමෙන් ගෙන්වා ගත් ඇඳුම් මසන්නියකවන සෝපියා අම්මාත් සමග එකතු වී අවශ්‍ය දෑ මැසුවාය. නිරන්තරයෙන්ම නූල් සපා කඩන බැවින් සෝපියාගේ දතක් ඉරි ගැසී තිබිණි. ඈ කුදුය, මුහුණ ලප සහිතය. මහන අතර පහත් හඬින් කතා කරන මේ දෙදෙන හඬ නංවා මහන නූල් පටවල් කැඩුවෝය. සෝපියා නැමැති මෙම මහන්නිය කොතරම් මූසල දැයි කියතොත්, ඇය හරියට අවුරුදු කීපයක්ම අල්මාරිය අස්සේ වැටී සිටියාක් මෙනි. ඇය සොයාගෙන, යම්තමින් ඇගේ ඇඳුම් ශුද්ධ පවිත්‍ර කොට ඇයට මැසීම බාර දී ඇතිවාක් මෙනි, නිකීතාට දැනුණේ.

ගුරුතුමා මේ දවස්වල දී උගැන්වීම වේගවත් කොට, ඔහු කීමට ආශා කළ පරිදි පිම්මක් ඉදිරියට පැන්නේය. ගුරුතුමා නිකීතාට වීජ ගණිතය උගැන්වීම ආරම්භ කළේය. එය ඉතාමත්ම නීරස විෂයයක් බව කිව යුතුය.

අංක ගණිතය හදාරන විට වැදගැම්මකට නැති නොයෙක් දේ ගැන කීව ද ඒවා එක්තරා කුතුහලයක් ඇති කරයි. මැරුණු මීයන් සහිත ජල තටාකවලට පොම්ප තුනකින් ජලය වත්කිරීම පිළිබඳ විස්තරයත්, කොටු අල්ලි සහිත කබායක් හැඳගත් ගිරා හොටක් වැනි නහයක් සහිත මිනිහෙක් කෝපි වර්ග තුනක් මිශ්‍ර කිරීම පිළිබඳ විස්තරයත්, රාත්තල් අවුන්ස ගැන විස්තරයත්, නැතිනම් රෙදි වර්ග දෙකක් විකුණන අවාසනාවන්ත වෙළෙන්දා ගැන විස්තරයත් ආදිය සහිත සිනාව උපදවන දේ අංක ගණිතය පාඩමෙහි දී දැනගත හැකිය. එසේ වතුදු, වීජ ගණිතය එවැන්නක් නොවේ. එහි නිදසුන්, ආදර්ශ කිසිවක් නැතිය. වීජ ගණිතය පාඩම් පොතින් වහනය වන මැලියම් ලාටුවල සුවඳ පමණකි ඉතිරිව ඇත්තේ. ගුරුතුමා නිකීතා වෙත නැමී වීජ ගණිතය සහ එහි නීති රීති විස්තර කරන විට, ඔහුගේ මුහුණ තීන්ත කුප්පියෙන් පිළිබිඹු වුණේ කලගෙඩියක් සේය.

ඉතිහාස පාඩම විස්තර කළ අර්කාදියි ඉවානවිච් ගුරුතුමා ලිපට පිටුපා සිට ගත්තේය. ලිප වටා ඇති පිහන් මැටි සුදු බදාම සහිත බිත්තිය පසු බිම කොට ගත් ඔහුගේ කළු පැහැති කබාය ද, රත් පැහැති යටි රැවුල ද, ඇස් කණ්නාඩිවල රත්තරන් රාමුව ද අපූරු චිත්‍රයක් මවා පෑවේය. ප්‍රැන්ක් රාජ්‍යයේ රජකමට පත් වූ වාමන පිපින් රජු* සුවාසොන්හි දී අසිපත් පහරින් බඳුනක් දෙපළු කළ සැටි ගුරුවරයා විස්තර කළේය. ඔහු වාතය දෙබෑ කරන්නාක් මෙන්, පිපින්ගේ ක්‍රියාව පෙන්වනුවස්, අත්ලෙන් ගැසීය.

"නිකීතා දන ගන්නට ඕන, වාමන පිපින් වැනි අය අධිෂ්ඨාන ශක්තියෙන් සහ නිර්භය චරිත ලක්ෂණයෙන් යුක්ත වූ මිනිසුන් බව. අපේ සමහර අය වගේ නොවෙයි. මේ අය කම්මැලිකමට වැඩවලින් මග හැරියේ නැහැ. ඒ ගොල්ල නිතරම තීන්ත කුඩුව දිහා බැලුවේ නැහැ. 'මට නැහැ, මට මහන්සියි' වැනි ලැජ්ජා සහගත වචන ඒ ගොල්ල දනගෙනවත් හිටියේ නැහැ. විජ ගණිත පාඩම ඉගෙන ගන්නවා වෙනුවට ඒ ගොල්ල කෙස් කැරළි ඇඟිල්ල වටා ඔතමින් හිටියේ නැහැ. අන්න ඒ නිසා තමයි ඒ ගොල්ල අද දක්වාත් අපට නිදසුන් වෙලා තියෙන්නේ..." මෙසේ පැවසූ ගුරුවරයා ඇඟිලිවලින් අල්ලා ගෙන හිටිය පොත ඉහළට එසවීය.

දිවා ආහාරයෙන් ඉක්බිතිව අම්මා ගුරුතුමාට මෙසේ පැවසුවාය:

"අදත් හිම තුෂාරය අංශක විස්සට වැඩි නම් නිකීතාට එළිමහනේ ඇවිදින්ට ඉඩ දෙන්න එපා."

ගුරුතුමා කවුළු වීදුරුව ළඟට විත් එහි ඇති හිම තුෂාර මල් රටාව දියවනුවස් කටින් පිම්බේය. කුඩා වට රවුමක හැඩැති ප්‍රමාණයකට හිම දියවිණි. එවිට කවුළුවට එහා පැත්තෙන් එහි රාමුවට සවි කර ඇති උෂ්ණත්වමාන යන්ත්‍රය දෙස හේ බැලීය.

"අද බිංදුවට පහළින් හිමාංක විසි එකයි දශම පහයි, අලෙක්සාන්ද්‍රා ලියොන්තියෙව්නා."

---

* වාමන පිපින් - (714-768) සමකාලීන යුරෝපා භූමියෙහි මධ්‍යතන යුගයෙහි දී පැවති ප්‍රැන්ක් රාජ්‍යයේ රජකම් කළේය.

"ඔව් ඔව්, මම එය දැනගෙන හිටියා. නිකීතා ගෙදරට වෙලා සෙල්ලම් කරන්න" අම්මා පෙපලාය.

නිකීතා තාත්තතාගේ කාර්යාල කාමරයට ගොස් සමින් කළ කවරයකින් වසා ඇති සෝපාව මත වාඩි වී, පෙනිමොර් කූපර්* ලියූ හාස්කම් සහිත පොත ගෙන කියවන්නට විය.

කාර්යාල කාමරයේ පූර්ණ නිහඬතාවයෙකි. ඒ නිසා කන්වල හඬක් ඇසුණාක් මෙන් විය. තනිවම සෝපාව මත වැතිර සිටින කෙනෙකු එවැනි හඬකට හසු වූ විට, ඉතා අපූරු දේ සිතින් මවා ගත හැකියි. කවුළුවේ වීදුරුවල හිම තට්ටු අතරින්, සුදු පැහැති ආලෝකයක් වැටිණි. නිකීතා කූපර්ගේ නවකතාවෙන් පිටු කීපයක් කියවා, මුලක් හෝ අගක් හෝ නැති හරිත වර්ණ මහා ප්‍රේරි භූමියේ සුළං පහරට හසු වී, වැනෙන තළපත් අතරින්, හොම්බ සතුටින් දිගු කරගෙන දුවන මුස්ටාන්ග් නැමැති වන අශ්වයනුත්, කොර්දිලියේර කඳු පද්ධතින්, රූරා ගලා බසින දිය ඇල්ලකට ඉහළින් ගුරොන් නැමැති රතු ඉන්දියානු ගෝත්‍රිකයන්ගේ නායකයා, පිහාටු සහිත හිස් වැස්මක් පැළඳගෙන, අවියක් අතින් ගෙන, කඳු මුදුනෙක ගල්මුවා පිළිමයක් සේ සිටින සැටිත් නිකීතා මනැසින් දිටීය. ඒ අතර මහ වනය මැද යෝධමය ගසක් මුල ගල් කැටයක් උඩ තමා වාඩි වී සිටින සැටි නිකීතාට දැනෙයි. ඔහු තිකටට අත තබාගෙනය. ඔහුගේ දෙපා මුල ගිනි මැලයෙකි. වනය අවට නිහඬතාවයකි. දෙකන්වලට වැදෙන මුදු පවන ද දැනෙයි. වංචාකාරී ලෙස ලීලාාව පැහැර ගෙන ගොස් ඇති බැවිනි, නිකීතා මෙහි විත් සිටින්නේ. ඔහු ලීලාාා කීපවරක්ම මුදා ගත්තේය. ඒ සඳහා ඔහු කළ වික්‍රමයන්ගේ නායකයා මරා දමුව ද, ඔහු යළි, යළිත් උපන්නේය. ඔහු යළිත් එම කන්ද මත සිට ගත්තේය. නිකීතා ලීලාාව කොතරම් වාරයක් මුදාගත්ත ද, ඇය සඳහටම මුදා ගැනීමට ඔහු අසමත් විය...

ශීත දවස්වල දී යම්තම් ඇවිදීමට අම්මා නිකීතාට අවසර දුන් විට ඔහු ගෙවත්තේ තනිවම ඇවිද්දේය. ඉස්සර මෙන් මිසිකාත් සමග සෙල්ලම් කිරීම දැන් සතුටක් නොදෙයි. මිෂ්කා ද දැන් මෙහෙකරුවන්ගේ

---

* පෙනිමොර් කූපර් (1789-1851) - ඇමරිකන් ගත්කරුවෙකි. ත්‍රාසය දනවන නවකතා පෙළක්ම ලියුවේය. මෙහි ප්‍රධාන වීරයා නෙට් බම්පෝ ය. ඔහුගේ ආරූඪ නාමය සම් පාද ජලාව ය. අනික් වීරයා ඇමරිකන් ඉන්දියානුවෙක් වන චින්ගාච්ගුක් (මහා නාගයා) ය.

කාමරවලට වී, සුදු සෙල්ලම් කරයි. පැරදුණු විට හිසකෙස් වැටියෙන් අල්ලා ඇදීමට ඉඩ දෙයි. නිකීතා ළිඳ ළඟට විත් කල්පනා කළේය. ලීලාගේ හිස බැඳි පීත්ත පටිය ජනේලයෙන් පෙනුණේ ඔහු මෙතැන සිටින විට දීය. දැන් එම ජනේලය හිස්ය, පාළුය. ෂරොක් සහ කතොක් නැමැති බල්ලන් දෙදෙනා ලැග සිටින රිය මඩුව අසල හිමට යට වී තිබුණු කුරුළු මළ කුණක් උහු ගොඩ ගත්තෝය. ලීලා අසලට වී සිටියේ ද මේ කුරුල්ලාය. "නිකීතා බලන්නකො, මේ කුරුල්ලා මැරිලා. මට නම් මහ ලොකු දුකක්"යැයි ලීලා කී සැටි ඔහුට මතක් විය. නිකීතා කුරුළු කුණ බල්ලන්ගෙන් උදුරාගෙන ඈතට ගෙන ගොස් වළලා දැමීය.

ජලාශය අසලින් ගමන් කළ නිකීතාට නත්තල් නිවාඩු සමය මතක් විය. නත්තල් ගහ වටා පැවැත් වූ උත්සවයට පසුව ඔහු ගමේ ළමයින් කැටුව ගිය සැටිත්, ආපසු එන විට සඳ පහන නිසා ඔහුගේ සෙවණැල්ල වැටී තිබුණු සැටිත් ඔහුට මතක් විය. එදා ඔහු තමාට සිදු වූ දේ ගැන එතරම් අඩුවෙන් සැළකුවේ මන්ද? එදා දෙනෙත් වසාගෙන හඟින්නට තිබුණි - එදා කොතරම් ලොකු සැපතක් ඔහුට තිබුණේද. එහෙත් දැන් මුහුණට ඉදිකටු තුඩුවලින් අනින්නාක් වැනි සුළඟත්, පොකුණ මත ගොඩ ගැසී ඇති අයිස් ගොඩැල්ලත් පමණකි. එදා ඔහුත් ලීලාත් ඒ ගොඩැල්ලේ සිට පහළට රූටමින් සෙල්ලම් කළ සැටි ඔහුට මතක් වේ. එදා ලීලා නිහඬව දෙනෙත් වසාගෙන පහළට රූටන හිම යානයට නැගී ගෙන රූටන්නට වූවාය. අද එහි සේයා පවා නැත.

පැල්පත්වල පිදුරු වහළ තරම්ම උසැති හිම ගොඩැලි මත නැගී නිකීතා ගමන් කළේය. මෙතැන සිට සුදෝසුදු හිමෙන් වැසුණු සමතලා කුඹුරු මීදුම සහිත හිම කතර ඈතට විහිද ගොස් අහස වැළඳ ගන්නා සැටි ද පෙනේ. හඬ නගමින් හිම කුණාටුව හමන්නට විය. ඔහු හැඳ සිටි බැටළු සමින් කළ හිම කබායේ වාටි සුළඟට ලෙළදිණි. ගොඩැල්ලට තවත් හිම වැටෙයි. හිටගෙන මේ හිම කතර දෙස බැලීමට තමාට සිත් දෙන්නේ මන්දැයි ඔහුටම නොවැටහෙයි.

නිකීතා පාළු ගතියෙකින් පෙළෙන සැටි දුටු අම්මා ඒ ගැන ඔහුගේ ගුරුවරයාට දැන්වූවාය. නිකීතාගේ වීජ ගණිත පාඩම් නැවැත්වීමටත්, වේලාසනින් ඔහු නින්දට යැවීමටත් අම්මා සහ ගුරුවරයා තීරණය කොට, ගුරුවරයා එතරම් නුවණට හුරු නොවන සේ,

නිකීතාට එඩරු තෙල් 'පෙවීමක්' ගැනත් පැවසීය.

මේ සියලු පියවරයන් ගන්නා ලදී ගුරුවරයාගේ නිරීක්ෂණය අනුව නිකීතාගේ තත්ත්වය යහපත් විය. එහෙත් ඔහු පුවකරන සැබෑ බෙහෙත ආවේ සති තුනකට ඉක්බිතිවය. මහ ගෙදරත්, ගෙවත්තත්, කුඹුරුත් අළු පැහැති මීදුමකින් වසා ගන්නා තෙතමනය සහිත බලවත් දකුණුදිග සුළඟකි. කැබැලිවලට කැඩී අහසේ පාවෙන වලාකුළුත් සමග එය පැමිණියේය.

## ලිහිණියෝ

ඉරිදා මෙහෙකරුවන්ගේ කාමරයකට රැස් වූ කම්කරුවකු වන වසීලි, මිෂ්කා, එඬේර කොල්ලකු වන ල්යොක්සා සහ බොහෝ උසැති, කුඩු මිනිහකු වූ අර්ත්යොම් එක් වී කාඩ් සේලම් කළෝය. දිගැති කැඩුණු නහයක් සහිත අර්ත්යොම් අශ්වයකු පවා නැති කුලී ගොවියෙකි. ඔහු විවාහයක් කර ගැනීමට ආශා කළ ද එකද තරුණියක්වත් ඔහුගේ අඹුව වීමට කැමැති නොවූහ. මේ ළඟ දී අර්ත්යොම් මහ ගෙදර කිරි දොවන රත් පැහැති ලස්සන කෙල්ලකු වන දුන්යාෂා දෙස බලන්නට වූයේය. ඈ මුළු දවස තිස්සේම ගව පට්ටියේ සිට බිම් ගෙයටත්, මුළු තැන් ගෙටත් දුවමින් බෙලෙක් භාජන අතින් ගෙන වැඩ කරන්නට වූවාය. ඇය වෙතින් ප්‍රණීත කිරි පුසුඹ වහනය විය. හිම වැටෙන විට ඇගේ දෙකොපුල්වල හිම පියළි තිබෙන සැටියෙක් පෙනෙන්නට විය. ඕ විහිළු ගති ඇති තරුණියක් වූවාය. අර්ත්යොම් කිනම් වැඩෙක යෙදී සිටියද, දුන්යාෂා දුටු විගස ඒවා සියල්ල පසෙක තබා, අත ඇති උදැල්ල පසෙක තබා, ඔටුවකු සේ දිගැති පාද තබමින් ඇය වෙත පැමිණෙයි. ඇයට උඩු කය නමා ආචාර කරයි:

"ආයුබෝවන් දුන්යා"

"ආයුබෝවන්" යැයි දුන්යාෂා ද පිළිතුරු දෙන්නේ කිරි සහිත බාල්දිය බිම තබා ඒප්‍රනයෙන් කට වසා ගත්තාය.

"දුන්යා ඔයා හැම තැනම දුවන්නේ කිරි දොවන්නද?"

එවිට දුන්යාෂා දණ නමා හොඳටම සිනාසී අයිස්වලින් වැසී ඇති අඩි පාර දිගේ දුවගොස් හිම ගොඩ හරහා බිම් ගෙයට වැදී, කිරි

සහිත බාල්දිය එහි තබා යතුරු බාර මෙහෙකාරිය වන වසිලිස්සා අමතා ඉක්මණින් මෙසේ පැවසුවාය:

"ඔවුවා ආයෙමත් මගෙන් ඉල්ලා හිටිනවා, එයත් සමග විවාහ වෙන්නැයි කියලා. අනේ අම්මේ පණ යන වැඩක්!" ඈ හඬ නගා කොතරම් හයියෙන් සිනාසුණේ ද යත්, ගෙවත්ත පුරාම එය රැව්දිණි.

තිකීතා මෙහෙකරුවන්ගේ කාමර පෙළට ආවේය. අද ඔවුන්ට බැටළු ඔළු සහිත ව්‍යංජනයක් පිළියෙළ කරලාය. බැටළු ඔළු ව්‍යංජනය සහ [illegible] දුන් පිළිස්සූ පාන් සුවඳ ඉමහත් සතුටක් ගෙන දෙයි. දොර අසල කෙක්කකින් එල්ලන ලද මැටි මුවා කේතලයෙකි. එය අත් සේදීම සඳහාය. ලිප ළඟ වූ බංකුව මත පහෝම් වඩුරාළ වාඩි වී සිටී. ලප සහිත ඔහුගේ නළලට කළු පැහැති හිසකේ රොදක් වැටී ඇත. ඔහුගේ මුහුණෙන් රොස් බවක් පළවිය. ඔහු ඔහුගේ සපත්තුවට අණ්ඩයක් මසමින් සිටියේය. ඔහු සපත්තු මහන ලොකු ඉදිකටුවෙන් පරෙස්සම් සහිතව හම සිදුරු කර සපත්තුවේ දණහිස දක්වා දිගැති කොටස සිය දණහිස්වලට තබා තද කොට ගෙන මහන්නට විය. ඒ අතර ඔහු යටැසින් තිකීතා දෙස බැලුවේත් රොස් ගතියෙකිනි. අද පහෝම් වඩුරාළ කුස්සි අම්මාට ද බැණ වැදුණේය. බූට්ස් වැනි දණහිස දක්වා දිගැති සපත්තු අදින විට මේස් වෙනුවට භාවිතා කරන රෙදි පටි කුස්සියේ ගිනි මැලයට උඩින් වේලෙන්ට දමූ විට, කුස්සි අම්මාගේ නොසැලකිල්ල නිසා එකකට ගිනි ඇවිලීම වඩුරාළගේ කෝපයට හේතු විය.

ලොකු මේසය වටා ගෙදර මෙහෙකරුවන් වාඩි වී සිටියේ ඉරිදාට අදින පවිත්‍ර කබා ඇඟලා ගෙනය. ඔවුහු තෙල් ගා හිස පීරා ගෙන සිටියෝය. අර්ත්යොම් පමණක් ඉරුණු ගොවි කමිසයක් ඇඟලා සිටියේය. හේ අවාසනාවන්තයෙකි. ඔහු රැක බලා ගැනීමට ද, ඔහුගේ රෙදි සෝදා දීමට ද කිසිවෙක් නොසිටියහ. කාඩ් සෙල්ලම් කළ ඔවුහු හඬ නගා කාඩ් ඇනූහ.

"නුඹ පරද්දන්ට දහයක් ඔට්ටුයි."

"නුඹ පරද්දන්ට තවත් පණහක් ඔට්ටුයි."

"ඔන්න බලාපන්" එකෙක් තුරුම්පුවක් පෙන්වීය.

"ඉඳා මේ බලාපන් තුරුම්පු ගොඩ."

"ඉවරයි."

"අනේ!"

"ඉතින් අර්ත්යොව් ගුටි කාපන්!"

"ගුටි කන්නේ මොකටද? හරි නැහැ. ඔතන වැරැද්දක්." මවිතව කාඩ් දෙස බැලූ අර්ත්යොම් පැවසීය.

"නහය දික් කරපිය!"

අර්ත්යොම් කාඩ් දෙකක් ගෙන ඒවායින් දෙනෙත් වසා ගත්තේය.

කාඩ් තුනක් එකට ගොනු කරගත් වසීලි එහි කොණක් ගස්සවමින් අර්ත්යොම්ගේ දිගැති නහයට පහර දුන්නේය. අතික් අය පහරවල් ගණන් කරමින් අර්ත්යොම් සෙළෙවෙන්නේ නැතිව සිටිය යුතු යැයි කියමින් කෑ ගැසූහ.

තිකීතා කාඩ් සෙල්ලම් කිරීමට වාඩි වී පැරදුණෙන් නහයට කාඩ් "ටොකු" පහළොවක් කෑවේය. ඒ වේලාවේ දී සපත්තුව සහ උපකරණ පසෙක තැබූ වඩුරාළ දැඩි ලෙස මෙසේ පැවසීය:

"අද්‍ද පල්ලියෙ දේව මෙහෙයට ගිහින් එන්නට ඕන. නමුත් මේ ඔලු ගෙඩි ටික මෙතනට වෙලා සූදු කෙළිනවා. මේ පාස්කු කාලෙ තහනම් කරපු කෑම කන්න විතරක් බඩජහරිකමට බලාගෙන ඉන්නවා..." මෙසේ කී ඔහු කුස්සි අම්මාට ඇසෙන සේ කෑගැසීය: "ස්තෙපනීදා, කෑම සූදානම් කරපන්!" වඩුරාළ නැගිට අත් සේදීමට ගියේය.

කුස්සියේ ස්තෙපනීදා කුස්සි අම්මා බියවූවා ඇගේ අත තිබූ

යකඩ පියන බිම වැටිණි. මෙහෙකරුවෝ කාඩි කුට්ටම පසෙක තැබූහ. වසීලි බිත්තියේ අලවා තිබූ දේව රූපය සහිත පින්තූරය දෙස බලා හතික කුරුසියේ ලකුණ ඇඳ ගත්තේය. එම පින්තූරයෙහි කැරපොත්තන්ගේ පා සටහන් දක්නට තිබිණි.

ස්තෙපනීදා බැටළු ඔළු සහිත ව්‍යංජනය ලී බඳුනකට දමා ගෙන ආවාය. එම ව්‍යංජනයෙන් හුමාලයක් පිට විය. මෙහෙකරුවෝ නිහඬව බැරෑරුම් ලෙස තම හැඳිත් රැගෙන මේසයට වාඩි වූහ. වසීලි දිගැති පාන් කැලි කපා එක් එක් කෙනෙකුට කැල්ලක් බැගින් දී හැඳි මිටෙන් මේසයට ගසත්ම ආහාර ගැනීම ආරම්භ විය. බැටළු ඔළු දමා සෑදූ ව්‍යංජනය රසය!

පහෝම් වඩුරාළ මේසයට වාඩි නොවී, ඔහුට අයත් පාන් කැල්ල රැගෙන ලිප අසල බංකුව මත වාඩි විය. එවිට ඔහුට ස්තෙපනීදා තැම්බූ අර්තාපල් සහ ලුනු කුඩු ගෙනැවිත් දුන්නාය. ඔහු පාස්කු සමය තුළ දී පල්ලියේ අණ පරිදි මස් සහ කිරි ආහාර නොගත්තේය.

ඇඟිලි තුඩුවලින් අර්තාපල් ගෙඩියක් ගත් පහෝම් එය ලුණු කුඩුවලට ඔබා, යළිත් ස්තෙපනීදාට බණින්ට විය: "මගේ කකුලට ඔතන සපත්තු පටි නුඹ පුච්චල දැම්මා. නුඹ ගොඩේ අම්මණ්ඩි කෙනෙක්, හැබෑ මෝඩියෙක්!"

නිකීතා මෙහෙකරුවන්ගේ කාමරවලින් පිටතට පැමිණියේය. එදින මීදුම් සහිත දවසකි. තෙතමනය මුසු සුළං හමන්නට විය. හිම කැට ගොම ගොඩ මත වැටෙත්ම ඒවා කහ පැහැයක් ගත්තේය. පිටිය හරහා සාදා ඇති එය මාර්ගය හිම ගොඩට වඩා උසය. ගස් කඳන්වලින් සාදා ඇති ගෙවැටවල් ද, දුර්වර්ණ වූ පිදුරු වහලවල් ද, නග්න තුරු අතු ද, තීන්ත නොගාන ලද ලී මුවා මහ ගෙදර ද යන මේ හැම දෙයක්ම අළු පැහැතිය, කළු පැහැතිය, වෙන් වී පෙනිණි.

නිකීතා ජලාශය වෙත ගියේය. තෙතමනයට හසු වී ඇති තුරු අතු නගන හඬ ඈතට චුව ඇසෙයි. එය ජලාශය තුළ ගලා බසින හඬ සමාන වේ. වෙත්ලා ගස්වල මුදුන් සුළඟට හසුව වැනෙයි. ඒ තුරු මුදුන් වළාකුළු සමග එතුනාක් මෙනි. සිහිති අතු සුළඟට අසුව පාවෙන්නට විය.

කළු පැහැති කුරුල්ලෝ ඉමහත් බියෙකින් යුතුව හඬ නැගූහ.

නිකීතා හිස ඔසවා ගෙන කට හැරගෙන බලා සිටියේය. ඒ කුරුල්ලන් තෙතමනය මුසු මීදුම සහිත කුණාටුවෙන් පැමිණියාක් මෙනි. කළු වළාකුළු සමග පාවී ආ උන් වැනෙන වෙත්ලා තුරු මුදුන්වල පැටළුණු සැටියෙකි. උහු අපැහැදිලි, බියජනක, ප්‍රීතිමත් යමක් ගැන කෑගැසූහ. නිකීතා අතිමහත් ලෙස මවිත විය. ඔහුගේ හදවත ගැස්සිණි.

වසන්තය ආරම්භයේ දී හමන ප්‍රථම කුණාටුවත් සමග පැමිණි ලිහිණියෝය, ඒ. උහු බිඳුණු කුරුළු කූඩු සොයා පැරණි ස්ථානවලට විත් සිටිති. වසන්තය එළැඹියේය.

## රෝද සහිත පුංචි ගෙදර

දවස් තුනක් තිස්සේම තෙතමනය සහිත සුළං හමන්නට විය. අවට වාතයෙන් හිම, ගොම සහ ගවයින්ගේ සුවඳ වහනය විය. හරක් පට්ටියේ දොර හැරිය විට උහු තෙරපෙමින් හඬ නගමින්, ශබ්ද කරමින් ළිඳ ළඟට ආවෝය. බයාන් නමින් හඳුන්වන හරකා වසන්තයේ සුළං ඉව අල්ලමින් බියජනක ලෙස හඬ නැගීය. මිෂ්කා සහ ල්යෝක්සා කස දෙකකින් ඌට පහර දෙමින් ඌ යළිත් හරක් පට්ටිය තුළට එළවා දැමීමට යමතමින් සමත් වූහ. අශ්ව ගාලේ දොර හැරිය විට අශ්වයින් පිටතට දුවගෙන ආවේ නිදිමත ගතියෙකිනි, වෙරි වූ විටෙක මෙනි. උන්ගේ ලොම් කළු පැහැගෙන රළු ගැසී තිබිණි. උන්ගේ ග්‍රීව කිලිටිය, පහතට නැමිලාය. උන්ගේ උදර පිරිලාය. වේස්තා නැමැති වෙළඹ අශ්ව ගාලට යාබද කොටුවෙක පැටව් ගසලාය. තෝරුම් රහිතව සහ ඉක්මන් වෙමින්, තෙමුණු ලිහිණියෝ කෑගසමින් පියෑඹුවෝය. බිම්ගෙයට පසුපසින් පිහිටි කොටසේ මෙතෙක් හිමවලට යටවී තිබුණු කුඩා සතුන්ගේ හා පණුවන්ගේ මළ කුණු අවුස්සා කන කපුටුවෝ ඒ මේ අත පැන්නාහ. තුරුලතා බිය දනවන හඬක් නංවමින් වැතිණි. ජලාශයට එහා වේත්ලා ගස් මුදුන්වල සිටි, කළු පැහැති වළාකුළු සමග පියෑඹූ ලිහිණියෝ හඬ නැගූහ.

මේ දවස්වල දී නිකීතා හිසරදයෙන් පෙළෙන්නට විය. නිදිබර සහ තැතිගත් ගතියකින් පසු වූ ඔහු ගෙවත්ත පුරා ඇවිදින්නට විය. දිය වූ හිම සහ තෙතමනය නිසා පිම්බී ඇති මාර්ග ඔස්සේ, කමත දක්වා ඔහු

ගියේය. එහි ධාන්‍ය පොතු සහ තිරුඟු පිටිවල සුවඳක් ද, මීයන් අධික වූ විට ඇතිවන ගඳක් ද වහනය විය. මේ දැන්-දැන් යම්කිසි බියජනක දෙයක් සිදුවෙතියි යන අපැහැදිලි හැඟීමෙකින් නිකීතා පෙළෙයි. එය පසක් කැර ගැනීමට හෝ එයට සමාවදීමට හෝ ඔහුට නොහැකිය. මීට පෙර ඔහු අවබෝධ කරගත්, ඔහුට කිට්ටු දේ වූ මහ පොළොව, සතුන්, ගවයින්, කුරුල්ලන් ඔහුට පිටස්තර, සතුරු සහ දුෂ්ට කොටස් ලෙස ඔහු සළකයි. පසක් කර ගත නොහැකි දෙයක්, පාපතර යමක් මේ දැන් සිදුවනු ඇත, එය වළක්වාලීමට නොහැකිය. එසේවතුදු ඔහුගේ මේ නිදිමත ගතියත් සතුන්ගේ මළකුණු, අශ්වයින්ගේ කුර, ගොම, ජරාපත් හිම ආදිය නිසා මත් වූ ගතියකින් සිටීමත් විසින් ඔහු කුතුහලයෙකින් පෙළෙන්නට වූයෙන්, හැම දෙයක් වෙතටම ඉබේ ඇදී ගියේය.

තෙමී ගෙදර ආ නිකීතා දෙස ඔහුගේ අම්මා අවධානයෙකින් යුතුවත්, එමෙන්ම සෙනෙහසකින් තොරවත් බැලුවාය. එම බැල්මෙහි යම් කිසි හෙළාදකීමේ ස්වභාවයක් පෙනෙන්ට තිබිණි. අම්මා ඔහු කෙරෙහි කෝප වී සිටින්නේ කිනම් හේතුවක් නිසාද යන්න නොදත් ඔහුගේ තෝන්තු ගතිය එයින් තවත් අධික විය. මේ දවස්වල දී ඔහු කිසිඳු දහකාරී ක්‍රියාවක් නොකළද, ඔහුගේ සිත කිසියම් බියෙකින් වෙළී පැවතිනි. ලෝකයේ සියලු දේ පටන් ගන්නා යම්කිසි අපරාධයකට කිසිම හේතුවක් නොමැතිව ඔහුත් පංගුකාරයකු බවක් ඔහුට හැඟිණි.

පිදුරු ගොඩට සුළං හමන දිසාවෙන් නිකීතා ගමන් කළේය. සරත් සමයේ අවසාන කාලයේ දී තිරිඟු කරල්වල ඉතිරි ටික කොටා ගැනීම සඳහා මෙහෙකරුවන් සහ මෙහෙකාරියන් පිදුරු ගැනීම නිසා ඒ විශාල පිදුරු වටා වළ-සිදුරු කීපයක් ගැසී තිබිණි. ගිම්හාන කාලයේ දී මෙවැනි තැන්වලට වැද නිදාගැනීම සිරිතකි. උණුසුම සහ සුවඳැති ඒ පිදුරු ගොඩෙන් අඳුරෙහි දී ඇසුණු කතා ඔහුට මතක් විය. ඔහු පිදුරු ගොඩ සැලකුවේ බියජනක දෙයක් ලෙසිනි.

කමතට නුදුරින් තිබෙන රෝද සවිකර ඇති කුඩා නිවාසය වෙත ඔහු ළං විය. ඉස්සර එහි කෘෂිකාර්මික උපකරණ ගොඩ ගසා තිබිණි. එහි දොර එකම ගැටයකට හසුව පහත් හඬක් නංවයි. දැන් එය පාළුය. නිකීතා ලී මුවා පිය ගැට පෙළ නැග පාළු කුඩා ගෙයට ඇතුළු විය. එහි එක් කුඩා කවුළුවකි. එය හතරට බෙදන ලද වීදුරු පියනකින් වසලාය.

ගෙතුළ හිම කැටි තිබිණි. පියස්ස යට ලී බිත්තියෙහි ඇති රාක්කයෙක, ඉකුත් සරත් සමයෙහි දී එහි දමාගිය දිරාපත්වුණු ලී හැන්දක් තිබිණි. හිස් වූ තෙල් බෝතලයක් ද, පිහි මිටක් ද එය අසළ විය. වහළට ඉහළින් සුළං හඬ නැංවීය. නිකීතා මේ ගෙතුළට වැද ක්ලපනාවෙහි නිමග්න විය. ඔහු දැන් මේ ලෝකයේ තනි වී සිටී. ඔහුට කිසිවෙක් ආදරය නොකරති. හැම දෙනෙක්ම ඔහු කෙරෙහි තරහ වී සිටිති. ඔහුගේ දෙනෙත කඳුලින් පිරුණු අතර ඔහුට දුකක් දැනිණි. සත්තකින්ම, කුටියක් වැනි මෙම පාළු ලී මඩුවේ ඔහු තනිවෙලාය.

"අහෝ දෙවියනි"යි නිකීතා පවසත්ම ඔහුගේ පිටි කොන්ද දිගේ කඩි කුහුඹුවන් නගින්නාක් සේ ඔහුට දැනිණි. "අනේ දෙවියනි, ආයෙමත් හැම දෙයක්ම හොඳින් සිදුවන ලෙස සලස්වන්න. අම්මා මට ආදරය කිරීමටත්, මගේ ගුරුතුමාට මා කීකරු වීමටත් සලස්වන්න... හිරු පායා තණ පඳුරු වැඩීමට සලස්වන්න... ලිහිණියන් මෙතරම් බියකරු ලෙස හඬ නැංවීම නවත්වන්න... බයාන් නැමැති හරකාගේ බියජනක හඬ නැගීම නවත්වන්න... අනේ දෙවියනි, යළිත් මට සැනසීම ලබා දෙන්න..."

නිකීතා මෙලෙස දෙවියන් යැදුවේ අඩක් දණ නමා ගෙන ඉක්මණින් කුරුසියේ ලකුණ ඇඳ ගනිමිනි. ඔහු නිහඬ වී, අනතුරුව හිස් බෝතලය, දිරාපත්වුණු ලී හැන්ද, පිහි මිට දෙස බැලීය. සැබවින්ම ඔහුට ලෙහෙසියක් දැනුණාක් මෙනි. ඔහු තවත් ස්වල්ප වේලාවක් ඒ ඉතා කුඩා කවාටය සහිත ලී ගෙදර නැවතී සිට සිය නිවෙස බලා ගමන් කළේය.

සැබවින්ම කුඩා ගෙය ඔහුට පිහිට විය. ඔහු හිම කබාය ගළවා අම්මා සමීපයෙන් යත්ම ඕ වෙනදා මෙන්ම සැලකිල්ලෙන් ඔහු දෙස බැලුවාය. ඇගේ විශාල අළු පැහැති දෙනෙත්වල දැඩි ගතියකුත් තිබුණ ද, ඕ හිටි හැටියේම සෙනෙහසින් ඔහු දෙස බලා ඔහුගේ හිස අත ගා මෙසේ ඇසුවාය:

"ඉතින් පුතා හැම තැනම දිව්වද? පුතාට තේ ඕනද?"

## තාත්තාගේ පැමිණීම

මහ රෑ මොර සූරන වැස්සක් පතිත විය. එය ටකරන් වහළට වැටුණේ මහා ශබ්දයක් ඇති කරමිනි. අවදි වූ නිකීතා ඇඳෙහි වාඩි වී මඳ

සිනා පාන්නට විය.

මහ රෑ වසින වැස්ස අපූරු හඬක් ඇති කරයි. "නිදන්න, නිදන්න!" යැයි කියන්නාක් මෙන් වැහි බිංදු කවුළු වීදුරුවලට තට්ටු කරන්නට විය. සුළං නිවෙස ඉදිරියේ හඬ නගමින් පෙරළි කළේය.

කොට්ටයේ ශීතල පැත්ත උඩු අතට හැරවූ නිකීතා යළිත් වැතිර ගනිමින්, ගොතන ලද පොරෝනය හිස සිට දෙපතුල දක්වා පොරවා ගනිමින් හරි-බරි ගැහී මුමුණන්නට විය. "හැම දෙයක්ම ඉතාම, ඉතාම හොඳට සිද්ද වේවි!" නිදි දෙව්දුවගේ පහස ලබත්ම ඔහු උණුසුමැති වළාකුළු මත පාවෙන්නට විය.

උදෑසන වැසි තුරල් වී තිබුණ ද, දකුණේ සිට උතුරට පාවී යන කළු වළාකුළු වලින් අහස පිරී පැවතිණි. නිකීතා කවුළුවෙන් පිටත බලා විමතියට පත්විය. වත්ත පුරා තිබුණු හිම කැට් දිය වී ගොසිණි. ගෙවත්ත පුරා වතුර වළවල් ඔස්සේ රිය රෝද සහ හිම යානාවල පැල්ලම් සහිත මාර්ග සටහන් නොමැකී ඇත. තොපල් තුරවල දම් පැහැති ලා දලු සුළඟට වැනෙන්නේ සතුට මුසු බවක් අඟවමිනි. අහසේ දකුණු දිග සිට ඉතා දීප්තිමත් නිල් පැහැයෙකින් යුත් අහස් තීරුවක් වළාකුළු මැත් කෙරෙමින් මහ ගෙදරට ඉහළින් පෙනිණි.

උදේ තේ බී අවසාන වූ ඉක්බිතිව අම්මා ඉමහත් කලබලයෙකින් හා නොසන්සුන් තාවයෙකින් ජනේලයෙන් පිටත බලන්නට වූවාය.

"බලන්නකො දවස් පහක් තිස්සේ තැපැල් නැහැ නොව.. මට නම් කිසිම දෙයක් තේරුම් ගන්ට බැහැ. ඔන්න වසන්තය නිසා හිම දියවෙලා පාර තොට සියල්ලම පිරිලා. දැන් ඉතින් සුමාන දෙකක් යනතුරු පාරවල් සේරම වතුරට යට වෙලා. මදෑ වෙච්ච දෙයක හැටි." ඕ ගුරුතුමා දෙස බලා පැවසුවාය.

අම්මා එයින් අදහස් කළේ තාත්තා ගැන බව නිකීතාට වැටහිණි. තාත්තා, දැන් දැන් එතියි හැම දෙනෙක්ම බලාපොරොත්තු වී සිටියහ. තැපැල් ගෙන ඒම සඳහා අසරුවකු යැවීමට පුළුවන්ද? යන්න දැන ගැනීමට ගිය ගුරුතුමා වහාම යළිත් ආහාර ගන්නා කාමරයට විත්

යම්කිසි විශේෂ උස් හඬෙකින් කතා කළේය:

"මහත්වරුනි, අර බලන්න!... වතුර හෝ ගා හඬ නගමින් බැස යන සැටි බලන්න."

නිකීතා දොර ඇරියේය. ගලා බසින ජලයේ වාෂ්ප නිසා තියුණු සහ පවිත්‍ර ගතියක් ලැබූ වාතය ගෙතුළට වැදිණි. දියවන හිම කැට ජලය බවට පත් වී කුඩා අගල් සහ දිය පාර ඔස්සේ අගාධය දක්වා හඬ නගමින් බැස යන්නට විය. එතැන් සිට වසන්ත ජලය ගංගාව දක්වා ගලා ගියේය. ඉවුරු අභිබවා නැගී සිටි ගංගා ජලය අයිස් ගොඩවල් කරකවයි! එම ජලයෙහි තණ පඳුරු පාවෙයි. ගංගා ජලය ජලාශයටත් ඉහලින් ගලා ගොස් අගාධයට වැටිණි.

මහ ගෙදරට ඉහළින් ඇති වූ දීප්තිමත් නිල් පැහැති ලපය සියලු වළාකුළු පන්නා දමා අහස පවිත්‍ර කළේය. අහස නිල් පැහැතිය, ශීතලය, සීමා රහිතය. ගලා බසින ජලයෙහිත්, වතුර වළවලත් හිරු රැස් දිලිසෙන්නට විය. අති විශාල පොකුණ සහ ජලය ගලා බසින ආගාධය හිරු පිළිබිඹු කළෝය.

ලොමින් ගෙත්තම් කළ සාළුව පපුවට තද කරගත් අම්මා "අනේ දෙවියනේ, වාතය කොතරම් ප්‍රණීතද?"යි පැවසුවාය. ඇගේ මුහුණේ මඳ සිනාවෙකි. ඇගේ අළු පැහැති දෙනෙත්වල කොළ පැහැයට හුරු ගිනි පුපුරුය. අම්මා මඳ සිනා පාන විට, මෙලොව ඇති ඉතාම ලස්සන කාන්තාව බවට ඇය පත් වන්නීය.

නිකීතා ගෙවත්ත වටේට ඇවිද්දේ හිම දියවන සැටිත්, වතුර බැස යන සැටිත් බැලීමටය. හැම තැනින්ම කුඩා දිය පාරවල් බැස යන්නට විය. තැන, තැන අළු පැහැති කුඩා හිම ගොඩවල්ය. බොල් ගැසුණු හිම කැටි පයට පැගී බිඳිණි. කොහේ ගියත් හැම තැනම ජලය තිබුණු බැවින් මහ ගෙදර ජලයෙන් වට වූ කුඩා දූපතක් බඳු විය. උස් බිමක ඇති යකඩ කම්මලට යාමට නිකීතා සමත් විය. එතැන් සිට ඔහු පල්ලම දිගේ ආගාධය වෙත දිව ගියේය. ඉකුත් වසරේ සිට ගොඩ ගැසුණු තණ පඳුරුත් සමග හිම සහිත පිරිසිදු ජලය ප්‍රණීත සුවඳක් අවට විහිදුවමින් ගලා බසින්නට විය. පිරිසිදු ජලය දෝතට ගත් ඔහු එය

පානය කළේය.

ඈත ආගාධය අසල කහ සහ තිල් පැහැති ලප සහිත හිම කැට් ඉතිරිව තිබිණි. ගලා බසින වරෙක ඒවා කපා ගෙන දිය පාරක් සාදා ගනී. තවත් වරෙක එය හිම තට්ටුවට උඩින් පාවෙයි. එයට "නස්ලුස්" යැයි කියති. එවන් ජල පහරකට අසරුවෙක් අසුවුවහොත් අශ්වයාටත්, අසරුවාටත් දෙවියන්ගේ පිහිට තමයි! වසන්ත ජලයෙන් පිරි වළවලට වැද පීනන්නට ඇත්නම් කෙතරම් හොඳදැයි සිතමින් තිකීතා ගලා බසින ජලය අසලින් වූ තණ බිස්ස මත ඇවිද්දේය. වසන්තයේ මඳ පවන විසින් කුඩා මුදු මෙන් රැළි ඇති කර තිබෙන ජලයෙන් පොකුණ පිරිලාය. හිරු රැස් නිසා එහි ජලය රිදී කඳක් මෙන් දිලිසෙයි. පොකුණට බැස නෑමට ද ඔහුට සිත් විය.

පොකුණේ අතික් ඉවුරෙහි පිහිටි සමතලා බිමෙහි ජල පහර ගලා බසී. සමහර දිය කඩිති දම් පාටට හුරුය. අනිත් තැන්වල තවමත් හිම කැට්වල නටබුන් පෙනෙයි. ඈත පිටිය හරහා සැදැල රහිත අශ්වයින් පිට නැග ගත් අසරුවෝ පස් දෙනෙකි. ඉදිරියෙන් ගමන් කරන අසරුවා සිය සගයින් දෙසට හැරී යමක් කියා, කෑගැසීය. ඔහු අත ඇති ලනු පොට සෙළවීය. අළු පැහැති අශ්වයා අර්තමොන්ට අයත් බව තිකීතා හඳුනා ගත්තේය. අන්තිමට ගමන් ගත් අසරුවා රිටක් උරෙන් ගෙන සිටියේය. අසරුවෝ අගාධවලට ඈතින් සහ එහා ගංඉවුරේ පිහිටි හොම්යකොව්කා ගම දෙසට ගමන් ගත්හ. මාර්ග රහිත ජලයෙන් පිරි බිමෙහි අසුන් පැන්නීම ඉතා අපූරු දෙයක් විය.

තිකීතා පහළ පිහිටි පොකුණ දක්වා ආවේය. එතැන කහ පැහැති හිම ගොඩට උඩින් ජල කඳ පෙණ දමමින් අගාධයට වැටිණි. පොකුණ වසා තිබුණු අයිස් තට්ටු මත වැටුණු ජලය කුඩා රැළි ඇති කළේය. වම් පසින් වේත්ලා තුරු අතු පවනට නැටවිණි. ඒවා පුළුල්ය, විශාලය, මුදුය. සුළඟට හසුව වැනෙන එහි නග්න අතු මත ඉකුත් රැයෙහි වැස්සට හසුවුණු ලිහිණියෝ වාඩි වී උන්හ.

ජලාශයට ඉහළින් ඇද-කුදු ගැසුණු ගස් අතරින් අසරුවෙකු පෙනුණි. ඒ අසරුවා ඔහුගේ විළුඹවලින් වැහැරුණු අශ්වයාට ඇන්නේ දෑතේ වැළමිට් නටවමිනි. ඔහු අනෙකකු නොව ස්ත්යෝප්කා



කර්නඋෂ්කින්ය. වතුර පිරුණු තණ බිම් හරහා අසු පැන්නු ඔහු නිකීතාට කෑගසා යමක් පැවසීය. අශ්වයාගේ කුර ජලය සහිත බිමට ගැටීම විසින් කුණු තැවරුණු මඩ කැටි විසිවිණි. යම්කිසිවක් සිදු වූ බව නම් පැහැදිලිය. නිකීතා ගෙදර දුව ගියේය. පැළ දොර අසල පිම්බුණු ගැලක් විය. එයට බැඳ තිබුණේ කර්න උෂ්කින්ලාගේ අශ්වයාය. ඌ නිකීතාට හොම්බ වැනීය. ඔහු ගෙතුළට දිවයත්ම, අම්මා බියපත්ව මහ හඬින් වරක් කෑගසන සැටි ඇසිණි. ඈ කොරිඩෝරයේ ඈත කෙළවර සිටි අතර ඇගේ මුහුණ විකෘති වී, දෙනෙත් සුදුමැලි වී, කට ඇද වී තිබිණි. ඇය පිටුපසින් ස්ත්යෝප්කා ද, තවත් දොරකින් පිටතට පැනගත් නිකීතාගේ ගුරුවරයා ද එන සැටි දිටීය. අම්මා ගමන් කළා නෙව, ඉගිළුණු සැටියක් පෙනිණි.

"ඉක්මණට, ඉක්මණට" යැයි ඕ කෑගැසුවාය. දොර විවෘත කළ ඕ "ස්තෙපනීදා, දූන්යා, මෙහෙකරුවන්ගේ කාමරවලට ගිහින් දන්වාපල්ලා! හොම්යකොව්කා ගමේ වසීලි නිකීතියෙවිච්* ගිලෙනවායි කියාලා..."

ඉතාම භයානක දෙය හොම්යකොව්කා ගම අසල දී මෙය සිදුවීමය. නිකීතා දෙනෙත් අන්ධකාර වී ඔහුට ක්ලාන්තයක් දැනිණි. කොරිඩෝරයේ හිටි හැටියේම එැනු බැදෙන සුවඳක් දැනිණි. පසු කලෙක අම්මා විස්තර කළ පරිදි, නිකීතා දෙනෙත් වසාගෙන හාවකු මෙන් කෑගැසීය. ගුරුවරයා ඔහු අල්ලා ගෙන පංති කාමරයට ගෙන ගියේය.

ඔහු නිකීතාගේ දෑතින් තදින් අල්ලා ගෙන කතා කළේය: "නිකීතා නුඹට ලැජ්ජා නැතිද? නුඹ දැන් ලොකු ළමයෙක් නොව, ඉතින් මොකද? මොනවද වෙලා තියෙන්නේ? වසීලි නිකීතියෙවිච් දැන් මෙලහකටත් එනවා ඇති... සමහර විට එයා වතුර පිරිච්ච අගලක වැටිලා වෙන්ට ඕන... අර මෝඩ ස්තෝප්කා නුඹලෑ අම්මා බය කළා... මම උගේ කනින් අදින්නම් අතට අහුවුණාම..."

එසේ වුවද, ගුරුවරයාගේ දෙතොල් වෙවුලන සැටිත්, ඔහුගේ නෙත්වල කනීනිකා තිතක් දක්වා කුඩා වී තිබෙන සැටිත් නිකීතාට යසට පෙනිණි.

---

* වසීලි නිකීතියෙවිච් - නිකීතාගේ තාත්තා - අනුවාදක

අම්මා හිම කබාය පවා අඳින්නේ නැතිව ගෙදර සිටි ඇඳුමෙන්ම මෙහෙකරුවන්ගේ කාමර දෙසට දිව ගිය ද, ඒ වනවිටත් මෙහෙකරුවෝ රිය අසල හඬ නගමින් රියට ශක්තිමත් අශ්වයකු බැන්දෝය. එය අශ්වයින් බඳින කර වළල්ලක් නැති හිම යානයකි. අශ්ව ගාලේ සිටි අශ්වයන් අතුරෙන් පිට උඩ යා හැකි එවුන් සමහර සේවකයෝ අල්ලා ගත්හ. එකෙක් පිදුරු ගොඩ උඩ තිබුණු දිගු රිටක් ගත්තේය. සමහරු උදැල්ලක් ගැනීම සඳහාත් අන් සමහරු කඹ ලනු පොටවල් ගැනීම සඳහාත් යුහුසුලු වූහ. දුන්යාෂා මෙහෙකාරිය ගෙදරින් පිටවූයේ බැටළු සමින් කළ හිම කබායක් සහ තවත් හිම කබායක් අතින් ගනිමිනි. පහෝම් වඩුරාළ නිකීතාගේ මවු වෙත අවුත් මෙසේ පැවසීය:

"අලෙක්සාන්ද්‍රා ලියොන්තියෙව්නා දූන්යාව ගමට යවලා වොඩ්කා ගෙන්වා ගන්න. අපි හාම් පුතාව ගෙනා හැටියේම එයාට වොඩ්කා දෙන්න ඕන..."

"පහෝම්, මාත් එනවා තුඹලාත් සමග යන්ට" අම්මා කීවාය.

"කොහොමටවත් එපා. ගෙදර යන්න. ඔබට හෙම්බිරිස්සාව හැදේවි."

පහෝම් හිම යානයට නැගී, පටි අතින් ගෙන අශ්වයා අල්ලා ගෙන සිටියවුන්ට කෑගැසීය. "අත හැරපල්ලා!" අශ්වයා හේසාරවය කොට එයත් ඇදගෙන මඩ සහ දිය කඩිති අඩින් වේගයෙන් දිව්වේය. රිය පිටුපසින් අශ්වයින් පිට නැගගත් අතිකුත් මෙහෙකරුවෝ කෑ ගසමින්, කෝටුවලින් අශ්වයිනට පහර දෙමින් උන් එළවූහ.

අම්මා බොහෝ වේලාවක් ඈත යන පිරිස දෙස බලා සිට හිස පහත් කරගෙන සෙමින් ගෙදර ගියාය. ඕ ආහාර කාමරයේ කවුළුව අසල වාඩි වූවාය. හොම්යකොව්කා ගමේ වෙත්ලා ගස්වල මුදුන් පවනට වැනෙන සැටි මෙතැන සිට පෙනේ. අම්මා නිකීතාට අඬගසත්ම, ඔහු දුව ගොස් ඇගේ ගෙළ බදාගෙන වූලන් සාලුවෙන් වැසී ඇති ඇගේ උරයකට හේත්තු වූයේය...

"දෙවියන්ගේ පිහිටෙන්, නිකීතා පුතේ, අපට ඔය විපතින්

ගැළවීමට පුළුවන් වේවි"යි ඇය කීවේ සෙමින් සහ වචනයෙන් වචනය වෙන් කැරමිනි. අනතුරුව ඕ නිකීතාගේ හිස බොහෝ වේලාවක් තිස්සේ සිප ගත්තාය.

නිකීතාගේ ගුරුවරයා කීපවරක්ම කාමරයට විත් ඇස් කණ්නාඩි කුට්ටම හරි ගස්වා දෑත් මදින්නට විය. කීපවරක්ම අම්මා එළිපත්තට ගොස් ඔවුන් එතිද?යි බැලුවාය. යළිත් කවුළුව අසල විඩි වී ඕ නිකීතා අත නොහැරම තමා වෙත තබාගත්තාය.

දවස අවසන් බව දන්වමින් බැස යන හිරු අහස දම් පැහැයෙන් සැරසීය. කවුළුවේ වීදුරුවල පහළ කොටසෙහි කුඩා හිම කැට් ඉතිරිව තිබිණි. හිටි හැටියේම ගෙය අසලින්ම වාගේ අශ්වයාගේ කුර ගැටෙන හඬ ඇසිණි. අශ්වයාගේ හොම්බ තෙමිලාය. පහෝම් හිම යානයේ පැත්තකින් වාඩි වී සිටී. හිම යානයේ හිම කබා තුනකට යටින් බැටළු ලොම් අතරින් නිකීතාගේ පියාගේ වසීලි නිකීතයෙවිච්ගේ මුහුණ පෙනිණි. ඔහු මඳ සිනා පායි. අඩු රැවුළ වෙනුවට මුහුණේ දෙපස අයිස් කැට දෙකකි.

අම්මා කැගසා හදිසියෙන් නැගී සිටියාය. ඇගේ මුහුණ ගැස්සිණි.

"ජීවතුන් අතර!" යැයි ඕ කෑගැසුවාය. ඇගේ දීප්තිමත් දෙනෙතින් කඳුළු කැට කඩා හැළෙන්නට විය.

## තාත්තා ගිලිණු හැටි

කෑම කාමරයේ වට මේසය ළඟ තබන ලද විශාල ඇඳි පුටුව මත සිනිඳු ඔටු හමින් මසන ලද ලෝගුවක් හැඳගත් වසීලි නිකීතියෙවිච් වාඩි වී සිටියේය. ඒ ඇඳි පුටුව ද සම් කවරයකින් වසන ලද්දකි. ඔහුගේ දෙපා වාලෙන්කි නැමැති හිම සපත්තුවලින් උණුසුම ලබයි. තෙතැති උඩු රැවුළ සහ දුඹුරුවන් යටි රැවුළ දෙපැත්තට පීරා තිබිණි. ඔහුගේ රත් පැහැති ප්‍රීතිමත් මුහුණ සමවාරයෙන් පිළිබිඹු වෙයි. සමවාරය ද ශබ්ද නගමින් වතුර උණු කළේය. එහි පතුලේ වූ දැලෙන් කුඩා ගිනි පුපුරු පිට විය.

වසීලි නිකීතියෙවිච් හෙවත් නිකීතාගේ පියා වොඩ්කා පානය කළ නිසා සතුටුදායක සිතින් ඔද වැඩී දෙනෙත් හකුළුවාගෙන සිටියේය. ඔහුගේ සුදු පැහැති දත් දිලිසිණි. අම්මා පෙර මෙන්ම අළු පැහැති ගවොමෙන් සැරසී වුලන් සාළුව පොරවාගෙන සිටියද පෙනුමෙන් අමුතු ගතියක් දරුවාය. ඇයට මඳ සිනා පෑම නවත්වා ගත නොහැකි විය. ඇගේ යටි තොල නැමිලාය. නිකට නිතර ගැස්සෙන්ට විය. ගුරුතුමා විශේෂ අවස්ථාවල දී පළඳින කැස්බෑ ලෙලි ඇස් කණ්නාඩි කුට්ටම ලා ගෙන සිටියේය. නිකීතා පුටුවක් මත දණ ගසා ගෙන උදරය මේසය මත තබාගෙන තාත්තා ළඟටම වී ඔහු දෙස බලාගත්වනම සිටියේය.

යමක් ගෙන යමින් ද, තවත් වරෙක යමක් ගෙන එමින් ද විනාඩියක් පාසා කාමරයට එන දුන්යාෂා මෙහෙකාරිය, හාම්පුතා එනම් නිකීතාගේ පියා දෙස දෙනෙත් මහත් කර ගෙන බලයි. ස්තෙපනීදා තෙලෙන් බදින ලද රසැති පූප වර්ගයක් ගෙනාවාය. බළලා පුරුදු පරිදි වලිගය ඔසවා ගෙන ලොකු ඇදි පුටුව අසලට වී, වරෙක පිටත්, තවත් වරෙක ළපැත්තත් නැතිනම් හිසත් එහි අතුල්ලමින් අස්වාභාවික ලෙස හඬ නගා පුරු-පුරු ගාන්නට විය. ඉත්තෑ පැටියා ද උගේ පුංචි ඉත්තෑ කූරු විදහා ගෙන කෑම අල්මාරියට යටින් එබිකම් කොට බැලීය. ඌ ද සතුට අහවන අටියෙකි.

තාත්තා එක පූපයක් කෑවේය. "ස්තෙපනීදා, හරි රසයි!" කියා තවත් පූපයක් කෑවේය. "ස්තෙපනීදා, පූප බොහොම රසයි!" අනතුරුව ඔහු කිරි තේ උගුරක් බී ඇසක් අඩවන් කොට ඉඟිමරා කතා කරන්නට විය:

"ඔන්න ඉතින් අහපල්ලා මා ගිලෙන්ට ගිය හැටි! සමාරා නගරය පහු කරලා දවස් තුනක් මම ගමන් කළා. හේතුව මෙන්න මේකයි සාෂා" මෙසේ කී ඔහු බැරෑරුම් බවක් මොහොතකට මවා ගත්තේය. හේතුව, මට ලොකු වාසිදායක දෙයක් මිල දී ගැනීමට හැකි වුණා. තමාට අයත් ලෝඩ් බයිරන් නැමැති කළුවන් අශ්වයාව මට මිල දී ගන්ට යි කිය කියා පස්ද්‍යූනින් මගෙන් ඉල්ලන්ට පටන් ගත්තා. මට තමුසෙගෙ අශ්වයා මොකටද? තමුසේ ඇවිල්ලා බලනවකො කියලා ඔහු ඇවිට්ලි කළා. මම අශ්වයා දැක්කා විතරයි, මගෙ සිත ඌට ඇදී ගියා. හරිම ලස්සන දක්ෂ අශ්වයා! ඌ උගේ දම් පාට ඇස්වලින් මගේ දිහා බැලුවේ හරියට

"මා මිල දී ගන්න"යි ඉල්ලන ඉඟියකින්. ඔන්න ඒ පාළු පස්ද්යූනිත් එයාගෙ හිම යානයයි, අශ්වයා හිම යානයට බඳින්ට ඕන කරන ආම්පන්නයි මිල දී ගන්ටයි කියල ඇවිටිලි කැන්ට පටන් ගත්තා... සාෂා, මම අශ්වයයි, හිමයානයය, අම්පන්නයි මිල දී ගත්තට ඔයා තරහ නැහැ නේද?" තාත්තා අම්මාගේ අතක් අල්ලා ගෙන ඇසුවා. "ඔයා මට සමාවෙන්න!" අම්මා දෙනෙතත් වසාගත්තාය: ගම් සභා පාලක මඩුල්ලේ සභාපතිවරයා වන පස්ද්යූනිත්ව වුව ද මිල දී ගැනීම ගැන අද වගේ දවසෙක තරහ විය හැකිද? තාත්තා යළිත් කතාව කියන්ට පටන් ගත්තේය: ඔන්න ඉතින් ලෝඩ් බයිරන් කියන අශ්වයා ගෙවත්තට ගෙනෙන්ටයි කියල මම අණ කළා. මොනවා කරන්ටද? කියලා මා කල්පනා කළා. සමාරාවල අශ්වයාව දාලා එන්ට මා කැමති වුණේ නැහැ. නොයෙක් වර්ගයේ තෑගි මම එක පෙට්ටියකට දැම්මා. මෙසේ කී ඔහු කපටි ලෙස එක ඇසක් අඩවන් කොට ඉඟි මැරුවේය. "උදේ පාන්දර එළිවෙන යාමෙට මට ලෝඩ් බයිරන්ට හිම යානයට බැඳලා දුන්නා. මම සමාරා නගරයෙන් පිටවුණේ තනිවමයි. මුල දී යම්තමින් හිම කැට සමහර තැන්වල තිබුණා. අතර මග දී හිම දියවෙලා වතුර පිරුණා, මහ පාරවල. මගේ අශ්වයා ඩහදිය දමාගෙන කරත්තෙ ඇද්දා, උගේ පිටෙන් ඩහදිය නැවෙන්ට පටන් ගත්තා. කොල්දිබාන් ගමේ වොස්ද්විෂෙන්ස්කි පියතුමාගේ ගෙදර රෑ ගත කිරීමට මම ඉටා ගත්තා. පූජකතුමා මට කොල්බසා වර්ගයකින් සංග්‍රහ කළා. එතරම් රසැති කොල්බසා මගේ උපන්තේකට මම නම් කාලා නැහැ. පූජක තැන මට මෙහෙම කියාපි: "වසීලි නිකීතියෙව්ච් නුඹ දැන් මේ හවස ගියොත්, මහ රෑ අනුමානයක් නැහැ වතුර වළකට වැටෙනවා." මම නම් ගමනට ලෑස්ති වෙන්ටමයි බලාගෙන හිටියේ. ඔන්න ඔය විදිහට පූජකතුමාත් සමග දිගින් දිගටම තර්ක කළා. කළු ස්මොරොදින පළු වර්ගයකින් පෙරාපු වයින් පානයක්, බොහොම මිහිරියි. ඔය වැනි පානයක් පැරිස් නගරයට ගෙන ගියොත් ප්‍රංශකාරයො පිස්සු වැටේවි... අපි ඒ ගැන පසුව කතා කරමු. නින්දට ගියා විතරයි, නා කපන වැස්සක් පටන් ගත්තා. සාෂා, ඔයාට සිතාගන්ට පුළුවනි මට ඇති වෙච්ච කණගාටුව ගැන. ගෙදරින් හැතැප්ම විස්සක් දුර ඉඳගෙන ඔයාවයි, ගෙදර අයවයි හමුවෙන්නේ කවදාදැයි දැන ගැනීමට නොහැකිව ලත වීමට සිද්ධ වීම ගැන... පූජක තුමාවයි, එයාගෙ මිහිරි පානයයි අමතක කරමු."

"වසීලි" යැයි ඔහු අමතමින් තාත්තාගේ කථාවට බාධා කළ

අම්මා මෙසේ තෙපළාය:

"ඔය වැනි අන්තරාදායක ගමන් මින් පස්සේ යන්ට එපයි කියල මම ඔයාගෙන් ඉල්ලනවා." ඈ ඔහු දෙස බැලුවේ බැරෑරුම් විලාසයකිනි.

"ඔයාට මම අවංක ලෙසින්ම පොරොන්දු වෙනවා" යැයි තාත්තා ගත් කටට ම කීවේය. හේ යළිත් සිට විස්තර කථනය ආරම්භ කළේය. "ඔන්න ඉතින් උදෑසන වැස්ස නැවතුණා. මම බයිරන්වත් හිම යානයට බැඳ ගෙන ගමනට පිටත් වුණා. අනේ දෙවියම්පා!... හැම තැනම ගං වතුර ගලලා වගෙයි. නමුත් අස්පයාට ලෙහෙසියි. පාරක් තොටක් පේන්ට නැහැ. මම ඔහේ හිම යානය දක්කනවා. දණක් වතුර. පොකුණු උඩින් දක්කනවා. හැබැ ලස්සනයි. හිරු පායලා... සුළං හමනවා... මගේ හිම යානය පාවෙනවා. දෙපා තෙමිලා, අපූරු සතුටක්! ඔන්න මට ඈත සිටම අපේ වේත්ලා ගස් පෙනුණා. හොම්යකොව්කා ගමට ඇවිත් ගෙදරට එන පාර හොයන්ට පටන් ගත්තා. ගඟ හරහා ලෙහෙසියෙන් යන්ට පුළුවන් කොහෙන්ද?... ආඃ, අර ගම් සභාවේ සභාපති නීචයා!" යැයි කී නිකීතාගේ තාත්තා ඇඳි පුටුවට මිට මෙළ වූ අතින් ගැසීය. "මම ඔය ගම් සභාපති පස්ද්යුනින්ට පෙන්වන්නම් කොතැනින්ද පාලම් හදන්ට ඕනයි කියන එක! ගඟේ ඉතාම නොගැඹුරු තැනින් යාම සඳහා මට හොම්යකොව්කා ගමෙන් හැතැප්ම තුනක් විතර දුරින් යාමට සිදු වුණා. මගේ ලෝඩ් බයිරන් අස්පයා හරිම හොඳ සතා. අපි හරියට නියම තැනින් ගඟෙන් එගොඩ වුණා. දැන් ඉතින් ගඟෙන් නම් එගොඩ වුණා. ඉදිරියට වතුර පිරිච්ච ගල් වළවල් තුනක් තියෙනවා ඒවා මහ භයානකයි. හැරිලා යන්ට නම් බැහැ. සාෂා, ඔයාම හිතා ගන්න, අයිස් කැටත් සමග වතුර පායනවා. නමුත් යාර තුනකටත් වැඩිය ගැඹුර තියෙන ගල් වළේ පතුල පේන්නේ නැහැ."

"අපොයි බොහොම භයානකයි!" අම්මා තෙපළාය.

"මම අශ්වයාගේ කරපටි සේරම ගළවලා. ඌව යානයෙන් වෙන් කළා. නමුත් මා මගේ දොහා හිම කබාය ගැළෙව්වේ නැහැ. ඔන්න මා කළ වරද. මම බයිරන්ගේ පිට උඩ නැංගා. ඌ ඉස්සෙල්ලා මුරණ්ඩු වුණා. ඌ ඉව අල්ල අල්ලා හේසාරවය කළා. මම ඌ අත ගාලා සන්සුන් කළා. ඌ අඩියක් පස්සට තියලා පැන්නා වතුර වළට, ඌගේ බෙල්ල ළඟට එන

කල්ම වතුර. ඌ එතැනට වෙලා ඉන්නව මිසක් හෙළවුණේවත් නැහැ. මම අසු පිටින් බැස්සා විතරයි මාවත් තිකට ළඟට එනකල් ගිලුණා. මම වතුර තියෙන තැන්වල පීනන්ටයි, අයිස් තියෙන තැන්වල දණ ගාන්ටයි පටන් ගත්තා මට අවශ්‍ය මොනවාදැයි අශ්වයාට තේරුම් ගියා. ඌ 'මාව අතහරින්ට එපා!' කියන්නාක් මෙන් කණගාටුදායක ලෙස හඬ හඬ නැගුවා. ඌ මා පසු පස පීනන්ටයි, ගාටන්ටයි පටන් ගත්තා. ඌ පස්සෙන් ඇවිත් මගේ දොහා හිම කබායට ඉස්සරහ ගතෙන් පැටලිලා. ඒ වෙලාවේ දී මගේ දොහා හිම කබාය වතුරට විහිදිලයි තිබුණේ. ඉතින් දොහා-කබායයි මාවයි වතුරට කිඳ බැස්සා. මම මුළු වැර දමා පීනන්ට වුණා. හිම කබායෙ බර මා ඇදගෙන පතුලටම යනවා. නමුත් පතුලක් පේන්නටවත් නැහැ. මම දැඟළුවාම වාසනාවට හිම කබාය යම්තම් මගේ ඇඟෙන් ගැළවිලා ගියා. තවමත් ඒ හිම කබාය වතුර වළේ ඇති... මම වතුර වළෙන් එළියට පැනලා මඩ හිම කවලම් වෙච්ච තැනක වැටිලා හති හැරියා, කට ඇරගෙන හරියට ගෙම්බකු වගෙ. මට ඇහෙනවා වතුර වළ ඇතුළෙ 'ගුඩු ගුඩු ගාන සද්දයක්. හැරිලා බැලුවහම පෙනුණා අස්පයාගේ හොම්බෙන් බාගයක්ම වතුරට ගිලිලා. ඌ රේන්ස් පටිවලට පැටලිලා. මම ආයෙමත් වතුරට පැනලා කට කලියාවෙන් රේන්ස් පටි ගළවලා දැම්මා. එවිට ඌ මුහුණ ඔසවලා මා දිහා බැලුවා, හරියට මිනිසකු බලන්නා වගේ. ඔන්න ඔය විදිහට අපි දෙන්නම පැයකටත් වැඩි වේලාවක් ඔය වතුර වළට වෙලා පීන පීන හිටියා වෙන්ට ඕන. ඔන්න මට හීතල හැදීගෙන එන සැටියක් දැනුණා. හදවත පවා හීතල වේගෙන එනවා. ඔන්න ඒ අතරතුර අස්පයා පැනීම නතර කළා. වතුර පාරට ඌ ගහගෙන යන්ට වුණා. වතුර වළේ ඉන්නවට වඩා ගහගෙන යන වතුරේ පීනන්ට ලේසියි. අපි ගහගෙන යන පිරිසිදු ජල පහරට වැටුණා. බයිරන් පළමුවෙන්ම තණ බිමට ආවා, ඊළඟට මම. ඔන්න ඔහොම තමයි අපි එහා ඉවුරට පීනාගත්තේ. මම අස්පයාගේ ගෙල අල්ලා ගෙන ගමන් කළා. අප ඉදිරියේ තවත් වතුර වළවල් දෙකක්. අප දෙදෙනාම වැනෙන්ට පටන් ගත්තා. ඔන්න ඔය වේලාවෙදි තමා අස්පයින් පිට උඩ නැගලා ආපු ගම්මුන් මම දුටුවේ"...

තිකීතාගේ තාත්තා තවත් අපැහැදිලි වචන කීපයක් කියලා හිටිහැටියේම හිස පහතට දමා ගත්තේය. ඔහුගේ මුහුණ දම් පැහැයට හුරුවිය. ඔහුගේ දත් දෙපෙළ එකට එක හැප්පෙන්නට විය.

"කමක් නැහැ. ඔය සමවාරය නිසා මට තියෙන හීතල පිටවෙලා යන හැටි තමා ඔය", ඔහු පැවසීය. ඔහු ඇඳි පුටුවේ පසුපසට හිස නමා ගෙන දෙනෙත් වසා ගත්තේය. ඔහුගේ මුළු සිරුරම වෙවුලන්නට වූයෙන් ඔහු ඇඳට ගෙනයන ලදී. ඔහු උණ විකාරයෙන් දොඩවන්නට විය...

## නොසන්සුන් සතියක්

තාත්තා දවස් තුනක් තිස්සේ උණ විකාරයෙන් දොඩවමින් සිහිසන් නැතිව සිට ප්‍රකෘති සිහිය ලැබුණු විගසම නැගූ ප්‍රශ්නය මෙය විය. "ලෝඩ් බයිරන් ජීවත් වෙනවද?" ඒ ලස්සන අශ්වයා යහතින් සිටියේය.

ඉක්මණින්ම නිකීතාගේ තාත්තාට සුවය ලැබිණි. ඇඳෙහි වැතිර සිටීමට තරම් කාලයක් නොවීය. ධාන්‍ය වැපිරීමට පෙර ඇතිවන වසන්ත සමයේ කලබලය ආරම්භ විය. යකඩ කම්මලේ අලුත් නගුල් දත් සාදන ලදී. නගුල් අලුත් වැඩියා කිරීම සහ අශ්වයින්ට ලාඩම් ගැසීම කරන ලදී. තිරිඟු උදුල්ලෙන් එකතු කැරන විට කලබල වූ මීයෝ පැන දුවන්ට වූහ. දාහියා පොතු වියළි වාතයත් සමග ඉහළ නැඟ දූලි වලා ඇති කළේය. මඩුවේ ධාන්‍ය පොළන ශබ්දය ඇසිණි. ගෙදර ශුද්ධ පවිත්‍ර කිරීමේ මහා ව්‍යාපාරයක් ආරම්භ විය. ජනේල විවෘත කොටැ වීදුරු සහ රාමු පිස දමන ලදී. ලී මුවා පොළව සබන් ගා සෝදා පවිත්‍ර කරන ලදී. සීලිමේ මකුළු දැල් සියල්ල ඉවත් කරන ලදී. පලසු, ඇඳි පුටු, සෝෆා ආදිය සඳළු තලයට ගෙන ගොස් ඒවා අව්වට වේලා ගසා එහි තුබූ ශීත සමයේ දූලි පළවා හරින ලදී. හිම කාලයේ දී එක් තැනෙක තබා තුබුණු ඇඳ, පුටු, සෝෆා, ආදි දේ ශුද්ධ පවිත්‍ර කොටැ වෙනත් ආකාරයකට තැබීම නිසා නොසන්සුන් තාවයක් මතු විය. ඉත්තෑ පැටියාට මෙය රිසි නොවූයෙන් මහ ගෙදර කෑම කාමරය අතහැර ඌ ගබඩා කාමරයට ගොස් පදිංචි විය.

අම්මා ආහාර ගන්නා කාමරයේ හැඳි, ගෑරුප්පු ආදී රිදී බඩු ද, දේව පින්තූර වටා ඇති රිදීමය මල්දම් ද සුද්ධ පවිත්‍ර කළාය. ඇ පැරණි පෙට්ටගම් විවෘත කැරූත්ම එහි වූ කපුරු සුවඳ වසන්තයේ වාතය සමග මුසුවිය. හිම කාලය පුරා පෙට්ටගම් වල දමා තිබීම නිසාම අලුත් දේ

බවට පත් වූ පැරණි වසන්ත ඇඳුම් ආදිය අතට ගත් ඕ ඒවා ඕනෑකමින් බැලුවාය. කෑම කාමරයේ තැම්බූ බිත්තර සහ එළුනු ද විය. නිකීතා සහ ඔහුගේ ගුරුතුමා ඒ බිත්තර එළුනු ලෙලිවලින් පාට කළහ. එවිට එහි කටුව කහ පැහැයක් ගත්තේය. එම බිත්තර කඩදාසිවල ඔතා විනාකිරිත් සමග ඒවා උතුරා නටන වතුරට දැම්මෝය. එවිට ඒවායේ විවිධ පාට ඇති විය. අනතුරුව එම බිත්තරවලට රන් හා රිදී පාටින් 'වැඩ' දමනු ලැබූහ. මෙය පාස්කු උත්සවය නිමිත්තෙනි.

සිකුරාදා මුළු ගෙදරම වැනිලා සහ කර්දමුන්ගු සුවඳින් වහනය විය. එය කුලීච් නැමැති රසැති පාන් වර්ගය පුළුස්සන්නට පටන් ගත් බැවිනි. හවස්වන විට අම්මාගේ ඇඳෙහි උසැති 'බාබ්' නැමැති කේක් ගෙඩි දහයක් සහ කුලීච් පාන් ද පිරිසුදු තුවායෙකින් ඔතා තිබිණි.

මේ දවස්වල කාලගුණය ස්ථිර නොවීය. හිටි හැටියේම කළු වළා පාවී අවුත් කුඩා හාල් ඇට වැනි හිම වැස්සක් ඇති කරවයි. සැනෙකින් අහස වළා රහිත වී එහි පතුලක් නැති පවිත්‍ර නිල්වන් අහස බැබළේ. තවත් වරෙක අහසින් වසන්තයේ ශීත සුළං හමා තෙතැති හිම කුණාටුවක් ඇතිවෙයි. රාත්‍රී කාලයට දිය කඩිති යළිත් අයිස් තට්ටුවලින් වැසී යයි.

සෙනසුරාදා දවස මහ ගෙදර පාළු විය. මෙහෙකරුවන්ගෙන් අඩක් ද, අනික් අය ද කොලොකෝල්ට්සොව්කාහි සෙනසුරාදා උදේ පවත්වන මංගල්‍ය පූජාවට ගියහ. එගම මහ ගෙදරට හැතැප්ම හතක් ඈතින් පිහිටියේය.

සතියක් පුරා අධික ලෙස වෙහෙස වී වැඩ කිරීම නිසා අම්මා අයහපත් සෞඛ්‍යයෙන් පෙළෙන්නට වූවාය. රාත්‍රී ආහාරය ගත් විගසම නින්දට යන ලෙස තාත්තා ඇයට කීවේය. සමාරා නගරයේ සිට බලාපොරොත්තු වූ පෙම් හසුන නොලැබීම නිසා ඉමහත් දොම්නසට පත් අර්කාදි ඉවානවිච් සිය කාමරයේ දොර වසාගෙන මූසල කපුටුවකු ලෙස උන්නේය.

නිකීතා සෙනසුරාදා උදෑසන මංගල දේව මෙහෙයට යාමට කැමති නම්, අර්ත්යොම් සොයා ඔහු ලවා රෝද දෙකක් සහිත ගැලට

අප්රොදීන් නැමැති වෙළඹී - අශ්වයා බන්දවා ගත යුතුය. අප්රොදීත්ගේ කකුල් හතරටම ලාඩම් ගසා ඇත. ඉර බහින්න ඉස්සෙල්ලා ගමනට පිටත් වී ගොස්, වසීලි නිකීතියෙවිච්ගේ මිතුරෙකුවන ප්යොතර් පෙත්රෝවිච් දෙව්යාතවිගේ ගෙදර නවාතැන් ගත යුතුය. ඔහුට කොලකෝල්ට්සොව්කාහි හාල් සිල්ලර කඩයක් ඇත. "ප්යොතර් මාමාට ළමයි ගොඩක් ඉන්නවා. පුතා මෙහෙ ඉන්නෙ තනියම. ඒක හොඳ නැහැ."යි අම්මා නිකීතාට පැවසුවාය.

ඊ පාන්දර අරුණෝදයටත් කලින් නිකීතා රෝද දෙකක් සහිත ගැලට නැග යෝධයකුවන අර්ත්යොම් අසලින් වාඩි විය. ගොරෝසු හණ රෙදිවලින් මසන ලද දිගැති කබායක් ඇඳ සිටි යෝධයා ඉණ වටා පුළුල් අලුත් කුෂාක් පටියක් බැඳ සිටියේය. අර්ත්යොම් මහලු අසුගේ පටි ඇද මෙසේ පැවසීය: "ඉතින් අපට උදව් කරපන්!" මහළු වෙළඹිය පස්ස ගාත් ඔසවමින් හැල්මේ යන්නට වූවාය. ගෙවත්ත සහ යකඩ කම්මල පසුකොට ගොස් ගල් වළට ළං වූ විට කලු පැහැති ජලය රෝදයේ කඩ ඇණය දක්වා උසට ගලා තිබිණි. අශ්වයා යම්කිසි හේතුවක් නිසා නිතර අර්ත්යොම් දෙස බලන්නට විය.

ශීත සුළං නිසා දිය කඩිති සිහිඳු අයිස් තට්ටුවකින් වැසිලාය. අශ්වයාගේ කුරවලට සහ ගැල් රෝදවලට හසුවෙන අයිස් තට්ටුව බිඳෙන්නේ හඬක් නගමිනි. අර්ත්යොම් ඔහුගේ දිගු නහය පහත් කැර ගෙන නිහඬව සිටියේ දුන්යාෂාට ඔහුගේ ඇති අවාසනාවත් ආදරය ගැන මතක් වුණ නිසා විය යුතුය. ඈත ඇඳිරි අහසේ ඉතා කුඩා වීදුරු කැට මෙන් තරු බැබළෙන්නට විය.

## ප්යොතර් පෙත්රෝවිච්ගේ ළමයි

කවාකාර යකඩ කොක්කකින් සිලිමට එල්ලා ඇති ලාම්පුවේ ආලෝකය නිල් පැහැතිය. එය කාමරය ආලෝක කළේ මඳ වශයෙනි. පහත් තිරයෙන් භූමිතෙල් ගඳ වහනය විය.

කපු රෙදි කවරවලින් යුත් කුකුළු පිහාටු සහිත ගුදිරි මෙට්ට බිම එළා තිබිණි. එයින් ගෘහමය උණුසුමක් සහ කොල්ලන්ගේ සුවඳක් පැතිරී ඇත. නිකීතා ප්යොතර් ප්යෙත්රොවිච්ගේ ළමයින් සමග ඒ මෙට්ට මත

වැතිර සිටියි. වලෝද්යා, කෝල්යා, ල්යෝෂ්කා, ල්යෝන්කා හෙවත් නහයෙන් අඬන්නාත්, තවත් පුංචි කොල්ලෝ දෙදෙනෙක් ද වැතිර උන්හ. පොඩි එවුන් දෙන්නාගේ නම් දැන ගැනීමට තිකීතාට වුවමනාවක් නොවීය.

වැඩිමල් කොල්ලෝ පහත් හඩින් නොයෙකුත් කතා කීවෝය. නහයෙන් අඬන ල්යොන්කා නිතර ටොකු ඇනීම්වලට සහ කනෙන් ඇදීම්වලට භාජනය විය. පොඩි දෙදෙන මෙට්ටයට මුහුණ ඔබා ගෙන නිදාගත්හ.

ප්යොතර් ප්යෙත්රොවිච්ට පිරිමි ළමයින් හය දෙනෙකු හැරුණු විට තවත් ගෑනු ළමයෙක් ද වූවා, ඕ වයසින් තිකීතාට සමාන වූවාය. ඇගේ නම ආන්නාය. ඇගේ මුහුණ පුරා වසන්ත ලප ඇත. ඇගේ මුහුණ කුරුල්ලකුට සමාන වූයේ ඇය සිනා නොවීම විසිනි. ඇගේ දෙනෙත් අවධානය යොමු කළ අතර ඇගේ නහය වසන්ත ලප නිසා කළු පැහැගෙන තිබිණි. ආන්නා විටින් විට, කොරිඩෝරයෙන් පිරිමි ළමයින්ගේ කාමර අසලට ආවේ නිහඬවය. එවිට කෝල්ලන්ගෙන් එකෙක් ඇයට මෙසේ තරවටු කළේය:

"ආන්නා මෙහාට එන්ට එපා. මම නැගිට්ටොත්..."

ඈ එවිට නිහඬව අතුරුදහන් වූවාය. ගෙතුළ පූර්ණ නිශ්ශබ්දතාවයක් ඇති විය.

දේවස්ථානයේ අන්නවිරාළ වන ප්යොතර් ප්යෙත්රොවිච් රෑ දෙගොඩ හරියේම දේවස්ථානයට ගියේය. ඔහුගේ බිරිඳ හෙවත් ළමයින්ගේ අම්මා වන මාරියා මිරෝනව්නා ළමයින්ට කතා කොට මෙසේ පැවසුවාය:

"කැගසපල්ලා! කැගසපල්ලා! නුඹලගේ ඔළු ගෙඩිවලට මම ටොකු අනින්නම්..."

උදෑසන මංගල පූජාවට පෙර යම්තම් හෝ නිදා ගැනීමට ඕ ගියාය. දහ නොකර ළමයින් ද ඇඳට යා යුතු යැයි ඈ අණ කළාය.

වටකුරු මුහුණක් සහ අවුල් වූ හිසකේ ඇති ල්යෝෂ්කා වැටුණු දත් සහිත කට හැර මෙසේ පැවසීය:

"පසුගිය පාස්කු මංගල්ලෙ දා අපි කැට ගැහැව්වා. මම පාස්කු බිත්තර දෙසියයක් දිනා ගත්තා. ඒවා කාලා මගේ බඩ පිම්බුණා."

නිකීතා ල්යෝෂ්කාගේ කතාව විශ්වාස කරතියි බිය වූ ආන්නා දොර අසල සිටගෙන මෙසේ තෙපළාය:

"ඒ කතාව බොරුවක්. නිකීතා විශ්වාස කරන්ට එපා!"

"දෙවියම්පා දන් මම නැගිටලා නුඹට..." ල්යෝෂ්කා ඇයට සැරවිය.

දොරින් එහා නිහඬතාවයකි.

වලෝද්යා වැඩිමලාය. ඔහු දුඹුරු පැහැතිය. ඔහුගේ හිසකේ බොකුටුය. මෙට්ටය මත එරමිණිය ගොතාගෙන වාඩි වී සිටි ඔහු නිකීතාට මෙසේ පැවසීය:

"අපි හෙට ගන්ධාර කුළුණට නගිමු. මම සීනු ගහන්ට පටන් ගත්තම මුළු කුළුණම දෙදරුම් කනවා. වම් අතින් මම පුංචි සීනු නාදකරනවා, ඩිරින්, ඩිරින්. දකුණු අතින් මහ සීනුව බුම් බුම් ගාලා ගානවා. එය රාත්තල් ලක්ෂයක් බරයි."

"අන්න ඒ කතාව බොරුවක්" ආන්නා දොරින් එහා සිටගෙන සෙමෙන් පැවසුවාය.

වලෝද්යා කොතරම් වේගයකින් හිස හරවා බැලුවේ ද යත්, ඔහුගේ හිස කෙස් කැරළි නැටවිණි.

"ආන්නා!" යැයි ඔහු ගුගුළේය.

"ඔන්න අපේ තාත්තා නම් බොහොම ශක්තිමත්, අස්පයාගේ

ඉස්සරහ දෙපය අල්ලා ඌ ඔසවන්න තාත්තාට පුළුවනි. මට එහෙම දෙයක් කරන්ට තවම නම් බැහැ. ඕන් ගිම්හාන කාලෙට නිකීතා එන්න අපේ දිහාවට. අපි යමු පොකුණට. හැතැප්ම හයක් දුර පොකුණ තියෙන්නේ. මට ඒ පොකුණ අයිනේ තියෙන ලොකුම ගහට නැගලා පොකුණට පනින්ට පුළුවනි"යි වලෝද්‍යා කීවේය.

ඊළඟට ල්යෝෂ්කා කට දැම්මේය:

"මට පුළුවනි වතුර යටට වෙලා හුස්ම ගන්නේ නැතිව ඉන්ට. වතුර යට හැම දෙයක්ම පේනවා. අපි පහුගිය ගිම්හාන කාලෙදි පොකුණෙ නැවා. මගේ ඔළුවෙ පනුවොයි, කිනිතුල්ලොයි, මහා විශාල කුරුම්ණියොයි වැහැව්වා."

"අන්න ඒ කතාව බොරුවක්!" යම්තම් ඇසෙන සේ ආන්නා කීවාය.

"ආන්නා ඔයාගේ කොණ්ඩෙන් අල්ලා අදිනවා!"

වලෝද්‍යා ඉමහත් අමනාපයකින් කතා කළේය.

"අපේ නංගී හරිම වසයි. හැම තිස්සේම එයා අප ළඟටම රිංගන්ට එනවා. වැදගැම්මකට නැති කෙල්ල. පස්සෙ එයා අම්මාට කේළාම් කියනවා, අපි එයාට ගැහුවා කියලා."

පවුලේ තෙවැනි පිරිමි ළමයා වන කෝල්යා මෙට්ටය මත වැතිර සිටින අතර අතක් නිකටට තබා ගෙන නිතරම නිකීතා දෙස බලාගෙන සිටියේය. ඔහුගේ දෙනෙත් කරුණාබර නමුදු එහි දොම්නසක සේයාවක් තිබිණි. ඔහුගේ මුහුණ දිගටිය, ශාන්තය, නාසයේ අග සිට උඩු තොල දක්වා ඇති දිග සාමාන්‍ය ප්‍රමාණයට වඩා බොහෝ වැඩිය. නිකීතා ඔහු දෙස බලත්ම, ඔහු දයාන්විත දෙනෙත්වලින් සිනාසුණේය.

"කෝල්යාට පීනන්ට පුළුවන්ද?" නිකීතා ප්‍රශ්න කළේය.

කෝල්යා යළිත් දෙනෙත්වලින් සිනාසුණේය. වලෝද්‍යා ආවාට

ගියාට මෙන් කතා කළේය:

"කෝල්යා මල්ලී පොත් කියවනවා. ගිම්හාන කාලෙට එයා වහල උඩ මඩුවක් හදාගෙන එහාට වෙලා පොත් කියවනවා. එයා නගරයට යවලා උගන්වන්ට තාත්තා තීරණය කළා. මම ගෙදර දොර වැඩ කටයුතු පාලනය කරන්ට පුරුදු වෙනවා. ල්යෝෂ්කා තවම පොඩියි. එයා ඔහේ දුවපුවාවේ." වලෝද්යා ල්යොන්කාගේ කෙස් වැටියෙන් ඇද මෙසේ ද කීවේය: "මේ කොල්ලා මහ කරදරකාරයා. තාත්තා කියනවා එයාට පණුගාය තියෙනව කියල."

"එයාට පණුගාය නැහැ. පණු අමාරු තියෙන්නේ මටයි. හරිම භයානක පණු අමාරුවක්. මොකද දන්නවද මම කොළ ජාති සහ මල් ජාති අමුවෙන් කන නිසා. හිස් ගෙඩියන්ව වුණත් මට කත හැකියි" ල්යෝෂ්කා පැවසීය.

"ඒ කතාව ඇත්තක් නොවෙයි" යළිත් දොරට එහා සිට කියන සැටි ඇසිණි.

"ආන්නා, තුඹ ඉතින් ප්‍රවේසම් වෙයන්" මෙසේ කී ල්යෝෂ්කා මෙට්ට උඩින් පැන නිඳ සිටි පොඩි එකාත් පෙරළාගෙන දොර අසලට දිව්වේය. නිදා සිටි පොඩි කොල්ලා තින්දෙන්ම කෙඳිරි ගෑවේය. එහෙත් කොරිඩෝරය දිගේ කොළයක් පියාඹා ගිය විටෙක මෙනි. ආන්නා හතිකට දිව ගියෙන්, ඈත කාමරයක් වසන සැටි ඇසුණි.

ල්යෝෂ්කා ආපසු විත් මෙසේ පැවසීය: "අම්මාගේ කාමරයට ගිහින් හැංගුනා. කොහොම වුණත් මම එයාට ටොක්කක් අනිනවාමයි."

"අලෝෂා ආන්නාට ඉන්න ඉඩ හරින්න. එයාගෙ ඇහේ එල්ලෙන්ට යන්නේ මොකටද?"

එවිට ල්යෝෂ්කා, වලෝද්යා පමණක් නොව නාහෙන් අඩන ල්යෝන්කා පවා කෝල්යාට කඩා පනින්ට වූහ.

"අපි එයාගේ ඇහේ එල්ලෙන්ට ගියාද? එයා අපේ ඇහෙ

එල්ලෙන්ට ආවා. හැතැම්ම දාහක් දුර ගිහිල්ල හැරිල බැලුවොත්, ඔන්න ආන්නා අපේ පස්සෙන් එන සැටි පෙනේවි. අපි කියන දේවල ඇත්ත-නැත්ත, කරන දේ හරි-වැරැද්ද හොයන්න එයා අපේ වලිගය වගේ පස්සෙන් එනවා..."

ල්යෝෂ්කා තව දුරටත් ඔහුගේ හපන්කම් කියන්ට විය:

"මම දවසක් දා ඔය කෙල්ලගෙන් බේරිලා ඉන්ටයි කියලා වතුරට බැහැලා කමිෂ් පඳුරු අස්සේ හැංගිලා හිටියා. මගේ ඇඟේ කුඩැල්ලො එල්ලිලා මගේ ලේ බිව්වා."

වලෝද්යා ද ඇයට දොස් පැවරීමට එකතු විය:

"ඔන්න අපි දවසක්දා දවල් කෑමට වාඩි වුණා. ආන්නා අම්මාට කේලාම් කිව්වා - ඔන්න වලෝද්යා මී පැටියෙකු අල්ලා සාක්කුවේ දාගෙන ඉන්නවයි කියලා. ඒ මී පැටියා මට බොහොම වටිනවා වෙන්න පුළුවනි."

නහයෙන් අඬන ල්යෝන්කා ඒ කතාවට කට දම්මේය:

"කොහේ ගියත් අඬන තුරුම මා දිහා බලාගත්තු ගමන් ඉන්නවා."

ආන්නාට විරුද්ධව තිකීතාට පැමිණිලි ඉදිරිපත් කළ ළමයින්ට නිහඬව සිටින්නැයි අම්මා කළ අවවාදය අමතක විය. මංගල දේව මෙහෙයට සැරසෙනතුරු ඔවුහු නිහඬව සිටිය යුත්තාහ. ඈත සිට බැරෑඩි හඬකින් ළමයින්ගේ අම්මා - මාරියා මිරෝනව්නා තර්ජනය කරන්නට වූවාය.

"නිහඬ වෙයව්! තුඹලාට කීපාරක් කියන්ටද?..."

ළමයි වහාම නිහඬ වූහ. අනතුරුව ඔවුහු කසු කසු ගාමින් එකිනෙකා තල්ලු කැරැමින් හිම සපත්තු සහ හිම කබා ඇඳ ගත්හ. මප්ලර් කර වටා බැඳ ගෙන එළියට දිව ගියෝය.

මාරියා මිරෝනවිනා අළුත් හිම කබායක් පොරවා ගෙන රෝස මල් වැටිච්ච සාලුවකින් හිසත් ගෙලත් ඔතා ගෙන සිටියාය. ආන්නා ද විශාල ලොම් තුවායකින් හිසත් ගෙලත් ඔතා ගෙන මව්ගෙ අතක් අල්ලා ගෙන ආවාය.

අහසේ තරු පායා තිබිණි. පොළොවේ පස්වලින් සහ තද ශීතෙන් පුසුඹක් වහනය විය. ඇදිරි ගෙවල්වලින් පිට වූ බැතිමත්තු තුනී අයිස් තට්ටු සහිත දිය කඩිති පාගමින් දේවස්ථානය බලා ගමන් ගත්හ. අහසේ තරු බැබළිති. පයට පෑගෙන තුනී හිම තට්ටු බිඳුනේ හඬ නංවමිනි. ගැමි ගැහැණු ගම්මු සහ ඔවුන්ගේ දූ දරුවෝ තිහඬව ගමන් කළහ. ඈත කඩපොළ සහිත අංගණ චතුරශ්‍රයෙහි දේවස්ථානයේ රන් පැහැති කපෝලය පෙනෙයි. එයට පහළින් පේළි තුනකට සිටින සේ මැටි පහන්වලින් ආලෝක කැරැ ඇත. මඳ පවනට හසුවන ගිනි සිළු පසන් ලෙස නැටෙයි.

## ආත්ම ශක්තිය

මංගල දේව මෙහෙය අවසන් වූ ඉක්බිතිව ගෙදර පැමිණි විට, ආහාර වර්ග මේසයට බෙදා පමණක් නොව ගෙබිත්තියේ කඩදාසිවලට පවා රතු රෝස මල් (කඩදාසිවලින් සාදන ලද) අලවා තිබිණි. කූඩුවේ සිටි සැලළිහිණියා පහන් සිළුවේ ආලෝකය නිසා කලබල විය. ඉතා දිගැති කබායක් ඇඳ සිටි ප්‍යොතර් පෙත්‍රෝවිච් සිය උඩු රැවුල නටවා සුපුරුදු ලෙස සිනාසුණේය. ඔහුගේ උඩු රැවුළ තතාරයෙකුගේ මෙනි. ඔහු හැම දෙනාටම වෙරිවලින් සාදන ලද නලිව්කා නමැති පානය කුඩා වීදුරුවක් බැගින් වත් කළේය. ළමයි කටු ඉවත් කර බිත්තර කෑවෝය. අනතුරුව හැඳි ලෙව කෑවෝය. කර බැඳි සාලුව පවා ඉවත් නොකැරැ මාරියා මිරෝනොවිනා වාඩි වී සිටියේ අධික තෙහෙට්ටුව නිසාය. ඇයට කතා කිරීමට පවා ශක්තියක් නැත. තමාගේ රුළ කා බී අවසාන වනතුරු ඈ බලා සිටියාය. ඈ ඇගේ ළමයින් හැඳින්වූයේ රුළ යන නාමයෙනි.

නිකීතා, නිල් පැහැති ගිනිසිළුව සහිත පහන අසල බැටළු සමින් සාදන ලද හිම කබාය පොරවා ගෙන මෙට්ටය මත දිගා වී නිදා ගත්තේය. ඔහුට සිහින් හඬක් ඇසුණ සැටි දැනේ: "මරණය මුදාලීමට මරණය ඉදිරිපත් කරමින් ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන් නැගී සිටිය

සේක..." යළිත් දල්වෙන ඉටිපන්දම් ද, උණු වී හැලෙන ඉටි ද, පූජකයින්ගේ රන්මුවා ධවල ලෝගු සහ පූජක ඇඳුම් ද නිල් පැහැති දුම් වළා නැගෙන සැටි ද, දේවස්ථානයේ රන් තරු සහිත කපෝලය සහ පියාපත් දිග හැර ගත් පරෙවියකු ද නිකීතාට සිහිනෙන් පෙනිණි. යකඩ වැටක් සහිත කවුළුවට එහා රාත්‍රි අන්ධකාරය රජ කරයි. දහස් ගණන් නෙත් ගිනිදැල්වල ඡායාව පිළිබිඹු කරමින් රතු පාටින් බැබැළේ. දේවස්ථානයේ බටහිර දිග ද්වාර විවෘත වත්ම හිස පහත් කැරගත් සාන්තුවරයෝ ගමන් ගතිති. වසරක් පුරා කරන ලද පවුවලට එදින සමාව ලැබිණි. ලප සහිත නාසයක් ඇති ආන්නා, නිල් පැහැති පීත්ත පටි දෙකකින් කොණ්ඩය සරසා ගෙන සිය සොහොයුරන් සිප ගැනීමට ඉදිරියට එයි... නිකීතා දුටු සිහිනය එබඳු විය.

ප්‍රථම උදෑසන අළු පැහැතිය, උණුසුම සහිතය, ශුභාරංචිය ඝණ්ඨාර නාදයෙන් දන්වන ලදී නිකීතා සහ ජ්‍යොතර් පෙත්රෝවිච්ගේ ළමයි සියලු දෙනම පොදු ජන ගබඩාව වෙත ගියහ. එය හරකුන් තණ කන ස්ථානයෙහි පිහිටා ඇත. එහි ජනයාගෙන් පිරිලාය. ඔවුහු විවිධ ඇඳුම්වලින් සැරසී හඩ නගා කතා කරති. කොල්ලෝ නා නා විධ කෙළි සෙල්ලම් කළහ. එකා පිට එකා නැගී දිවූහ. අලුත් ගවුම් ඇඳගෙන වෛවර්ණ පාටවලින් සළු පොරවාගෙන තරුණියෝ ගබඩා බිත්තිය අසල ලී කඳන් මත වාඩි වී සිටියහ. හැම කෙනෙකු ළඟම සූරිය මල් ඇට, වියළි මුද්‍රික එළ, පාස්කු බිත්තර ආදිය තිබිණි. ඔවුහු සූරියකාන්ත මල් ඇට ආදිය සපමින්, දිලිසෙන නෙත්වලින් බලමින් සිනාසෙති.

ඉස්තරම් සපත්තු කුට්ටම් සහිත දෙපා විහිදුවා පරාලයක් කොළවර වාඩි වී සිටින ගැහැණු සොඩකු වන පේත්කා ස්තාරස්තින් කිසිවකු දෙස නොබලා ගර්මෝනිකා නැමැති තම සංගීත භාණ්ඩය අතින් ගෙන හිටි හැටියේම එය විහිදුවා වාදනය කරයි: "ඉතින් මොකද අනේ පනේ! අනේ පනේ!" "පනේ අනේ" නැමැති ගීත රාවය පැතිරේ.

එහා බිත්තියේ කට්ටියක් එක් වී, ඔර්ල්යාන්කා නැමැති ක්‍රීඩාවේ යෙදී සිටිති. හැම ක්‍රීඩකයකුගේ අතෙහි කොපෙක් දෙකේ කාසි සහ කොපෙක් තුනේ කාසි ගොඩකි. වාරය පැමිණි විට ක්‍රීඩකයා පහේ කාසියක් උඩ වීසි කොට බිම වැටෙත්ම එය පයින් පාගා, යළි අතට ගෙන උඩ වීසි කරයි: "නෝනාද? පොල්ලද?"

මෙහි පසුගිය වසරේ සිට පවතින තණ පඳුරු සහිත බිමෙහි විවිධ ක්‍රීඩා බිත්තර ඔට්ටුවට සෙල්ලම් කරති, කොල්ලෝ.

නිකීතා ද සෙල්ලම් කරන කෙල්ලන් ළඟට ගොස් බිත්තරයක් සාක්කුවෙන් එළියට ගත්තේය. එවිටම වාගේ ආන්නා කන ළඟටම විත් මෙසේ කොඳුරා කීවාය:

"මේ අහන්න, ඔයා ඒ ගොල්ල එක්ක සෙල්ලම් කරන්ට එපා. ඒ ගොල්ල ඔයා රවට්ටාවි." ඈ කොහේ සිට ආවාදැයි සිතාගත නොහැකිය.

ආන්නා තම සිනා රහිත වටකුරු නෙත්වලින් නිකීතා දෙස බලා ලප සහිත නහය නැටෙව්වාය. නිකීතා පිරිමි ළමයින් ඉන්න තැනට ගියේ ඔවුන් සමග සෙල්ලම් කිරීමටය. එවිට ආන්නා යළිත් කොහේදෝ සිට පැමිණ දෙතොල් තද කැර ගෙන කතා කළාය:

"මේ කොල්ලන් එක්ක සෙල්ලම් කරන්න එපා. ඒ ගොල්ල ඔයා රවට්ටන්ට තීරණය කළ හැටි මට ඇහුණා."

නිකීතා ගිය හැම තැනම ආන්නාද ගියාය. ඈ ඔහුගේ කනට කොඳුරා කියන්නට වූවාය. ඇය මෙසේ කරන්නේ මන්දැයි නිකීතාට වටහාගත නොහැකිය. ඔහුට මෙය අපහසුවකි, එමෙන්ම ලැජ්ජාවකි. ඔහු දෙස බලා කොල්ලන් සිනා සෙන සැටි ඔහුට ඇසේ. එක කොල්ලෙක් ඔහු දෙස බලා කෑගැසීය.

"ගෑණුන් පස්සෙ යන ගෑණු කිච්චා!"

නිකීතා ශීතල වතුර සහිත තිල් පැහැති පොකුණ වෙත ගියේය. වැලි සහිත බෑවුමේ තවමත් මඩ සහ හිම ඉතිරි වී ඇත. බැද්දේ උසැති ගස්වල සිට ලිහිණියෝ හඬ නැගූහ.

"මේ අහන්න, ඔයා දන්නවද සුස්ලික් කියන වැලි මීයෝ ඉන්න තැන. මම දන්නවා. අපි එතනට ගිහිල්ල උන් බලමු"යි ඔහු පිටුපසින් පැමිණි ආන්නා කීවාය.

නිකීතා ඇය දෙස නොබලාම කෝපයෙන් හිස වැනීය. ආන්නා යළිත් කොඳුරන්නට වූවාය.

"දෙවියම්පා ඇත්ත. මගේ ඇස් දෙක පල්ලා. නිකීතා වැලි මීයන් බලන්ට කැමති නැත්තෙ මොකද?"

"නැහැ. මම කැමති නැහැ."

"එහෙනම් නිකීතා කැමති නම් අපි වැල් ගොඩේ බිත්තර හංගන ක්‍රීඩාව කරමු."

"බැහැ. මට බැහැ."

"එහෙනම් නිකීතා මාත් සමග සෙල්ලම් කිරීමට කැමති නැහැ නේද?..."

ආන්නා එසේ අසා දෙතොල් තද කැරගෙන පොකුණ දෙස බලන්ට වූවාය. මඳ පවනට පොකුණු දියෙහි කුඩා රැළි වැටිණි. ඇගේ හිසේ එක් කෙස් කරලක් වැනිණි. ඇගේ නාසය රතු පැහැ ගති. දෙනෙත්වල කඳුළු පිරිණි. ඇගේ ඇස් නැටවිණි. නිකීතාට කාරණය අවබෝධ විය: ආන්නා උදැසන ඔහු පසු පසින් ඇවිද්දේ ඇය ඔහු කෙරෙහි අමුතු හැඟීමක් ඇති කැරගත් බැවිනි. හරියට නිකීතා ලීලා කෙරෙහි ඇති කැරගත් හැඟීමට සමාන හැඟීමකි, එය.

නිකීතා පොකුණේ අයිනටම ගොස් සිට ගත්තේය. ආන්නා තවත් ඔහුට පෙරැත්ත කළොත් ඔහු පොකුණට පනිතැයි නොඅනුමානය, ඔහු එතරම් ලැජ්ජාවකට සහ අසීරුතාවයකට මූණ පා සිටී. අපූරු වචන කතා කිරීමත්, අපූරු හැඟීම් සහ මඳ සිනා පෑම් ඇති වන්නේත් ලීලා සමග මිස අන් අය සමග නොවන බව නිකීතාට දැනුණේය. වෙනත් ගැණු ළමයින් සමග එලෙස හැසිරීම පාවාදීමක් සහ ලැජ්ජාවට කරුණකි.

"පිරිමි ළමයි මට විරුද්ධව නිකීතාට කේළාම් කියල. මම ගිහිල්ල ඒ ගොල්ල ගැන අපේ අම්මට කියනවා... මම තනිවම සෙල්ලම් කරනවා.. මට කාවවත් ඕන නැහැ. ඒක බොහොම හොඳ දෙයක් තියෙන

තැන මම දන්නවා... ඒක බොහෝම හොඳ දෙයක්..." ආන්නා දිගටම කියන්නට වූවාය.

නිකිතා ඇගේ දෙඩවීමට සවන් දී ඇය දෙස නොබලා නිහඬව සිටියේය. ඔහුගේ හදවත තුළ ඇයට ඉඩක් නැත.

## වසන්තය

දැන් නම් ශීත කාලයේ දී මෙන් හිරු දෙස බැලිය නොහැකිය. කඳු මුදුනට ඉහළින් හිරු ඇස් අන්ධකාර කැරවන ආලෝක ධාරා විහිදුවයි. සුනිල්වන් අහසේ සුදු පැහැති වළාකුළු පාවෙයි. ඒවා හිම පියලිවලට සමානය. වසන්ත සුළං නිසා ප්‍රණීත තණ සුවඳ සහ කුරුළු කූඩුවල සුවඳ වහනය විය.

මහ ගෙදර ඉදිරිපිට ළපටි තොපොල් පැළවල දළු ලන්නට වූයෙන් මන පිනවන සුවඳක් පැතිරිණි. රත් වූ වැලි පොළවේ කිකිළියෝ කෙකෙර ගෑහ. වසන්ත හිරුගේ තාපය නිසා රත් වූ පොළවේ දිරාපත්වන තුරු පත් අතර තණ පඳුරු ලියලන්නට විය. දිය කඩිතිවල සුදු සහ කහ පැහැති තරු වැනි රූප මැවිණි. දවස් ගෙවෙත්ම, ගෙවත්තට වැඩි වැඩියෙන් කුරුල්ලෝ ආවෝය. දෙපයින් යාමෙහි සමත් කළු කුරුල්ලෝ ගස් අතරින් දුවන්නට වූහ. ලීපා ගස්වලට ඉවොල්ගා නැමැති කුරුල්ලෝ ආවෝය. උන් කොළ පැහැයෙන් සහ රන්වන් පාටට හුරු කහ පැහැයෙන් යුක්තය. උන්ගේ පියාපත් සිනිඳුය. උහු ඉතා මිහිරි ලෙස ගී ගැයූහ.

හිරු උදාවත්ම, වහළ උඩ සහ කුරුළු කූඩුවල සිටි සියලු කුරුල්ලෝ කීච් බීච් නාදයෙන් ගයන්නට වූහ. විවිධ පක්ෂීහු විවිධ හඬින් නාද කළහ, ගී ගැයූහ. උතුරේ සිට යුරෝපයේ දකුණටත් අනතුරුව අප්‍රිකාවටත් ශීත කාලය එළැඹෙන්ට පෙර පියාසර කරන කුරුල්ලෝ වසන්තය එළැඹෙත්ම යළිත් රුසියාවට විත් අලුත්, අලුත් ගී ගයති. සමහරු රාග තාල වරදවා ගයන ගායකයින්ට සමාන බවක් දැරුවෝය. සුදු පැහැති බිරියෝසා ගස් අතරින් පායාඹන කොට්ටෝරුවා අලු පැහැති ලපයකට සමානය. රතු කොණ්ඩ කුරුල්ලා ගසක ඉඳ හිස වන වනා වට පිට බලයි.

එදින හොඳින් හිරු පායන ඉරිදා දවසකි. තුරු අතුවලැ පිනි බිඳු තවමත් වියළී නැත. පොකුණ අසලට පැමිණි කොහා දොම්නස මුසු හඬෙකින් වත්තේ සිටි පණුවාගේ සිට සියලු සතුන්ට ආශිර්වාද කැරූන්නාක් මෙන් මුදු ලෙස නාද කළේය.

"ජීවත් වෙයල්ලා, ආදරය කරපල්ලා! වාසනාවත්ව ජීවත් වෙයල්ලා. කොහා-කොහා. කොහොම වුණත් මම තනියම ජීවත් වෙන්නම්, කොහා-කොහා..."

මුළු ගෙවත්තම කොහාට සවන් දුන්නේ නිහඬවය. බිං කුන්ඩෝ, කුරුල්ලෝ, හැමදාම හැම දෙයටම පුදුම වන ගෙම්බෝ, සමහරු අඩි පාරේ, තවත් සමහරු සඳළු තලයේ පිට ගැට පෙළ මත සිට ගෙන කොහාගේ හඬට සවන් දෙමින් ඉරණම ගැන සිතන්නට වූහ. කොහාගේ ගීතරාවය අවසන් වත්ම මුළු මහත් වත්තම ප්‍රීතියට පත් කැරූවමින් තුරු අතුවල කොළ සෙළවෙන්නට විය.

දවසක් දා අගලේ ගැට්ට මත වාඩි වී සිටි නිකීතා පොකුණේ උඩහ ඉවුරේ තණ පඳුරෙන් යුත් තැන්නේ අශ්වයින් රංචුවක් යන සැටි දුටුවේය. කප්පාදු කරන ලද අශ්ව පැටවු වලිග වනමින් තණ උලා කති. වෙළඹ හිස ඔසවා බැලුවේ ඇගේ පාටවා ළඟ දැයි දැන ගන්නා අටියෙනි. අශ්ව පැටවු උන්ගේ දිගැත් දුබල කකුල්වලින් අශ්ව අම්මා වටේ හැල්මේ යති. උන්ගේ දණහිස අවට මහතය. උන් උන්ගේ මවුගෙන් ඈත් වීමට බිය වූවාක් වැන්න. සමහර පැටවු අම්මා ළඟට වී කිරි බොන්නට වූහ, වලිග වැනූහ. එවැනි වසන්ත දවසෙක කිරි බීම යහපත් දෙයකි.

රංචුවෙන් වෙන්වන අශ්ව පැටවු තණ පිටිය හරහා දුවමින් උඩ පනිමින් හේරවය කළහ. හිස වැනූහ. එක් අශ්වයෙක් උඩ පැන පෙරළෙන අතර අනිකා දත් විරිත්තා හඬ නගයි. තවත් එකෙක් හපන්ට මෙන් ඉදිරිපත් වෙයි.

නිකීතාගේ තාත්තා ජලාශය පසු කැරූ මහ මහ දිගේ රියෙන් ගමන් කළේය. ඔහු සිහින් කැන්වස් රෙද්දෙන් මැසූ උඩු කබායකින් සැරසී සිටියේය. සුළං පහරට ඔහුගේ යටි රැවුළ පැත්තකට වීසිවිණි. ඔහුගේ දෙනෙත්වල ප්‍රීතිමත් ගතියක් තිබුණ ද ඒවා ඔහු හකුළුවා ගෙන සිටියේය.

කුඩා දූලි පොදක් ඔහුගේ කම්මුලක දක්නට තිබිණි. නිකීතා දැක ඔහු රේන්ස් පටි ඇද රිය නැවැත්වීය.

"ඔය අස්ප රංචුවෙ ඉන්න එවුන්ගෙන් පුතා කැමති මොකාටද?"

"ඒ මොකද?"

"අතුරු ප්‍රශ්න අහන්නේ නැතිව පුතා උත්තර දෙන්න."

නිකීතා ද තාත්තා මෙන් දෙනෙත් හකුළුවාගෙන තද දුඹුරු පැහැති ක්ලෝපික් නැමැති අශ්වයා දෙස ඇහිල්ලක් දිගු කළේය. නිකීතා ඔහුට බොහෝ කල් සිට කැමතිය. ඌ ආචාර ශීලීය, කීකරුය, උගේ මුහුණ පුදුමාකාර ලෙස කරුණාවත්ය.

"මෙන්න මේ අශ්වයා."

"ඒක යසයි. පුතා කැමති අශ්වයා අපූරුයි."

තාත්තා එක් ඇසක් අඩවන් කොටැ ඉහි මරා. තලු ගසන්නාක් මෙන් ශබ්දයක් ඇති කැරැ, රෙන්ස් පටි ගැස්සවීය: සප් බලැති අශ්වයා රිය ඇදගෙන දිවුවේය. ඉක්මණින් ඈත යන තාත්තා දෙස බැලූ නිකීතා කල්පනා කරත්තනට විය: තාත්තාගේ ප්‍රශ්නය නිකමට ඇසූ ඒවා නොවේ.

## කොඩිය එසවීම

වී කුරුල්ලන්ගේ කීචි-බීචි හඬ නිසා නිකීතා අවදි විය. ඉවොල්ගා කුරුල්ලා හඬ නගන සැටි ඔහු අසා සිටියේය. වතුර පිරි බටයකට පිඹින්නාක් වැනි හඬකි, එය. කවුළු දොර විවෘත කැරැ තිබුණෙන්, වසන්ත සමයේ ප්‍රණීත වාතය ලා තණ පඳුරු සිපගෙන කාමරයට වදියි. තෙතැති තුරු පත්වලට හිරු රැස් වැටිලාය. මද පවනට කවුළු පඩිය මත පිනි බින්දුවක් වැටිණි. ගෙවත්තේ සිට නිකීතාගේ ගුරුතුමා ගැගසනු ඇසෙයි:

"අද්මිරාල් තුමාණෙනි, ඉක්මණට ඇස් ඇර බලනවාද?"

"නැගිටිනවා!" යැයි පිළිතුරු දුන් නිකීතා තවත් මොහොතක් ඇඳෙහි වැතිර සිටියේය. මෙලෙස වැතිර ගෙන ඉවෝල්ගාගේ හඬට සවන් දීමත්, පිත්තට හසු වූ තුරු පත් සෙළවීමත් ඔහුට ප්‍රීතියක් ගෙන දෙයි.

අද මැයි මස එකොළොස් වැනිදා, නිකීතාගේ උපන් දිනය නිමිත්තෙන් කොඩිය එසවීමට නියම කැර තිබිණි. එම උත්සවය පොකුණෙහි දී සිදු කරනු ඇත. ඉක්මණින් ගෙවී යන කාලයට ඉඩ නොතබන්නාක් මෙන් නිකීතා කලබල නොවී අලුත් කමිසය හැඳ ගත්තේය. එය මල් වැටුණු නිල් පැහැති සම්සයකි. සමින් කළ අලුත් කලිසමක් ද ඇඳ ගත්තේය. එය කොතරම් ශක්තිමත් ද යත්, ඕනෑම ගස් අත්තක පැටලුනත් ඉරෙන්නේ නැත. තමා ගැන යහපත් ලෙස සිතූ නිකීතා දත් මැදීමට පවා ඉදිරිපත් විය.

අම්මා නිකීතා තමා වෙත ඇද ගෙන ඔහුගේ අද්මිරාල් (නෞකාපති) පදවිය පවා අමතක කරන්නී, පුරා වසරක් ඔහු නොදුටුවාක් සේ ඔහුගේ හිස දෙස බලා සිට ඔහුගේ මුහුණ ආදරයෙන් සිප ගත්තාය. තාත්තා යටි රැවුළ අත ගා දෙනෙත් මහත් කොට නෞකාපති නිකීතාට වාර්තාව ඉදිරිපත් කළේය:

"උතුමාණන් වහන්ස, ඔබ තුමා වෙත ගෞරවාදරයෙන් දන්වා සිටින වගනම්. මුළු මහත් පෘථිවි ගෝළයේ සිටින ආකාශ වස්තු විද්‍යාඥයින් පිළිගනු ලබන ග්‍රිගොරියානු දින දර්ශනය අනුව අද නුඹ වහන්සේට දස වසරක් පිරෙයි. එම දිනය නිමිත්තෙන් නුඹට තිළිණ වශයෙන් තල දොළහකින් යුත් පිහියක් තෑගි කරමි. මෙය මුහුදු කටයුතුවලට බොහෝ ප්‍රයෝජනවත් දෙයකි.

ඔවුහු උදේ තේ පානයෙන් ඉක්බිතිව පොකුණට ගියෝය. නිකීතාගේ පියා දෙකොපුල් පුම්බාගෙන අපූරු තාලයෙකට යුද්ධ නෞකා තූර්ය වාදනය කටින් පිඹිබේය.

අම්මා තාත්තාගේ තූර්ය වාදනය දෙස බලා 'ඉල කැඩෙනතුරු' සිනාසුණාය. අම්මා තණ පඳුරුවල ඇති පිනි බිඳුවලට ගැවුමේ සායෙහි වාටිය නොතෙමන පරිදි ඇඳුමක් ඇහලා ගෙන සිටියාය. ගුරුතුමා හබල් දෙක සහ ලෝහමය තුඩක් සහිත දිගු රිටක් උරින් ගෙන ගමනට

එකතු විය.

පොකුණු ඉවුරෙහි විශාල කොඩි ගසක් විය. පොකුණු දියෙහි ඔරුව වර්ණනගත වූ කොළ සහ රතු පැහැති තීරු පිළිබිඹු විය. ඔරුවේ සෙවැණැල්ල පිටිවහල් කැර ගනිමින්, දිය සත්තු පීනූහ. දිය මතු පිට දිය මකුළුවෙක් දිවැ ගියේය. තුරු අතුවලට මුවාවෙමින් සහ කුරුළු කූඩුවලැ සිට ලිහිණියෝ පහත බැලූහ.

කොඩිවැලේ පහළින් අද්මිරාල්ගේ ධජය නිකීතාගේ පියා විසින් බඳින ලදී. එය කොළ පැහැති පසුබිම සහිත රතු පැහැති ගෙම්බෙක් පස්සා ගාත්වලින් සිටින සැටි දක්වෙන කොඩියකි. තාත්තා දෙකොපුල් පුම්බාගෙන, අද්මිරාල්ගේ කොඩිය ලනු පටට බැඳ ඉහළට අදිත්ම, එය කොඩි ගහේ මුදුනට ගොස්, මඳ පවනට ලෙළදෙන්ට විය. තුරු අතු සහ කුරුළු කූඩුවල සිටි කුරුල්ලෝ කලබල වී කෑගසමින් පියාඹන්නට වූහ.

නිකීතා වාඩි වී ඔරුව පදවන සුක්කානම අතට ගත් අතර ගුරුතුමා හබල් දෙක දෙපැත්තට දමා ඔරුව පැදවීමට සූදානම් විය. ඔරුව මඳක් සෙළවී පොකුණේ ජලය පීරා ගෙන ඉදිරියට ගියේය. පොකුණු ජලයට ඔරුවත්, හබල් දෙකත්, අහසේ වළාකුළුත්, වේත්ලා ගස් මුදුන් සහ එහි වාඩි වී සිටි ලිහිණියනුත් පිළිබිඹු විය. ඔරුව ජලයෙහි පැද්දෙන්නට වූයේ, අහසත් මහ පොළවත් අතරින් යන්නාක් මෙනි. නිකීතාගේ හිසට ඉහළින් මදුරුවෝ රොත්තක් පියාඹන්නට වූහ. උහු ඔරුව පසු පසින් පියැඹූහ.

"වේගය වැඩිකරනු! තවත් වැඩිකරනු!" තාත්තා ඉවුරේ සිට නිකීතාට කෑගැසීය.

අම්මා අතක් වනා සිනාසුණාය. නිකීතාගේ ගුරුතුමා වැර දමා හබල් ක්‍රියා කැරවූයේය. පසෙක වූ තිල් පැහැති තණ පඳුරුවලින් බියගත් තාරාවෝ දෙදෙනෙක් අඬක් පියාසර කැරමින් දිවැ ගියෝය.

"ගෙම්බා කොඩියට අරක්ගත් නෞකාපතිතුමනි! සතුරාට පහර දීම සඳහා වහාම ඉදිරියට නෞකාව පදවන්නැ!"යි තාත්තා කෑගැසීය.

## ෂෙල්තුහින් නමැති කුරුල්ලා

කහ පාට හොටක් සහ කළු පාට සිරුරක් ඇති කුරුල්ලා පඳුරකට මුවා වී සිටියේය. එය එළිපත්ත සහ ගෙදර බිත්තිය අතර ඇති මුල්ලක වූ ගිනි රත් වූ තණ බිස්සේ විය. ඌ නිකීතා දෙස බැලුවේ ඉමහත් බියෙකිනි.

උගේ හිස පහත් වී ගොස් ඉදිරියට නැමී තිබිණි. ඌ සැහැවී ගෙන උන්නේ දෙපා බඩ යට සඟවාගෙනය. නිකීතා ඌ දෙසට නැඹුරු වෙනම ඌ බිය ගැන්වීමට මෙන් හොට ඉදිරියට දමා කට හැරියේය. නිකීතා කුරුල්ලා අතට ගෙන දෑත් බොකුටු කොටැ ඌ එය මත තැබීය. ඌ ස්ටාර්ලිං නැමැති කුඩා කුරුල්ලෙකි. ඌ ප්‍රථමවරට කුරුළු කූඩුවේ සිට පියාඹා යාමට තැත් කළ විට පියාපත් ශක්තිමත් නැති නිසා බිම වැටුණා විය යුතුය. බිව වැටුණු ඌ පඳුරකට මුවා වී සිටියේය.

කුරුළු පැටියාගේ හදවත ඉතා වේගයෙන් ගැස්සිණි. "දැන් වහාම ඉගිලී යායුතු" යැයි ඌ කල්පනා කළා විය යුතුයි. ඌ පණුවන්, මැස්සන්, දළඹුවන් හොටෙන් ඇන අල්ලා කන සැටි ගැන දැන සිටියේය.

නිකීතා ඌ කට ළඟට ගෙනාවේය. කුරුළු පුංචා දෙනෙත් පියා ගත්තේය. උගේ හදවත වේගයෙන් ගැහෙන්නට විය. නිකීතා ඌට කටින් පිඹ ගෙදර ගෙනාවේය. කොල්ලාට බඩගිනි නැති නිසා පසුව මා කා දමනු ඇතැයි කුරුල්ලා සිතුවා විය හැකියි.

නිකීතාගේ අම්මා ද ඌ අත්ල මත තබා කටින් පිඹ ඌ දෙස බලා මෙසේ තෙපලාය:

"අනේ පුංචි පැටියෙක්, හොට කහම කහ පාටයි, හරියට සෙංගමාල කාරයෙක් වගේ."

කවුළු පඩියේ සිට පැත්තට පෙනේර රෙද්දක් සවි කොට ඇතුල් පැත්තට එනම් ගේ පැත්තට අඩක් වැටෙන සේ පෙනේර රෙද්දෙන් අඩවන් කොටැ කුහරය තුළට කුරුළු පැටියා දැමීය. මුල්ලකට වන් කුරුළු පැටියා ලෙහෙසියෙන් නිකීතාට ගොදුරු නොවන බව පෙන්වීමට තැත් කළේය.

පෙනේර රෙද්දෙන් පිට පැත්තේ ගෙවත්තෙහි වී කුරුල්ලන් රංචුවක් කීචි-බීචි ගාමින් පොර කන සැටි ඇසේ. ගෙයි ඇතුළු පැත්තේ සිට නිකීතාගේ විශාල දෙනෙත් ඌ දෙස බලන සැටි ඌට දැනේ. "මා ඉවරයි, මගේ පණ ඉවරයි" කුරුළු පැටවා සිතන්නට විය.

නිකීතා ඌ කා දමනවා වෙනුවට ඌට මැස්සන් සහ පණුවෙක් ගෙන දුන්නේය. "මේ කොල්ලා මා මරා ගෙන කන්ට ඉස්සෙල්ලා මට ගොදුරු දෙනවා" යැයි කුරුළු පැටවා සිතීය. ඌ පණුවා දෙස හොරැහෙන් බැලීය. රතු පාට පණුවා නයෙක් මෙන් දරණු ගැසීලාය. "මම මේ පණුවාව කන්නේ නැහැ. ඌ හැබෑ පණුවෙක් නොවේ. මේක හැබෑ රැවටිල්ලක්!"

තුරු ලතාවලට එහා හිරු බැස ගියේය. පුංචි පැටවා නිදි මතින් දෙනෙත් පියා ගත්තේය. ඌ පාදවල කුඩා නියවලින් කවුළු පඩිය තදින් අල්ලා ගත්තේය. දැන් පුංචි කුරුළු ඇස්වලට කිසිවක් නොපෙනේ. ගෙවත්තේ සියලු කුරුල්ලෝ නිහඬ වූහ. නිදිමතත්, තෙතමනය සහිත තණකොළ සුවඳත් ඌට දැනිණි. උගේ හිස ඉබේටම පිහාටුවක් අස්සට යැවෙයි. මොනවා වුනත් කෝප වී සිටි කුරුළු පැටවා තද නිදිමත විසින් සෙළවිණි. අනතුරුව වලිගයට වාරු වී නිදා ගත්තේය.

කුරුළු පැංචා අවදි වුණේ වී කුරුල්ලන්ගේ කලබලය සහ පොරකා ගැනීම නිසාය. පිණි බින්දු සහිත තුරු පත්‍ර ඇඳිරිය අතරින් පෙනේ. ස්ටාර්ලින්ග් පක්ෂියෙක් ඈත සිට ලස්සනට ගී ගයයි. "භයියක් ඇත්තෙම නැහැ. භාමත නිසා වමනය යන්ට වගෙයි." කල්පනා කළ කුරුළු පැටවාට ඊයේ නිකීතා ගෙනා පණුවා පෙනිණි. ඌ කුඩා සිදුරකට අඩක් රිංගා ගෙන සිටියේය. කුරුළු පැටවා පැන ඌට හොටෙන් ඇන ඇදගෙන ඌ ගිල දැම්මේය. "වරදක් නැහැ. පණුවා රසයි."

ඇඳිරි පැහැය දැන් නිල්වන් ආලෝකයකට හැරවිණි. කුරුල්ලෝ ගී ගයති. පෙනේර රෙද්දේ කුඩා සිදුරු අතරින් හිරු එළිය කුරුළු පැටවාගේ නිවහනයට වැටිණි. "තවත් ජීවත් වෙමු" යි සිතූ ඌ ඉදිරියට පැන මැස්සෙක් අල්ලා කෑවේය.

එවිටම වාගේ කුරුළු පැංචාගේ නිවහන වෙත පැමිණි නිකීතා

ඔහුගේ අත පෙනේර රෙද්දට ඇතුළු පැත්තට දමා මැස්සන් සහ පණුවන් ගොඩක් දැම්මේය. බොහෝ බිය වූ කුරුළු පැංචා පියාපත් විහිදාගෙන අත දෙස බැලීය. ඒ අත උගේ හිසට උඩින් සෙළවී පසුව පෙනේර රෙද්දටත් ඉහළින් ඉවත් වී නොපෙනී ගියේය. නිකීතා යළිත් වරක් තමා දෙස බලන සැටි කුරුළු පැටවාට පෙනිණි. ඒ දෙනෙත්වල පැහැය වෙනස්වන සැටියෙකි.

නිකීතා ගිය පසු කුරුල්ලා කල්පනා කළේය: "ඉතින් එයා මාව කෑවේ නැහැ. ඒ කොල්ලා කුරුල්ලන් නොකන හැඩයි. එහෙනම් ඉතින් මට බය වීමට හේතුවක් නැහැ."

කුරුළු පැටවා බඩ පුරා කා බී හොටෙන් පිහාටු සුද්ද කොට, උඩ පැන පැන යමින් පෙනේර රෙද්දෙන් ආවරණය වී ඇති ගෙවත්තෙහි සිටි, හිසෙහි පිහාටු වැටුණු වී කුරුල්ලකු දෙස බලා ඌට විහිළු කරන්නට විය. හිස සොළවා වී කුරුළු තට්ටයා දෙස බලා හඬ නැංවීය: "චීක්-චිලික්, චීක්-චිලික්" කෝප වූ වී කුරුළු තට්ටයා ඉදිරියට පැන පුංචි කහ කුරුල්ලාට හොටෙන් ඇන්නද එය පෙනේර රෙද්දට පැටළිණි. "ඉතින් නුඹ මට ඇනපු හැටිද?" කියා අසන්නාක් මෙන් ඌ දෙස බැලූ කුරුළු පැටියා කවුළු පඩිය ඔස්සේ ගමන් කළේය.

ඉන් අනතුරුව යළිත් කවුළුව ළඟට ආ නිකීතා ඒ වර කෑම රහිතව හිස් අත කුරුළු පැටවා වෙත දිගු කළේය. කුරුළු පැටවා උඩ පැන හැකි තරම් වේගයෙන් නිකීතාගේ අතට හොටෙන් ඇන්නේය. ආපස්සට ගොස් ඌ සටනට සූදානම් විය. නිකීතා කට හැර සිනාසුණේය:
හා-හා-හා!

එලෙස දවසක්ම ගෙවිණි. දැන් නම් බිය වීමට දෙයක් නැත. කෑම හොඳයි නමුත් පාළු ගතියක් දැනෙනවා. කුරුළු පැටවා ඇඳිරි වැටෙනතුරු බලා සිට රැයෙහි දී ඉතා හොඳින් නිදා ගත්තේය.

උදෑසන ඉතිරිව තිබුණු කෑම ටික ගිල දමා පෙනේර රෙද්දෙන් පිටතට යන සැටියක් සොයා බලන්නට විය. වටේටම පිරික්සා බැලුවද සිදුරක් එහි නොවීය. එවිට ඌ වතුර පිරි පීරිසියට පැන හොටෙන් වතුර උරා හිස ඔසවා බීවේය.

දහවල් කාලය ඉතා දිගු බවකි. තිකීතා පණුවන් අල්ලා ගෙනවිත් කුරුළු පැටියාට දුන්නේය. ජනේල පඩිය තාරා පිහාටුවකින් සුද්ද කළේය. තට්ට වී කුරුල්ලා කළු කුරුල්ලෙකු සමග පොර කෑමට ඉදිරියට ආවද කළුවා ගැසූ පහරක් නිසා තට්ටයා විසි වී ගියේය. ඌ යළිත් පියාපත් ගසා නැගී සිටියේය.

ඔන්න ඉන් පසු ජනේලය ළඟටම ආවේ පොල්කිච්චාය. ඌ ඇවිත් හඬ නගා වලිගය නටවා තේරුමක් ඇති කිසිවක් නොකර ඉගිලී ගියේය.

උණුසුම් හිරු එළිය ගැනත්, මී පැණි ගැනත් මලීන කුරුල්ලා හොඳ ලස්සන ගීතයක් ඇද පැද ගයන්නට වී. ඒ ගීතය අසා ෂෙල්තුහින් ද දුකට පත් විය. ඌටත් ගීතයක් ගායනය කිරීමේ ආශාවක් ඇති වුණ ද උගුරෙන් පිටතට ගීතය නොඑයි. කොහේ ගයන්ටද? පෙනේර රෙද්දට මුවා වෙලා කවුළු පඩිය උඩට වෙලා ගී ගයනු නොහැකිය...

ඌ යළිත් පෙනේර රෙදි දෙකට මැදින් ඇති කවුළු පඩිය උඩ ගමන් කරන විට මහා භයානක සතෙකු දිටීය. ඌ උගේ කෙටි ගාත් අතරෙන් බිමෙහි බඩ ගාමින් ප්‍රවේසමින් එන සැටි ෂෙල්තුහින් දැක්කේය. උගේ මුහුණ වටකුරුය. මුහුණ දෙපස සතට වැඩුණු මයිල් ගස් කිහිපයක් ඇත. උගේ දෙනෙත් යකුගේ මෙන් තපුරුය. බොහෝ බියට පත් ෂෙල්තුහින් බිම වාඩි වී නොසෙල් වී සිටියේය.

ඒ තමා තිකීතාගේ ගෙදර ඉන්න බළල් තඩියා. ඌ එකවර උඩ පැන උගේ ගාත්වල ඇති දිගු නියපොතුවලින් කවුළු පඩිය අල්ලා ගත්තේය. කොළ පැහැති ඇස්වලින් බළල් තඩියා පෙනේර රෙද්ද දෙස බලත්ම කුරුළු පැටවාගේ කට ඉබේටම ඇරියේ බිය නිසාය... අහෝ දෙවියනි... කුරුළු පැටවාගේ හොටටත් වැඩිය දිග ඇති බළල් නියපොතු ඌ දෙසට එල්ල වී ඇත. එක පහරකින් බළලා පෙනේර රෙද්ද ඉරා සිදුරු කළේය. කුරුළු පැටවාගේ හදවත ඉතා වේගයෙන් ගැහෙයි. පියාපත් නැටවෙයි. ඔන්න එවිට, හරියටම නිසි වේලාවට එතැනට පැමිණි තිකීතා බළලාගේ බෙල්ල කෙටියෙන් අල්ලාගෙන ඌ ගෙනැගොස් දොරින් එහා දැම්මේය. බළල් තඩියා අමනාපයෙන් කෙඳිරි ගා වලිගය පහතට දමා ගෙන දිව්වේය.

"නිකීතාට වඩා බලගතු සතෙක් නැතැ"යි කුරුළු පැංචා සිතුවේය. බළලා පන්නා දැමීමෙන් ඉක්බිතිව පැමිණි නිකීතාට තම හිස අත ගෑමට ඉඩ දුන්න ද කුරුළු පැටවා බියවීම නැවැත්වූයේ නැත. ඌ බිය නිසාම බිම ඉන්දවිණි.

එදින ද අවසන් විය. පසුදා උදෑසන තම කවුළු පඩිය දිගේ යමින් තරඹන විට, ඊයේ බළලාගේ නිය පහරට ඉරී ගිය සිදුර කුරුළු පැටවා දුටුවේය. ඌ හොටටත් හිසත් එළියට දමා අනතුරුව සිදුරෙන් පිට වී සෙමින් හමන සුළං පහරට එක් වී ඉතා පුංචි අත් තටු වනමින් යමතමින් කාමරයේ ලී පොළවට ඉහළින් පියාසර කළේය.

දොර අසල දී ඌට යමතමින් ඉහළ නැගීමට හැකි විය. යාබද කාමරයේ වටකුරු මේසයක් වටා වාඩි වී සිටින සතර දෙනෙකු ඔහු දිටිය. ඔවුහු අතින් විශාල කැබලි ගෙන ඒවා කටේ ඔබා ගන්නා සැටි කුරුළු පැටවාට පෙනිණි. හතර දෙනම නෙත් හරවා තමා දෙස බලන සැටි කුරුළු පැටවා දුටුවේය. වහාම අතික් අතට හැරී පියාඹා යා යුතු යැයි ඌ තීරණය කළ ද බිම නොවැටී ආපසු හැරෙන ගමන්ම පියාසර කිරීමේ ඒ අමාරු කාර්යය කිරීමට මේ කුරුළු පැංචාට නොහැකි විය. එක් තටුවකට බරව ඌ මේසය මත වැටී, දෙපසින් සිට සිටගත්තේය. ඌ දැන් ඉන්නේ සීනි දීසියට සහ ජෑම් දීසියට මැදිනි... තමා ඉදිරියේ නිකීතා වාඩි වී සිටින සැටි කුරුළු පැටවා දුටුවේය. එවිට ඌ තව දුරටත් කල්පනා නොකරම දීසියේ කෙළවරට පැන, එතැනින් නිකීතාගේ උරයට පැන්නේය. ඌ උරය මත වාඩි වී පිහාටු පුම්බාගෙන දෙනෙත් ද අඩවන් කැර ගත්තේය.

එලෙස නිකීතාගේ උරයක් මත සිට පුංචි කුල්ලා සීලිම දක්වා පියාසර කොට මැස්සෙක් අල්ලා ගෙන කාලා, ගෙයි මුල්ලේ ඇති පීකුස් ගහ වෙත පියාඹා ගොස් වැසීය. පසුව ලාම්පුවේ ගොලෝව වටා පියාඹා බඩගිනි දනුණෙන් පෙනේර රෙද්දෙන් වසා ඇති තම කවුළුව වෙත ගොස්, එහි තමා වෙනුවෙන් පිළියෙළ කැර තිබූ පණුවන් කා දැමීය.

හවස් වනවිට නිකීතා එළි පත්තක් සහිත කුඩා ගෙයක් වැනි ලී මුවා කුරුළු කූඩුවක් ගෙනාවේය. ෂෙල්තුහින් එම ගෙයට කැමැත්තක් දක්වා එය තුළට රිංගා ගත්තේය. එහි පොඩි දොරක් සහ සිහිති කවුළු දෙකකි. ගෙතුළ ඇඳිරිය. ඌ තම අලුත් නිවාසය පිරික්සා බලා එහි

නිදා ගත්තේය.

එදින රාත්‍රියෙහි ගබඩා කාමරයට දමා සිටි බළල් තඩියා බැරෑඩි හඬින් 'ක්‍යාව්' ගාමින් මීයන් පවා අල්ලීම වර්ජනය කළේය. බළලා කුරුළු පැටවා ඇල්ලීමට ගිය නිසා ඌට දඬුවම් දෙන ලදී. දොර අසලට වී කළ බළල් කෙඳිරිය ඌටම පවා එපා විය.

දැන් නිකීතාගේ මහ ගෙදර බළලා, ඉත්තෑ පැටියා හැරුණු විට තුන්වැනි ප්‍රාණකරුවෙක් ද එනම් ෂෙල්තුහින් නැමැති කුරුළු පැටවා ද වාසය කරන්ට විය. මේ කුරුළු පැංචා නිදහස්, දක්ෂ ප්‍රයෝගකාරී කුරුල්ලෙක් විය. ඌ මිනිසුන් කතා කරන සැටි අසා සමහර ශබ්ද හඬනගා උච්චාරණය කළේය. 'සාෂා' යන්න (හෙවත් අලෙක්සාන්ද්‍රා - නිකීතාගේ මවුගේ නාමය) ශබ්ද කිරීමටත් හිස පහත් කරමින් 'සාෂා' කියා ගීතමය ලෙස කීමටත් ෂෙල්තුහින් උගත්තේය. එය තමාට කරන ආචාරයක් ලෙස නිකීතාගේ මවු පවසන්නට වූවාය. ෂෙල්තුහින්ව දකින නිකීතාගේ මවු "ආයුබෝවන් හොඳ කුරුළු පැංචො මගෙ, ගී ගයපන් නුඹ පොඩි දරුවකු වගේ" කියමින් කුරුල්ලාට සුරතල් බස් දෙඩුවාය. කුරුල්ලා ද ඇගේ ගවොමේ බිම වැදෙන කෙළවරේ වසා සිටීමටත් ඇය පසුපසින් ඉමහත් සතුටින් යාමටත් උගත්තේය.

එලෙස මේ කුරුල්ලා සරත් සමය දක්වා ගෙදර වාසය කළේය. උගේ තටු වැඩිණි. ඒවා කළු පැහැති පිහාටු වලින් වැසිණි. ඌට රුසියන් බසින් කතා කිරීමට ද පුළුවන් බව දැනගන්නා ලදී. දහවල් කාලයේ දී ගෙවත්තේ සැරි සරන ඌ ඇඳිරි වැටෙත්ම, කවුළු පඩිය මත ඇති උගේ කුරුළු ගෙය තුළට විත් රැය ගත කළේය.

අගෝස්තු මාසයේ දී ඌ සමග හාදවුණු කැලෑ ස්ටාර්ලිං කුරුල්ලෝ ඌට හොඳට පියාසර කිරීමට උගැන්වූහ. සරත් සමයේ දී තුරු අතුවල කොළ හැලෙන්නට පටන් ගත් විගස ෂෙල්තුහින් නැමැති මේ කුරුල්ලා සිය සගයින් සමග එකතු වී හිම කාලයෙන් බේරීම පිණිස ඈත පිහිටි අප්‍රිකාව බලා ඉගිලී ගියේය.

## අශ්ව පැටවා

වසන්ත කුඹුරු වැඩ කැරැ හමාර විය. පළතුරු වත්ත කපා ශුද්ධ කොට අතු ගා අංකුර රෝපණය කොට වතුර ඉස සම්පූර්ණ කරන ලදී. ගොයම් කපා පාගන දවස තෙක් වැඩ කටයුතු අල්ප සමය එළැඹියේය. වැඩට ගන්න අශ්වයින්, රංචුවට දක්කන ලද්දේ උන්ට තිකම් සිටීමට හා නිදල්ලේ හැසිරීමට ඉඩ දෙනු සඳහාය. උහු තණ පිටියේ ලා තණ කමින් ඇවිද්දාහ. උදැසන තණ පිටිය නිල් පැහැති මීදුමකින් වැසෙයි. අඳුරු වළාවලින් යෝධමය ඔසොකෝර් ගස් මැවී ඒවා මහ පොළවට ඉහළින් පවතින සැටියෙක් පෙනෙයි.

අශ්ව රංචුව බලා ගන්නා ලද්දේ මීෂ්කා විසිනි. උසැති කසාක් වර්ගයට අයත් සැදැලයක් සහිත අශ්වයකු පිට නැග ගත් ඔහු, පාවහන් රහිත දෙපා දෙපැත්තට දමා ගෙන, දෙපා වනමින් රේන්ස් පටි අතින් ගෙන ඌ මෙහෙයවීය.

අශ්ව පැටියෙක් රංචුවෙන් ඈත්ව තිල්වන් තණ පිටියෙහි දුවන විට මිෂ්කා ඌට කෑගැසීය. "ආසාත්!" ඔහු අත ඇති කසය කරකවා වෙඩි හඬක් බඳු හඬක් ඉන් නැංවීය. මෙසේ අශ්වයින් පාලනය කරන මීෂ්කා තණ උලා කමින් සිටින තම අශ්වයා පිටින් බැස අගලෙහි පස් කණ්ඩිය උඩ වාඩිවෙයි. ලීයක් ගෙන එය පොතු ගසා පිළියෙළ කරයි. නැතිනම් කලිසම දණහිස දක්වා නවාගෙන පොකුණට බැස කමීෂ් පඳුරු උගුල්ලයි. කමීෂ් ගහේ මුල් දිගුය, නයින් මෙනි. එහි ඇති කුඩා අල ඇඹුල් රසය, ඒවා කන විට 'කරස්-කරස්' යන හඬක් මතුවෙයි. මුල් පිටි සහිතය, පැණි රසය. කමීෂ් අල සහ මුල් බොහොමයක් කෑවොත් බඩ රිදෙනු ඒකාන්තය.

නිකීතා මුළු දවස තිස්සේ ම මිෂ්කා ළඟට වී අශ්වයින් පිට යන සැටි ඉගෙන ගත්තේය. අශ්වයාගේ පිටෙහි ඇති සැදැලයට නැගීම අපහසු කරුණක් නොවීය, මහලු අශ්වයා සාමකාමීව සිටගෙන උන්නද, එහෙත් උගේ පිට උඩ නැග ගෙන රේන්ස් පටි අල්ලා ගත් පසු ඌ හැමේ යාමට පටන් ගත් විට නිකීතා වරෙක දකුණටත්, තවත් වරෙක වමටත් බරවෙන්නට විය. අළු පැහැති ඒ අශ්වයා පියවර තිහක් පමණ දුර ගොස් නැවතී විශාල දෙතොල් සහිත හොස්ස තණ පඳුරක් දෙසට පාත් කළ

විය, නිකීතා බියගෙන ගැහෙමින් සැදැලයේ ඉදිරිපස නැම්ම තදින් අල්ලා ගත්තේය. සමහර විට අශ්වයාගේ ග්‍රීවය දිගේ පහළට රූටා ගියේය. අශ්වයා ඒ ගැන කලබල නොවීය.

එවිට මිෂ්කා නිකීතාට මෙසේ පැවසීය:

"නුඹ බයවෙන්ට එපා. බිම වැටුණාම එතරම් රිදෙන්නෙ නැහැ. හැබැයි බෙල්ල නමා ගෙන තියාගන්ට ඕන. දැතින් බිම වැටුණොත් දෙවියන්ගේ පිහිට තමා. වැටෙන විට තුන්කුන්දුම් ගැහිලා වැටෙන්න. ඕන්න මම පේනවන්නම් සැදැල සහ කටකලියා නැති අස්පයකු පිට නැගලා ගමන් කරන හැටි."

මිෂ්කා අවුරුදු තුනක් වයසැති තවම මිනිසුන් පිටින් ගෙනයාමක් නොකළ අශ්ව නාම්බන් වෙත දුව ගොස් උන්ට කතා කළේය:

"මෙන්න පාන්, මෙන්න කාපන්..."

ඔහු වෙත ආවේ සිහින් කකුල් ඇති තරුවා නැමැති අශ්වයාය. ඌ හුරතල් සතෙකි. ඌ කන් යොමා ගෙන පාන් ඉල්ලන්නාක් මෙන් දම් පැහැති තොල් යොමා පාන් සෙව්වේය. මිෂ්කා උගේ ගෙල කසමින් ඌ සුරතල් කළේය. තරුවා නමැති අශ්ව පෝතකයා ද මිෂ්කා සතුටු කැරැවීමට මෙන් හිස නටවා මිෂ්කාගේ උරහිස උගේ දත්වලින් සෙමින් ඇල්ලීය.

මිෂ්කා ඌ අත ගාමින් උගේ ගෙල දිගේ අත්ලෙන් උගේ දිලිසෙන සම පිරිමැද්දේය. එවිට අශ්ව පෝතකයා කලබලයෙන් දෙපා ගස්සන්ට විය. මිෂ්කා උගේ ගෙල ග්‍රහණයෙන් දැඩි කොටැ ගෙන උගේ පිට උඩ නැංගේය. මවිතයට පත් ඌ පැත්තකට හැරී හිස සැලීය, උඩ පැන පස්සා ගාත්වලින් බිම හිඳගත්තේය, අනතුරුව සැනෙකින් නැගී සිට ඉමහත් වේගයකින් දිව්වේය.

මිෂ්කා ඌ පිට උඩ වාඩි වී සිටියේ අඩුවලින් එල්ලී සිටින සතකු මෙනි. එවිට හිටි හැටියේම නැවතී පසුපස ගාත්වලින් උඩ පනිත්ම, මිෂ්කා ගුලියක් සේ කුඩු ගැසී තණ බිස්ස මත පෙරළුණේය. අනතුරුව

මිෂ්කා, නිකීතා වෙත ආවේ, කොර ගසමිනි. කම්මුලක් සීරීම නිසා ගැලූ ලේ බින්දු පිස දමමිනි.

"ඒ කාලකණ්ණි අස්පයා මා දර කෝටු ගොඩකට විසි කළා. නිකීතාට ඔහොම පහන්කමක් කරන්ට බැහැ. ඔයාගෙ ඇගේ තෙල වැඩියි."

නිකීතා නිහඬව මෙසේ කල්පනා කළේය: "මගේ බෙල්ල කැඩුණත්, මම මිෂ්කාට වඩා හොඳට අස්පයා පිට යාමට ඉගෙන ගන්නවාමයි."

දහවල් ආහාර ගනිද්දී නිකීතා තරුවා නැමැති අශ්වයා ගැන විස්තර කළ විට, අම්මා ඉමහත් සේ කැළඹීමට පත්වුණාය.

"මෙල්ල නොකළ අසපයින් ළඟින්වත් පුතා යන්ට එපා. පුතා ඇහුණද?" මෙසේ කී අම්මා තාත්තා දෙස බැලුවේ දෙනෙතින් ආයාචනය කැරැන්නාක් මෙනි. "අනේ වාස්යා, ඔයාවත් මගේ ඉල්ලීම ඉටු කරන්ටයි කියල පුතාට කියන්න. නැතිනම් වෙන්නෙ අතපය කඩා ගැනීමටයි..."

"අන්න හොඳ වැඩේ. ඔයා පුතාට තහනම් කරන්න අස්පයින්ගෙ පිට උඩ යාම. පයින් ගමන් කිරීමත් තහනම් කරන්න. පය පැටලිලා බිම වැටිලා නහය කඩා ගන්ට පුළුවන් නොවැ. පුතා ලොකු වීදුරු බූජමක දාලා වටේට පුළුන් දමලා එයා කටු ගෙට යවන්නැ"යි තාත්තා උපහාස ලෙස කීවේය.

"මම ඔය වග දැනගෙන තමා හිටියෙ. මේ ගිම්හාන කාලෙදි මට නිවීහැනේ ඉන්ට ලැබෙන්නේ නැහැ..." අම්මා දොම්නස පළ කළාය.

"සාෂා, ඔයා තේරුම් ගන්ට කොල්ලාගේ වයස අවුරුදු දහයක්."

"ඒ වුණාට..."

"මා කැමති නෑ මගේ පුතා තිකම් නෝන්ජල් කැඳයෙක් වෙනවාට," තාත්තා කීවේය.

"ඒ වුණාට පුතාට ක්ලෝපික් අශ්වයා එක පාරටම තෑගි කිරීමත් හොඳ වැඩක් නොවේ."

"පළමුවැනි කරුණ නම් ක්ලෝපික්ගේ පිට උඩ අත දරුවකුට වුණත් යන්ට පුළුවනි," තාත්තා අම්මාට පැහැදිලි කළේය.

"උෟට ලාඩම් ගහල."

"නැහැ මා තියම කළා උගේ ලාඩම් ගළවා දමන්ට."

"එහෙනම් ඉතින් එයාට දෙන්න එයා ඉල්ලන ඕන දෙයක්. ඕනෑම යක්ෂ ආවේශ වේච්ච අස්පයකුගේ පිට උඩ ගිහිල්ලා බෙල්ල කඩාගන්ට එයාට අවසර දෙන්න"යි අම්මා කියා සිටියේ කඳුළු පිරි දෙනෙතින් බලමිනි. අනතුරුව ඕ හනික නැගිට තම නිදන කාමරයට ගියාය.

තාත්තා ඉක්මණින් තම යටි රැවුළ අත ගෑවේය. අත පිස්නය මේසය උඩ තබා අම්මා වෙත ගියේය. මෙම දෙබස තමාට අයිති දෙයක් නොව බව අහවමින් මෙතෙක් වේලා තිහඬව සිටි නිකීතාගේ ගුරුවරයා තම ඇස් කණ්නාඩිය හරි ගස්වා ගනිමින් පහත් හඬින් මුමුණුවේය:

"ළමයෝ, නුඹේ දසාව හොඳ නැහැ."

"අර්කාදියි ඉවානවිච් අම්මාට කියන්න මම අස්පයා පිටින් බිමට නොවැටීමට පොරොන්දු වනබව... සත්තක ඇත්ත. මම..."

"ඉවසීම, විඳ දරා ගැනීම සහ අධිෂ්ඨාන ශක්තියැ"යි පැවසූ ගුරුතුමා ඔහුගේ නහය මත වැසීමට තැත්කළ මැස්සකු ඉතා දක්ෂ ලෙස අල්ලා ගත්තේය. "අස්පයකු පිට හොඳට යාමට ඉගෙන ගන්නවාක් මෙන්ම, ඔය ගති ගුණ තුනත් ඉතා වැදගත්..." ගුරුවරයා කීවේය.

ඒ අතර නිදන කාමරය තුළ ඇවිලෙන විවාදය ඇසෙයි. තාත්තාගේ කටහඬ රැව්දිණි: "ඔය වයසෙදි කොල්ලො සම්පූර්ණයෙන්ම ස්වාධීනය..." "ස්වාධීන කොහිද?" අම්මා ප්‍රශ්න කළේ බලාපොරොත්තු

විරහිත ගතියෙකිනි... "ඇමරිකාවේ ළමයි ඔය වයසෙදි නිදහස්..." "ඒක ඇත්තක් නොවෙයි..." "මම ඔයාට කියන්නෙ, ඇමරිකාවේ ළමයින් බොහොම නිදහස්. මම උදාහරණයක් කියන්නම්..." "අනේ දෙවියනේ අපි ජීවත්වන්නේ ඇමරිකාවේ නොවෙයි..." අම්මා තෙපළාය.

ස්වාධීනත්වය ගැන සතියක් පුරාම කතා කරන ලදී. අතපය කඩා ගැනීමට නියම වුණු කෙනෙකු දෙස බලන ආකාරයට අම්මා නිකීතා දසෙ බැලූ අතර, යටත් පිරිසෙයින් බෙල්ල කඩා නොගනිතියි ඕ පැතුවාය.

නිකීතා එම සතිය පුරාම පොකුණට එහා තණ පිට්ටනියට වී අශ්වයින් පිට උඩ යන සැටි පුහුණු විය. මිෂ්කා ඔහු දිරි ගන්වමින් ඔහුගේ දක්ෂකම් පෙන්වීය. දුවගෙන ගොස් එක පිම්මට අසු පිට නැගීම, පසු පසින් ගොස් කරණමක් ගසා අසු පිට නැගීම ආදිය දේ මිෂ්කා දක්ෂ ලෙස කළේය.

"අස්පයා කට අරින්නත් ඉස්සෙල්ල උගේ බෙල්ලේ කෙස් වැටියෙන් අල්ලා උගේ පිට උඩ නගින්ට ඕන."

පසුදා උදෑසන ඔව්හු සඳළුතලයට වී තේ පානය කරන්නට වූහ. තේ මේසය මත සෙවණැලි ඇති කැරැමින් කුසුම් ලතාවල සෙවන වැටී තිබිණි. අම්මා නිකීතාට අඬ ගසා ඔහු දෙස බලා දුක්බර හඬෙකින් කතා කළාය:

"පුතා දන්නවද, දැන් පුතාට අවුරුදු දහයක් පිරුණා. පුතා දැන් තනිවම වැඩ කරගන්න ඕන. පුතාගෙ වයසෙ අතික් ළමයි සම්පූර්ණයෙන්ම, සම්පූර්ණයෙන්ම..." ඇගේ කටහඬ බිඳුණාක් මෙනි, ඕ තාත්තා දෙසට යමින් මුහුණ හරවා කතා කළාය. "හැබැටම තාත්තාගේ කතාව හරි. පුතා දැන් පුංචි ළමයෙක් නොවෙයි."

තාත්තා බිම බලාගෙන ඇඟිලි තුඩින් මේසයට ගසන්නට විය. අම්මා යළිත් නිකීතාට මෙසේ කීවාය: "අපි හෙට වෙම්බුලාතවාගේ ගෙදරට යන්ට ලෑස්ති වෙනවා. පුතත් කැමති නම් ක්ලෝපික් අස්පයා පිට නැගිලා එන්න... නමුත් මා ඉල්ලා හිටිනවා... ඉල්ලා හිටිනවා..."

"අනේ, අම්මේ, අම්මාට මම සත්තකටම පොරොන්දු වෙනවා, මට කිසිම තුවාලයක් වෙන්නෙ නැහැ." මෙසේ කී නිකීතා අම්මාගේ දෙනෙත්, කම්මුල්, නිකට සහ මිහිරි පලු සුවඳක් වාහනය වන දෑත් සිප ගත්තේය.

පසු දවස වේලාසනින් දහවල් ආහාරය ගෙන, නිකීතාගේ පියා වයිලි නිකීතායෙවිච් අළු පැහැති සමින් කරන ලද ඉංග්‍රීසි සැදෑලය ගෙනෙන ලෙස නිකීතාට අණ කොට අශ්ව ගාලට යන ගමන් මෙසේ පැවසීය:

"පුතා අශ්වයාගේ ඇඟ පිරා ශුද්ධ පවිත්‍ර කරන්ටත්, කට කලියාව අන්දවන්ටයි, සැදෑලය දමන්ටත්, ඌ පිට ගිය පසු උගේ ඇඟ තිවෙන්ට ඉඩ හරින සැටිත් ඉගෙනගන්ට ඕන. අස්පයා ශුද්ධ පවිත්‍රව තියාගත යුතුය. අන්න එතකොට තමා නුඹ නියම අසරුවකු වෙන්නේ."

අශ්වයෝ තිදෙනෙක් පියස්ස විවෘක කළ රියකට බඳින ලදහ. අස්රියකරු සෙර්ගේයි ඉවානවිච් යටි කබායක් සහ දම් පැහැති අත් වැසුම් ලා ගෙන 'කැප්' හිස් වැස්මක් පැළඳ සිටියේය. ඔහු පිහාටුවක් සහිත තොප්පියක් හිස ලා ගත්තේ තමාට අයත් ආසනයෙහි වාඩි වී අශ්වයින්ගේ පටි සකස් කරමිනි. රියකරුවා තමාට උදව් කරන අර්ත්යොම්ට බැණ වැදුණේය:

"උඹ මොකද මිනිහෝ අස්පයාගේ පපුවට පහළින් පටිය දමන්නේ, මෝඩ මනුස්සයා නුඹ පටි වරද්දලා නොව. නුඹ හොඳයි බළලකු වේවැල් කූඩෙට බන්දවන්ට."

"මට අස්පයො නැහැ නෙව," අර්ත්යොම් කීවේය.

"අන්න ඒ නිසා තමා නුඹට කෙල්ලෝ කැමැති නැත්තේ, නුඹ මෝඩයා. මට අලුත් රේන්ස් පටි දෙනවා" අසරුවා පැවසීය.

විවෘත කළ දොර අසල හම් පටියෙන් බැඳ සිටි ලෝඩ් බයිරන් නැමැති අශ්වයා කටකලියාවේ කොටසක් සපමින් ලී මුවා පොළව මත පනිමින් සිට, අසරුවාගේ උරහිසක් යම්තමින් දත්වලින් සැපුවේ ඔහුට

නොරිදෙන ලෙසිනි. රිය මඩුව තුළ සම් සුවඳක් ද, අශ්වයින්ගේ ඩහදිය සහ පරෙවියන්ගේ සුවඳක් ද වහනය විය. රියකරුවා සිනහ මුසු මුහුණෙන් නිකිතා දෙසට හැරී කතා කළේය.

"පුංචි මහත්තයා සැදෑලය දාන්ට කැමති නැද්ද?"

ක්ලෝපික් නැමැති අශ්වයා ගෙනෙන ලදින් නිකිතා ඔහු දෙස කැළඹුණු සිතින් බැලීය.

ක්ලෝපික් දුඹුරු පැහැතිය, ඌ ඉතා හොඳින් පීරන ලද මිටි මහත අශ්වයෙකි. අශ්ව පොව්වකු වූ උගේ පාදවලට මේස් ඇන්ද වූ කලෙක මෙන් ඒවායේ පැහැය උඩ කොටසේ පැහැයට වඩා වෙනස් විය. වලිගය කළු පැහැතිය, ඝනය. ගෙල ද තද දුඹුරු පැහැතිය. උගේ ඇස් බාගෙට වැසෙන සේ පෙති දෙකක් ඇස්වලට තරමක් ඈතින් සවි කැරැ තිබිණි. ඌ කෙදි අතරින් බලමින් ප්‍රීතිමත් ලෙස හිස සැලීය. පිට දිගට කළු පැහැති සම් පටියකි.

"මේ අස්පයා කරුණාවන්තයි," එසේ කී අස්රිය කරුසෙර්ගේයි ඉවානිච් ඌට වතුර බාල්දියක් ගෙනාවේය.

ක්ලෝපික් වතුර බී හොම්බ උඩු අතට හරවත්ම උගේ අළු පැහැති දෙතොල් අතරින් වතුර වැස්සිණි.

නිකිතා කියා දුන් පරිදි කටකලියාව ඇන්දවීය. අශ්වයා යකඩමය කොටස දතින් අල්ලා ගත්තේය. නිකිතා ඌගේ පිටට සැදෑලයට පෙර දැමිය යුතු රෙදි දමා අනතුරුව සැදෑලය තබා පටිවලින් පදින්නට විය. එය ලෙහෙසි කාර්යයක් නොවීය.

"බඩ පුම්බාගන්නවා. හරිම කපටි අස්පයා, බඩ පුම්බා ගන්නවා." එසේ පැවසූ අස්රියකරුවා ක්ලෝපික්ගේ බඩට අත්ලෙන් ගැසීය. එවිට අශ්වයා ප්‍රශ්වාස කළේය. නිකිතා බඳ වටා සැදෑල පටි තද කළේය.

නිකිතාගේ පියා විත් අණ දුන්නේය:

"රේන්ස් පටි වම් අතින් අරගෙන, අස්පයාගේ ඉස්සරහ පැත්තෙන් වම් උරහිස ගැවෙන ලෙස සිට ගෙන උගේ පිට උඩ නගින්න. ජංඝා* වලින් අස්පයාගේ බඳය අල්ලා ගනු. සැදැල වළලු තුළට පාද නොදමනු, පාද හරවන්ට එපා."

නිකීතා අශ්වයා පිට වාඩි වී වෙව්ලන දකුණු පාදයෙන් සැදැල වළල්ල ඇල්ලීය. ක්ලෝපික් අශ්වයා හැල්මේ අශ්ව ගාල තුළට ගියේය.

තාත්තා කෑගැසීය:

"නැවැතියන්, නැවැතියන්! දකුණු රේන්ස් පටිය ඇදපන්, ඇතුම් හරින්ට එපා!..."

අශ්වගාලට පැමිණි ක්ලෝපික් කිසි ගණනක් නොගෙන සිට ගත්තේය. නිකීතා උගේ පිටින් බැස කටකලියාවෙන් ගෙන ඌත් සමග දොර වෙතට ගමන් කරමින් කපටි අශ්ව පෝතකයාට බැණ වැදුණේය:

"ඌරා, නුඹ අස්පයෙක් නොවෙයි, ඌරු තඩියෙක්. මෝඩයා..."

ක්ලෝපික් සතුටු සිතින් ගෙල නැටවීය. අස්රිය පදවන්නා නිකීතා වෙත පැමිණ මෙසේ පැවසීය:

"ඉඳගන්න. මම ගෙන යන්නම්. අස්ස පැටියා හරි කපටියා. ඌ වැඩකරන්ට කැමති නැහැ. පැත්තකට වෙලා ඉන්ටයි උගේ ආසාව."

අවසානයේ දී ක්ලෝපික් අශ්වයා මෙල්ල කොට නිකීතා ඌ පිට නැගී, අශ්ව ගාල සහ හරක් මඩුව වටා හැල්මේ ගියේය.

අස්රිය පදවන්නා හෙවත් සෙර්ගේයි ඉවානවිච් පිහාටු සහිත තොප්පිය හිස ලා ගෙන, පිටි තැවරූ අත්වැසුම් ලා ගෙන, රියකරුගේ කුටියෙහි වාඩි වී, දැඩි ලෙස කෑගැසීය:

---

* දණහිස සිට පාද දක්වා වූ කකුලේ කොටස. - අනුවාදක

"අත හැරපිය!"

ලෝඩ් බයිරන්ගේ කටකලියාවෙන් අල්ලා ගෙන සිටි අර්ත්යොම් එය අතහැර හතික අහකට පැන්නේය. අස්ස මඩුව තුළ තිබූ ත්‍රොයිකා රිය එහි ලී මුවා පොළව ශබ්ද කැරමින් පිට විය. රියෙහි වාර්නිෂ් ආලේපය සහ පිත්තල මෙවලම් ආදිය හිරු රැස් විසින් දිලිසිණි. අශ්වයෝ තිදෙන කුර ගටමින් දූලි නංවමින්, කුඩා සීනු සහ ගෙජ්ජි හඬවමින් හරිත වර්ණ ගෙවත්ත වඩා දුව ගොස් මහ ගෙදර දොර අසල නැවතුණහ.

සුදු ඇඳුමෙකින් සැරසී, ගෙදරින් පිටතට ආ අලෙක්සාන්ද්‍රා ලියොන්තියෙව්නා තම අතැති සුදුවන් කුඩය දිග හරිමින් ඈත හැල්මේ යන අසු පිට උඩ නැග සිටින නිකීතා දෙස කැළඹීමෙකින් බැලුවාය. පියා මවු අස් රියට නංවා ඔහුත් එහි වාඩි විය.

"යමු" හේ අණ කළේය.

අස්රියකරු සෙර්ගේයි ඉවානවිච් රේන්ස් පටි උස්සත්ම උසස් වර්ගයට අයත් අශ්වයින් තිදෙනා ඉතා ලෙහෙසියෙන් අස්රිය ඇදගෙන කුඩා පාලම හරහා ගොස්, හැල්මේ දුවන්නට වූහ. මේ සියලු වැඩ කටයුතු ගැන හොඳින් දන්නා අශ්වයකුවන ලෝඩ් බයිරන් දෙකන් නැටවීය. අම්මා නිතර, නිතර නිකීතා දෙස බලන්නට වූවාය. නිකීතා හිස නමාගෙන, රේන්ස් පටි අතහැර වේගයෙන් ත්‍රොයිකා රිය පසු පසින් අසු පැන්නීය.

ත්‍රොයිකාව පරදවා වේගයෙන් අසු පැන්නීමට නිකීතා අදහස් කළ ද, ක්ලොපික්ගේ පුරුද්ද අනුව එය නුවමනා වැඩක් ලෙසය, ඌ ගණන් ගත්තේ. ත්‍රොයිකාව ළඟට ආ විට ක්ලෝපික් තරමක් වේගයෙන් හැල්මේ දිවුවද, රියට පසු පසින් එහි දූලි වළාත් සමග ගමන් කළේය. ඌ නවත්වාලීමට හෝ ඌ මාර්ගයෙන් හරවා ලීමට හෝ නොහැකි වූයේ ඒවා සියල්ල නුවමනා දේ ලෙස එම අශ්ව පෝතකයා සැලකූ බැවිනි. ඔහේ ගමන් මග ඔස්සේ ක්ලෝපික් ගමන් කළා මිස අනවශ්‍ය ධාවන තරඟයකට ඉදිරිපත් වූයේ නැත.

අම්මා හැරී පුතු දෙස බැලුවාය. නිකීතා දෙතොල් තද කැරගෙන



ක්ලෝපික්ගේ දෙකන් මැද්දෙන් ඉදිරිය බැලීය. නිකීතා අසුගේ ගමන විසින් සෙළවෙයි. ඔහුට වමනය දැමීමට මෙන් ඔක්කාරයක් දනෙයි. ක්ලෝපික්ගේ හැල්ම නිසා නිකීතාගේ අතුනු බහන් දහලන සැටියෙකි.

"පුතා රියෙහි වාඩි වීමට කැමතිද?" අම්මා ඇසුවාය.

නිකීතා මුරණ්ඩු ලෙස හිස වැනීය. තාත්තා සිනාසී, අස්රියකරුට අණ කළේය.

"වේගය වැඩි කරන්න!"

ලෝඩ් බයිරන් උගේ අයෝමය පාද ඉදිරියට වීසි කරමින් වේගය වැඩි කළේ දෙකන් ඔසවා ගනිමිනි. ත්‍රොයිකාව වේගයෙන් ඉදිරියට ඇදෙත්ම, නිකීතා පිට උඩ තබාගෙන දුවන ක්ලෝපික් ද ගමන් වේගය වැඩි කළේය. එහෙත් ත්‍රොයිකාව ඈතට යනු දුටු ක්ලේපික් කේන්ති ගිය විටෙක මෙන් තවත් වේගයෙන් දුවන්නට විය.

සෙමින් හැල්මේ යන විට ඇති වන අප්‍රිය ස්වභාවය අතුරුදහන් විය. දන් නිකීතාගේ දෙකන් අසලින් වාතය වේගයෙන් පියාඹන සැටියෙකි. ළපටි ගොයම් පැළ සුළඟට වැනෙයි. හිරු රැස් නිසා ප්‍රමෝදයට පත් සැළලිහිණියෝ ලස්සන ගී ගයත්.. මෙය සැබවින්ම පෙනිමෝර් කූපර්ගේ නවකතාවකට සමානය.

ත්‍රොයිකාව ගමන් වේගය අඩු කරත්ම ක්ලෝපික්ට එයට ළං විය හැකි විය. නිකීතා සතුටින් පිරි සිතින් පියා දෙස බැලීය.

"නිකීතා කොහොමද, හොඳද?"

"ඉතා අපූරුයි.. ක්ලෝපික් ඉතාම හොඳ අශ්වයෙක්" පියාගේ ප්‍රශ්නයට පිළිතුරු දුන් නිකීතා පැවසීය.

## ජල ක්‍රීඩාව

උදේ පාන්දර නිකීතාත්, ඔහුගේ පියාත්, ගුරුතුමාත් පවු අඩිපාර දිගේ පොකුණ දක්වා ගමන් කළේ නෑමට සහ පීනීමටය. තණ පිටියෙහි පිනි බිඳු තිල් පැහැයෙන් බැබලිණි.

ගෙවත්තේ තවමත් උදෑසන මීදුම දැකිය හැකි විය. තණ පිටියේ විවිධ පාටින් යුත් මල් සහ කොළ සහිත පඳුරුවලට ඉහළින් සමනලයෝ පියෑඹූහ. මී මැස්සෙක් නද දුන්නේය. ගෙවත්තේ තුරුළිය ගහන තැනක සිටි කැලෑ පරවියෙක්, බෙල්ල පුම්බාගෙන දොම්නසින් හා මිහිරි හඬෙකින් යුතුව ග්‍රෑ-ග්‍රෑ යන හඬ නැගුවේ වසන්තය ගෙවී ගිය ද යළිත් එනු ඇතැයි ද, වසන්තය හැමදාම පවතිනු ඇතැයි ද කියන්නාක් මෙනි.

පොකුණේ ජලස්නානය සඳහා විශේෂයෙන් සාදා ඇති ස්ථානයට තිදෙන පැමිණියහ. නිකීතාගේ පියා ඇඳුම් ලිහා පපුවට තට්ටු කැරගනිමින් ද ඇස් හකුළුවා ගනිමින් ද මෙසේ පැවසීය:

"හරි හොඳයි, ඉතාම අනර්ඝයි!"

ඉර අව්වට වේලුණු රතු පැහැති ඔහුගේ මුහුණත්, උඩු සහ යටි රැවුලත් ඔහුගේ සුදු පැහැති සිරුරට සන්ධි කළ සැටියක් බැලූ බැල්මට පෙනේ. තාත්තා ඉතා නිරොගී පුද්ගලයකු ලෙස නිකීතාට දැනිණි. මැස්සෙක් හෝ මදුරුවෙකු හෝ ඇඟට වැසූ විට ඔහු හඬ නැංවෙන සේ අතින් ගසයි. එවිට ඌ තැලුණු තැන රතු ලපයක් මතු වෙයි. පසුව තාත්තා ඉතා හොඳ සුවඳ සබන් වර්ගයක් ගෙන පොකුණ ඇති ස්ථානයට ගොස් හිසේත් උඩු සහ යටි රැවුලේත් සබන් ගාමින් පෙණ නංවමින් හඬ නැංවීය.

"හරි හොඳයි, හරි අපූරුයි!"

නාන ස්ථානයට ඉහළින් සබන් පෙණ සහිත තාත්තාගේ හිස දෙස බලමින් දිය මදුරුවෙකු ඉගිලී ගියේ උගේ දම් පැහැති ඇස් දෙක මහත් කැර ගනිමිනි. ඒ අතර නිකීතාගේ ගුරුතුමා ඉක්මණින් සහ ලැජ්ජා සහිතව ඇඳුම් ගලවමින් දෙපාවල ඇඟිලි වකුටු කැර ගත්තේය. ඔහුගේ

දෙපා තරමක් වක ගැසිලාය. ඔහු කොටු කැරූ ඇති නාන ස්ථානයේ ලී දොර හැර, කිසිවෙක් නැති බව වට පිට බලා සැක හැර දනගෙන ජලයට පැන බැරැඞ් හඬින් කෑගැසීය: "ඔන්න ඉතින්, හරිම සැපයි." ඔහු ජලයට පතින විට ඇති වූ හඬ විසින් ලිහිණියෝ බිය වූවෝ ඉගිලී ගියහ. නිකීතාගේ ගුරුතුමා - අර්කාදියි ඉවානවිච් වරෙක දකුණු අත ද තවත් වරෙක වම් අත ද පෙරට යවමින් ඉක්මණින් පීනන්ට විය. රතු දුඹුරු හිසකේ සහිත ඔහුගේ හිස සහ සිහින් සිරුර තිල්වන් ජලයේ වේගයෙන් පාවිය.

පොකුණ මැදට පීනා ගිය ගුරුතුමා පිනුම් ගසන්ටත් දිය යට කිමිදෙන්ටත් විය. ඔහු ජලයට අධිපති වදියානොයි මෙන් "උන්-බර්ර්ර්" යන හඬ නැංවීය.

තාත්තා සබන් ගා නාල අවසන් වනතුරු නිකීතා මැලියම් සහිත ලී බංකුව මත වාඩි වී සිටියේය. ඔහු සබන් ගා ඇඟ පට්ටයකින් පිරිමැද දෙකන් වසාගෙන තෙවරක් පොකුණු ජලයෙහි කිමිදුණේය. එවිට ඔහුගේ උඩු සහ යටි රැවුළු ජලය නිසා මුහුණට ඇලී දුක්බර රූපයක් මවා පෑවේය. එය 'දුක්බර වාස්යාගේ වෙස් ගැනීම' නමින් හැඳින්විණි.

මෙසේ ජලස්නානය කළ නිකීතාගේ පියා කුඩා පාළමෙන් මහ පොකුණට පැන පීනන්ට වූයේ "ඉතින් අපි පීනමු"යි කියමිනි. ඔහුගේ ස්ථුල ශරීරය ජලයෙහි වැදුණේ බරපතළ ලෙසකිනි. ඔහු ගෙඹි ශෛලියෙන් අත් පා එකවර වකුටු කොට දිග හරිමින්, සෙමින් පීනන්ට විය.

නිකීතා හුරුබුහුටි ලෙස දියට පැන පිහිනා පියාට ළං විය. කොල්ලන් සමග එකතු වී වාග්රා ගඟේ පීනීම පුහුණු වූ නිකීතා තම දක්ෂතාවය ගැන පියාගේ පැසසුම් බලාපොරොත්තු විය. දන් ඔහුට පැත්තකට හැරී පීනන්ටද උඩුබැලි අතට පීනන්ටද, දිය යටින් යාමට ද පිළිවන.

තාත්තා රහසක් කියන්නාක් මෙන් මෙසේ පැවසීය:

"අර්කාදි ගිලලවන්ට යමු."

පිය පුතු දෙදෙන දෙපැත්තට වී ගුරුවරයා වෙත ළං වූහ. ළඟ නොපෙනෙන කෙනෙකු වූ ගුරුවරයා මේ දෙදෙනාගේ ළංවීම නොදිටීය. දෙදෙන දෙපැත්තෙන් පීනා ඔහු මත කඩා පැන්නාහ. බලාපොරොත්තු රහිත ප්‍රහාරය නිසා අන්දමන්ද වූ ගුරුතුමා උඩ පැන සැනෙකින් දිය යටට ගිය ද ඔහුගේ කකුලකින් අල්ලා ගන්නා ලදී. ගුරුවරයා අන් හැමටම වඩා කිති කැවීමට බිය වූ කෙනෙකු බව පිය පුතු දෙදෙන දත්තෝය. එහෙත් ගුරුවරයා අල්ලා ගැනීම කොහෙත්ම ලෙහෙසි කාර්යයක් නොවීය. පිය පුතු දෙදෙන පිහිනා, නාන ස්ථානයට යලි පැමිණි විට, යට ඇඳුම් ඇඳගෙන ඇස් කණ්නාඩි කුට්ටමක් ලාගෙන වාඩි වී සිටි ගුරුවරයා උපහාසයෙන් මෙසේ පැවසීය:

"මහත්වරුනි, පිහිනීම ඉගෙන ගන්ට ඕන." දිය නා ගෙදර එන තිදෙන දුටු නිකීතාගේ මවු හිරු රැස් නිසා දෙනෙත් හකුළුවා ගෙන මඳහස පාමින් මෙසේ තෙපළාය:

"ලීපා ගස් යට තේ සූදානම් කරලා තියෙනවා. මා එනතුරු ඉන්ට එපා. පාන් තිවිල යාවි."

## වියළි කාලගුණය

නිකීතාගේ පියා දවස් කීපයක් තිස්සේ බැරෝමීටරයට (වායු පීඩන මාන යන්ත්‍රයට) ඇඟිලි තුඩින් ගසන්නට විය. එහි කටුව "වියළි, ඉතා වියළි" බව පෙන්වාලුයේ එක තැන සිටිමිනි. සති දෙකක් තිස්සේ වැහි බින්දුවක්වත් වැටුණේ නැත. තිරිඟු පැසීමේ කාලය මෙයයි. දැඩි තියහය නසා පොළව ඉරි තැලී තිබිණි. ගවයන්ගේ කුර ගැටීම නිසා ඇතිවන දූලිවලට සමාන දූලි පටලයකින් පොළවේ සිට අහස දක්වා වැසී තිබිණි. දිය කඩිත සිඳිණි. ජලය නැතිකම විසින් කොළ හැකිළී ගොසිණි. නිකීතාගේ පියා බැරෝමීටරයට කොතරම් තට්ටු කළ ද පලක් නොවීය. කාලගුණය 'වියළි, ඉතා වියළිය.'

ආහාර ගැනීම සඳහා මේසයට වාඩිවන විට පෙර මෙන් විහිළු තහළු කිරීමක් නොවීය. අම්මාගේ සහ තාත්තාගේ මුහුණුවලින් කරදරය හා දොම්නසක් පළවිණි. නිකීතාගේ ගුරුවරයා ද වරෙක පිහාන දෙස බලමින් තවත් වරෙක ඇස් කණ්නාඩි හරිගස්වා ගනිමින් නිහඬ වූයේ,

සුසුම් ලැම පිටතට නොපෙන්වීමටය. ඔහුට එලෙස කණගාටු වීමට හේතු තිබිණි: ගිම්හාන නිවාඩු සමය සස්නෝව්කා ගමේ ගත කිරීමට පැමිණෙන බව ගුරුවරයාට දන්වා සිටි ඔහුගේ පෙම්වතිය වන වාස්සාආ නීලව්නා නැමැති නගරබද ගුරුවරිය, ඇගේ මවුගේ බරපතළ අසනීපය නිසා ඇයට සාත්තු කරන බැවින්, පොරොන්දු වූ පිරිදි නිවාඩුව ගත කිරීමට නොහැකි බවත්, සරත් සමයේ දී සමාරා නගරයේ දී ඔහු මුණ ගැසීමට බලාපොරොත්තු වන බවත් ලියා එවා තිබිණි. "මවුගේ බරපතළ රෝගය නිසා මා දන් ඇඳට බැඳ තබලා" යැයි ඕ ඔහුට ලියා එවුවාය.

නිකීතා වාස්සාආ නීලව්නාගේ රූපය සිතින් මවාගත්තේ මෙසේය: අළු පැහැති කබායක් හැඳගත් උසැති මුඩුම කාන්තාවක් වාඩි වී සිටී. ඇගේ එක් පයක් දම්වැලකින් ඇඳ කකුලකට බැඳ ඇත. ඉතා දැඩි තියහය නිසා මහ පොළවෙන් මතුවන වියළි පටලයෙන් පීඩා විඳින විටෙක, නග්න බිත්තියක් අසල වාඩි වී, එක් පයක් ඇඳ කකුලකට බැඳ ගෙන ඇති නගරබද ගුරුවරියක සිතින් මවා ගැනීම සිත් තැවුල් ගෙන දෙන්නකි.

දිවා ආහාරය ගනිද්දී, තාත්තා පිහානේ වාටිය ඇඟිල්ලෙන් පිරිමදිමින් මෙසේ පැවසීය:

"හෙට වැස්සේ නැතිනම් ගොයම් සේරම විනාශ වෙනවා."

අම්මා දොම්නසින් හිස පහත් කළාය. කවුළු වීදුරුව මත වසා සිටි ගෙමැස්සා හඬ නැඟුවේ වියරු වැටුණු කලෙක මෙනි. වීදුරු කණ්නාඩි දෙකක් සවි කැරු ඇති කවුළුවේ ඉහළ කොටසේ එම ස්ථානය පිරිසිදු කැරු නැති අතර එහි මකුළු දැල් පවා බැඳී තිබිණි. සඳළුතලයේ වීදුරු දොර වසා තිබුණේ, ගෙවත්තේ සිට අති උණුසුම් වාතය ගෙට ඇතුළු නොවීම පිණිසය.

"ඇත්තටම ආයෙමත් සාගතය පිරිච්ච අවුරුද්දක් ද, අහෝ දෙවියනි! කොතරම් භයානකද!"

"ඔහොම තමා, වාඩිවෙලා වැස්ස බලාපොරොත්තුවෙන් ඉන්නවා" තාත්තා කවුළුව වෙත ඇවිත්, කලිසම් සාක්කුවල දෑත්

ඔබාගෙන අහස දෙස බලන්නට විය: "තව එක දවසක් මේ විදිහට පැව්වොත් සාගත හිම කාලයක්, උණ සන්නිපාතයක්, ගවයින් එළ දෙනුන් විනාශවීමක්, ළමා මරණ... හැම විනාශයක්ම ඇතිවේවි."

දිවා ආහාරය නිහඬව ගන්නා ලදී. තාත්තා නින්දට ගියේය. අම්මා කුස්සියට ගියේ සෝදන රෙදි ගැන සොයා බැලීමටය. ඉමහත් චිත්ත පීඩාවෙකින් පසු වූ නිකීතාගේ ගුරුතුමා යවට මෙන් ගිනි රත් වූ ස්ටෙප්ස් බිමෙහි ඇවිදීමට ගියේය.

සොහොනක මෙන් නිහඬතාවයක් ඇති වූ කාමරවල මැස්සෝ පමණක් හඬ නැංවූහ. ගෙදර හැම දොයක්ම දූලි පටලයෙකින් වැසී තිබිණි. මොනවා කළ යුතු දැයි නිකීතා නොදත්තේය. දූලි පටලය සහිත වුව ද හිරු රැස් ඇස් අන්ධකාර කැරැවීමෙහි සමත් විය. පුළුල් ගෙවත්ත ජන ශූන්‍ය විය, නිහඬ විය: හැම දෙයක්ම සදා නින්දෙන් පසුවන්නාක් මෙනි. නිහඬතාවයත්, ඉඩෝරයත් හිස තුළ වේදනාවක් වැනි යමක් ඇති කළේය.

නිකීතා ගෙවත්තට ගිය ද එහි පණ ඇති ලකුණු නොතිබිණි. තිදිබර මී මැස්සෙක් ගුමු, ගුමු නාද දුන්නේය. දූලි සහිත තුරු අතුවල කොළ නොසෙල් වී තිබිණි. ඒවා ලෝහ පතුරුවලට සමානය. පොකුණේ බොර දියෙහි ඔරුව නොසෙල් වී තිබි, එහි ලිහිණියෝ කැත කළහ.

නිකීතා මීයන්ගේ ගඳක් සහිත සෝපාවෙහි වැතිර ගත්තේය. කාමරය මැද මේස රෙද්ද රහිත කෑම මේසයය. එහි කකුල් සිහින්ය, බොහෝය. මේ මේසය තරම් මුඩුම ගෘහ භාණ්ඩයක් ලෝකයේ වෙන කොහේවත් නැතැයි නිකීතාට සිතේ. ඈත කුස්සියෙහි වැඩ කරන කුස්සි අම්මා පහත් හඬින් යම්කිසිවක් ගායනය කළාය. ඈ පිහිය ගඩොල් කැටයකට උලනවා විය යුතුය, එසේ පිහිය මුවහත් තබන ගමන්ම විලාප ගසනවා විය යුතුය. පාලු ගතිය ඉවසා ගත නොහැකිව ඈ අඩ ස්වරයෙන් විලාප ගසයි.

බාගෙට ඇර ඇති කවුළුව ළඟට ෂෙල්තුහින් හෙවත් සෙංගමාල කුරුල්ලා පියාඹා ආවේය. ඌ කට හැර ගෙන ඉන්නේ දැඩි උෂ්ණය උහුලන්ට බැරි නිසාය. තරමක් හුස්ම ගෙන ඌ මේසය ළඟට විත් පැරණි

පුරුද්ද අනුව නිකීතාගේ උරහිස මත වැසී. ඌ නිකීතාගේ මූණ සහ දෙනෙත් දෙස බලා ඔහුගේ කනට උඩින් ඇති උපන් ලපයට හොටෙන් ඇන්නේ, එය ධාන්‍ය ඇටයක් යැයි සිතා විය යුතුය. එලෙස කොටා ඌ යළිත් නිකීතාගේ දෙනෙත් දෙස බැලීය.

"කුරුළු පැංචො, නුඹ යන දිහාවකට යනවා!" මෙසේ කී නිකීතා පීරිසියකට වතුර වත් කළේ අති මහත් කම්මැලි ලෙසය.

පුංචි කුරුල්ලා වතුර බී, පසුව පීරිසියට පැන පිහාටු විදහා නාන්නේ වතුර සෑම තැනම හලා දැම්මේය. ඌ ඉමහත් ප්‍රීතියෙන් තටු ගසා ශුද්ධ පවිත්‍ර විය හැකි තැනක් සොයන්නට විය. ඌ කුඩුවක් වැනි බැරෝමීටරයේ ලී කවරය වැසුවේය.

"ප්‍යු-ප්‍යු, බර්ර්ර්" යන හඬක් ඌ මිහිරි ලෙස ගැසීය.

"කුරුළු පැංචා දොඩවන්නේ මොනවාද?" මෙසේ ප්‍රශ්න කළ නිකීතා බැරෝමීටරය වෙත ගියේය.

ෂෙල්තුහින් හිස නමා ආචාර කරමින් පිහාටු හොටෙන් ශුද්ධ පවිත්‍ර කරමින් කුරුළු බසින් සහ රුසියන් බසින් දොඩවන්නට විය. ඒ වේලාවේ දී බැරෝමීටරයේ පීඩනය පෙන්වන ඊතලය 'පීඩනය වෙනස්වීම' සිට 'කුණාටුව' දක්වා ඇති ස්ථානය වෙත ළංවෙමින් සිටින සැටි නිකීතා දුටුවේය.

ඔහුත් ඔහුගේ පියා මෙන් බැරෝමීටරයට ඇඟිලි තුඩින් තට්ටු කරත්ම, එහි ඊ සළකුණ කුණාටුව දක්වා තවත් ළං විය. තාත්තා මද්දහන නින්දේ සැතපී සිටින පුස්තකාලය වෙත නිකීතා දුව ගියේය. දොරට තට්ටු කරන හඬක් ඇසුණෙන්, තාත්තා නිදිමත සහිත බැරැඩි හඬෙකින් ප්‍රශ්න කළේය:

"කවුද ඔතන? මොකද හදිසිය?..."

"තාත්තා නැගිටලා බැරෝමීටරය බලන්න..."

"නිකීතා මගේ නින්දට බාධා කරන්න එපා."

"තාත්තා නැගිටලා ඇවිත් බලන්න, බැරෝමීටරය වෙනස් වෙලා..."

කාර්යාල කාමරය තුළ නිහඬතාවයක් ඇති වූයේ තාත්තාට ඇවදිවීමට අපහසු වූ නිසා විය යුතුයි. ඔහු නැගිට පාවහන් පවා නොමැතිව දොර අසලට එන සැටිත්, ඇතුළු පැත්තෙන් දොර හරින සැටිත් ඇසිණි. අවුල් වූ යටි රැවුල සිහත මුහුණ පෙනිණි.

"මා නැගිට්ටෙව්වේ මන්ද?.. මොනවා වෙලාද?..."

"බැරෝමීටරය කුණාටු ඇතිවන බව පෙන්වනවා."

"බොරු!" යැයි සෙමින් පැවසූ තාත්තා වහාම බැරෝමීටරය එල්ලා තිබෙන ස්ථානයට දිව ගියේය. එහි බැලූ විගස ඔහු මුළු නිවෙසම දෙවනත් කැරැමින් කෑගැසීය: "සාෂා, සාෂා, වැහි කුණාටු ඇති වේවි!.. හුරේ, අපි බේරුණා!"

විඩාව සහ දැඩි සූර්ය තාපය වැඩි විය. කුරුල්ලෝ නිහඬ වූහ. ගෙමැස්සෝ අඩ නින්දකට වැටුණහ. හවස් වත්ම හිරු බැස ගියේ ගිනි රත් වූ දූලි පටලයට මුවා වෙමිනි. ඉක්මණින්ම ඇඳිරි වැටිණි. අහස ඇඳිරිය. එකද තරුවක් වත් දක්නට නැත. බැරෝමීටරයේ ඊය 'කුණාටුව' පෙන්වා සිටියේ ස්ථිර ලෙසිනි. කෑම මේසය වටා ගෙදර අය රැස් වූහ. අඳුර නිසා නොපෙනෙන ගෙවත්ත දෙස සඳළු තලයේ දොරවල්වලින් බලමින් පහත් හඬින් කතා කළහ.

ඔවැනි මර නින්දක් වැනි නිහඬතාවයෙක පොකුණ අසල වේත්ලා තුරුවල අතු සෙළවෙන්නට විය. ලිහිණියෝ බියවූවෝ, කෑගැසුවෝය. තාත්තා අඳුරේම සඳළුතලයට ගියේය. ශබ්දය වඩාත් වැඩි වූ අතර එහි ප්‍රීතිමත් බවෙක් දක්නට තිබිණි. ඉන් අනතුරුව ඇති වූ තද සුළං පහරක් නිසා අකාසියා මල් පඳුරු පොඩි විය. මල්වල සුවඳ ගෙතුළට වැදිණි. වියළි කොළ සුළඟට පාවිය. කිරි පැහැති ලාම්පු ගොලෝවේ ගිනි සිළුව නැටවිණි. සුළං පහර දුම් බටයට වැදී හූ හඬක්

නැංවීය. කොහේදෝ කවුළුවක් විවෘත වී සුළං පහර විසින් නටවන ලදී. දැන් ගෙවත්තේ ඇති සියලු තුරු සහ අතු ද සෙළවෙයි. ගස් මුල්වලින් හඬ පිටවෙයි. ඇසට නොපෙණෙන තුරු මුදුන් සෙළවිණි. සුළං පහර නිසා පීඩා වින්ද තාත්තා සඳළුතලයේ සිට ගෙතුළට ආවේය. ඔහුගේ කට විවෘත වෙලාය, දෙනෙත් මහත් වෙලාය. රාත්‍රිය දෙනෙත් අන්ධ කරවන පැහැයෙන් වෙළාගත්තේය. යළිත් අඳුර රජ කරන්නට විය. මුළු මහත් අහස මහපොළව මත කඩා වැටෙන සැටියෙකි. මහා ශබ්දය නිසා ජනේල වීදුරුමත වැහි බින්දු වැටෙන සැටි කිසිවකුට නැසිණි. ධාරාතිපාත වැස්සක් පත්ත විය. අමම්මා සඳළුතලයට වී මහ වැසි දෙස බලා සිටිත්ම ඇගේ දෙනෙත්වල සතුටු කඳුළු පිරිණි. තෙතමනය විසින් ඇති කරන ලද සුවඳ, වැසි ගතිය සහ තණ සුවඳ ගෙතුළට පිවිසියේය.

## කුඩා ලියුම

නිකීතා ක්ලෝපික් නැමැති අසු පිටින් බැස ඌගේ රේන්ස් පටිය කණුවේ ඇණයක බැඳ උත්යොව්කා ගමේ කඩ පොළ අසල පිහිටි තැපැල් කාර්යාලයට ඇතුළු විය.

තැපැල් ලිපිකරු වාඩි වී ලියුම් හා පාර්සල්වලට අලවන ලාකිරි ඉටිපන්දමකින් උණු කැරමින් සිටියේය. ඔහුගේ මේසය අසල ඇති කඩුල්ල විවෘත වී ඇත. ඔහුගේ මුහුණ ඉදිමිලාය. ඔහුගේ මේසයෙහි ලාකිරි පැල්ලම් සහ තීන්ත පැල්මය. තැනින් තැන දුම් කුඩු විසිරී ඇත. ඔහු ලාකිරි මුද්‍රාව ගෙන ලියුමට දමා ගැසුවේ එම ලියුම එවූ මිනිසාගේ හිස කඳින් වෙන් කිරීමට පහර ගසන විටෙක මෙනි. අනතුරුව ඔහු මේස ලාච්චුවෙකින් තැපැල් මුද්දරයක් ගෙනැ දිව දිගු කොටැ මුද්දරය දිව මත තබා එය ලියුමට ඇලවීය. ඔහුගේ දෙනෙත් නිකීතා දෙසට එල්ල වත්මැ ඔහු අහකට කෙළ ගැසුවේය.

ඒ තැපැල් මහතාගේ නම ඉවාන් ඉවානවිච් ලාන්දිෂෙව්ය. සියලු පුවත්පත් සහ සඟරා කියවීම ඔහුට ඇබ්බැහි වූ පුරුද්දකි. ඔහු මුල සිට අග දක්වා ඒවා කියවන තුරු අයිතිකරුට ඒවා බාර නොදෙයි. ඔහුගේ මේ පුරුද්ද නිසා ඔහුට විරුද්ධව සමාරාවේ ලොක්කන්ට පැමිණිලි කළ නමුදු, එයින් පලක් නොවූ අතර ඔහු වඩාත් කිපීම පමණකි, එයින් ඇති වූයේ. වසරකට හය වරක් ඔහු කට ගොන්නක් බී ගනී. එවිට කිසිවෙක්

තැපැල්හලට ඇතුළු වීමට පවා බිය වෙති. එසේ මත්පැන් බීගත් තැපැල් මහතා කවුළුවෙන් පිටතට හිස දමා ගෙන බෙරිහන් දෙයි: "මගේ ආත්මය විනාශ කළා, කාලකණ්නියෝ!"

දැන් තැපැල්හලට වන් තිකීතා තැපැල් මහතා ඇමතීය:

"තාත්තා කිව්වා ලියුම් ගේන්ටයි කියලා."

තැපැල් මහතා කිසිවක් නොදොඩා ලාකිරි උණු කිරීමට යළිත් පටන් ගත්තේය. උණු ලාකිරි අතේ සම පුළුස්සාලමින් වේදනාවක් ඇති කළ විට ඔහු කෑගැසුවේ, නැගිට යළිත් වාඩි විය. ඉක්බිතිව කතා කළේය:

"තුඹේ තාත්තා කවුදැයි මා දැනගත යුත්තේ කුමක් නිසාද?" ඔහු ඇසුවේ ආචාරශීලි බවෙන් තොරවය. "මෙහි හැම එකෙක්ම තාත්තා කෙනෙක්. හැම දෙනාම තාත්තලා..."

"මොනවාද ඔබ මේ කියන්නේ?" තිකීතා විස්මය පළ කළේය.

"තුඹලාට තාත්තලා දහසක් ඉන්නවා කියලයි කියන්නේ." මෙසේ කී තැපැල් මහතා මේසය යටට කෙළ ගැසීය. "නම, වාසගම - තාත්තාගේ නම වාසගමයි මම අහන්නේ තේරුණාද?" තිකීතා පියාගේ නම සහ වාසගම කී විට ඔහු ලාකිරි කැල්ල අහක දමා ලියුම් මිටියක් ගෙන තිකීතාට දුන්නේය.

තිකීතා ලියුම් මිටිය තම සම් පසුම්බියෙහි ලාගෙන බයාදු ලෙස මෙසේ ඇසීය:

"සහරා පත්තර එහෙම නැද්ද?"

එවිට තැපැල් මහතා පුම්බා ගනිමින් ඇතුළු කාමරයට වැදුණේය. තිකීතා ඔහුගේ පිළිතුර බලාපොරොත්තු නොවී දොර හැර ගෙන පිටතට ආවේය.

කණුවේ බැඳ සිටි ක්ලෝපික් නැමැති අශ්වයා කුර ගටමින්

වලිගය වනා මැස්සන් එළවමින් උන්නේය. කුණු තවරාගත් අවුල් වූ කෙස් වැටි සහිත කොල්ලෝ දෙදෙනෙක් ක්ලෝපික් දෙස බලමින් සිටියහ.

"අයින් වෙයල්ලා!" නිකීතා කෑගැසුවේ අසුගේ සැදැලය මත වාඩි වෙමිනි.

එක් කොල්ලෙක් දූලි මත වාඩි වූ අතර අනෙකා හැරී ආපසු දුවන්නට විය. තැපැල් මහතා යළිත් ලාකිරි උණු කරන සැටි තැපැල් හලේ කවුළුවෙන් පෙනිණි.

උත්යොව්කා ගමෙන් පිට වූ නිකීතා තිරිඟු කුඹුරු සහිත ස්ටෙප්ස් බිමට වැදී තම ක්ලෝපික්ට නිදැල්ලේ යාමට ඉඩ දුන්නේය. නිකීතා තම සම් පසුම්බිය ගෙන ලියුම පිරික්සන්නට විය.

එක් ලියුමක් කුඩාය. එහි ලියුම් කරවය දම් පැහැතිය. නිකීතාට බාර දෙන්න යැයි ලොකු අකුරින් එහි ලියා තිබිණි. ගෙත්තම් 'ඒම්බොස්' කළ කඩදාසියෙහි ලියා ඇති එම ලියුම නිකීතා ඉමහත් කැළඹීමෙකින් කියැවීය. එහි මෙසේ ලියා තිබිණි.

"ප්‍රිය නිකීතා, මට ඔයා අමතක වෙලා නැහැ. මම ඔයාට බොහොම ආදරෙයි. දැන් අපි ගිම්හාන දාවා නිවෙසක නැවතී ඉන්නවා. එය බොහොම හොඳ ගෙයක්. වික්තර් හැම තිස්සේම මට කරදර කරනවා. එයාගෙන් බේරිල්ලක් නැහැ. එයා අම්මා කියන දේ අහන්නේ නැති තරම් මුරණ්ඩු වෙලා, එයාගෙ හිස මැෂිමෙන් මුඩු ගෑවා, තුන්වෙනි වතාවට. එයාගෙ ඔළුව හැම තැනම සීරිලා. මම ඇවිදින්නේ තනියම. අපේ ගෙවත්තේ ඔන්චිල්ලාවක් තියෙනවා. ගෙවත්තේ ඇපල් වැවිලා. හැබැයි ඒවා තවම ඉදිලා නැහැ. අපේ මායාකාරී වනය ගැන ඔබට මතකද? සරත් කාලයේදි සමාරා නගරයට එන්න. ඔයා දීපු මුද්ද මම නැති කැර ගත්තේ නැහැ. ආයුබෝවන්. මීට ලීලායා."

ඒ අපූරු ලියුම නිකීතා කීප වරක්ම කියැවීය. එය විසින් ඔහු යළිත් නත්තල් සමයේ සුහද මතකය වෙත ගෙන ගියේය. ඉටිපන්දම් ආලෝකය, බිත්තියේ සෙවණැලි යළිත් මතු වී පෙනිණි. දරියගේ විශාල නුවන් සහ ලස්සන කොණ්ඩා පටිය යළිත් නිකීතාගේ මනැසෙහි ඇඳිණි.

නත්තල් ගස අලංකාර කිරීමට සෑදූ කඩදාසි දම්වැල හඬ නැංවීය. හිම තුෂාරයට හසු වූ කවුළු වීදුරු, හිමවලින් වැසුණු මහ ගෙදර පියස්ස, සුදු පැහැති හිම කැටි සහිත තුරු අතු, සුදෝසුදු හිම කතර මැවිණි... මායාවක් වැනිය. අපූරුය!...

නිකීතා ක්ලෝපික්ගේ රේන්ස් පටිය ඇද කසයෙන් පහරක් ගැසීය. බලාපොරොත්තු රහිතභාවය විසින් ඌ තිගැස්සිණි. අනතුරුව අශ්වයා හැල්මේ යන්නට විය. දන් සුළං පහර නිකීතාගේ දෙකන්වල හඬක් නංවයි. මහා ස්ටෙප්ස් භූමියටත්, ගංගාව ගලා බසින ඉවුරුවලටත් උඩින් රාජාලියෙක් පියාසර කරයි. තැනින් තැන දන් ගොයම් කපා අවසන් කැර ඇත. කඳු බෑවුම් සහිත වියළී ගිය පොකුණේ වීබිස් පක්ෂීහු දුක් දොම්නසකින් කෑගැසූහ. "වේගයෙන් අසු පන්නනු! වේගයෙන්, තවත් වේගයෙන්!" යැයි නිකීතා කල්පනා කළේය. ඔහුගේ හදවතෙහි දැඩි ප්‍රීතියෙකි, එය වඩාත් වැඩි වේගයෙන් ගැහෙයි. "සුළඟ හඬ නගන්න, හඬ නගන්න!.. රාජාලිය පියාඹන්න, පියාඹන්න!.. වීබිස් හඬ නගන්න, හඬ නගන්න!... මා නුඹට වඩා වාසනාවන්තයි! සුළඟයි මායි, සුළඟයි මායි!..."

## පෙස්ත්‍රාව්කාහි සල්පිල

දනට දවස් තුනක් තිස්සේ නිකීතාගේ තාත්තාත් අම්මාත් අතර පොඩි පහේ නොසතුටකි. පෙස්ත්‍රාව්කාහි සල්පිලට යාමට තාත්තා අති මහත් චුවමනාවක් දක්වුව ද අම්මා එම ගමනට තීරණාත්මක ලෙස විරුද්ධ වූවාය.

"අනේ වසීලි, ඔයා නැතුවට පෙස්ත්‍රාව්කාහි සල්පිල ඉතා අගේට පවත්වාවි" අම්මා කීවාය.

තාත්තා යටි රැවුළ මිටින් ගෙන රැවුළු ගස් සපමින් දෙවුර නටවා "පුදුමයි, ඒක බොහොම පුදුමයි!" පැවසීය.

"ඒකට කමක් නැහැ. ඔයාට පුදුම වුණාට කමක් නැහැ!"

"නැහැ නැහැ, ඒක ඉතාමත්ම පුදුමයට හේතුවක්!"

"ඔන්න වසීලි, මම ආයෙමත් කියනවා. අපට අලුත් අශ්වයින් ඕන නැහැ. අපේ අශ්වගාල පිරිල, දෙවියන්ට කීර්තිය අත්වේවා!" අම්මා පැවසුවාය.

"ඔයා තේරුම් ගන්ට මම යන්නේ අර කාලකණ්ණි අස්ප වෙළඹිය සරේම්කා විකුණන්නට."

"අපොයි ඒක තේරුම් නැති වැඩක්. සරේම්කා අගේ ඇති සතා."

"ඔයා මොනවා දොඩවනවාද!" තාත්තා අම්මාගෙන් අසමින් දෙපා පුළුල් කැරගෙන දෙනෙත් මහත කැර ගත්තේය. "සරේම්කා හපනවා, පස්ස ගාත්වලින් අතිනවා."

"නැහැ, අපොයි නැහැ. සරේම්කා එහෙම කරන්නේ නැහැ." ඕ ඔහුගේ මතවලට විරුද්ධ වූවාය.

එවිට තාත්තා තීරණාත්මක ලෙස මෙසේ පැවසීය: "එහෙනම් එක්කෝ මා තෝරා ගන්න, නැතිනම් ගෙදර වැඩවලට අර කාලකණ්ණි සරේම්කා අස්ප වෙළඹ තියා ගන්න!"

අවසානයේ දී ඕ පසු බැස්සාය. නිකීතා නිගමනය කළ පරිදි අම්මා තාත්තා තෝරා ගත්තාය. දෙදෙන අතර පැවැති විවාදය අවසන් වූයේ සමාදානවීමෙන් සහ වරදාන දීමෙනි. සරේම්කා විකුණා දැමීමට සහ තාත්තා "මහ සල්ලි ගොඩක් සල්පිලේ දී වියදම් නොකිරීමට" පොරොන්දු විය.

සල්ලි වියදම් නොකිරීම පිණිස ගෙවත්තේ වැටී තිබුණු ඇපල් ගෙඩි එකතු කොට ගැල් දෙකක් පුරවා ඒවා සිල්ලරට විකිණීම පිණිස පෙස්ත්‍රාවිකා සල්පිලට යවන ලදී. එක් ගැලකට නැඟී මීෂ්කාත් සමඟ යාමට නිකීතා තාත්තාගෙන් අවසර ලබා ගත්තේය.

උදේ සිටම ගමනට බාධා ඇති විය. අශ්වයින් ගමනට සූදානම් කැර නොතිබිණි. මීෂ්කාට අශ්වයින් සොයා යාමට සිදු විය. අශ්ව ගාලේ සිටි සරේම්කා නැමැති අශ්ව වෙළඹ ගෙනැවිත් ඌගේ ඇඟ බුරුසුවකින්

පිරිමදින්ට පටන් ගත් විට, ඌ අස්ගොව්වා වන සෙර්ගේයි ඉවානවිච් සපා කන්නට විය. ඌ ඔහුගේ ඇඟ මස් කඩා නොගත්තා පමණකි. රාත්‍රි ඇඳුම් පිටින් කවුළුව අසල සිටි තිකීතාගේ පියා මෙය දුටුවෙන් ඔහු හතිකට අශ්ව ගාලට දුවගෙන ආවේය.

"ඔන්න ඌ හපාකනවා!... මම නුඹලාට කීවේ මොනවාද!..."

සරේම්කා උඩ පනින්නටත් පස්සා ගාත්වලින් පහර දෙන්නටත් පටන් ගත්තේය. ඌ කටකලියාවත් කඩා බිඳ ගෙනැ යළිත් අශ්ව රංචු වෙත දිවැ ගියේය. ඉන් අනතුරුව ඇපල් පුරවා ගත් ගැල් සමග යාමට නියමිතව සිටි අර්ත්යොම් සොයාගත නොහැකි විය. ඔහු ඉකුත් රාත්‍රියේ සිට ගම්සභා පොලිස් කාර්යාලයේ සිටින බව දැනගන්නට ලැබිණි. ඔහු නියමිත කලට බදු නොගෙවීම නිසා ඔහුට ගම් සභා පොලිස් කුඩුවේ ලගින්නට සිදුවිය. අර්ත්යොම් වසර පහක් තිස්සේ බදු ගෙවා නැත. යම්කිසිවෙක් ඔහුගේ බදු ගෙවා ඔහු නිදහස් කරනතුරු ඔහුට එහි ලගින්නට සිදුවිය.

තිකීතාගේ පියා විසින් වසීලි නිකිතියෙවිච් ඇපකාරයකු යවා අර්ත්යොම් ඇප පිට නිදහස් කැරැ ගන්නා ලදී. අර්ත්යොම් අශ්වයා ගැලට බැඳීමට ආවේ ඉමහත් සතුටකිනි. ඔහු සරේම්කා ගැලෙහි අයිනෙන් බැඳ දැමීය. තිකීතා සහ මිෂ්කා ප්‍රථම ගැලට නැග ගත්හ. අර්ත්යොම් රේන්ස් පටි ගෙන රිය පැදවීමට පටන් ගනිත්ම, අස්ගොව්වා රියේ රෝදය පෙන්වා 'කඩ ඇණය, කඩ ඇණය!" යැයි කෑ ගැසීය. ඔහු එසේ කළේ අර්ත්යොම්ට විහිළු කිරීම සඳහාය. අර්ත්යොම් වහාම බැස කඩ ඇණය පිරික්සා බලා, සියල්ල නිසි ලෙස තිබෙන බව දැනගෙන හිස කසා, හිස සළා රියට නැග පැදවීය.

ගැලෙන් ගමන් කිරීම ප්‍රීතියට කරුණකි. සුළං හැමීය, තණ සහ තිරිඟු පිදුරු පුසුඹ වහනය විය. කටු සහිත රෙපෙයිනික් පඳුරු සුළඟට වැනිණි. ඈත, ඈත, ඇසට පෙනෙන තරම් දුරක සිටි රාජාලි උකුස්සෙක් සෙමින් පියාසර කරමින් අහසට නැංගේය. ඈත නිල්වන් දුම් වළා නගින සැටි පෙනේ. නගුල් තබා ඇති ලී කුටියේ ගොවීන් සඳහා කැඳ පිසින බව ඉන් දැනිණි.

රෝද සහිත ලී කුටිය වෙත පැමිණි අර්ත්යොම් සිය ගැල නැවැත්වූ පසු කොල්ලෝ දෙදෙනා ද ගැල නවත්වා වතුර බීම සඳහා කුටිය අසල තිබූ ලී පීප්පය වෙත ගියෝය. ගොවීන්ට කෑඳ පිසිමින් සිටි මහල්ලා ගැල ළඟට විත් ඒ රිය කඳට අතක් තබා හිස වනා මෙසේ ඇසීය:

"ඇපල් ගෙනියන්නේ විකුණන්ටද?" එවිට නිකීතා ඔහුට ඇපල් ගෙඩියක් දුන්නේය. "තරුණයා, මට එපා. විකල කෑමට මට දත් නැතැ"යි මහල්ලා පැවසීය.

ලී රෝද සහිත කුටියෙන් ඈත් වී තවත් දුර යන විට වියගහට බඳින ලද ගොනුන් සහිත නගුල් ඇති ගොවීන් දක්නා ලදී. ගොවියන් වැරහැලි හැඳගෙන සිටි අතර ආහාර ගැනීම සඳහා ගමන් ගත්හ. අර්ත්යෝම් නැවතී පෙස්ත්‍රාවිකා ගමට යන මාර්ගය අසමින් බොහෝ වේලාවක් ගත කළේය.

මද්දහන වනවිට, සුළං හැමීම අඩු වී හිරු තාපය වැඩි විය. මේ තාප මාලා දෙස බලමින් සිටි නිකීතා වරෙක පාවෙන නිවෙසක් ද, වරෙක ගසක් ද, තවත් වරෙක කුඹ ගස් රහිත නැවක් ද මායාකාරී ලෙස දිටීය. ගැල් ඉදිරියට ගියේය. තණ පොත්තෝ හඬ නැගූහ. ස්ටෙප්ස් භූමියෙන් ඒකතානමය හඬක් ඇසෙයි. ගැල අසලින් ගමන් කරමින් සිටි සරේමිකා වෙළඹිය උස් හඬින් හේසාරවය කළාය. අර්ත්යොම් පසුපස හැරී බලා, ඇසක් අඩවන් කොට මෙසේ පැවසීය:

"අපේ අය එනවා!"

සැණෙකින් ගැල් අසලින් ලෝඩ් බයිරන් නැමැති අශ්වයා ප්‍රමුඛ ත්‍රොයිකා හෙවත් අශ්වයින් තිදෙනෙක් බැඳි රියක් ගැල් දෙක පසු කැර ගියේය. නිකීතාගේ පියා දිග කබායක් ඇඟ ලා ගෙන මහේසාකය ලීලාවෙන් අස්රියෙහි වාඩි වී සිටියේය. ඔහුගේ යටි රැවුළ සුළඟට දෙපැත්තට වැනෙයි. ඔහු නිකීතා දෙස ප්‍රීතිමත් නෙත්වලින් බලා මෙසේ ප්‍රශ්නයක් නැගීය:

"පුතා, උඹ මා ළඟට එනවද?" ත්‍රොයිකා අස්රිය වේගයෙන්

ඉදිරියට ඇදිණි.

ස්ටෙප්ස් බිමෙහි ඈත කෙළවරේ සුදු පැහැති දේවස්ථානයේ අර්ධ ගෝලාකාර කුපෝල දෙකක් පෙනිණි. ළිංවලින් වතුර ගැනීම සඳහා සවි කැරූ ඇති මාන කොකුන්ගේ හැඩය ඇති දිගැති රිටි ද, වේත්ලා තුරුවල මුදුන් ද, දුම් බට සහ පියසි ද- හිරු රැස් නිසා දිලිසෙන ගඟ අසල වූ පෙස්ත්‍රාව්කා ගම - එතැනින් ඔබට ගැල්මඩු කූඩාරම් ද, අශ්ව රංචු ද දක්නට ලැබිණි.

ඇපල් ගෙඩි පිරි ගැල් ගඟ හරහා ඇති පාලම ඔස්සේ ගොස් දේවස්ථානය ඉදිරිපිට චතුරශ්‍රය පසුකොට ලා රතු පැහැති නිවාසය අසලින් හැරී මඩු කූඩාරම් සහ ගැල් සහිත සල්පිල් භූමියට වැදුණේය. රතු පැහැති නිවාසයෙහි කෙළවර කවුළුව අසල තරබාරු පූජකයෙක් වයලීනයක් වයමින් සිටියේය. අර ගැල් දෙක හැලි වලන් විකුණන ගැල් පෙළට එකතු විය.

නිකීතා ගැල මත නැගී සිටගෙන අවට නැරඹීය: දෙනෙත් වැසෙන තරම් විශාල යටි රැවුලක් ඇති අභිකුණ්ඨිකයෙක් නග්න පපුව සහිතව, රිදී පැහැති බොත්තම් සහිත කප්තානයක් හැඳ වැහැරුණු අශ්වයකුගේ දත් පිරික්සා බලයි. උගේ අයිතිකරුවන දුබල මිනිහෙක් අභිකුණ්ඨිකයා දෙස විමතියෙන් බලයි. කපටි වෙළෙන්දෙක් ගැහැණියකට මුට්ටියක් විකිණීමට කපටි බස් දොඩවයි. එය පාට කළ මුට්ටියකි. "දෙන්ට මට මුට්ටියක්. එපා මට ඔවැන්නක්" යැයි ගැහැණිය කියයි. "ලෝකය වටේ ගියත් මේ වගේ මුට්ටියක් හොයා ගන්ට බැහැ" යැයි වෙළෙන්දා ඇයට පෙරළා පවසයි. බීගත් මිනිහෙක් බිත්තර වෙළෙන්දෙකුට බැණ වදියි: "මේකත් බිත්තරයක්ද, හැබෑ බිත්තරයක්, හරියට කුරුළු බිජ්ජක් වගෙයි. ඔන්න අපේ කල්දිබාන් ගමේ බිත්තර හරිම ලොකුයි, කලිදිබාන්වල කිකිලියො කර ළඟට එනතුරු පිරිලා තියෙන වී, තිරිඟුවල ඇවිදිනවා." වෛවර්ණ ඇඳුම් ඇඳගත් තරුණ කෙල්ලෝ ගමන් කරති. ඔවුහු නිකීතාගේ ගැල ද ඇති කඩ පිල්වලට එති. වෙළෙන්දෝ හැම තැන හඬ නගති, යන එන අයට ආරාධනා කරති. "එන්ඩ එන්ඩ, ලාබයි ලාබයි..." දූවිලි, කෑගැසීම්, අශ්වයින්ගේ හේසාරවය සල්පිල පුරා රැව්දෙයි. මැටි නළා සාදන ශිල්පියෝ නළා පිඹිමින් හඬ නගති. ගැල්වල ඒරියා කඳන් උඩු අතට හරවා ඇත. උරයක ඇකෝඩියනයක් එල්ලා ගත්

තරුණයෙක් එය වාදනය කරමින් ඉදිරියට යයි: "ඒහ් දූන්‍යා, දූන්‍යා, දූන්‍යා!..." හඬ නගා ගායනා කරයි.

අර්ත්යොම් අශ්වයා ලිහා දමා ගැලෙහි ඇති ඇපල් ගෙඩි වෙළඳමට ගොඩ ගැසීය. එවේලෙහි යුද කබායක් සහ අසිපතක් බඳ පටියෙහි එල්ලාගත් මිනිහෙක් අර්ත්යොම් දෙස බලා හිස වැනීය. අර්ත්යොම් ද ඔහු දෙස බලා තොප්පිය අතට ගෙන ආචාර කළේය.

"ඔන්න තෝ මගේ අතට අහුවුණා පාදඩයා, දැන් ස්ථිර ලෙසින්ම මම තෝ හිර භාරයට ගන්නවා" යැයි උඩු රැවුළු සහිත නිලධාරියා ගෙරවීය.

"ඔබතුමාගේ කැමැත්තක්" අර්ත්යොම් බයාදු ලෙස කීවේය.

උඩු රැවුළා අර්ත්යොම්ගේ අතක් අල්ලා ගෙනැ ඇද්දේය. අසල වලන් විකුණමින් සිටි මහලු මිට්ටා කපටි ලෙස සිනාපෑවේය. මිෂ්කා වහාම නිකීතා වෙතැ ඇවිත්, "ඉක්මණට ගිහින් තාත්තාට කියන්න. උර්යාද්නික් නිලධාරියා අර්ත්යොම්ව සිර කුඩුවට ගෙනිච්චයි කියලා. මම ඇපල් කරත්ත දෙක බලා ගන්නම්"යැයි පැවසීය.

නිකීතා සෙනඟ අතරින් දුව ගොස් අශ්වයින් විකුණන මඩුව අසලට ආවේ, එහි දී පියාගේ අස්රිය දුටු බැවිනි. තාත්තා ඉමහත් ප්‍රීතියෙන් අශ්ව කොටුව අසල කබා සාක්කුවලට දැත් ඔබා ගෙන සිටියේය. නිකීතා අර්ත්යොම්ට වුණ දේ කියන්ට පටන් ගනිත්ම, තාත්තා ඔහුගේ කතාවට බාධා කොට මෙසේ පැවසීය:

"අර බලාපන් අර අස්ප පැටියා... ආ ඌ කොතරම් අපූරුද!..."

අශ්වයින් අතරින් ගමන් ගත් බෂ්කීරියානුන් තිදෙනෙක් රතු පැහැති දක්ෂ අශ්ව පැටියකු තොණ්ඩුවෙකින් ඇල්ලීමට උත්සාහ ගත්හ. එහෙත් අශ්ව පැටියා දත් විරිත්තමින් දෙකන් නටවමින් තොණ්ඩුවෙන් බේරීමට උත්සාහ ගත්තේය. ඌ උඩ පනිමින්, හැරෙමින් ඇත් මැත් වෙමින් අශ්ව රංචුව තුළට පැන ගත්තේය. යළිත් පාලු ඉඩැති තැනෙකට දුව ගියේය. හිටි හැටියේම ඌ පහත් වී දණ නමා කොටුවේ හරස් පොල්ල

අතරින් ගෙලත් හිසත් යවා පොල්ලා මැත් කොටැ පඳුරු සහිත ස්ටෙප්ස් භූමියට දිවැ ගියේය. උගේ ගෙල සහ වලිගය සුළං පහරට පිම්බී නැටවිණි. නිකීතාගේ පියා ඉමහත් ප්‍රීතිය විසින් උඩපැන නටන්නට විය.

බෂ්කීරියානුවෝ බකල ගසා දුවමින් අශ්වයන් පිට නැගගත්හ. උහු මිටි සහ කිලිටි සත්තුය. දෙදෙනෙක් පැනගිය අශ්ව පැටියා අල්ලා ගැනීමට ඌ පසුපසින් අසුන් එළ වූ අතර අනිකා තොණ්ඩුව සහිත කඹය අතින් ගෙන පැන යන පැටියා ඉදිරියට හමුවීමට ගියේය. අශ්ව පැටියා දහලන විට බෂ්කීරියානුවෝ මෑග ලෙස හූ හඬ නගමින් ඔවුන්ගේ අසුපිටින් ගියහ. පැටියා දහලන විට උගේ බොල්ලට තොණ්ඩුව දමන ලදී. ඌ මර හඬ දී කෑගසද්දී, උගේ ලපැතිවලට දෙපැත්තෙන් පහර දෙන්නට ද බෙල්ලේ තොණ්ඩුව හිර කරන්නට ද වූහ. එවිට අශ්ව පෝතකයා බිම ඇද වැටුණේය. ඩහදිය පෙරෙන ඒ අශ්ව පෝතකයා කොටුවට ගෙනෙන ලදී. ජ්‍යෙෂ්ඨ බෂ්කීර් ජාතිකයා නුහුරු ලෙස අසු පිටින් බැස නිකීතාගේ පියා වෙත ඇවිත් මෙසේ පැවසීය:

"බාච්කා, අස්ප පැටියා මිල දී ගන්න!" තාත්තා සිනාසී වෙනත් අශ්වයකු නැරඹීමට වෙනත් කොටුවකට ගියේය. නිකීතා නැවතත් අර්ත්යොම්ට සිදු වූ දේ විස්තර කරන්නට විය.

"හරිම නරකක් තමා! මම ඒ මෝඩයා සමග කුමක් කරම්ද? මෙන්න මේ කාසි දෙකක් අරගෙන පානුයි, මාලුයි අරගෙන මා එනතුරු ඇපල් කරත්ත ළඟට වෙලා ඉන්න"යි තාත්තා නිකීතාට කීවේය. "සරේම්කාව මම මිද්වියෙදෙව්ට විකුණලා දැම්මා. වැඩි මුදලකට නොවෙයි, ඒ වුණත් පුතේ වැඩි කරදරයක් වුණේ නැහැ. පුතා යන්ට, මම දැන්ම එන්නම්."

එහෙත් තාත්තා පැවසූ 'දැන්ම එන්නම්' යන්නට බොහෝ වේලා ගත විය. විශාල රතු පැහැති හිරු ස්ටෙප්ස් බිමට එහා බැස යන්නට විය. සල්පිලට ඉහළින් රන් පැහැති දූලි වළා නැගිණි. අන්න ඒ වේලාවේ දී තාත්තා ආවේය. ඔහුගේ මුහුණේ යම්කිසි ව්‍යාකූල බවක් පෙනෙන්ට තිබිණි.

ඔහු නිකීතා දෙස නොබලා කතා කළේය: "මම ඔටුවන් මිල දී

ගත්තා. බොහොම ලාබෙට. අර වෙළඹිය ගෙන යාමට තවම ආවේ නැතිද? පුදුමයි! ඉතින් ඇපල් ගොඩක් විකුණුවද? කොපෙක් හැට පහක විතරයි. පුදුමයි. මම කිව්ව මිද්වියදෙව්ට අර වෙළඹට සන්තෝෂමක් හැටියට ඇපල් ටික දෙන්නයි කියල. ඔය ඇපල් ටික යන යකාට ගියාදෙන්.. දැන් ඉතින් යමු අර්ත්යොම්ව බේරාගන්ට..."

තාත්තා නිකීතා උරෙන් අල්ලා ගෙන තිහඬ වූ සල්පිලේ ගැල් පේළි අතරින් ගියේය. ගැල්වලින් පිදුරු, තිරිඟු සහ තාර පුසුඹක් වහනය විය. සමහර තැන්වලින් ගීත ඇසේ. එය ස්ටෙප්ස් බිමෙහි දෝංකාරය නංවයි. අශ්වයෝ හේසාරවය හඬ නගති.

"පුතා දන්නවාද මට අම්මගෙන් හොඳට බැණුම් අහන්ට වේවි... ඉතින් ඒකට කමක් නැහැ. අපි හෙට ත්‍රොයිකාවක් බැලීමට යමු. අලු පාට පුල්ලි සහිත අස්පයින්... කොහොම වුණත් බැණුම් අහන්ට සිද්ද වෙනවා..." තාත්තා මැසිවිලි කීවේය.

## කමතේ සිට

හවස ප්‍රණීත තිරිඟු පිදුරු සහිත ගැලක නැගී නිකීතා ගෙදර ආවේ කමතේ සිටය. හිරු අවරදිගට ගොසිනි. සරත් සමයට සුදුසු දම් පැහැයෙන් අහස සැරසී ඇත. ඈත ඈත අතීතයේ සිට මෙහි ස්ටෙප්ස් භූමිය සහ පුරාණ ගම් සහ තියම් ගම් හරහා මාර්ගය වැටී ඇත.

සැන්දෑ ඇඳිරිය පවතිද්දී, ගොයම් කපන ලද කුඹුරුවල පිඩැලි දක්නට තිබිණි. තැනින් තැන බිම් හාන ගොවීන්ගේ ගිනිමැල පෙනුණු අතර එයින් කටුක දුම් ගුලි නගින්නට විය. ගැල ඒ මේ අත පැද්දෙමින් හඬ නැඟීය. නිකීතා උඩුබැලි අතට දිගා වී දෙනෙත් වසා ගෙන සිටියේය. මහන්සිය නිසා ඔහුට එක්තරා සතුටක් දැනිණි. ඔහු එම දවස ගැන අඩ නින්දෙන්ම සිතන්නට විය....

...කමතේ අශ්ව බාන් හතරක් වැඩ කරති. කමතේ සෙක්කුව මැද වාඩි වී සිටින්නේ මිෂ්කාය. ඔහු අශ්වයින්ට කෑ ගසමින් කසය හඬ නංවයි.

කමතේ ලී රෝදය හඬ නංවමින් හම්පිටිය ක්‍රියා කරවයි. එහි සිට හම්පටිය මත වැටෙන තිරිඟු බොල් පොතු සුළඟට පාකරමින් රතු පැහැති ගෙයක් වැනි ගබඩාවට යැවෙයි. බෙරයක් උග්‍ර හඬක් නංවන සැටි ඈත ස්ටෙප්ස් බිමෙහි ඇසේ. තිරිඟු ධාන්‍ය ඇට පොතුවලින් වෙන් වෙයි. නිකීතාගේ පියා ආරක්ෂක ඇස් කණ්නාඩි කුට්ටමක් පැළඳ ගෙන, කමිස අත් නවාගෙන ඩහදිය පෙරාගෙන ගොවීන්ට අණ දෙයි. ඔහුගේ යටි රැවුළ සුදු පැහැතිය, කට කළු පැහැතිය. තිරිඟු කරල් පුරවා ගත් ගැල් වැළ නොකැඩී එති. ගැටවරයෙක් දුවමින් විත් පිදුරු මිට දෑතින් ගෙන ලී තට්ටුවට පැන එය කුඩා කන්දක් වැනි පිදුරු ගොඩට වීසි කරයි. විශාල පිදුරු ගොඩ වටේ සිටින මහලු ගොවීහු ලී උදළුවලින් එය සකස් කරති. මුළු මහත් වසරකම ශ්‍රමය, සැලකිල්ල, බිය අවසන් වෙයි. දවස පුරාම ගීත ගායනය ඇසේ. විහිළු තහළු රැව්දෙයි. කමතට තිරිඟු කරත්තයක් ගෙනා අර්ත්යොම් ගැල් අතරින් යන විය තරුණියන්ට අසුවිය. ඔවුහු ඔහු කිති කැවූහ. කිති කැවීමට බිය අර්ත්යොම් බිම පෙරළුණු නිසා ඔහු ඇඟ පුරා දාහියා පොතු තැවරිණි. එය බැලීමට සිනහ උපදවන දර්ශනයක් විය.

...නිකීතා දෙනෙත් හැර බැලීය. සෙළවෙන ගැල හඬ නැංවීය. දුන් ස්ටෙප්ස් භූමිය පුරා අඳුර රජකරයි. අහසේ තරු දිලෙන්නේ අගෝස්තු මාසය බව කියා පාමිනි. අහස පුරා තරු පිරිලාය. ආකාශ ගංගාව අඳුර බිඳ ආලෝකය පතුරුවයි. නිකීතා ගැලෙහි සැතපී තරු යට තොටිල්ලෙක වැනෙන්නා සේ ඈත ග්‍රහ ලෝක දෙස සන්සුන්ව බලන්නට වූයේය.

"මේ ග්‍රහ තරු සියල්ල මගේ. කවදාහරි මම අහස් යානාවෙක නැගිලා ග්‍රහ ලෝකවලට යනවා..." නිකීතා සිතන්නට විය. ඔහුගේ අහස් යානය වවුලෙකුට සමාන යැයි ඔහුට සිතෙයි. අඳුරු අහස පසු කොට ඔහු නිල්වත් ග්‍රහ ලෝකයකට පිවිසෙයි. එහි කඳු රිදීවන්ය. අලංකාර පොකුණුය, හිරු බැස යන විට ඇතිවන දර්ශනයට සමාන ලෙස අහසේ මාලිගා සහ රූප පාවෙන සැටියකි ඔහුට දැනෙන්නේ.

නිකීතාගේ ගැල කඳු බෑවුමක් බසිත්ම, බල්ලන්ගේ හඬ ඇසිණි. පොකුණු පිසගෙන තෙතමනය සහිත සුළං හමයි. ගැල ගෙවත්තට පැමිණ ඇත. මහ ගෙදර කෑම ශාලාවේ සිට උණුසුම සහිත සැප පහසු පහන් ආලෝකය කවුළුවෙන් පිටතට විහිදෙයි.

## පිටවීම

සරත් සමය පැමිණියේය. මහ පොළව සැතපීමට සැරසුණාක් මෙනි. හිරු පායන වේලාව දවසක් පාසා පමා වූ අතර කිසිඳු උණුසුමක් නැත. හිරු මහලු වූවාක් වැනිය. කුරුල්ලෝ පියාඹා ගියෝය. ගෙවත්ත පාලු වූ අතර කොළ හැලෙන්නට පටන්ගති. පොකුණේ තිබූ ඔරුව ගොඩ ගෙන ඇණිය උඩට හරවා මඩුවේ තබල ලදී.

දැන් උදෑසන, වහලේ සෙවනට හසුවන තැන තණකොළ සුදු පැහැගත් අතර පින්නට හසු වී තිබිණි. සරත් සමයේ පිණි සහිත තණකොළ පාගමින් තාරාවෝ පොකුණට ගියහ. උහු මහත් වූ අතර හිම කැටිවලට සමාන වූහ. තරුණියෝ දොළොස් දෙනෙක් ගම්වලින් විත් ගෝවා කපා පීප්පවල පිරවූහ. ඔවුහු ගීත ගැයූහ. ඔවුන් ගෝවා කපන හඬ රැව් දිණි. බටර්වලින් වෙඩරු වෙන්කරන ස්ථානයේ සිට දුව ආ දුන්යාෂා ගෝවා මද කැවාය. සරත් සමයේ දී ඈ වඩාත් ලස්සන වී ඇත. දැන් ඇගේ මුහුණ රතු පැහැයෙන් අලංකාර වෙලාය. දුන්යාෂා නිතර නිතර මෙහෙකරුවන්ගේ කාමර පෙළට දුව එන්නේ ගෝවා මද කෑමට සහ කෙල්ලන් සමග කතා කිරීමට නොව, ඇගේ රූ සපුව තරුණ කම්කරුවකුවන වසීලිට පෙන්වීමටය. ඔහුට ද රතු පැහැයෙන් දිලිසෙන මුහුණක් ඇත. අර්ත්යොම් ඉමහත් ලෙස අධෛර්ය්‍ය පත් වූයේ, මෙහෙකරුවන්ගේ කාමරවලට වී අශ්වයින්ගේ මෙවළම් අලුත් වැඩියා කළේය.

අම්මා මහ ගෙදර ගිම්හාන කාමරවල සිට ශීත කාලයට වාසය කරන කාමරවලට පදිංචියට ආවාය. ගෙතුළ යළිත් ගිනි තැපීමෙන් උණුසුම ඇති කරන ලදී. ඉත්තෑ පැටියා පිහන් අල්මාරිය යටට රෙදි කැලි සහ කඩදාසි කැබලි ගෙනැවිත් ශීත කාලය තුළ නිදා ගැනීමට ගුහාවක් සාදා ගත්තේය. ගුරුතුමා ඔහුගේ කාමරයට වී සිවුරු හඬ ලන්නට විය. නිකීතා දොරෙහි සිදුරකින් ගුරුතුමා දෙස බලන්නට වී, ගුරුතුමා කණ්නාඩිය ඉදිරිපිට සිටගෙන යටි රැවුළ මිටෙන් ගෙන සිටී. කල්පනාකාරී ලෙස සිවුරු හඬලයි. කරුණ පැහැදිලිය, ඔහු විවාහ වීමට තීරණය කර ඇත.

නිකීතාගේ පියා තිරිඟු පිරවූ ගැල් කීපයක් සමාරා නගරයට

යවා පසුදින ඔහුත් එහි ගියේය. ගමනට පිටත් වීමට පෙර තාත්තාත් අම්මාත් අතර ලොකු සාකච්ඡාවක් ඇති විය. දැන් අම්මා තාත්තාගෙන් ලියුමක් බලාපොරොත්තු වූවාය.

සතියකට පසුව තාත්තා අම්මාට ලියූ ලියුමේ මෙසේ සඳහන් විණි:

"මා තිරිඟු විකුණා දම්මේ වාසි පිටයි, මිද්වියෙදෙව්ටත් වඩා වැඩි මුදලකටයි. පරම්පරා අයිතිය පිළිබඳ කටයුතුවල වෙනසක් සිදු වී නැත. ආදරණීය සාෂා එනිසා ඔබ ඉතා තදින් විරුද්ධ වූ දෙවැනි තීරණය ගැනීමට සිදු වී තිබෙනවා. මේ සීත සමයේදීත් අප දෙදෙනා වෙන් වී සිටීම සුදුසු නැත. විද්‍යාලයේ අධ්‍යාපනික වර්ෂය ආරම්භ වී තිබෙන බැවින් නගරයට පැමිණීමේ ඔබේ කටයුතු ඉක්මන් කරන්න. විශේෂ වරප්‍රසාදයක් හැටියට දෙවැනි පංතියට ඇතුළුවීමේ පරීක්ෂණයට පෙනී සිටීමට නිකීතාට අවසර ලැබිල තියෙනවා. ඒ විතරක් නොවෙයි. අපේ නගරබද නිවාසයට සුදුසු ඉතා ලස්සන මල් පෝච්චි දෙකක් - මේවා චීනයේ සාදපු ඒවාය - මිල දී ගන්නැයි මට යෝජනා කරල තියෙනවා. මා ඒවා නොගෙන ඉන්නේ ඔයා තරහ වෙතියි කියන බිය නිසා පමණයි."

අම්මා අතීරණයෙන් පසු වූයේ ටික දවසකි. තාත්තා අත ඇති විශාල මුදලක් තිබීම ද, කිසිවකුටත් අවශ්‍ය නැති චීන මල්පෝච්චි ගැනීමට ඔහු පෙළඹීම ද නිසා බිය වූ අම්මා දවස් තුනක් ඇතුළත දී ගමනට අවශ්‍ය දෑ පිළියෙළ කළාය. නගරයේ ගෙදරට අවශ්‍ය ඇඳ, පුටු, මේස, පෙට්ටගම, ලුණු දැමූ ගෝවා ආදිය ඇති පීප්ප ද, තාරාවුන් කුකුළන් ආදී සතුන් ද ඕ ගැලි කීපයක පටවා යැවූවාය. අනතුරුව ඇ, නිකීතාත්, ගුරුවරයාත් සහ ගෙදර කුස්සි අම්මාවන වසිලීසාත් කැටුව ගැල්වලට පෙරටුව ත්‍රොයිකා රිය දෙකකින් නගරය බලා ගියාය. එදින ඇඳිරිය සහ සුළං සහිත දිනයක් විය. අම්මා අශ්වයින්ට අනුකම්පා කළ නිසා ගමන සෙමින් විය. කල්දිබාන්හි ඔවුන් රිය ගත කළේ නැවතුම් පොළකය. පසු දින දිවා ආහාරය ගැනීමට නියමිත වේලාව වනවිට, ස්ටෙප්ස් භූමියේ සමතලා බිමින් ඇඳිරිය සහත වළා පටල අතරින් දේවස්ථානයේ අර්ධ ගෝලාකාර පියස්ස පෙනිණි. වාෂ්පවලින් ක්‍රියා කරන මෝල්වල දුම් බට අහස දෙසට නෙරා ඇත. අම්මට නගර ජීවිතය නොරිස්සන නිසා, ඒ නිහඬව සිටියාය. ගුරුවරයා නම්

නොඉවසිල්ලෙකින් රැවුළු ගස් සපන්නට විය. ගඳ ගහන කම්හල් අසලින් ඔවුහු බොහෝ වේලාවක් ගමන් කළෝය. ඊළඟට ගස් සහ ලී ගබඩා කළ ගබඩාය, තැබෑරුම් සම අවන්හල් ද, සිල්ලර කඩ ද සහිත අපිරිසුදු වීදිය ද පසු කළහ. අනතුරුව සමාරා ගඟ මත වූ පුවුල් පාලමය. හවස් කලෙට නගරබඳ ගැටවරයින් දඟකරමින් හැසිරෙන්නේ මෙහිය. සමාරහි ගංගාවේ දළ බෑවුමෙහි ගස කඳින් සාදන ලද ඇඳිරි ගබඩා ගෙවල් ද පෙනිණි. විඩාපත් අශ්වයෝ කන්ද නගින්ට පටන් ගනිත්ම, අස් රියේ රෝද නගර වීදිවලට ගැටී හඬක් නැංවිණි. පිරිසිදු ඇඳුමින් සැරසුණු නගර වැසියෝ කුණු තැවරුණු අස්රිය දෙස මවිතයෙන් බැලූහ. අස්රිය නුහුරු හාස්‍ය ජනක බවක් පාන සැටිත්, කුණු තවරාගත් අශ්වයින් ගමින් ආ සැටිත්, නිකීතාට දැනිණි. ඔවුන්ගේ අස්රිය පසු කරගෙන කළු පැහැති අශ්වයෙක් ගියේ උගේ පාදවල ඇති ලාඩම්වලින් හඬ නංවමිනි. ඒ අස්රිය දිලිසෙන ලෙස 'පොලිෂ්' කර තිබිණි.

"සෙර්ගේයි ඉවානවිච්" යැයි අස්රියකරු ඇමතූ නිකීතා ඉක්මණින් රිය පදවල ලෙස ඉල්ලා සිටියේය.

"මෙහෙම යමු..." හේ පිළිතුරු දුන්නේය. සෙර්ගේයි ඉවානවිච් මනා ලෙස රියැදුරු අසුනෙහි වාඩි වී, අශ්වයින් තිදෙනා බැඳි රේන්ස් පටි අතට ගෙන රිය එළවයි. අස් රිය මගෙකින් හැරී, ගිනි නිවන ස්ථානය පසු කළේය. එහි ගේට්ටුව අසල ග්‍රීක තොප්පියක් හිස ලාගත් තරුණයෙක් සිටියේය. අවසානයේ දී අස් රිය යකඩ වැටක් සහිත සුදු පැහැති ගෙයක් ඉදිරිපිට නවත්වන ලදී. තාත්තා ගෙයි කවුළුවෙන් පිටත බලා අප දැක අත වනා අතුරුදහන් වී විනාඩියකින් පහ දොර ඇතුළු පැත්තෙන් විවෘත කළේය.

ප්‍රථමයෙන් ගෙතුළට දිව ගියේ නිකීතාය. ගෘහ භාණ්ඩ හා සුදු පැහැති බිත්ති සහිත ගෙය තීන්ත සුවඳින් පිරිලාය. ලී පොළව දිලිසෙයි. මූණ සෝදන බේසම්වලට සමාන ලොකු මල් බඳුන් දෙකක් බිත්තිය අසලතිබිණි. ගෙයි සාලයේ ඈත කොණක පිහිටි ආරුක්කුවකින් පිටතට වන් ගැනු ළමයකුගේ රූ සපුව දිලිසෙන තෙක් මැද ඇති ලී පොළවෙහි පිළිබිඹු විය. ඇගේ දෑත් සුදු පැහැති ඒප්රනයට යටින් තබා ඇත. ඇගේ දෙපා වසා ඇති කහ පැහැති පාවහන් පවා දිලිසෙන පොළවෙන් පිළිබිඹු වෙයි. කොණ්ඩය කරල් දෙකකට සිටින සේ ගොතා පීත්ත පටිවලින්


ТОРГОВАЯ

බැඳලාය. ඇගේ නිල්වන් නුවන්වල දැඩි බැල්මකි, දෙනෙත් රතමක් හැකිලී ඇත. ඕ ලීලායාය. නිකීතා සිටගෙන උන්නේ පොළවට ඇලුණු කලෙක මෙනි. සස්නෝව්කා ගමෙන් පැමිණි ගැමියන් දෙස නාගරිකයින් බැලූ පරිදිම, ඇයත් ඔහු දෙස බලා සිටි බව එහි තේරුමය.

"ඔයාට මා ලියපු ලියුම ලැබුණද?" ඕ ප්‍රශ්න කළාය. නිකීතා හිස වැනීය. "ඒ ලියුම කොහිද, ඒක වහාම මට දෙන්න"යි ලීලා ඉල්ලා සිටියාය.

තමා ළඟ ඒ ලියුම නොතිබුණ ද, ඔහු බොරුවට සාක්කු අත ගාන්නට වූයේ එය සොයන බවක් බව අඟවමිනි. ලීලා අවධානයෙකින් සහ රොස් බවකින් යුතුව ඔහුගේ දෙනෙත් දෙස බැලීය...

"මම පිළිතුරක් ලියන්ටයි හිටියේ, නමුත්..." ඔහු මුමුණන්ට විය.

"ලියුම කොහිද?"

"මගේ ඇඳුම් පෙට්ටියෙ."

"ඔයා අදම ඒ ලියුම මට නොදුන්නොත් අප අතර ඇති මිතුරුකම සදහටම ඉවර වේවි... මම බොහොම කණගාටු වෙනවා ඔයාට ලියුම් ලිවීම ගැන.. දැන් මම විදුහලේ පළමුවැනි පන්තියට බැඳුණා."

ලීලා දෙතොල් තද කරගෙන දෙපයේ ඇඟිලි තුඩුවලින් නැගිට සිටියාය. නිකීතා ඇගේ ලියුමට පිළිතුරු නොලිව් බව ඔහුට වැටහුණේ දැන්ය.. ඔහු කෙළ ගිළිමින් පයක් යම්තමින් එසවූයේ එය මෙතෙක් වේලා ඇලී තිබුණු බැවිනි... ලීලා යළිත් වරක් ඇගේ දැත් සුදු පැහැති ඒප්‍රනයට යටින් තබා ගත්තාය. ඈ නහය ඔසවා ගත්තී, අහංකාර බවක් මවා පෑවාය. අවඥාව විසින් ඇගේ දිගැති ඇහි බැමි සම්පූර්ණයෙන්ම වැසුණු කලෙක මෙනි.

"අනේ මට සමාවෙන්න. ඒවා සියල්ලම වුණේ අස්පයින්, සී සෑම, කමත, මිෂ්කා... හන්දා..." ඔහුගේ මුහුණ දම් පැහැයෙන් දිස්විය.

හේ හිස පහත දමා ගත්තේය.

ලීලයා නිහඬ වූවාය. ඔහු කළ වරද විසින් ඔහුට හැඟුණේ ඔහු ගොම ගොඩක් වැනි අධමයකු ලෙසය. එහෙත් ඒ අතර ආන්නා අපොලොසොව්නා හෙවත් ලීලයාගේ මවුගේ කටහඬ සාලයේ රැව්දිණි. ඇ සහ නිකීතාගේ මවු සිප වැළඳ ගත්හ. රියකරුවෝ ගෘහ භාණ්ඩ හා පෙට්ටි ගෙතුළට ගෙන ආහ... ලීලයා කෝපයෙන් හතිකට මෙසේ පැවසුවාය:

"අපව පෙනේවි... ඔයා එක්ක කිසිම දෙයක් කරන්ට බැහැ... බොරුවට සතුටුවන බවක් පෙන්වන්න... සමහරවිට මම මේ වරට ඔබට සමාව දෙනවා..."

ඕ සාලයට දුව ගියාය. එහි සිට ගෘහ භාණ්ඩ රහිත හිස් සාලයේ ඇගේ කට හඬ රැව්දිණි:

"සාෂා නැන්දේ ආයුබෝවන්, ඔබේ පැමිණීම අපට ලොකු සතුටක්!"

එලෙස නාගරික ජීවිතයේ ප්‍රථම දවස ආරම්භ විය. ප්‍රීතිමත්, නිසල අපහසු සහිත ගම්බද ජීවිතය වෙනුවට, විශාල නොවන කාමර හතක් තුළ නාගරික ජීවිතය ආරම්භ විය. එම කාමරවල ඇති කවුළුවලින් පිටත බලන විට, පාද මහත අශ්වයින් රිය අදින සැටිත්, පෙස්ත්‍රාව්කාහි වෙරිනෝසොව් දොස්තර මහතා මෙන් හැඳ පැළඳගෙන නාගරිකයින් බැරෑරුම් ලෙස ඒ-මේ අත යන සැටිත් පෙනේ. සුළං පහරට හසුව ගසා ගෙන යන කඩදාසි කැබලි සහ දූලිවලින් බේරෙනුවස් ඔවුහු තම කබා කරින් කට වසා ගනිති. කලබල ගතිය, ඝෝෂාව, කැළඹිලි සහිත කතාබහ. මෙහි වේලාව පවා ගත වුණේ වෙනත් විදිහකටය. එනම් මෙහි වේලාව පියාඹන්නට විය. නිකීතා සහ ඔහුගේ ගුරුවරයා එකතුව ඔහුගේ කාමරය පිළියෙළ කළහ. මේස පුටු නිසි පරිදි තබා පොත් පිළියෙළ කොට දොර රෙදි සහ ජනෙල් රෙදි දැමූහ. හවස් වත්ම පැමිණි වික්තර් පස්වැනි පංතියේ කොල්ලන් වැසිකිළියට වී සිගරැට් බොන බවත්, ඔවුන්ගේ අංක ගණිත ගුරුවරයාගේ පුටුවට ගම් දමා තිබුණු නිසා ඔහු පුටුවට ඇලුණු බවත් පැවසීය. වික්තර් නිදහස් ලෙසත් අමතක වූ ලෙසත් හැසුරුණේය.

නිකීතා සතු තල දොළහේ පිහිය ඉල්ලා ගෙන කිසියම් සගයකු සමග පිහාටු නැමැති ක්‍රීඩාව සඳහා පිටත්ව ගියේය.

හවස ඇඳිරි වැටෙත්ම නිකීතා කවුළුව අසල සිට ගත්තේය. හිරු බැසයාම නගරයේ ද ගමේම මෙනි. නිකීතාට හැඟුණේ වරක් ඔහු අල්ලාගත් ෂෙල්තුහින් නමැති පුංචි කුරුල්ලාට ඇතිවුණ හැඟීමය. කුරුළු පැංචා මෙන්ම පෙනේර රෙදිවලට කොටුවුණු සිරකරුවෙකි, නිකීතා. ඔහුගේ ගුරුතුමා උඩු කබායක් සහ තොප්පියක් ලා ගෙන කාමරයට ආවේය. ඔහුගේ ඇඳුම්වලින් ඕඩිකොළොං වහනය විය.

"මම රෑ නවය වනවිට එනවා."

"ගුරුතුමා යන්නේ කොහේද?"

"මම තවම නොගිය දිහාට. හා-හා-හා! ඔන්න මල්ලී, නුඹ ලීලයා කොහොමද පිළිගත්තෙ, සැරට නේද... කමක් නැහැ, පහු වෙන කොට හරියාවි. ඒක බාගෙට හොඳක් වෙන්ටත් පුළුවනි. ගමේ දී එකතු කරගත් ජෙල බැහැල යැවි..."

ගුරුවරයා එසේ පවසා කාමරයෙන් පිටවිය. එක දවසක දී ගුරුවරයා වෙනස් වූ සැටි නිකීතාට දැනිණි.

එදින රාත්‍රියෙහි ඔහු සිහිනයක් දිටීය. රිදී බොත්තම් සහිත නිල් පාට කබායක් ඇඳගෙන සිටින ඔහු ලීලයාට සැරෙන් කතා කරයි:

"මෙන්න ඔයාගේ ලියුම. ආපහු එය බාරගන්න."

එසේ කියත්ම ඔහු අවදි විය. යළිත් ඔහුට නින්ද ගියේය. ඔහු දූන් දිලිසෙන පොළවෙහි ගමන් කරයි. ලීලයාට කතා කරයි:

"ඔයාගෙ ලියුම ආපහු බාරගන්න!"

ලීලයාගේ දිගැති ඇහි බැමි උස් පහත් වෙයි. ඇගේ නාසය උඩහුය, එය පිටස්තර මෙවලමක් වැනිය. ඔන්න දූන් ඒ පිටස්තර මුහුණේ එම පිටස්තර බව අතුරුදහන් වී, සිනාසෙන්ට පටන් ගනී...

ඔහු අවදි වී වට පිට බැලීය. මහ පාරේ පහන් කණුවේ ආලෝකය කාමරේ බිත්තියට වැටිලා ඇත්තේ මවිතවන ආකාරයකටය... නින්ද ගිය පසු යළිත් ඔහුට එම සිහිනයම පෙනිණි. තේරුම් ගත නොහැකි එම ගැණු ළමයාට ඔහු මීට පෙර මෙතරම් ආදරය කර නැත...

පසුදින උදෑසන නිකීතාත්, ඔහුගේ මවුත්, ගුරුතුමාත් විද්‍යාලයට ගොස් එහි ප්‍රධානියා හමු වී කතා කළෝය. විද්‍යාලයේ ප්‍රධානියා කෙට්ටුය, ඔහුගේ හිසකේ පැසිලාය. ඔහුගෙන් පිත්තල සුවඳක් වහනය වෙයි. සතියක් ඉකුත් වත්ම, විද්‍යාලයේ දෙවන පංතියේ ප්‍රවේශ විභාගවලින් සමත් වූ නිකීතා විද්‍යාල ශිෂ්‍යයකු බවට පත් විය...



පිටකවරය - ශ්‍රියානන්ද හෙට්ටිආරච්චි

## අලෙක්සේයි තොල්ස්තෝයි

රුසියානු මහා ලේඛක ලියෝ තොල්ස්තෝයිගෙන් පසු රුසියානු සාහිත්‍යයට එනමින්ම බිහිව සාහිත්‍ය ක්ෂේත්‍රයේ ශිල්ප දක් වූ පසුකාලීන ලේඛකයා වශයෙන් අලෙක්සේයි තොල්ස්තෝයි සම්මාන ගත වී සිටියි. "නිකීතාගේ ළමා කාලය" රුසියන් ළමයින්ගේ බලවත් ආදරයට පත් වූ අතර ලේඛකයෙකුගේ ළමා වියේ අත්දැකීම් වැන්න.

කුරුළු පොත්
594/5, නාවල පාර, රාජගිරිය
දුරකථන: 2863350

Sarasavi Bookshop
9 5 5 5 9 1 0 7
NIKETHAGE LAMA KALAYA
11-2025 Rs. 750.00

ISBN 955 - 591 - 074 - X

මිල රු. 750.00